*Department of Social Statistics*

# 3rd National Research Conference on Applied Social Statistics


**Social Statistics Students' Association**
**Department of Social Statistics**
**University of Kelaniya**
**Sri Lanka**


**Chief Coordinator**

Senior Lecturer C.D.Chathuranga

**Chief Editor**

Ms.Apeksha Embuldeniya

**Co-Editors**

A. L. A. D. P. Kumari
E. M. N. Wijerathna
K. A. D. L. Y. M. Senapala
D. N. Fernando
Y. M. R. Kumarihamy
H. A. D. T. Hapuarachchi
W. P. A. S Wijesekara

**Cover Page Designers**

L.N.Liyanage
D.M.S.S.Dayarathna
A.A.S.D.Adikari
D.H.S.Madhuwanthi


Third Edition: 2017 November

# NRCASS 2017
## Advisory Committee

**Professor A.H.M.H.Abayarathna**

*Dean, Faculty of Social Sciences*

**Senior Professor Upali Hettiarachchi**

*Head, Department of Economics, University of Kelaniya*

**Dr. K.M.L.M.Manjula Gunarathna**

*Head, Department of Social Statistics, University of Kelaniya*

**Mr. Namal Balasooriya**

*Senior Lecturer, Department of Social Statistics, University of Kelaniya*

**Mr. C.D.Chathuranga**

*Senior Lecturer, Department of Social Statistics, University of Kelaniya*

# NRCASS 2017

## Panel of Reviewers

**Senior Professor Sunanda Madduma Bandara**

*Department of Economics, University of Kelaniya*

**Dr. M. M. Gunathilake**

*Senior Lecturer, Department of Economics, University of Kelaniya*

**Dr. W. M. Semasinghe**

*Senior Lecturer, Department of Economics, University of Kelaniya*

**Dr. H. R. Anulawathie Manike**

*Senior Lecturer, Department of Economics, University of Kelaniya*

**Dr. R. A. S. P. Bandara**

*Senior Lecturer, Department of Economics, University of Kelaniya*

**Dr. K. M. L. M. Manjula Gunarathna**

*Head, Department of Social Statistics, University of Kelaniya*

**Mr. Namal Balasooriya**

*Senior Lecturer, Department of Social Statistics, University of Kelaniya*

**Ms. L.W.Dasanayake**

*Senior Lecturer, Department of Economics, University of Kelaniya*

**Mr. C. D. Chathuranga**

*Senior Lecturer, Department of Social Statistics, University of Kelaniya*

## Social Statistics Students' Association

## Committee Members

| | |
|---|---|
| President | M. D. M. Ubesena |
| Vice President | C. T. Samarasinghe |
| Secretary | L. N. Liyanage |
| Vice Secretary | K. A. D. L. Y. M. Senapala |
| Treasurer | H. M. U. P. Herath |
| Editors | W. H. S. Prayadharshani |
| | H. A. D. T. Hapuarachchi |
| | D. U. P. Dasanayake |
| Committee Members | D M S S Dayarathne |
| | S C Lasanthi |
| | W H S L Priyadharshana |
| | A D N P Assalla |
| | M.K.I.A.Bandara |
| | B.G.T.D. Bandara |
| Senior Treasurer | Senior Lecturer C. D. Chathuranga |



## Message from the Vice Chancellor

## University of Kelaniya

It is indeed a great honor for me to offer this message on the occasion of the 3rd National Research Conference on Applied Social Statistics of the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

This symposium exposes an impressive opportunity to undergraduate researchers to present their research findings to the university community. This event will undoubtedly contribute to advance fundamental understanding or to solve real world problems.

It is unexceptionable that this symposium "NRCASS – 2017" will lead the undergraduates of the university to amplify their research skills as well as to develop the quality of the research they publish. As a leading higher education institution, the University of Kelaniya is very much conscious about the research outputs which would be a great asset to the society. We, the University of Kelaniya support to the university community, specially the undergraduates to carry out their valuable research. Moreover, the academic staff of the university is highly dedicated in encouraging undergraduates to publish ample research findings.

I wish to congratulate the organizing committee and the chief coordinator of NRCASS – 2017 for their tremendous effort towards this event. I am delighted to congratulate all the participants and I would like to pay my appreciation to those who got the benefit from this excellent occasion.

Professor D. M. Semasinghe

Vice Chancellor

University of Kelaniya



## Message from the Dean
## Faculty of Social Sciences

It is a great pleasure to offer my congratulations as the Dean of the Faculty of Social Sciences, on the occasion of 3rd National Research Conference on Applied Social Statistics for undergraduates – 2017 proceeded by Social Statistics Students' Association, University of Kelaniya.

This is a vital opportunity for the undergraduate researchers in the Faculty of Social Sciences to take part in forums and share their research findings in front of an assembly of academics. This will support to develop research skills of the undergraduates which is definitely an outstanding culture in university procedure.

The Faculty of Social Sciences always inspires its undergraduates to involve and achieve the best with their innovative ideas and to reach national and international research platforms.

I would like to make this opportunity to pay my heartfelt wishes to the organizing committee of Social Statistics Students' Association, research presenters, academic and non – academic staff members of the University of Kelaniya who were the pillars of strength in making this event a success for the 3rd consecutive time.

Professor A. H. M. H. Abayarathne

Dean

Faculty of Social Sciences

University of Kelaniya



# Message from the Head
# Department of Social Statistics

As the head of the department, I am delighted to give my congratulatory note on the occasion of the 3rd National Research Conference on Applied Social Statistics of the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

The Department of Social Statistics always gives the opportunity to undergraduates to improve their research abilities and soft skills. Department of Social Statistics tries to create a platform to groom the exemplary epitomes to perfect future leaders. I am happy to see that there are many undergraduates who have benefited from such measures and made their career a success.

This symposium, NRCASS – 2017 serves as a foundation to brighten the inner aptness and skillfulness of undergraduates which help to publish successful researches. It is clear that this is an output of a great enthusiasm of those who dedicated their valuable time. I take this opportunity to offer my gratitude to everyone who worked hard to make this event a success. Furthermore, I'm grateful and wish you all the very best in making this event for the 3rd consecutive time and as 1st time as a new academic department.

Dr. Manjula Gunarathna

Head

Department of Social Statistics

University of Kelaniya



# Message from the Chief Coordinator
# NRCASS – 2017

As the chief coordinator of National Research Conference on Applied Social Statistics NRCASS – 2017, I am happy to congratulate the editorial team, advisory committee, chairpersons, organizing committee, distinguished reviewers, article writers and precisely to the Social Statistics Students' Association for organizing the National Research Conference on Applied Social Statistics. I wish to express my heartfelt of gratitude on behalf of the organizing committee to the Research Council of University of Kelaniya for its financial assistance.

As the theme of the conference connotes as "Innovation and Optimization on Sri Lankan Quantitative Research". This theme leads to integrate the research views of multiple disciplines and is expected to focus on different viewpoints of researches. This theme itself paves the way for undergraduates to explore new research opportunities.

The NRCASS – 2017 is an important moment for the undergraduates as this provides a platform for undergraduates to present their research findings and in a boarder viewpoint; Also it leads the undergraduates to widen the perspective of knowledge in terms of their findings.

This conference provides an excellent opportunity for undergraduates to participate in presentations. The participants of this conference will have a wonderful experience with keynote speakers to recognize the parameters of researches. Moreover, they will have the opportunity to mix with different academics with multiple perspectives.

Further, I hereby extend my warm wishes to the success of "NRCASS-2017".

C. D. Chathuranga, Senior Lecturer
Chief Coordinator – NRCASS 2017

# Table of Content


**DEMOGRAPHY** 1

ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය හා විවාහය

ඩී. යූ. පී. දසනායක, ඒ. පී. ඩී. එන්. පෙරේරා, ආර්. ඒ. එස්. සඳුනිකා, අයි. අයි. ඊ.සිල්වා 3

ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණාවරණ භාවිතයේ ඇති ප්‍රවණතාවය විමසීම : ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම ඇසුරින්

ආර්. ජී. එස්. ඩබ්. ආරියරත්න 4

ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ඉහළ යාමේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීම

පී. එම්. පී. සි. ගජනායක 5

ශාස්ත්‍රපීඨ උපාධි අපෙක්ෂකයන්ගේ පරිගණක ඒකක භාවිතය ; රුහුණ විශ්වවිද්‍යාලීය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය ඇසුරින්

එස්. සී. ලසන්ති 6

දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධන උදෙසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි කාර්යභාරය පිළිබඳ අධ්‍යයනයක්. (අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග 7

වයස අවුරුදු 18ට අඩු බාලවයස්කාර මව්වරුන්ට ඇතිවන ශාරීරික හා මානසික ගැටලු (කුලියාපිටිය බටහිර ප්‍රදේශය ඇසුරින්)

පී. ඒ. ටී. ඩී. රත්නසිරි, ඩබ්. එම් ඩබ්. එම් විජේසිංහ එස්. ටී. ආර්. අයි. සිල්වා කේ. කේ. එස්. යූ. ඉෂාරි උබේසේකර කේ. පී. එල්. උදයංගනී 8

ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වර්ධනය වීම ආර්ථිකය කෙරෙහි ඇතිකරන බලපෑම

ඩබ්. පී. ආර්. රුවන්තී 9

ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වර්ධනය වීමේ ප්‍රවණතාවය

යූ. එච්. පී. පී. එස්. සමරනායක. 10

සේවා වියුක්ත ග්‍රාමීය තරුණ ප්‍රජාව මුහුණදෙන සමාජ ආර්ථික ගැටලු: සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ඒ. පී. එස්. සරෝජනී 11

මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි මානව සාධක හඳුනාගැනීම

එච්. සසිකා මධුවන්ති 12

මෑතකාලීනව දික්කසාදවීමේ ප්‍රවනතාව හා ඊට බලපාන හේතු

එස්. ටි. ආර්. අයි. සිල්වා 13

ස්වාභාවික ආපදා නිසා නැවත පදිංචි කළ පුද්ගලයන් මුහුණ දෙන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ ආර්ථික තත්ත්වයන් විමසා බැලීම (අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසන්තගම නිවාස ව්‍යාපෘතිය ආශ්‍රයෙන්)

කේ. එම්. ඩී. එම්. තිලකරත්න, ආර්. පී. එස්. එස්. දිසානායක, එස්. පී. එල්. ඔමීගා හංසිනී, පී. ටී. පතිරණ, පී. පී. එන්. බස්නායක 14

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සාඵල්‍යතාව සීමා වීම කෙරෙහි බලපාන සාධක

එස්. ඒ. ඩි. එම්. ඩි. ඒ. විජේසිංහ 15

**ECONOMICS** 17

පූර්ව ළමා අවධියේ පෝෂණ ඌණතාවය කෙරෙහි ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ බලපෑම

ඒ. ඩී. එන්. පී. අස්සැල්ල 19

ඉතිරිකිරීම් තැන්පතු සඳහා බැංකුවක් තෝරාගැනීමේදී ග්‍රාමීය පාරිභෝගික හැසිරීම

ඩී. එම්. යූ.. සි. දෙලන බී. එම්. එස්. පී. බාලසූරිය 20

පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී බිම් මට්ටමේ දී මතුවන ගැටලු

එස්.ඒ. දිල්හානි 21

The Impact of Microfinance on Women's Entrepreneurship

R. M. Dilki Hansika Rathnayake 22

ජංගම බැංකු ක්‍රමයේ භාවිතය සහ එහි ප්‍රවණතා (කොමර්ෂල් බැංකුව ඇසුරින්)

ඩී. එන්. ප්‍රනාන්දු 23

ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ සහ ආර්ථික වෘද්ධිය අතර පවතින සම්බන්ධතාවය පරීක්ෂා කිරීම.

ඩී. ඩී. ඩබ්. එන්. ගුණරත්න. 24

පාංශු පෝෂකත්වය මත පදනම් වූ රසායනික පොහොර භාවිතයේ ආර්ථික ප්‍රතිලාභ

එච්. එම්. යූ. පී. හේරත් 25

දළ ජාතික නිෂ්පාදනය සඳහා මහවැලි වගා භූමි ප්‍රමාණයෙහි දායකත්වය

ඒ. එල්. ඒ. ඩී. පී. කුමාරි 26

ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය(ATM) භාවිතය සහ එහි ප්‍රවණතා

ජී. එස්. ජී. නිසංකා 27

ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියට කාර්මික අපනයන දක්වන දායකත්වය

බී. පී. එස්. පී. කේ. පතිරත්න 28

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි විදේශ සේවානියුක්තිකයින්ගේ ප්‍රේෂණවල දායකත්වය (2006-2016)

ආර්. පී. ඩී. එන්. වයි. ප්‍රේමරත්න 29

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමෙහිලා සමූපකාර ග්‍රාමීය බැංකු මගින් ණය අවශ්‍යතා සපුරාලීම සම්බන්ධ දායකත්වය (කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ආර්. එච්. එම්. අයි. එම්. රාජකරුණා 30

අනාර්ථික සාධක මාරපන දකුණ ග්‍රාමයේ ආර්ථික පසුගාමිත්වයට හේතු වූ ආකාරය

බී. එම්. එම්. රසාංජලී 31

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීම කෙරෙහි ග්‍රාමීය කාන්තාවනගේ ආර්ථික දායකත්වය (කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ටාසය ඇසුරින්)

එම්. පී. ඩී. සදමාලි 32

ග්‍රාමීය සේවා වියුක්තිය අඩුකරලීම කෙරෙහි ඇඟලුම් කර්මාන්තයේ දුෂ්කරතාවය.(ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

සී. ටී. සමරසිංහ 33

කෘෂිකාර්මික සංවර්ධනය හා තොරතුරු සම්පාදනය

ඩී.සානිකා ප්‍රියංජලී දිසානායක 34

ශ්‍රව්‍යාබාධිතයන්ගේ රැකියා නියුක්තිය

ඩබ්. එච්. ශානිකා ප්‍රියදර්ශනී 35

උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය

යු. කේ. ඩී ශාන්ති 36

කෘෂි කර්මාන්තය තුළ තරුණයින්ගේ සහභාගීත්වයේ අඩුවීම කෙරෙහි බලපාන සාධක (කුරුණෑගල දිස්ත්‍රික්කයේ පලුගොල්ල ග්‍රාම නිළධාරි වසම ඇසුරිනි)

ඩී. එම්. සුනේත්‍රා සෙව්වන්දි දයාරත්න 37

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අධ්‍යාපනය, සඵලතාවය කෙරෙහි ඇති කරන බලපෑම

බී. එම්. එන්. එම්. තිලකරත්න 38

ග්‍රාමීය කාන්තා සේවා නියුක්තිය දරුවන්ට ඇති කරන බලපෑම

එම්. ඩී. එම්. උබේසේන 39

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ උච්චාවචනය කෙරෙහි බලපෑම් කරනු ලබන සාධකයන්හි ප්‍රවණතාවය විමසීම.

එම්. ඩී. එම්. උබේසේන, යු. පී. පී. එස්. සමරනායක, එල්. එල්. ආර්. ලොරොන්සුහේවා, එස්. සී. ලසන්ති, 40

වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) මගින් ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයට වන බලපෑම

ඩබ්. පී. ඒ. එස්. විජේසේකර 41

**EDUCATION** 43

ඉංග්‍රීසි අධ්‍යාපනය පාසල් දරුවන් තුළ කේන්ද්‍රගත වීමේ විෂම බව

ටී. ඩබ්. කේ. එම්. ආරියකරුණා 45

විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි දක්වන ප්‍රවණතාවය පිළිබඳ කරනු ලබන සමාජ විද්‍යාත්මක පරීක්ෂණයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ජේ. එම්. ඩී. වයි. බණ්ඩාර 46

ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම සාධනයට බලපාන සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් (කොටපොල අධ්‍යාපන කොට්ඨාශය ආශ්‍රයෙන්)

ආර්. ඩී. චතුරංග 47

ශ්‍රී ලංකාවේ ප්‍රථමික අධ්‍යාපනයේ වර්තමාන ප්‍රවණතාවය ( ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ග්‍රාම සේවා වසම ආශ්‍රයෙන්)

ඩී. ඒ. කේ. චතුරංගනි 48

අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුන්ගේ විභාග ආතතිය සඳහා විභාග මූලික අධ්‍යාපන ක්‍රමයේ බලපෑම

එස්. ඒ. දිල්හානි 49

කලා උපාධි අපේක්ෂිත විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි හා දෙමල භාෂා දැනුම (කැලණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයන් ආශ්‍රයෙනි)

ආර්. පී. එස්. එස්. දිසනායක, බී. ජී. ටී. ඩී. බණ්ඩාර 50

විද්‍යාර්ථීන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන දේශන සඳහා සහභාගීවීමේ ප්‍රවණතාවය සහ විභාග ප්‍රතිඵල අතර පවතින සම්බන්ධතාවය.(කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්

එච්. ඒ. ඩී. ටී. හපුආරච්චි 51

ඉංග්‍රීසි භාෂාව පිළිබඳව උසස් පෙළ සිසුන්ගේ ආකල්පය

එස්. ආර්. හෙට්ටිආරච්චි, ඩි. යූ. පි. දසනායක 52

පූර්ව ළමා විය සංවර්ධනය සඳහා පෙර පාසලේ කාර්යභාර්යය පිළිබඳ අධ්‍යනයක්

ජේ. එච්. එම්. සී. පී. ජයපත්ම 53

පාසල් ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ අධ්‍යයනයක්

කේ. ඒ. ඩී. එස්. කාරියප්පෙරුම 54

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල බඳවා ගැනීමේ ප්‍රවණතාවය

ඊ. එච්. එම්. අයි. පී. කුමාරි, ජී. ඒ. එස්. මධුවන්ති, ඩී. පී. ඩී. දුලාරි 55

අ පො . ස ː උ/පෙළ විභාගය සඳහා සිසුන් සීඝ්‍රයෙන් උපකාරක පන්තිවලට යොමු වීම හරහා ඔවුන්ට සාර්ථක ප්‍රතිඵල ලැබේද?

ඩී. කේ. එම්. මලගල, ඩබ්. ඩබ්. එල්. සී. ජනන්ජනා 56

දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි ඇතිබලපෑම

එස්. ජී. එල්. ඔමීගා හංසිනී, පී. ටී. පතිරණ 57

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සංස්කෘතික මධ්‍යස්ථානයේ අමතර පාඨමාලාවන් සඳහා ශිෂ්‍ය සහභාගීත්වය අවම වීමට බලපාන සාධක

එම්. ඒ. රුශාන්ති දිල්ශානි 58

A Study on the Effect of Urban and Rural Divide on Youth Development Index (YDI) in Sri Lanka

Thevuni K. Kotigala 59

මුහුණුපොත භාවිතය විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් කෙරේ ඇති කරනු ලබන බලපෑම (කැළණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

කේ.එම්.ඩී.ඇම්. තිලකරත්න 60

පාසල් ළමුන්ගේ විනය පිරිහීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්. ( ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්)

ආර්. ඩී. එස්. කේ. වීරසිංහ 61

වර්තමාන අධ්‍යාපන රටාව තුළ 5 වසර ශිෂ්‍යත්ව ක්‍රමය මගින් දරුවන්ගේ මානසික තත්ත්වයට සිදු කරන බලපෑම

ඩබ්. එම්. ඩබ්. එම්. විජේසිංහ 62

උසස් පෙළ උපකාරක පන්ති සඳහා සහභාගී වීම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිදු කරන බලපෑම  (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

එස්. ඒ. ඩී. යාමිණී 63

**HEALTH** 65

බස්නාහිර පළාත තුළ විශාල ලෙස ඩෙංගු රෝගය පැතිර යාම පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක්.

ඩී. එස්. අබේසිංහ, කේ. කේ. ඩබ්. සුබෝදනී 67

උදෑසන ආහාරය පෙර පාසල් දරුවන්ගේ කායික සෞඛ්‍යයට ඇති කරන බලපෑම

කේ. එල්. අයි. බී. ගුණවර්ධන 68

පාසල් ළමුන්ගේ පෝෂණය කෙරෙහි පාසල් විසින් ක්‍රියාත්මක කරන පෝෂණ ව්‍යාපෘතියේ ( උදෑසන ආහාර වේල) බලපෑම

ආර්. එම්. ටි. පි. ජයසේකර 69

වකුගඩු රෝග ව්‍යාප්තිය හා කෘෂි රසායනික පොහොර භාවිතය බලපෑම

කේ. එම්. එම්. පී. කුලතුංග, එච්. ඒ. එන්. ඩී. හෙට්ටිආරච්චි, ඩී. එච්. බෝපිටිය 70

Economic Burden of Diabetes Mellitus

L. N. Liyanage 71

ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජ,ආර්ථික සාධකයන්හි ප්‍රවණතාවය විමසීම (සාහිත්‍ය විමර්ශනය ඇසුරින්)

එල්. එල්. ආර්. ලොරෙන්සුහේවා 72

ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන හේතු සාධක

එන්. කේ. අයි. ටී. නමුණුකුල 73

ශ්‍රී ලංකාවේ පිලිකා රෝගය පිළිබද අධ්‍යයනයක්

ඊ. එම්. එන්. විජේරත්න 74

**INDUSTRIAL AND INFORMATION TECHNOLOGY** **77**

සේවක තෘප්තිමත්භාවය සහ රැකියා කාර්යසාධනය අතර පවතින සම්බන්ධය හඳුනා ගැනීම  (කොග්ගල නෝබල්වෙයා පුද්ගලික සමාගම ඇසුරෙනි)

කේ. කේ. එස්. යූ. ඉෂාරි උබේසේකර 77

Factors relating to work stress among female nurses in private and public hospitals

M. A. Rushanthi Dilshani 78

කැලණිය විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ටී. ඩී. එච් දර්ශා 79

ශ්‍රී ලංකාව තුල මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණයට පවතින බාධක ( දකුණු පළාත ඇසුරින්)

එච්. පී. අයි. එස්. එච්. ගමගේ 80

රජයේ සමාජ ආරක්ෂක ආවරණ වැඩසටහන් ග්‍රාමීය දරිද්‍රතාවය කෙරෙහි ඇතිකරන බලපෑම

ඩබ්. ඒ. ඩී. ටී. එස්. මානපුරාව 81

**MEDIA AND TOURISM** 83

ඩෙංගු මර්දනය හා කළමනාකරණය කෙරෙහි ජනමාධ්‍ය දායකත්වය (ගාල්ල දිස්ත්‍රික්කයේ ගොඩකන්ද සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය ඇසුරෙන්)

කේ. එම්. පී. එම්. ඩයස් , කේ. ඩී. ලියනගේ 85

සන්නිවේදනය සහ අපරාධ (සන්නිවේදන මාධ්‍යක් වන රූපවාහිනිය අපරාධ කෙරෙහි බලපාන ආකාරය)

ඩී. ඩී. වයි. එන්. ගුණරත්න 86

තරුණ ප්‍රජාව ත්‍රාසජනක ගමනාන්තයන්හි, සංචාරය කිරීමටත්, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වීමට සමාජ ජාල වෙබ් අඩවිවල බලපෑම

ඩී. එච්. ඩී. හේවගේ ඒ. ඒ. පී. එන්. කුමාර 87

**POLITICAL AND POVERTY** **91**

රූපවාහිනී දේශපාලන වැඩසටහන් ඡන්දදායක හැසිරීමට බලපාන ආකාරය

එල්. අයි. ඒ. ගුණතිලක 91

The "DOKLAM" border standoff between two asian giants

M. S. H. U. Karunarathne 92

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික දරිද්‍රතාවය පිළිබඳව අධ්‍යනයක්

ටී. ඩබ්. එස්. කාංචනමාලා 93

රජයේ සමාජ ආරක්ෂක ආවරණ වැඩසටහන් ග්‍රාමීය දරිද්‍රතාවය කෙරෙහි ඇතිකරන බලපෑම

ඩබ්. ඒ. ඩී. ටී. එස්. මානපුරාව 81

**SOCIO-CULTURAL** 95

කැලණිය විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අතර ජංගම දුරකථන භාවිතය

ඒ. ඒ. එස්. ඩී. අධිකාරි 97

ඇඟලුම් හා රෙදිපිලි කර්මාන්තය කෙරෙහි ඇඟලුම් සේවකයන් මුහුණදෙන තත්ත්වයන් බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (බියගම අපනයන සැකසුම් කලාපය ඇසුරින්)

ජී. ජී. එන්. බස්නායක 98

කාන්තාවන් ආර්ථික හා දේශපාලන වශයෙන් ක්‍රියාකාරීත්වය පහල මට්ටමක පැවතීමට අදාල හේතු  අධ්‍යයනය (ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන්)

එම්. කේ. අයි. ඒ. බණ්ඩාර 99

හෙල්මළු වී වගා ක්‍රමය හීන වී යාම (මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළයටවර ග්‍රාමසේවා වසම ආශ්‍රයෙන්)

ඩී. ඒ. කේ. චතුරංගනී, ආර්. පී. එස්. ඩබ්. ආරියරත්න, ඩබ්ලිව්. එම්. එල්. ඩී. ජයතිලක, ආර්. ඩී. එස්. කේ. වීරසිංහ, එල්. පී. අයි. එස්. මධුශානි 100

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 2-5 අතර ග්‍රාමීය දරුවන්ගේ බර අඩු වීමට  හේතු (මඩුල්ල - දැලිව පවුල් සෞඛ්‍යය සෝවා නිලධාරි  කොට්ඨාශය ඇසුරින් සිදුකරන ලද අධ්‍යයනයක්)

කේ. එම්. සී. ප්‍රියංගනී 101

ශ්‍රී ලංකාවේ වර්තමාන කාන්තා පුවත්පත්වල ස්ත්‍රී සමාජභාවය වැදගත් කොට දැක්වීම පිළිබඳ අධ්‍යයනයක්

එම්. පී. ආර්. වී. ගුණසේකර 102

A Study based on the predicaments of studying environment of the university undergraduates.

M.Y.G.V. Jayawardena 103

ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි මහජන පුස්තකාලවල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් (කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ඩබ්. ජී. වී. ආර්. කුමාර 104

වයස්ගත වීම කාන්තාවන් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම

වයි. එම්. ආර්. කුමාරිහාමි 105

ත්‍රීරෝද රථ අනතුරු සිදුවීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම

එම්. පී. එන්. පී. මැණික්ගේ 106

මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි නාගරික හා ග්‍රාමීය පාසල් සිසුන් දක්වන නැඹුරුතාව

එම්. ඩී. ඒ. නිශාදි 107

පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවීමේ ප්‍රවණතාවය

ආර්. එන්. කේ. රාජපක්ෂ 108

විදේශ සේවා නියුක්තිය සඳහා දෙමාපියන් විදේශගත වීම (අත්තනගල්ල හා ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරෙන්)

ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග, ඩි. ඩි. වයි. එන්. ගුණරත්න, ඩි. ඩි. ඩබ්ලිව්. එන්. ගුණරත්න, කේ. ඩී. ලියනගේ, කේ. එම්. ජී. එම්. ඩයස් 109

වත්මන් පාසල් ශිෂ්‍ය ප්‍රජාව විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමුවීමේ ප්‍රවණතාව

පී. ඒ. ඩී. ටී. ඩී. රත්නසිරි 110

වයස්ගතවූවන් පැමිණීමට හේතු සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය :මීරිගම සෙත්සෙවන වැඩිහිටි නිවාසය ඇසුරෙනි

කේ. ඒ. ඩී. එල්. වයි. එම්. සේනාපාල 111

විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ ජංගම දුරකථන භාවිතය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එච්. ටී. ඒ. ශාලික 112

විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ ජංගම දුරකථන භාවිතය පිළිබඳ අධ්‍යනයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

ටී. එම්. එච්. ඩී. තලවත්ත ,ආර්. ඩබ්ලිව්. එම්. බී. එන්. රණසිංහ 113

පාසල් සිසුන්ගේ ජංගම දුරකථන භාවිතය හා එමගින් අධ්‍යාපනයට ඇති බලපෑම

කේ. පී. එල්. උදයංගනී 114

කාටූන් ශිල්පියා සහ නිර්මාණාත්මක සංදේශය ( තලංගම ජයසිංහ චරිතාපදාන අධ්‍යයනයක් )

ඩබ්. පී. සචිනි වත්සලා විජේසේකර 115

උගව පළාත් උපාධිධාරීන් රජයේ රැකියා අපේක්ෂා කිරීමට හේතු

ඩබ්. ඩබ්. එම්. ඩි. විජේතුංග 116

ගුවන්විදුලි කාන්තා වැඩසටහන් සහ ශ්‍රාවක බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (නෙත්, ලක්, ස්වදේශී සහ අයි.ටී.එන් ගුවන්විදුලි නාලිකා ඇසුරෙනි)

ඒ. එම්. එල්. එස්. අත්තනායක 119

බස්නාහිර පළාත තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

කේ. එල්. සී. එස්. චන්ද්‍රසිරි 120

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන වෘත්තිකයන් මුහුණපාන පොදු ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් (බස්නාහිර හා මධ්‍යම පළාත් ඇසුරින්)

ජී. එම්. එන්. එස්. ගජනායක 121

ස්ත්‍රී පුරුෂභාවය සහ සංගීත වර්ගය අනුව විශ්වවිද්‍යාල සිසුන් සංගීතයට ඇති රුචිකත්වය.

එච්. එම්. ඩී. ඉ. ගුණරත්න, පී. ජී. ඒ. කාවින්දි, ඊ. එම්. ජී. ජී. ඒකනායක 122

Socio-economic Impact of Brain drain in Sri Lanka

K. N. Samarasinghe 123

විශ්ව විද්‍යාල විද්‍යාර්ථයින්ගේ පුස්තකාල භාවිතය පිළිබඳ අධ්‍යනයකි (කැළණිය විශ්ව විද්‍යාලය ඇසුරිනි)

ඒ. එන්. සිරිමාන්න, ඒ. එම්. ඩබ්. සී. පුංචිනිලමේ, ආර්. එම්. එස්. කුමාරි 124

අර්ධ නාගරික ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතනවල හා ගෘහ ඒකකවල දායකත්වය

කේ. කේ. ටී. උදයංග, ආර්. එම්. එන්. ගුණසේකර 125

ආයෝජනය සඳහා කොටස් තෝරාගැනීමේ තීරණ කෙරෙහි බලපෑම් කරනු ලබන සාධක අධ්‍යයනය කිරීම. ( කොළඹ කොටස් වෙළඳපොළ දේශීය පුද්ගලික ආයෝජකයන් ඇසුරින්

ඒ. එම්. දුලීකා ප්‍රියදර්ශනී 126

The Impact of Microfinance Services on the Growth of the Microenterprises in Sri Lanka. (With special reference to Homagama DS. Division)

S. U. Badullahewage 127

Factors Affecting the Usage of Social Media among Youngsters (A Quantitative Approach)

G. P. S. Nalaka, H. P. Diunugala 128

ග්‍රාමීය හා නාගරික බව අනුව ස්ත්‍රී දේශපාලන සහභාගීත්වය

ඩී. ඒ. කේ. අයි. සිල්වා 129

# DEMOGRAPHY

# ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය හා විවාහය

ඩී. යූ. පී. දසනායක1, ඒ. පී. ඩී. එන්. පෙරේරා,
ආර්. ඒ. එස්. සඳුනිකා, අයි. අයි. ඊ. සිල්වා

**සංක්ෂේපය**

විවාහය යනු පුද්ගලයකුගේ ජීවිතයේ ඉතා වැදගත් සන්ධිස්ථානයකි. විවාහයේ දී කුල සාධකයට ද වැදගත් ස්ථානයක් ඇතැයි සමාජයේ මතයක් පවතියි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ දී බොහෝ විට කුල ක්‍රමය හමුවන්නේ විවාහය තුළිනි. මෙම කුල ක්‍රමය 21 වන සියවසේ දීත් විවාහය සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේ දී ඉස්මතු වනවා ද යන්න පර්යේෂණයේ ගැටලුව වේ. වර්තමානය වන විටත් විවාහය සඳහා කුල ක්‍රමය පදනම් කර ගන්නවා ද සහ කුලවාදය අවසන් කිරීමට වත්මන් පරපුරේ ඇති කැමැත්ත අකමැත්ත විමසා බැලීම මෙහි මුඛ්‍ය අරමුණු වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත භාවිතා කර ඇති අතර නියැදිය තෝරා ගැනීමේ දී නිස්සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ පහසු නියැදීම මඟින් 60 ක නියැදියක් තෝරා ගෙන ඇත. දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලී ක්‍රමය යොදා ගත් අතර දත්ත සැකසීමේ දී Microsoft Excel 2016 මෘදුකාංගය යොදා ගෙන ඇත. දත්ත විශ්ලේෂණයේ දී කයි වර්ග පරීක්ෂාව භාවිතා කොට ඇත. මෙහිදී රැස් කර ගත් දත්ත වගු හා ප්‍රතිශත ඔස්සේ තීරු ප්‍රස්තාර හා වට ප්‍රස්තාර යොදා ගෙන ඉදිරිපත් කර ඇත. ඒ අනුව 44% ක් විවාහය සඳහා කුල ක්‍රමය පදනම් කර ගැනීම සුදුසු යැයි පවසන අතර 56% ක් විවාහය සඳහා කුල ක්‍රමය පදනම් කර ගැනීම නුසුදුසු යැයි ප්‍රකාශ කර ඇත. නූතන සමාජයෙන් කුල ක්‍රමය තුරන් වී යනවාට 73% ට වඩා වැඩි පිරිසක් කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර වයස අවුරුදු 45-75 අතර පිරිස් කුල ක්‍රමය පවත්වා ගෙන යාමට කැමැත්තක් දක්වන බව අනාවරණය විය. කුල ගැටලුව හේතුවෙන් විවාහය හා පෙම් සබඳතා බිඳ වැටීම් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 42% කි. කුල ක්‍රමය හා අධ්‍යාපන මට්ටම සසඳන විට ගම්‍ය වන්නේ අධ්‍යාපන මට්ටම ඉහළ යාමත් සමඟම කුල ක්‍රමය පිළිබඳ මතවාදයන් ඔවුන් තුළින් තුරන්ව යන බවයි. තව ද අධ්‍යාපන මට්ටම කෙසේ වුව ත් කුල ක්‍රමය පිළිබඳ අදහස් නොදරන පිරිස් ද වර්තමාන සමාජයේ දැකිය හැක. ශ්‍රී ලංකාව තුළ සිදු වන විවාහයන්ගෙන් 71% ක් සම කුල අතර පමණක් සිදුව ඇත. නූතන සමාජය සහකරු හෝ සහකාරිය තෝරා ගැනීමේ දී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරයි. මෙම පර්යේෂණයේ අවසන් ප්‍රතිඵලය ලෙස විවාහය සඳහා කුල ක්‍රමය පදනම් කර ගැනීම නුසුදුසු බවත් වත්මන් පරපුර කුල ක්‍රමය සමාජයෙන් තුරන්වනවාට කැමති බව ත් තහවුරු විය.

***මුඛ්‍ය පද : කුල ක්‍රමය, විවාහය, ශ්‍රී ලංකාව***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dupamodi@gmail.com

# ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණාවරණ භාවිතයේ ඇති ප්‍රවණතාවය විමසීම :ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම ඇසුරින්*

ආර්. ජී. එස්. ඩබ්. ආරියරත්න[1]

**සංක්ෂේපය**

පුද්ගලයකුගේ ජීවිතයට පවතින අවදානම කොයි මොහොතේ සිදුවේ ද යන්න සැකසහිත බැවින් ඔවුන්ගේ සමීපතමයන් හෝ යැපෙන්නන්ගේ සුබසිද්ධිය උදෙසා ජීවිත රක්ෂණාවරණය හදුන්වා දී ඇත. සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණාවරණ භාවිතයේ ඇති ප්‍රවණතාවය විමසීමයි. එය, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම ඇසුරින් සිදු කරන ලද අතර මහනුවර දිස්ත්‍රික්කයේ සසම්භාවී නියැදීම් ක්‍රමයට ග්‍රාමීය වශයෙන් පුද්ගලයින් 20 දෙනෙකු හා නාගරික වශයෙන් පුද්ගලයින් 20 දෙනෙකු දත්තදායකයින් ලෙස යොදා ගනිමින් ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රාථමික දත්ත එක් රැස් කරගන්නා ලදී. ද්විතීයික දත්ත එක් රැස් කරගන්නා ලද්දේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම මඟින් ලබා ගන්නා ලද සංඛ්‍යා ලේඛන මඟිනි. ඒ අනුව සාපේක්ෂව ගත් කල්හි නාගරික ජනතාව වැඩි වශයෙන් ජීවිත රක්ෂණාවරණ සඳහා යොමු වී ඇති බව පෙනීයයි. එය ප්‍රතිශතයක් ලෙස 92% ක් වන අතර ඊට හේතු ලෙස ඔවුන් බොහෝමයක් ස්ථිර රැකියා වල නිරතවීම, නිසි අධ්‍යාපනයක් ලබා තිබීම, අනාගත අවදානම් පිළිබඳ පෙර සූදානමකින්පසුවීම, ඉතිරිකිරීම් ඉහළ මට්ටමක පැවතීම, ආදී කරුණු දැක්විය හැකිය. ඒ අතරින් ද පුරුෂයින් 90% ද, ස්ත්‍රීන් 71% ක් ද රක්ෂණාවරණ සඳහා යොමු වී ඇත. ග්‍රාමීය මට්ටමින් ගත් කල්හි එහිදී 48% ක ප්‍රතිශතයක් ජීවිත රක්ෂණාවරණ සඳහා යොමු වී ඇති අතර බොහොමයක් ඒ සඳහා යොමු නොවී ඇත්තේ ඒ පිළිබඳ නිසි දැනුමක් නොමැති වීම, නිසි ආදායම් මාර්ගයක් නොමැතිවීම, එදිනෙදා ජීවන කටයුතු පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම, ඉතිරිකිරීම් සාපේක්ෂව අවම මට්ටමක පැවතීම ආදී පොදු හේතූන් නිසාවෙනි. එය පුරුෂයින්ගෙන් 46% ක ප්‍රතිශතයක් වන අතර ස්ත්‍රීන්ගෙන් 19% ක ප්‍රතිශතයක් වේ. මෙහිදී ජීවිත රක්ෂණාවරණය පිළිබඳ පාරිභෝගික උපයෝගීතාවය සැලකීමේදී 70% එය පිළිබඳ තෘප්තිමත් වන අතර 10% එය පිළිබඳ තෘප්තිමත් නොවන මට්ටමක පසුවන බව පෙනීගිය කරුණකී. 20% ක පිරිසක් එය පිළිබඳ විශේෂිත මතයක් නොදක්වයි. මේ අනුව සමස්ත සමීක්ෂණයෙන් පෙනී යන්නේ ජීවිත රක්ෂණාවරණය ග්‍රාමීය ප්‍රදේශ වලට සාපේක්ෂව නාගරික ප්‍රදේශ වල බහුලව භාවිත කරන බවයි. එමෙන්ම කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂයින් ජීවිත රක්ෂණාවරණ භාවිත කරන බවද ගම්‍ය වන කරුණකි.

***මුඛ්‍ය පද : ජීවිත රක්ෂණාවරණ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම, ග්‍රාමීය, නාගරික***

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

shashiniariya@gmail.com

# ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ඉහළ යාමේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීම

පී. එම්. පී. සි ගජනායක[1]

**සංක්ෂේපය**

වියපත් ජනගහනයේ ප්‍රතිශතය ඉහළ යාම 21 වන සියවසේ ලෝකය මුහුණ දී ඇති කැපී පෙනෙන ජන විකාශ ප්‍රවණතාව ලෙස හැඳින්විය හැක. ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීම දකුණු ආසියාවේ සියලු රටවලට වඩා වේගයෙන් සිදුවන බව "ජනගහන වියපත් වීම සහ ප්‍රතිපත්ති සමග සම්බන්ධය" මැයෙන් පැවති සම්මන්ත්‍රණයේදි හෙළිදරව් විය. මේ හේතු කොට ගෙන සමාජීය ආර්ථිකමය සහ සංස්කෘතිකමය වශයෙන් ගැටලු සහගත තත්වයක් නිර්මාණය වන බැවින් මෙය අධ්‍යනය සඳහා සුදුසු කාලීන පැතිකඩකි. ජනගහනය වියපත් වීමේ ස්වභාවය හදුනා ගැනීමත්, එමගින් ඇතිවන සමාජ ආර්ථිකමය ගැටලු හදුනා ගැනීමත් හා ගැටලු විසඳා ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග හදුනා ගැනීමත් යන අරමුණු පදනම් කොට ගෙන මෙම අධ්‍යනය සිදු කොට ඇත. මෙම අධ්‍යනය සඳහා ද්වීතීයික දත්ත භාවිතා කළ අතර ජන හා සංඛ්‍යාලේඛණ තොරතුරු, පුවත්පත්, සගරා, අන්තර්ජාලය මගින් ලබාගත් තොරතුරු භාවිතා කර ඇත. 1991 ශ්‍රී ලංකාවේ ජනගහනය අනුව ශ්‍රම බලකායට ඇතුලත් නැති යැපෙන ප්‍රතිශතය 65%ක් වූ අතර එයට ළමයින් 52%ක් සහ වැඩිහිටියන් 13%ක් ඇතුලත් විය. 2011 දී යැපෙන ප්‍රතිශතය 60% දක්වා අඩු වී ඉන් ළමයින් 34% හා වැඩිහිටියන් 21% තත්වයට පත් වී ඇත. 1946 ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනය මිලියන 6.7ක් වූ අතර ඉන් වයස 64 ඉක්ම වූ පිරිස වූයේ මුලු ජනගහයෙන් 3.4% කි. 2011 දි එම පිරිස මුලු ජනගහනයෙන් 12.5% දක්වා ඉහළ ගොස් ඇති අතර 2040 වන විට ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය 24% දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව පැහැදිළි වන්නේ සෑම වැඩ කරන පුද්ගලයන් 4 දෙනෙකුට එක් වයසක පුද්ගලයෙකු සඳහා රැකවරණය සැලසීමට සිදු වන බවයි. වියපත් ජනගහනය ඉහළ යාම තුළින් නිර්මාණය වන බොහොමයක් ගැටලු ප්‍රතිපත්ති සම්පාදකයන්ට බලවත් අභියෝගයකි. එවැනි පසුබිමක් තුළ වැඩිහිටි අනුපාතය අනාගතයට ගැටලුවක් නොවන පරිදි ආර්ථික වර්ධනයට සක්‍රීය ලෙස දායක කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමත් වියපත් ජනතාවගේ උන්නතිය සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභ ක්‍රම, ආරක්ෂණ ක්‍රමවේද සැලසීම අත්‍යවශ්‍ය වේ.

***මුඛ්‍ය පද: වයස්ගත වීම, ජනගහනය, වැඩිහිටි ජනගහනය, ආර්ථිකය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය

gayanigajanayaka@gmail.com

# ශාස්ත්‍රපීඨ උපාධි අපේක්ෂකයන්ගේ පරිගණක ඒකක භාවිතය ; රුහුණ විශ්වවිද්‍යාලීය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය ඇසුරින්

එස්. සී. ලසන්ති[1]

**සංක්ෂේපය**

සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ උසස් අධ්‍යාපනය කෙරෙහි බෙහෙවින් වැදගත් වනු ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ පරිගණක ඒකක භාවිතය පිළිබඳව අධ්‍යයනය සඳහා මෙම අධ්‍යයනය සිදු කොට ඇත. මෙම පර්යේෂණ ගැටලුව වූයේ අධ්‍යයන වර්ෂ අනුව සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයන්වල සිසුන්ගේ පරිගණක ඒකක භාවිතයේ වෙනසක් පවතී ද යන්න සෙවීමයි. මෙම ගැටලුව මත පදනම්ව අධ්‍යයන වර්ෂ අනුව පරිගණක ඒකක භාවිතයේ වෙනසක් පවතී ද යන්න මෙන්ම පුමිතිරි භාවය අනුව ද වෙනසක් දැකිය හැකි දැයි සෙවීම මෙහි අධ්‍යයන අරමුණ විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ විශේෂවේදී පළමු වසර, දෙවන වසර, තෙවන වසර සිසුන් 90න් යුත් නියැදියක් ලබා ගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය මගින් දත්ත රැස් කරගනු ලැබිණි. SPSS මෘදුකාංගය භාවිතා කොට ගනිමින් එම දත්ත විශ්ලෙෂණය කරනු ලැබිණ. දත්ත විශ්ලේෂණයට අනුව ස්ථල අනුව සිසුන් පරිගණක ඒකකය භාවිතා කිරීමේ මධ්‍යන්‍යය පැය ගණනෙහි වෙනසක් ඇති බවත් (Mean difference = 7.934 ; p = 0.001) පුමිතිරි භාවය අනුව පරිගණක ඒකක පැහැදිලි වෙනසක් හඳුනා ගත නොහැකි බවත් (Mean difference = -0.32558 ; P = 0.953) නිගමනය කළ හැකි විය.

**මුඛ්‍ය පද ඃ** *තොරතුරු තාක්ෂණය, විශ්වවිද්‍යාලය, පරිගණක ඒකකය*

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

chathusenevirathne93@gmail.com

# දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධන උදෙසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි කාර්යභාරය පිළිබඳ අධ්‍යයනයක්. (අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග1

**සංක්ෂේපය**

රටක වැදගත් ම සම්පත එරට සිටින ළමා පරපුරයි. මන් ද අනාගතය භාරව ඇත්තේ ඔවුන් මත ය. එබැවින් දැනුම, කුසලතා, ආකල්පවලින් පිරි නීරෝගී දරු පරපුරක් ඇති කිරීම අප සැමගේ යුතුකමකි. මුල් ළමාවිය ලෙස හැඳින්වෙන්නේ දරුවෙකු මව්කුස පිළිසිඳ ගැනීමේ සිට අවුරුදු 5 ක් දක්වා කාලයයි. මෙම සමයේ දී දරුවාගේ මොළයේ වර්ධනය 80% පමණ සිදුවන බව වෛද්‍යවරු පවසති. කුඩා දරුවෙකු තම දෙමාපියන්ගෙන් බැහැරව සමාජයට මුසුවන පළමු අවස්ථාව වන්නේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හරහා යි. වර්තමානයේ බොහෝ ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන මෙම මධ්‍යස්ථානවල කාර්යභාරය නිසි ලෙස ඉටුවනවා ද යන්න පිළිබඳව ගැටලුවක් පවතී. එය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. දරුවන්ට නිසි අධ්‍යාපනයක් හා ආරක්ෂාවක් ලැබෙනවා ද යන්න හා අවශ්‍ය භෞතික හා මානව ප්‍රාග්ධනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව සොයා බැලීම මෙහි උප අරමුණකි. අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 5 කට අයත් පහසු නියැදියකින් ප්‍රාථමික දත්ත එකතු කරගන්නා ලදී. ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රම යොදා ගන්නා ලදී. සියලුම පෙර පාසැල් බස්නාහිර පලාත් පෙර පාසැල් ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වී තිබිණි. සියලුම පෙර පාසැල්වල මාධ්‍ය සිංහල වූ අතර පෞද්ගලිකව පවත්වාගෙන යන ඒවා වීම විශේෂිත වේ. ළමුන් 20 කට එක් ගුරුවරියක බැගින් දක්නට ලැබූ අතර එක් දරුවෙකුට සාමාන්‍ය වර්ග අඩි 10 ක පමණ ඉඩක් පැවති බව දත්ත විශ්ලේෂණයේ දී පැහැදිලි වේ. මෙම මධ්‍යස්ථානවල සේවය කරන ගුරුවරුන්ගෙන් 90 ක් පමණ ඒ පිළිබඳ අධ්‍යාපනයක් ලබා ඇති බව පැහැදිලි වේ. දරුවන්ගේ ක්‍රියාශීලි බව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා පිටි වැනි පහසුකම් වර්ධනය කළ යුතුය.

***මුඛ්‍ය පද : මුල් ළමාවිය සංවර්ධනය මධ්‍යස්ථාන අධ්‍යාපනය කාර්යභාරය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

waruniranathunga9@gmail.com

# වයස අවුරුදු 18ට අඩු බාලවයස්කාර මව්වරුන්ට ඇතිවන ශාරීරික හා මානසික ගැටලු (කුලියාපිටිය බටහිර ප්‍රදේශය ඇසුරින්)

පී. ඒ. ටී. ඩී. රත්නසිරි[1],ඩබ්. එම්. ඩබ්. එම්. විජේසිංහ, එස්. ටී. ආර්. අයි. සිල්වා, කේ. කේ. එස්. යූ. ඉෂාරි උඩබේසේකර, කේ. පී. එල්. උදයංගනී

**සංක්ෂේපය**

ළමා වයස අවසන් කර නවයොවුන් වියට එළඹෙන ගැහැණු දරුවන් යොවුන් ප්‍රේමය සොයා හැඟීම් දැනීම් වලට යටත් ව තම ජීවිත අසාර්ථක කර ගනී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගැබිනි තත්ත්වයට වූවන්ට සමාජීය, ශාරීරික, මානසික වශයෙන් මුහුණදීමට සිදූ වන අභියෝග පිළිබඳව මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කරයි. අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබුවේ කුලියාපිටිය බටහිර ප්‍රදේශයයි. සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවල ක්‍රමය මගින් දත්ත රැස් කරගත් අතර ප්‍රත්‍යක්ෂ අධ්‍යන ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කරන ලදී. වයස අවුරුදූ 18ට අඩු ගැබිනි මව්වරු සිව් දෙනෙකු යොදා ගනිමින් මෙම පරීක්ෂණය සිදු කර ඇත. නියැදිය සඳහා තෝරාගත් සිව්දෙනාගේ අධ්‍යාපන මට්ටම් සලකා බැලීමේදී පෙනී ගියේ මොවුන් කිසිවෙකු අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දී නොමැති බවයි. අධ්‍යාපන මට්ටම, සහෝදර සහෝදරියන්ගේ ආභාසය, අනවබෝධය, පවුලේ ආර්ථිකමය ගැටලු, දෙමාපියන්ගේ අවධානය අඩු වීම හා ඔවුන්ගේ අධ්‍යාපන මට්ටමේ අඩුබව, අයහපත් මිතුරන් ඇසුරු කිරීම ආදී කරුණු මෙම තත්වයට තවදූරටත් හේතු වූ සාධක ලෙස පෙන්වා දිය හැකිය. එමෙන්ම මොවුන්ට නිවසේදී මෙන්ම සමාජයේදී ද විවිධ අපහාසයන්ට මුහුණදීමට සිදූ වී ඇති බවත්, මොවුන්ගේ පවුලේ සාමාජිකයන් ද සමාජයට මුහුණදීමට නොහැකිව බොහෝ ගැටලුකාරී තත්වයන්ට මුහුණදෙන බව තවදූරටත් තහවුරු විය. සාහිත්‍ය විමර්ශනයන්ට අනුව පැහැදිලි වන්නේ විදේශ රටවල අවුරුදූ 13 ක් වූ දරුවන් ඔවුන්ගේ සංස්කෘතියට අනුව ගොඩනැගුනු ස්වාධීනව ජීවත්වීමේ අයිතියක් පවතින නිසාවෙන් ඔවුන් ළමා වයසේදීම ගැබ් ගැනීම් වලට ලක්වන බවයි. එහෙත් ශ්‍රී ලංකාවේ පවතින්නේ එයට පරස්පර විරෝධී සංස්කෘතියක් බැවින් ශ්‍රී ලාංකීය දරුවා අවුරුදූ 18 තෙක්ම බාල වයස්කාරයෙකු ලෙස සලකයි. එමෙන්ම වයස අවුරුදූ 18 අඩු ගර්භනීය මව්වරු පරිවාස ගත කළ යුතු වුවත් අප පරීක්ෂණයේ දක ගත හැකි වුයේ මොවුන් පරිවාස ගත වීම සිදු නොවන බවයි. එමෙන්ම ශ්‍රී ලාංකීය රාජ්‍ය නීති සංග්‍රහයට අනුව වයස අවුරුදූ 18 දී විවාහ වීමේ අයිතිය ලබා දී ඇත. නමුත් වයස අවුරුදූ 16 දී ලිංගික කැමැත්ත ප්‍රකාශ කළ හැක.(1907 අංක 19, 1952 අංක 14 දරණ විවාහ පණත) මෙම නීතියේ පවතින දූර්වලතාවන් නිසාද මෙම ගැටලුකාරී තත්වය ඇති වී තිබේ. එම නිසා වයස අවුරුදූ 18 ට අඩු දරුවන් ගැබිනියන් බවට පත් වුවත් ශ්‍රී ලංකාව තුළ ඔවුන්ට ඔවුන්ගේ ගැටලු සාක්ෂාත් කර ගැනීම සඳහාත් ළමුන් මෙම තත්වයෙන් මුදවා ගැනීම සඳහාත් ,ඔවුන්ට නිසි අධ්‍යාපනයක් ලබාදීමටත් වත්මන් රජය විසින් ස්ථිර පියවරක් ගතයුතුව ඇත.

***මුඛ්‍ය පද : බාලවයස්කාර මව්වරු , කුලියාපිටිය, අධ්‍යාපන මට්ටම , ගැටලු***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වර්ධනය වීම ආර්ථිකය කෙරෙහි ඇතිකරන බලපෑම

ඩබ්. ජී. ආර්. රුවන්ති[1]

**සංක්ෂේපය**

සංවර්ධිත රටවල සමාජ හා ආර්ථික දියුණුව නිසා එම රටවලට වැඩිහිටියන්ගේ සුරක්ෂිතතාවය කෙරෙහි විධිමත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත. නමුත් දියුණු වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටක මෙලෙස කෙටි කාලයක් තුළ ජනගහනය සැලකිය යුතු ලෙස වයස අවුරුදු 60ට වඩා වැඩි වයස් කාණ්ඩවලට අයත්වීම විශාල අභියෝගයක් වේ. මෙය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ වියපත් ජනගහන වර්ධනය දළ දේශීය නිෂ්පාදනයට ඇති කරන බලපෑම පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා 2007 සිට 2016 වර්ෂය දක්වා දළ දේශීය නිෂ්පාදනය, සේවා නියුක්තිය, අවුරුදු 60 හෝ ඊට වැඩි වයස්ගත ජනගහනය, පෞද්ගලික ඉතුරුම් යනාදී විචල්‍යයන්ට අදාළ කාලශ්‍රේණි දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව යන ආයතන මඟින් ලබාගෙන ඇත. බහුගුණ ප්‍රතිපායන ආකෘතිය යටතේ ඉහත අරමුණ පරීක්ෂා කරන අතර ඇස්තමේන්තුව සඳහා SPSS මෘදුකාංගය භාවිතා කරයි.දත්ත විශ්ලේෂණයට අනුව ආකෘතියේ පරාමිතීන් ලෙස සේවා නියුක්තියට අදාල ව (.167) ද අවුරුදු 60 හෝ ඊට වැඩි වයස්ගත ජනගහනයට අදාලව (.176) ද පෞද්ගලික ඉතුරුම්වලට අදාලව (.028) ද දැක්විය හැකිය. මේ අනුව පරායක්ත විචල්‍යවන දළ දේශීය නිෂ්පාදනය කෙරෙහි ජනගහනය වයස්ගතවීමේ බලපෑමක් ඇතැයි නිගමනය කළ හැකි ය.

***මුඛ්‍ය පද - දළ දේශීය නිෂ්පාදනය, වයස්ගත ජනගහනය, සේවා නියුක්තිය, පෞද්ගලික ඉතුරුම්***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

wgramesharuwanthi@gmail.com

# ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වර්ධනය වීමේ ප්‍රවණතාවය

යූ. එච්. පී. පී. එස්. සමරනායක[1].

**සංක්ෂේපය**

ජනගහනය ළදරු, ළමා, තරුණ, වැඩිහිටි යන සියලුම අවධීන්ට අයත් වූවන්ගෙන් සමන්විත වේ. විශේෂයෙන් මෙම අධ්‍යයනයේදී සලකා බලනුයේ, වැඩිහිටි සහ වයෝවෘද්ධ යන අවධිය පිළිබඳවය. සංවර්ධිත රටවල වියපත් ජනගහනය ලෙස සැලකෙන්නේ වයස අවුරුදු 65 හෝ ඊට වැඩි ජනගහනයයි. සංවර්ධනය වෙමින් පවතින රටවල වයස අවුරුදු 60 හෝ ඊට වැඩි පිරිස වියපත් ජනගහනය ලෙස සලකයි. ජනගහනය වයස්ගත වීම යනුවෙන් අදහස් කරනුයේ, රටක සමස්ත ජනගහනයට සාපේක්ෂව වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයන්ගේ ප්‍රතිශතය ඉහළ යාමයි. වයස්ගත ජනගහනය වර්ධනය වීමේ ගැටලුවට සංවර්ධිත රටවල් මුහුණ දී ඇති අතර සංවර්ධනය වෙමින් පවත්නා රටවල් එම ගැටලුවට මුහුණ දෙනු ලබන්නේ වර්තමානයේ දීය. ඒ අනුව, එය අධ්‍යයන පසුබිම කර ගනිමින් සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වර්ධනය වීමේ ප්‍රවණතාවය පිළිබඳව අධ්‍යයන කිරීම මෙහි අධ්‍යයන අරමුණ විය. මෙම අධ්‍යයනය ද්විතීයික දත්ත පදනම් කර ගනිමින් සිදු කරනු ලැබීය. එනම්, 2012 ජන සංගණන වාර්තාව, මහ බැංකු වාර්තා සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේනතුවේ ප්‍රකාශිත වාර්තා ද උපයෝගී කර ගන්නා ලදී. ඒ අනුව මෙම අධ්‍යනයෙන් 1981 දී සියයට 6.6ක් වූ වයස්ගත ජනගහනය 2012 දී සියයට 12.4ක් බව පෙනී ගියේය. එසේම 2015 වසරේ ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.96 ක් දක්වා ළඟා වී ඇති අතර ඉන් සියයට 13.9 ක් වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයන් බව පැහැදිලි විය. මින් පෙනී ගියේ කාලයත් සමඟ වැඩිහිටි ජනගහනය වර්ධනය වී ඇති බවයි. එසේම වැඩිහිටි ජනගහනය වර්ධනය වීමත් සමඟ එය රටේ ආර්ථිකයට බලපෑමක් එල්ල කරනු ලබයි. එනම්, ශ්‍රම බලකාය හීන වීම, සුභසාධන වියදම් ඉහළ යාම නිසා ඒ සඳහා දායකත්වය දැරීමට රාජ්‍යය අයවැයට සිදු වීම, යැපුම් අනුපාතය ඉහළ යාමෙන් කුටුම්භ වල වියදම් ඉහළ යාම, රැකබලාගන්නන්ගේ ගැටලුව යනාදී ගැටලු රාශියක් පැන නගී. මේ සඳහා කළ හැකි යෝජනාවක් වන්නේ වැඩිහිටියන්ගේ රැකවරණය, සුභසාධනය සම්බන්ධයෙන් රජය මඟින් අනාගත සැලසුම් සකස් කිරීමයි.

***මුඛ්‍ය පද : වයස්ගත ජනගහනය, ශ්‍රම බලකාය, සුභසාධනය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

prabodhasubha@gmail.com

# සේවා වියුක්ත ග්‍රාමීය තරුණ ප්‍රජාව මුහුණදෙන සමාජ ආර්ථීක ගැටලු: සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ඒ. පී. එස්. සරෝජනී[1]

**සංක්ෂේපය**

වර්තමානයේ ප්‍රබල සමාජ ගැටලුවක් ලෙස තරුණ සේවා වියුක්තිය හඳුනාගත හැකිය. 2012 ලෝක බැංකු සංවර්ධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව ඉහළ මට්ටමක පවතින බව හෙළි කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා වලට අනුව 2015 වසරේ වාර්තා වූ සමස්ත විරැකියා ජනගහනය 383,496 කි. පුරුෂයින්ගේ විරැකියා අනුපාතය 3.0% වූ අතර ස්ත්‍රීන්ගේ විරැකියා අනුපාතය 7.6%කි. වයස අවුරුදු 15-24 ත් අතර වයස් කාණ්ඩයේ විරැකියා අනුපාතය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම අනෙක් වයස් කාණ්ඩ වලට සාපේක්ෂ ව ඉහළ අගයක් වේ. එහෙයින් ඔවුන් මුහුණ දෙන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ ග්‍රාමීය සේවා වියුක්ත තරුණ ප්‍රජාව මුහුණදෙන සමාජ ආර්ථීක ගැටලු මොනවාද යන්න විමර්ශනය කිරීමයි. සෙසු අරමුණු ලෙස ග්‍රාමීය තරුණ ප්‍රජාවගේ අධ්‍යාපන මට්ටම විමසා බැලීම, ඔවුන්ගේ සමාජ සංස්කෘතික ජීවන රටාව අධ්‍යයනය කිරීම, ග්‍රාමීය තරුණ ප්‍රජාවගේ ආකල්ප හඳුනා ගැනීම, රැකියාවන් සඳහා ප්‍රවේශ වීමට පවතින අවස්ථාවන් හඳුනා ගැනීම වේ. පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා සමීක්ෂණ විධික්‍රමය යොදා ගත් අතර දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගැණිනි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවා වියුක්ත තරුණයන් 20 ක් හා තරුණියන් 20 ක් දත්ත දායකයින් වශයෙන් සහභාගී කරගෙන නිගමනයන්ට එළ 50% ක ප්‍රමාණයක් පවුලේ සෙසු සාමාජිකයන්ගෙන් යැපීම, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම, විවාහය ප්‍රමාද වීම, ආර්ථීකමය වශයෙන් ස්ථාවරභාවයකට පැමිණීමට නොහැකිවීම වැනි ගැටලු වලට මුහුණපාන බව හඳුනාගත හැකිවිය. මේ සඳහා විසඳුම් වශයෙන් ධනාත්මක ආකල්ප සංවර්ධනය, ස්වයං රැකියා සඳහා මාර්ගෝපදේශන සැපයීම, රැකියා අභිමුඛ වෘත්තීය පාඨමාලාවන්ට යොමු කිරීම ආදිය පෙන්වා දිය හැකිය.

***මුඛ්‍ය පද : සේවා වියුක්තිය, තරුණ ප්‍රජාව, ග්‍රාමීය අංශය***

[1] ශාස්ත්‍රවේදී (විශේෂ උපාධි) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය

samila4000@gmail.com

# මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි මානව සාධක හඳුනාගැනීම

එච්. සසිකා මධුවන්ති[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ජීවත්වන ජනතාව අනෙක් රටවලට සාපේක්ෂව නිතරම ස්වාභාවික විපත් වල ගොදුරු බවට නොපත්වේ. නමුත් වර්තමානය වනවිට පෞද්ගලික රථවාහන පාරිභෝජනය අධිකවීම, මාර්ග සංවර්ධනයවීම හා සමගාමීව සමස්ථයක් ලෙස පෙර වර්ෂවලට සාපේක්ෂව 2016 වර්ෂයේ මාර්ග අනතුරු සිදුවීමේ ප්‍රවණතාවය සීඝ්‍රලෙස වර්ධනය වී ඇත. බහුතරයක් එනම් ප්‍රතිශතයක් ලෙස 92% මාර්ග අනතුරු සිදූවීම කෙරෙහි මාර්ගය භාවිතා කරන්නන්ගේ බලපෑමක් පවතින බවත් ඉතිරි 8% පාරිසරික සාධක සහ රථවාහනවල පවතින දුර්වලතා හේතුකොටගෙන සිදුවන අනතුරු බව අනාවරණය වේ. එමෙන්ම 2016 වසරේ වැඩිම අනතුරු සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුළ සිදුවී ඇති බව අනාවරණය විය. මෙහිදී පුද්ගල මරණ 804 ක් සිදූ වී ඇත. ශ්‍රී ලංකාව තුළ මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි (මාර්ගය භාවිතාකරන්නන්ගේ) දායකත්වය හදුනා ගැනීම අධ්‍යනයේ ප්‍රධාන අරමුණවන අතර කාලීනව මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි මානව සාධක (මාර්ගය භාවිතාකරන්නන්) වල විචලනය හා වාහන වර්ගය අනුව අනතුරු සිදුවීමේ වෙනස්කම් හදුනගැනීම උප අරමුණු වේ. අධ්‍යයනය සඳහා ද්විතීක දත්ත මූලාශ්‍රයන් මගින් දත්ත රැස් කරන ලදි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසිය, ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කරන දත්ත මේ සඳහා භාවිතා කර ඇත. විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම මගින් දත්ත විශ්ලේෂණය කරන ලදි. අධ්‍යයනය අනුව මාර්ග අනතුරුවලට භාජනය වීමෙන් සිදුවන පුද්ගල මරණ ප්‍රතිශතය වාර්ෂිකව වර්ධනීය තත්ත්වයක් දැකගත හැකි වේ. 2005 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය වන විට මාර්ග අනතුරුවලින් සිදු වූ පුද්ගල මරණ ප්‍රතිශතය, ආසන්නව 44%කි. පසුගිය වසර තුළ අධික වේගයෙන් රිය ධාවනය කිරීම මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි ප්‍රබලත්වයක් ගෙන ඇත. මාර්ග අනතුරුවලින් 46%ම වයස අවුරුදු 25-35 අතර තරුණ පිරිස භාජනය වේ. මෙසේ අනෙකුත් වයස් ඛාණ්ඩයන්ට සාපේක්ෂව බහුතරයක් මාර්ග අනතුරුවලට තරුණ පිරිස් භාජනය වීමේ මූලික හේතු සාධකය වන්නේ ඔවුන් තුළ පවතින ආවේගශීලී සිතුවිලි බව මෙමගින් අවධාරණය විය. 2016 වර්ෂයේ අනතුරු විශාල ප්‍රමාණයක් මෝටර් රථ මූලික කරගනිමින් සිදු වී ඇත. එය යතුරුපැදිවලට සාපේක්ෂව 36%ක අනතුරු ප්‍රමාණයක් වාර්තා වී ඇත. මෙම අධ්‍යනයට අනුව මාර්ගය භාවිතාකරන්නන් සඳහා පවතින නීති රීති නිසිලෙස ක්‍රියාත්මක කිරීම සහ මාර්ග නීති කඩකිරීම සඳහා අයකරනු ලබන දඩ මුදල් ඉහල දැමීම, වරදකාරී රියදුරන්ගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීම, රියදුරු බලපත්‍රය නිකුත් කිරීමේදී අයතා ක්‍රමවලින් ලබාගැනීමට ඉඩ නොදීම හා ඒ සඳහා දැඩි නීතිමය පියවර ගැනීම, රජය මගින් රියදුරු පුහුණු පාසල් ආරම්භ කර රියදුරන් හට නිසි පුහුණුවක් සහ මාර්ග සංඥා පිලිබඳ අවබෝධයක් ලබාදීම හා මාර්ග අනතුරු බහුලව සිදුවන ස්ථානවල දැන්වීම් පුවරු ඉදිරිපත් කලයුතු බව අනාවරණය විය.

***මුඛ්‍ය පද : මාර්ග අනතුරු, මාර්ගය භාවිතාකරන්නන්, රියදුරන්, වර්ධනය, නීති රීති***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යනය අංශය ,කැලණියවිශ්වවිද්‍යාලය

shachimadhuwanthi@gmail.com

# මෑතකාලීනව දික්කසාදවීමේ ප්‍රවනතාව හා ඊට බලපාන හේතු

එස්. ටී. ආර්. අයි. සිල්වා[1]

**සංක්ෂේපය**

සාර්ථක ජීවිතයක් ගත කිරීමේ බලාපොරාත්තුවෙන් විවාහ දිවියට එලබෙන බොහෝ දෙනා අද වන විට ඇති වන සුලු ගැටුම් වලදී පවා දික් කසාදය වෙත යොමු වීමක් දක්නට තිබේ. එම නිසාවෙන්ම මගේ පරීක්ෂණ ගැටලුව බවට පත්ව ඇත්තේ පසුගිය වසර 3 තුළ කොළඹ දිස්ත්‍රික්කය තුළ දික්කසාද වුවන් සංඛ්‍යාව කොපමණද? ඔවුන් දික්කසාද වීමට බලපාන ලද ප්‍රබල හේතු මොනවාද? යන්න සොයා බැලීමයි. මෙහි ප්‍රධාන හේතුව වන්නේ දික්කසාදය සදහා වැඩිපුර යොමු වන්නේ යෝජිත විවාහ මගින් විවාහ පත් වුවන්ද, එසේත් නැතිනම් ප්‍රේම සබදතා මගින් විවාහ පත් වුවන්ද, යන්න සොයා බැලීමයි. මේ සදහා තොරතුරු රැස්කිරීමට මා විසින් යොදා ගනු ලැබූ ක්‍රමවේදය වන්නේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලි ක්‍රමයයි. මේ පරීක්ෂණය හරහා සොයාගත් අනාවරණය වන්නේ, එනම් දික්කසාදවී ඇත්තේ බහුතරයක් ප්‍රේම සම්බන්ධතා මගින් විවාහ පත් වුවන් බවත් මෙම පරීක්ෂණයට අනුව මොවුන් දික්කසාද වීමට ආසන්නතම හේතුව වන්නේ එකිනෙකාගේ වෙනස් වීම දරා ගැනීමට නොහැකි වීම මත විවාහ දිවිය නීරස වී එම තීරණයට එළඹුන බවයි. එමෙන්ම මේ මගින් ප්‍රත්‍යක්ෂ වන්නේ දික්කසාදය නම් වූ සමාජ ප්‍රශ්නය උද්ගත වන්නට 50% ට වඩා දායක වී ඇත්තේ ප්‍රේම සබදතා මගින් විවාහ පත් වුවන් බවයි.

***මුඛ්‍ය පද : දික්කසාදය, විවාහය, ප්‍රේම සබදතා***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ස්වාභාවික ආපදා නිසා නැවත පදිංචි කළ පුද්ගලයන් මුහුණ දෙන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ ආර්ථික තත්ත්වයන් විමසා බැලීම (අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසන්තගම නිවාස ව්‍යාපෘතිය ආශ්‍රයෙන් )

කේ. එම්. ඩී. එම්. තිලකරත්න[1], ආර්. පී. එස්. එස්. දිසානායක,
එස්. පී. එල්. ඔමීගා හංසිනී, පී. ටී. පතිරණ, පී. පී. එන්. බස්නායක

**සංක්ෂේපය**

වර්තමානය වන විට මානව සමාජය තුළ තවත් එක් ගැටලුවක් වී ඇත්තේ ස්වාභාවික ආපදාවන්ය. මෙම ස්වාභාවික ආපදා නිසා අවතැන් වන ජනයාට නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වෙයි. නමුත් මෙම නැවත පදිංචි කළ පුද්ගලයන්, අදාළ පදිංචි ප්‍රදේශය තුළදී ආර්ථික, සමාජීය හා ප්‍රජාවිද්‍යාත්මක ගැටලුවලට මුහුණ දීම දැකගත හැක. මෙම ගැටලුව පිළිබඳ පර්යේෂණයෙන් අවධානය යොමු කෙරුණු අතර, එහිදී සපුරා ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු වූයේ නැවත පදිංචි කළ පුද්ගලයින්ට අවශ්‍ය වූ ආර්ථික, සමාජීය හා ප්‍රජාවිද්‍යාත්මක අවශ්‍යතා ප්‍රමාණවත් මට්ටමින් පවතී දැයි සොයා බැලීමයි. මෙහිදී මෙම අධ්‍යයනයේ සංගහනය වූ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසන්තගම පදිංචි පවුල් අතරින් පවුල් 30 ක නියැදියක් සරල සසම්භාවී ක්‍රමවේදය යටතේ තෝරා ගැනුණු අතර ඔවුන්ට ප්‍රශ්නාවලිය යොමු කිරිමෙන් හා සම්මුඛ සාකච්ඡාවලට බඳුන් කිරීම මගින් ඉහත අරමුණුවලට අදාළ තොරතුරු සොයා ගන්නා ලදී. එම දත්ත විවිධ සංඛ්‍යානමය ක්‍රම ශිල්ප මත විශ්ලේෂණයට බඳුන් කිරිම මගින් ඉහත අරමුණට අදාළ ගැටලු පවතින බව සොයා ගන්නා ලද අතර, එනම් එම නැවත පදිංචි කළ පුද්ගලයන් 100%ක්ම පානීය ජල ගැටලුවට මුහුණ දෙන බවත්, මුළු ජනගහනයෙන් 37.83% සේවා වියුක්තභාවයෙන් පෙළෙන බවත්, මෙම පුද්ගලයින් සියලු දෙනාට ඉඩකඩ පිළිබඳ ගැටලු පවතින බවත් නිගමනය කිරිමට හැකි විය. තවද නැවත පදිංචි කළ පුද්ගලයින්ගේ ආදායම හා වියදම අතර ගිනි සංගුණක අගය 0.464 ක් වීමෙන් ආදායමේ අසමානතාවයේ වැඩිවීමක් දක්නට ඇත. ඔවුන්ගේ භූමි පරිභෝජන රටාව තුළ එය අක්කර 0.0625 ක් දක්වා පහත වැටීමකට ලක්වී ඇත. පවතින මෙම අර්බුදයන් මගහරවා ගැනීම සඳහා නිසි ප්‍රමිතියකින් යුතු ජල සම්පාදන ක්‍රමයක් හා ස්ථිර ජීවනෝපාය ක්‍රමයක අවශ්‍යතාවයක් මෙන්ම අහිමි වූ ඉඩම්වලට සාධාරණ වූ ඉඩ පහසුකම් ලබා දීමේ ක්‍රියාවලියක් ඇවැසි බව යෝජනා කළ හැකිය.

**මුඛ්‍ය පද:** *ස්වාභාවික ආපදා, නායයෑම, ගැටලු, ආර්ථික, සමාජීය, ප්‍රජාවිද්‍යාත්මක*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dineshmadusankat@gmail.com

# ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සාඵල්‍යතාව සීමා වීම කෙරෙහි බලපාන සාධක

එස්. ඒ. ඩී. එම්. ඩී. ඒ. විජේසිංහ[1]

**සංක්ෂේපය**

යම් රටක පවතින ජනගහනයේ විශාලත්වය හා ව්‍යුහයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ජනගහන ගතිකතාවේ වැදගත් අංගයක් ලෙස සාඵල්‍යතාවය හැඳින්විය හැකිය. සාඵල්‍යතාවය රටෙහි සමාජ, ආර්ථික, ජනගහන හා පාරිසරික සංවර්ධනය කෙරෙහි බලපෑම් කරනු ලබන සාධකයක් ලෙස ද හැඳින්විය හැකිය. 1955-1960 කාල පරාස තුළ ශ්‍රී ලංකාවේ මුළු සාඵල්‍යතා අනුපාතිකය 5.38 ක් ලෙස ඉහළ මට්ටමක පැවතිය ද එම කාල වකවානුවට අනුව සාර්ක් කලාපීය රටවල පහළම ස්ථානයක් හිමි වූයේත් ශ්‍රී ලංකාවට ය. 1990 දශකය වන විට ශ්‍රී ලංකාවේ මුළු සාඵල්‍යතා අනුපාතිකය 2.5 ක් වැනි අගයක් ගත්ත ද වර්තමානය වන විට මුළු සාඵල්‍යතා අනුපාතිකය 2 වටා කේන්ද්‍ර වෙමින් පවතී. අතීත දත්තයන්ට සාපේක්ෂව වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සාඵල්‍යතාව අඩු වී ඇති බව ගම්‍ය වී ඇති බැවින් එයට පාදක වූ හේතූන් කවරේද යන්න පරීක්‍ෂා කර බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. ඒ සඳහා ජන හා සංඛ්‍යාන ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රකාශනයන් අධ්‍යයනය කළ අතර එමඟින් සාඵල්‍යතාව සීමා වීම කරෙහි බලපාන සමාජ ආර්ථික විචල්‍යයන් ලෙස කාන්තාවන් වඩ වඩාත් අධ්‍යාපනය සහ රැකියා සඳහා යොමු වීමත්, කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ යාමත්, තීරණ ගැනීම සඳහා කාන්තාවන් සතු බලය වර්ධනය වීමත්, ළදරු මරණ අනුපාතිකය සීඝ්‍රයෙන් අඩු වීමත් , දරුවන් සඳහා වන දීර්ග කාලීන වියදම් වැඩි වීමත්, ස්ත්‍රීන් අධ්‍යාපනය සහ රැකියා කටයුතු සඳහා නිවසින් බැහැරව සිටීමත්, දිනෙන් දින වර්ධනය වන නාගරීකරණයත් දැක්විය හැකිය. මෙම අධ්‍යයනයට අනුව සාඵල්‍යතාව අඩුවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය ලෙස අධ්‍යාපනය හැඳින්විය හැකි අතර එහිදී දියුණු වන අධ්‍යාපන මට්ටමේ ප්‍රතිඵලයක් ලෙස සාඵල්‍යතාව පහළ බැසීම දැක්විය හැකිය. උසස් අධ්‍යාපනය ලැබූවන් තම අධ්‍යාපනයට සරිලන රැකියාවක නිරත වීමට අපේක්ෂා කරන අතර එහිදී නිවසින් පිටත හෝ රැකියාවක නිරත වීමට ඔවුන් යොමු වෙයි. එමඟින් ඇතිවන කාර්යබහුල ජීවන තත්ත්වය දරුවන් සංඛ්‍යාව පාලනය කිරීමට හේතු වේ. එසේම අධ්‍යාපනයට යොමු වීම මඟින් විවහ වන වයස් මට්ටම පමාවීමත් උසස් අධ්‍යාපනයකින් යුතු පුද්ගලයින් උපත් පාලනය සඳහා යොමු වීමත් සාඵල්‍යතාව සීමා වීමට හේතු වී ඇත.

***මුඛ්‍ය පද : කාන්තාවන්ගේ සාඵල්‍යතාව, ශ්‍රී ලංකාව, ජනගහනය, අධ්‍යාපනය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dilumiasinsana@yahoo.com

# ECONOMICS

# පූර්ව ළමා අවධියේ පෝෂණ ඌනතාවය කෙරෙහි ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ බලපෑම

ඒ. ඩී. එන්. පී. අස්සැල්ල[1]

**සංක්ෂේපය**

කුසගින්න සහ මන්දපෝෂණය ළමයින්ට අහිතකර වු ප්‍රතිවිපාක ඇති කරනු ලබයි. අඩු බර උපත්, විකලතා, ස්ථුලතාවය, ශාරීරික මානසික සෞඛ්‍ය ගැටලු මෙන්ම අධ්‍යාපන කටයුතු දුර්වල වීම යනාදී ගැටලු ළමා පෝෂණ ඌනතාවය සමග සම්බන්ධ වේ. පෝෂණ ඌනතාවය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටලුවක්ව පවතින අතර ප්‍රාදේශියව සහ ආදායම මට්ටම මත ව්‍යප්තියෙහි සැලකිය යුතු විෂමතා පවතී. 2012 වර්ෂයේදි අවුරුදු 5ට අඩු සියලු ළමුන්ගෙන් 13% ක් වර්ධනය නතර වුවන් ලෙසත් 24% ක් අඩු බරැති ළමුන් ලෙසත් වාර්තා වෙමින් ශ්‍රී ලංකාවටම දැඩි බරක් වු ළමා පෝෂණ ඌනතාවයකට මුහුණ දෙමින් සිටියි. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ ළමා පෝෂණ ඌනතාවයට බලපාන හේතු අධ්‍යයනය කිරීමත් එමගින් ආර්ථිකයට ඇති කරන බලපෑම කෙබඳුද යන්නත් අධ්‍යයනය කිරීම මූලික අරමුණු විය. ප්‍රශ්නාවලි ,සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත ද, 1990 සිට 2015 දක්වා ප්‍රකාශයට පත් කරනු ලැබු වාර්ෂික මහ බැංකු වාර්තා, ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන වාර්තා යන මූලාශ්‍රවල ද්විතියික දත්ත ද උපයෝගී කර ගනිමින් කාලශ්‍රේණි විශ්ලේෂණයන් ඔස්සේ වගු, ප්‍රස්තාර, රූප සටහන් ඇසුරින් දත්ත ඉදිරිපත් කරන ලදී. දෛනික කුටුම්භ කැලරි ඌනතාවය 2000-3500 අතර පවතින බවත්, දරිද්‍රතාවයෙන් යුත් කුටුම්භයන්ගේ ශක්ති පරිභෝජනය ධනවත් කුටුම්භයන්ගේ ශක්ති පරිභෝජනයෙන් 2/3 සමාන වන බවත් අනාවරණය විය. ශ්‍රී ලංකාව තුළ අඩු බර උපත් සහ වැඩීම නතර වීම සදහා දායක වන ප්‍රධානතම සාධකය කුටුම්භ ආදායමවන බවත් දරිද්‍රතාවය සහ ආහාර අනාරක්ෂිතතාවය මත මව්වරුන්ගේ දුර්වල සෞඛ්‍ය තත්වය මේ සදහා හේතු වන බවත් පැහැදිලි විය. ශ්‍රී ලංකාවේ මොණරාගල, කිළිනොච්චි, උතුරු මැද, මධ්‍යම කඳුකරයේ වතු ආශ්‍රිතව අඩු බර උපත් සහ ළමා පෝෂණ ඌනතාවය පැතිරීම අනෙකුත් ප්‍රදේශ වලට වඩා තුන් ගුණයකින් ඉහළ බවත් අනාවරණය විය. ශාරීරික මානසික වර්ධනයට ළමුන්ගේ ඇති හැකියාව අඩු වීමත්, පාසල් පැමිණීම සහ කාර්යසාධනය නතර වීමත් තුළ රජය මගින් අධ්‍යාපනය සදහා වූ ආයෝජනයේ ඵලදායීතාවය හීන වීමත් සමග ඔවුන් ශ්‍රමබලකායට ඇතුලත් වීමේදී නිෂ්පාදන ධාරිතාවට අහිතකර බලපෑම් ඇති කර සෘණාත්මක වර්ධනයක් පමණක් පෙන්නුම් කරන බව පැහැදිලි විය.

***මුඛ්‍ය පද : ශ්‍රී ලංකාවේ ළමා පෝෂණ ඌනතාවය, ආර්ථිකය, අවුරුදු 5ට අඩු ළමයින්, අඩු බර උපත්***

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

nireshaassalla@gmail.com

# ඉතිරිකිරීම් තැන්පතු සඳහා බැංකුවක් තෝරාගැනීමේදී ග්‍රාමීය පාරිභෝගික හැසිරීම

ඩී. එම්. යූ.. සි. දෙලන[1] බී. එම්. එස්. පී. බාලසූරිය

**සංක්ෂේපය.**

රටක ආර්ථික වෘද්ධිය සඳහා ඉතිරිකිරීම් මඟින් සිදුකෙරෙන දායකත්වය ඉතාමත් වැදගත් ය. මෑතකාලීනව ගත් කළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට 23.8% ක් වැනි ඉහළ දායකත්වයක් දේශීය ඉතිරිකිරීම් මගින් ලබා දෙනු ලැබේ. මෙම ඉතිරිකිරීම් සඳහා ග්‍රාමීය අංශය ද සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි. මන්ද යත් සමස්ත ජනගහනයෙන් 80% කට වඩා ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන බැවිනි. ග්‍රාමීය අංශයේ ජනතාව විවිධ ගණුදෙනු සඳහා විවිධ බැංකු තෝරාගනී. එමනිසා එයට තුඩුදෙන හේතු හඳුනාගැනීම වැදගත්ය. මෙම ග්‍රාමීය ජනතාව විසින් සාමාන්‍ය ඉතිරිකිරීම් තැන්පතු සඳහා බැංකුවක් තෝරාගැනීමේදී හැසිරෙන ආකාරය පිළිබද අධ්‍යයනය කිරීම මෙමගින් සිදුකෙරේ. ඉතිරිකිරීම් සදහා බැංකුවක් තෝරාගැනීමේදී  සලකා බලන කරුණු මොනවාද යන්න හදුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 41 පේද්දෝගම ග්‍රාම නිලධාරී වසම ඇසුරෙන් සසම්භාවී නොවන නියදුම් ක්‍රමය යටතේ බැංකු පාරිභෝගිකයන් 50 දෙනෙකුගෙන් යුත් නියැදියක් මේ සඳහා යොදාගන්නා ලදි. එහිදී ප්‍රශ්නාවලියක් මගින් ප්‍රාථමික දත්ත රැස් කිරිම සිදු කළ අතර පෙර සිදු කර ඇති පර්යේෂණ, බැංකු වාර්ථා, පොත්, සගරා, පුවත්පත් සහ අන්තර්ජාලය වැනි ද්විතීයික මූලාශ්‍ර ද භාවිතා කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා SPSS හා Excel වැනි මෘදුකාංග භාවිතා කළ අතර ප්‍රස්තාර හා වගු ආදිය මගින් දත්ත ඉදිරිපත් කිරිම සිදු කරණු ලැබීය.පර්යේෂණයෙන් ලද තොරතුරුවලට අනුව නියැදියෙන් 72% ක ප්‍රතිශතයක් රාජ්‍ය අංශයේ බැංකු වෙත ද 18% ක ප්‍රතිශතයක් පෞද්ගලික අංශයේ බැංකු වෙතද 10% ක ප්‍රතිශතයක් අංශ දෙකේම බැංකු වෙත ද යොමු වී ඇත. ඔවුන් තම ඉතිරිකිරීම් සඳහා බැංකුවක් තෝරාගැනීමේදී සලකා බලන ලද කරුණු අතර එය රාජ්‍ය බැංකුවක්ද පෞද්ගලික බැංකුවක්ද යන්න සලකා බැලීම 36% ක ප්‍රතිශතයක් බව හදුනා ගත හැකි විය. බොහෝ දුරට එයට හේතුව වී ඇත්තේ රාජ්‍ය අංශය කෙරෙහි සාමාජය තුළ දැඩි විශ්වාසයක් පැවතීමයි. පොලී අනුපාතය ද ඉතිරිකිරීම් දිරිමත් වීමට වැදගත් සාධකයක් වුව ද මෙහිදී එය සලකා බලා ඇත්තේ 22% ක් පමණි. මෙහිදී විශේෂයෙන් හඳුනාගත් කරුණක් ලෙස රජය මගින් පොහොර සඳහා මුදල් ලබාදීමේදී රාජ්‍ය බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක් අවශ්‍යවීම මත ඒ සඳහා ද රාජ්‍ය බැංකු වෙත යොමු වී ඇති බවයි. ඉතිරිකිරීම් සඳහා බහුලව යොමුවන වයස් කාණ්ඩය වූයේ අවුරුදු 30-40 ත් අතර පිරිස විය. වර්තමාන බැංකු කටයුතු පිළිබඳ ආකල්ප විමසන විට 42% ප්‍රමාණයක් ඒ පිළිබද තෘප්තිමත් වන අතර 40% ක ප්‍රමාණයක් ඒ පිළිබද සාමාන්‍ය අදහසක් දරයි.

***මුඛ්‍ය පද : ඉතිරිකිරීම්, දළ දේශීය නිෂ්පාදිතය,ග්‍රාමීය අංශය, පොලී අනුපාතය***

[1]ආර්ථික විද්‍යා අධ්‍යනාංශය,  කැලණිය විශ්වවිද්‍යාලය

udenidelana@gmail.com

# පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී බිම් මට්ටමේ දී මතුවන ගැටලු

එස්. ඒ. දිල්හානි[1]

**සංක්ෂේපය**

කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති අතර පොහොර සහනාධාර ප්‍රතිපත්තියට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. 1951 පොහොර සහනාධාර පනත හා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත (සංශෝධන) යටතේ පොහොර සහනාධාර ලබාදීම ආරම්භ වූ අතර, 2005 දී මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාව යටතේ රුපියල් 350 කට කි.ග්‍රෑ. 50 ක පොහොර මල්ලක් ලබාදීම පොහොර සහනාධාර ප්‍රතිපත්තියේ ප්‍රධාන සංධිස්ථානයක් වූ අතර, වත්මන් රජය විසින් කුඹුරු අක්කරයක් සඳහා රුපියල් 5000 ක ආධාර මුදලක් පොහොර සඳහා ලබා දෙන්නට විය. පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී විවිධ ගැටලු මතුවන බව සමාජය තුළින් පෙනෙන්නට විය. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටලු මොනවාද යන්න හඳුනාගැනීම වේ. මේ සඳහා කලුතර දිස්ත්‍රික්කයේ දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අහඹු ලෙස තෝරා ගැනුණි. මේ සඳහා ද්විතීයික දත්ත පුස්තකාල පරිශීලනය මඟින් ද, ප්‍රාථමික දත්ත සිද්ධි අධ්‍යයනය මඟින් දොඩම්ගොඩ, හා කළුතර ප්‍රධාන කෘෂිකර්ම උපදේශක කාර්යාලය ආශ්‍රිත බිම් මට්ටමේ නිලධාරින්ගෙන් ද ගොවි සංවිධානවලින් හා ගොවීන්ගෙන් ලබාගත් අතර ලැබුණු ගුණාත්මක දත්ත විස්තරාත්මකව විශ්ලේෂණය සිදු කෙරේ. අධ්‍යයනයෙන් හෙළි කරගත් අන්දමට පොහොර සහනාධාර ප්‍රතිපත්තිය බිම් මට්ටමේදී ක්‍රියාත්මක වීමේ දී ගැටලු රැසක් මතු වී ඇත. ලබාගත් ගොවීන්ගේ නියැදියෙන් 10% කට බැංකු ගිණුම් නොමැති වීම, පූර්ණ නියැදියෙන් 40% ක් අඳ ගොවීන් වන අතර, ඔවුන්ගෙන් 20% කට ඉඩම් හිමියන් විසින් මුදල් ලබා දී නොතිබිණි. ගොවීන් 15% කට ලැබුනු පොහොර වල ප්‍රමිතිය අඩු බව පැවසීම, ලැබෙන මුදල් වලින් පොහොර කුඹුරට නොදමා වෙනත් කාර්යයන් කිරීම, පොහොර සහනාධාරය ලබාගැණීමේ ක්‍රමවේදයේ සංකීර්ණත්වය, අඳ ගොවීන්ට හා කට්ටිමාරු ගොවින්ට සිදුවන අසාධාරණය, නිසි වේලාවට මුදල් නොලැබීම, බිම් මට්ටමේ නිලධාරින්ගේ අකාර්යක්ෂමතාව හා යාවත්කාලීන වීම ප්‍රමාද වීම හා ක්ෂේත්‍රවලට ළඟාවීමේ අපහසුතා, පොහොර මිල සම්බන්ධ ගැටලු ආදි ගැටලු රැසක් හඳුනාගන්නා ලදී. ඒ අනුව පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී බිම් මට්ටමේ දී ගැටලු මතුවන බවත්, එම ගැටලු ප්‍රතිපත්ති ක්‍රියාවලියට බලපාන බවත් හඳුනාගන්නා ලදී.

***මුඛ්‍ය පද : පොහොර සහනාධාර ප්‍රතිපත්තිය, ආධාර, දත්ත***

[1] සමාජසංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

dsamarasingha163@gmail.com

# The Impact of Microfinance on Women's Entrepreneurship

R. M. Dilki Hansika Rathnayake1


## Abstract

Entrepreneurship is the dynamic process of creating incremental wealth. Women's entrepreneurship are key instrument in the society and their role is very important because, they act dual role both in the family as well as society. Microfinance has an important role empowering rural women in developing countries such as Sri Lanka by accessing credit facilities for their income generating activities to enhance rural women's entrepreneurship. It has also been considered an effective vehicles for women's empowerment. The main objective of the study is to investigate the impact of micro credit facilities on empowerment of women entrepreneurs' in rural area. Also to identify some of the microfinance facilities and special packages available to small scale enterprises run by women in the rural area, families of those women. In this study 37 women's were selected randomly from the Teldeniya area for the sample. In this study both primary and secondary data were used. Primary data was collected by giving questionnaire to the selected sample unit and secondary data was collected from the related reports and empirical studies. Collect data was analyze using the SPSS software version 20 and MS Excel. Though there are many analytical methods, this study use descriptive statistics, Analysis of Variance (ANOVA), and regression analysis to analyze the data. The sample women doing these business more than five years. The study found that majority of microfinance supported women entrepreneurs in rural areas have not good education. And they doing that business for five or more years. Among micro finance products Credit card and payment services are not popular majority use credit, savings, and insurance. The study found that the amount of loan, level of education and rate of interest are the important factors which determine the women entrepreneurship development.


**Key Words:** *Microfinance, Women's Entrepreneurship, Microfinance facilities, Empowering, Sri Lanka.*

---

[1] Department of Economics, University of Kelaniya

hansirathnayakermd@gmail.com

# ජංගම බැංකු ක්‍රමයේ භාවිතය සහ එහි ප්‍රවණතා (කොමර්ෂල් බැංකුව ඇසුරින්)

ඩී. එන්. ප්‍රනාන්දු1


**සංක්ෂේපය**

වර්තමානයේ දී මූල්‍ය බැංකු ශාඛාවල ගනුදෙනු සඳහා සිය කාලය වැය කිරීමට ජනතාවගෙන් බහුතරයක් අකමැතිය. මෙයට විසඳුමක් වශයෙන් බැංකු ගනුදෙනුවල පහසුව සහ කාර්යක්ෂමතාවය උදෙසා මොබයිල් බෑන්කින් සේවාව හඳුන්වා දෙන ලදී. මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ මොබයිල් බෑන්කින් සේවාව භාවිතය සහ එහි ප්‍රවණතා පිළිබඳව අධ්‍යනය කිරීමයි. මෙම අධ්‍යනය කොමර්ෂල් බැංකුව ඇසුරෙන් සිදු කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයෙන් පුද්ගලයින් 70 ක සරල සසම්භාවී නියැදියක් යොදා ගනිමින් ප්‍රශ්ණාවලියක් මඟින් ප්‍රාථමික දත්ත රැස් කිරීමට කටයුතු කරන ලදී. එම ප්‍රශ්ණාවලි 70 අතරින් ප්‍රශ්ණාවලි 64 කට පමණක් ප්‍රතිචාර ලැබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස 91% කි. නියැදිය තුළින් ලබා ගත් දත්ත ප්‍රස්තාර, වගු හා ප්‍රතිශත යන සරල සංඛ්‍යාන ක්‍රමවේදයන් හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම මඟින් විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව ප්‍රතිචාර දැක්වූ 64 අතරින් 51% ක් හා පුරුෂයින් 48% ක් කාන්තාවන් වේ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 56% ක් විවාහක පුද්ගලයින් වේ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් එනම් 64% ක් රැකියා කරන අතර 35% ක් ව්‍යාපාර හිමිකරුවන් වේ. වයස් මට්ටම් සැලකූ විට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 5% ක් වයස අවුරුදු 20ට අඩු පුද්ගලයින් වන අතර 34% ක් අවුරුදු 20-40 අතර පුද්ගලයින් වේ. 45% ක් වයස අවුරුදු 41-50 අතර පුද්ගලයින් වන අතර ශේෂය එනම් 15% ක් වයස අවුරුදු 50 ට වැඩි පුද්ගලයින් වේ. කොමර්ෂල් බැංකුවේ මොබයිල් බෑන්කින් සේවය පිළිබඳ ව දැනුවත් ප්‍රමාණය 70% ක් වන අතර නොදැනුවත් ප්‍රමාණය 30% කි. කොමර්ෂල් ජංගම බැංකු සේවය පිළිබඳ ව පාරිභෝගික තෘප්තිය සැලකූ විට ඒ සඳහා 88% ක් තෘප්තිමත් වන අතර 7% ක් ජංගම බැංකු සේවාව පිළිබඳව දැඩි ව අතෘප්තිමත් ය. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ කොමර්ෂල් ජංගම බැංකු භාවිතය පිළිබඳව බහුතර පිරිසක් දැනුවත්ව සිටින බවයි. එමෙන් ම ප්‍රධාන ප්‍රවණතාවක් ලෙස කාන්තාවන්ට සාපේක්ෂව තරුණ වියේ පසුවන පුරුෂ පාර්ශවය බහුල ලෙස ජංගම බැංකු සේවාව භාවිතා කරන බවයි.


***මූඛ්‍ය පද : ජංගම බැංකුකරණය (Mobile Banking), මූල්‍ය බැංකු, බැංකු ගනුදෙනු***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

fernandonavodani@gmail.com

# ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ සහ ආර්ථික වෘද්ධිය අතර පවතින සම්බන්ධතාවය පරීක්ෂා කිරීම.

ඩී. ඩී. ඩබ්. එන්. ගුණරත්න.[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහල ආර්ථික වර්ධන ප්‍රවනතාවය ශ්‍රී ලංකාව ලෝකයේ මැදි ආදායම් ලාභී ආර්ථිකයක් බවට පත් කරමින් ඉහල ආර්ථික මාවතකට ප්‍රවිෂ්ට වීමට හේතු සාධක වී ඇත. රටක ආර්ථික වෘද්ධිය තීරණය කරන එමෙන්ම ආර්ථික වෘද්ධිය වේගවත් කරන සාර්ව ආර්ථික විචල්‍යන් රැසක් පවතියි. එම විචල්‍යයන් අතර ඉතිරි කිරීම් සහ ආයෝජන ආර්ථිකය සඳහා වැදගත් වේ. මේ නිසා රටක කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය මඟින් ආයෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනය වර්ධනය කිරීමත් ඒ තුළින් වෘද්ධිය වේගවත් කර ගැනීමටත් ප්‍රබල පිටුවහලක් සපයනු ලබයි. මෙම පසුබිම පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීමට කොට වෙළෙඳපොළ මඟින් දායකත්වයක් සපයන්නේද යන්න හඳුනාගත යුතුය. ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ සහ ආර්ථික වෘද්ධිය අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීම සහ කොටස් වෙළෙඳපොළ තුළ සිදු වූ මෑත කාලීන සංවර්ධන ප්‍රවණතා හඳුනා ගැනීම පර්යේෂණ අරමුණු වේ . දත්ත ලබා ගැනීමේ දී ප්‍රාථමික සහ ද්වීතියික දත්ත භාවිතා කරන ලදී. ප්‍රාථමික දත්ත ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මඟින් නිකුත් කරන තොරතුරු සහ තරැව්කාර සමාගම් මඟින්ද ද්විත්යික දත්ත කොටස් වෙළෙඳපොළ නිල වෙබ් අඩවිය සහ ශ්‍රී ලංකා මහා බැංකු වාර්ෂික වාර්තා මඟින් ද ලබා ගන්න ලදී. ඒ අනුව මෙම විශ්ලේෂණය සඳහා යොදා ගනු ලබන ඇගයීම් නිර්ණායක ද්විතියික දත්ත ඇසුරින් පරීක්ෂා කර බැලීමටත් ඒ තුළින් ලංකාවේ කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය මත ආර්ථික වෘද්ධිය සිදු කරන දායකත්වය පිළිබඳව පුරෝකථනය කිරීම තුළින් නිගමනවලට එළැඹීමත් සිදු කරයි. ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ පිලිබඳව අවධානය යොමු කරන විට එය සංවේදී කොටස් වෙළෙඳපොලක් වශයෙන් අර්ථ නිරූපණය කල හැකිය. සංවර්ධිත රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද කොටස් වෙළෙඳපොළ සහ ආර්ථික වෘද්ධිය අතර සෘජු සම්බන්ධතාවයක් පවතියි. ඒ අනුව කොටස් වෙලෙදපොලක ක්‍රියාකාරීත්වය සෘජුවම ආර්ථික ,දේශපාලනික සහ සමාජීය සාධකවල බලපෑම මත තීරණය වන බවත් වර්තමානයේ පවතින ලෝක ආර්ථික බලපම්වලට ලංකාවේ කොටස් වෙළෙඳපොළ ක්ෂණිකව ප්‍රතිචාර දක්වන බව නිගමනය කළ හැකිය .කොටස් වෙළෙඳපොළ පසුගාමී වන අවස්ථාවන්හි දී එයට සමගාමීව කාර්යසාධන නිර්ණායක ද පසුගාමී වන අතර වර්ධනය වන අවස්ථාවන්හි දී එයට සමගාමීව ආර්ථික කාර්යසාධන නිර්ණායක ද වර්ධනය වන නිසා ලංකාවේ කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය හා ආර්ථික වෘද්ධිය අතර අනුලෝම සම්බන්ධයක් පවතින බවට නිගමනය කල හැකිය.

***මුඛ්‍ය පද : කොටස් වෙළෙඳපොළ, ආර්ථික වෘද්ධිය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණි විශ්වවිද්‍යාලය

wathsalaniromi@gmail.com

# පාංශු පෝෂකත්වය මත පදනම් වූ රසායනික පොහොර භාවිතයේ ආර්ථික ප්‍රතිලාභ

එච්. එම්. යූ. පී. හේරත්[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනය කෙරෙහි කෘෂිකර්මාන්තයේ දායකත්වය සාමාන්‍යයෙන් 16.5% ක් පමණ වන අතර මේ සඳහා වී නිෂ්පාදනයෙහි දායකත්වය ද අති විශාල වේ. ඒ අනුව වී නිෂ්පාදන ප්‍රමාණය වැඩි කරවීමේ අරමුණු ඇතිව වැඩිදියුණු කරන ලද වී ප්‍රභේද භාවිතයත් ඉහළ ප්‍රමාණයෙන් රසායනික පොහොර භාවිත කිරීමත් සිදු වී තිබේ. මේ හරහා රසායනික පොහොර භූමියට එකතු වේ. මෙලෙස අතිරික්ත ලෙස භාවිතා කරනු ලබන රසායනික පොහොර නිසා ඇතිවන ගැටළුවට විසඳුම් වශයෙන් පාංශු පෝෂකත්වය අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේදී රටපුරා ගොවිජන සේවා බලප්‍රදේශ මට්ටමින් පස් සාම්පල් පරීක්ෂා කරමින් පරීක්ෂණාත්මකව තහවුරු කරනු ලැබූ පොහොර නිර්දේශයන්හි ද්විතීක දත්ත දැනට දිවයිනේ ක්‍රියාත්මක වන සුවිශාලතම සංවර්ධන ව්‍යාපෘතිය වන මහවැලි කලාපය තුල අනුගත කිරීම හරහා ලැබෙන ආර්ථික ප්‍රතිලාභ විමසා බැලීම මෙම අධ්‍යයන තුළ සිදුවී ඇත. මෙහිදී මහවැලි කලාප 10 තුලින් වැඩි වී වගා වපසරියක් ඇති මහවැලි එච් කලාපය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදාගෙන ඇත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කෘෂිකර්ම අංශය මගින් ලබාගත් 2015-2016 මහ කන්නය සහ 2016 යල කන්නයට අදාළ වී වගා බිම් ප්‍රමාණයන් බිම් වපසරිය ලෙස යොදාගෙන ඇත. මෙහිදී මෙම බිම් ප්‍රමාණය සඳහා පැරණි පොහොර නිර්දේශය හරහා අවශ්‍ය පොහොර ප්‍රමාණය හා මූල්‍ය ප්‍රමාණයත් නව පොහොර නිර්දේශය සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය හා මූල්‍ය ප්‍රමාණයත් සන්සන්දනය සඳහා වගු, ප්‍රස්ථාර භාවිතා කර ඇති අතර දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යානය උපක්‍රම සහ පරිගණක මෘදුකාංග භාවිතා කර ඇත. මෙමඟින් සලකා බලනු ලැබූ කන්න දෙක තුළ පාංශු පෝෂකත්වය මත පදනම් වූ රසායනික පොහොර භාවිතය නිසා කිලෝ 1242988 ක පමණ විශාල පොහොර ප්‍රමාණයක් සහ රුපියල් 62149400 ක පමණ මූල්‍ය ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජයට ඉතුරුම් ලෙස ලැබෙන බව අධ්‍යයනය තුළින් තහවුරු වන අතර එය රටක ජනතාවගේ සෞඛ්‍ය තත්වයට මෙන්ම ආර්ථිකයටද මහඟු පිටුවහලකි. මෙය දැනට රට පුරා ක්‍රියාත්මක නොවන අතර මහවැලි ව්‍යාපාරය තුල පමණක් නොව මෙම නව පොහොර නිර්දේශය රට පුරා ක්‍රියාත්මක කිරීම සහ ජනතාව දැනුවත් කිරීම මෙම අධ්‍යයනය මඟින් යෝජිත වේ.

***මුඛ්‍ය පද : වී වගාව, පාංශු පෝෂකත්වය, රසායනික පොහොර***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

udithapriyankara9525@gmail.com

# දළ ජාතික නිෂ්පාදනය සඳහා මහවැලි වගා භූමි ප්‍රමාණයෙහි දායකත්වය

ඒ. එල්. ඒ. ඩී. පී. කුමාරි[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ  ග්‍රාමීය ජනතාවගෙන් තුනෙන් එකක් පමණ කෘෂිකර්මාන්තය මත යැපෙන අතර එය රටේ දළ ජාතික නිෂ්පාදනයට 16.5% කින් පමණ දායකත්වය සපයනවා මෙන්ම මුළු රැකියා ප්‍රමාණයෙන් 35% ක දායකත්වයක් සපයනු ලැබේ. (මහ බැංකු වාර්තාව, 2016). රටේ ප්‍රධාන යැපුම් මාර්ගයක් වන කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා මහවැලි ගංගා සංවර්ධන ව්‍යාපෘතියද ඉතාමත් විශාල දායකත්වයක් සපයා තිබෙන අතර මෙය අද වන විට පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වී පවතී. මේ අනුව මෙම පර්යේෂණය  මගින් කෘෂිකර්මාන්තය තුළ ප්‍රධාන භෝග වගාවන් වන වී, පළතුරු ,එළවළු, අනෙකුත් බෝග  ආදීවන බෝගයන් මහවැලි කලාපයන් තුළ වගා කරනු ලබන ප්‍රමාණයත් (හෙක්ටයාර), එය දළ ජාතික නිෂ්පාදනය සඳහා කෙබඳු දායකත්වයක් සපයන්නේද යන්නත් අධ්‍යනය කිරීම අරමුණු කරගනිමින් සිදුකරනු ලැබීය. එහිදී මූලිකව මහවැලි ව්‍යාපෘතිය මගින් පාලනය කරනු ලබන විවිධ කලාපයන් තුළ වගා කරනු ලබන බෝග ප්‍රමාණයන් පිළිබඳ 2009 සිට 2016 දක්වා ද්විතීක  තොරතුරු පදනම් කරගත් අතර දත්ත ලබාගැනීම සඳහා මහවැලි දෙපාර්තමේන්තු කෘෂිකාර්මික අංශය  මගින් ලබාගත් කාර්යයාල ලේඛන මෙන්ම මහ බැංකු වාර්තා ආදිය භාවිතා කරනු ලැබීය. දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර මෙන්ම පරිගණක මෘදුකාංගයන්ද  භාවිතා කරනු ලැබීය. මේ අනුව අධ්‍යයනය තුලින් මූලිකව 2009-2016 යන වර්ෂයන් තුළ මහවැලි කලාපයන්හි නිෂ්පාදනයන් රටේ කෘෂිකර්මාන්තය සඳහා සපයන ලද දායකත්වය හා එම නිෂ්පාදනයන් එක් එක් වර්ෂයන් තුළ විචලනය වන ආකාරය පිළිබඳ අධ්‍යනය කිරීමට මෙම දත්ත රැස් කිරීම තුලින් හැකියාව ලැබුණි. එහිදී අවධාරණය වූයේ වාර්ෂිකව සාමාන්‍යයෙන් වී 15% ක්ද, සෝයා 75% ක්ද, බී ළූණු 30% ක්ද, ලෙස ජාතික නිෂ්පාදනය සඳහා දායකත්වය සැපයුවද මහවැලි ඉඩම්හි වගාවන අනෙකුත් බෝගයන් බොහොමයක දායකත්වය ඉතාමත් අඩු මට්ටමක පවතින බවයි. ඒ අනුව බෝග වගාවන් පුළුල් කිරීමට හා දේශීයව වගාකිරීමට විභවයක් ඇති අනෙකුත් කෘෂි නිෂ්පාදන වලින් රට ස්වයංපෝෂිත කිරීමට රාජ්‍ය ආයතන ඉලක්කගත වැඩසටහන් සිදුකල යුතු බව යෝජිත විය.

***මුඛ්‍ය පද : කෘෂිකර්මාන්තය, නිෂ්පාදනය, බෝග***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය,

kumaridinusha199@gmail.com

# ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය(ATM) භාවිතය සහ එහි ප්‍රවණතා

ජී. එස්. ජී. නිසංකා[1]

**සංක්ෂේපය,**

සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ **ATM** භාවිතය සහ එහි ප්‍රවණතාවය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. එය කොමර්ෂල් බැංකුව ඇසුරින් සිදු කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ටාව ප්‍රදේශයේ මේ සදහා සරල සසම්භාවී නියදිම් ක්‍රමය යටතේ තෝරා ගත් පුද්ගලයින් 50ක් ඇසුරින් ප්‍රශ්ණාවලියක් මගින් ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. මේ අනුව වයස අවුරුදු 18-35 අතර පසුවන්නන් ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය භාවිතා කරනු ලබයි. එය සමස්තයෙන් 82% කි. මෙහි පුරුෂයන්ගෙන් 56%කි ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය භාවිතා කරන අතර, කාන්තාවන්ගෙන් 44% ක් ස්වයක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය භාවිතා කරනු ලබයි. මෙහි වයස 36-45 ත් අතර වයසේ පසුවන්නන්ගේ සමස්ත පිරිසෙන් 61% ක් ස්වයංක්‍රීය බැංකු පහසුකම් භාවිතා කරන අතර පුරුෂයන් 73% ක් ද, ස්ත්‍රීන් 27% ක් ද **ATM** බැංකු ක්‍රමය භාවිතා කරනු ලබයි. වයස අවුරුදු 46-60 ත් අතර වයසේ පසුවන්නන්ගේ ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය භාවිතා කරනු ලබන්නේ 44% ක් වැනි පිරිසකි. එයින් 78% ක් පිරිමි පක්ෂය වන අතර 22% ක් කාන්තා පක්ෂය වේ. වයස අවුරුදු 60 ට වැඩි වයසේ පසුවන්නන්ගේ ස්වයංක්‍රීය බැංකු භාවිතය 21% ක් දක්වා ඉතා අඩු මට්ටමක පැවති අතර, එයින් 68% ක් පිරිමි පක්ෂය වු අතර 32% ක් කාන්තා පිරිස වේ. ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමයේ දැනුවත් ප්‍රමාණය සැලකූවිට 90% ක් වූ අතර එය නොදැනුවත් ප්‍රමාණය 10% ක් තරම් සුළු පිරිසක් විය. මෙම බැංකු ක්‍රමය සැලකූ විට, 85% ක් ඉන් තෘප්තිමත් වන අතර 5% ක් එය විවේචනය කරයි. 10% ක් ඒ පිළිබඳ විශේෂ මතයක් නොදරයි. මේ අනුව සමස්ත සමීක්ෂණයෙන් පෙනි යන්නේ කොමර්ෂල් ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය භාවිතය පිළිබඳ බහුතර පිරිසක් දැනුවත් වී සිටින බවයි. එමෙන්ම කාන්තාවන්ට සාපේක්ෂව පිරිමි පාර්ශවය බහුල ලෙස ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය භාවිතා කරන බවයි.

**මුඛ්‍ය පද :** *ස්වයංක්‍රීය බැංකු පහසුකම් ක්‍රමය, මූල්‍ය බැංකු, බැංකු ගණුදෙනු.*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

Nisankastat123@gmail.com

# ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියට කාර්මික අපනයන දක්වන දායකත්වය

බී. පී. එස්. පී. කේ. පතිරත්න[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අපනයන, කාර්මික අපනයන, ඛනිජමය අපනයන හා වර්ග නොකළ අපනයන ලෙස විභේදනය වී ඇත. මේවා අතරින් ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියට වැඩි දායකත්වයක් ලබා දෙන්නේ මුළු අපනයන ආදායමෙන් හතරෙන් තුනක් පමණ වූ කාර්මික අපනයන මගිනි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියට කාර්මික අපනයන දක්වන දායකත්වය අධ්‍යයනය කිරීමයි. මෙහිදී මහ බැංකු වාර්තාවන් ද්විතීයික දත්ත ලෙස භාවිතා කර ඇති අතර ඒවා වගු හා ප්‍රස්තාර මගින් ඉදිරිපත් කර ප්‍රතිශතක ආශ්‍රයෙන් විශ්ලේෂණය කර ඇත. 2015 වසරේ මුළු අපනයන සඳහා කාර්මික අපනයන 76%ක දායකත්වයක් ලබා දී ඇති අතර 2016 දී එය 77%ක් පමණ වූව ද 2015 ට සාපෙක්ෂව 2016 දී  කාර්මික අපනයන ආදායම 1% කින් පහළ ගොස් ඇත. මේ සඳහා ප්‍රවාහන උපකරණ හා ඛනිජතෙල් නිෂ්පාදිත ආදායම පහළ යාම හේතු විය. කොළඹ වරාය නගරය සංවර්ධනයට 2013 සහ 2014 වර්ෂවල ආනයනය කරන ලද කැණීම් යන්ත්‍ර 2015 දී අපනයනය කිරීමෙන් එම වර්ෂයේ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඉහළ යාම 2016 එම ආදායම 46% කින් පහළ යාමට හේතු විය. එසේම ඉන්දියාව සහ සිංගප්පූරුව වැනි ප්‍රධාන කලාපීය තරඟකරුවන් වෙතින් එල්ලවන තරඟකාරීත්වය ඛනිජතෙල් නිෂ්පාදිත ආදායම 23% පහළ යාමට හේතු විය. මීට අමතරව මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයනවල මෙන්ම රබර් නිෂ්පාදිත අපනයනවල පැවති දුර්වල ක්‍රියාකාරීත්වය කාර්මික අපනයන ආදායම පහළ යාමට හේතු වී ඇත. එසේ වුවද මුළු කාර්මික අපනයන වලින් 47% ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම 1.3% කින් ඉහළ ගොස් ඇත. ඒ අනුව සමස්තයක් ලෙස ගත් විට ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියට කාර්මික අපනයන දක්වන දායකත්වය ඉතා ඉහළ එකකි.

***මුඛ්‍ය පද : අපනයන සංයුතිය, කාර්මික අපනයන, කාර්මික අපනයන ආදායම, ඛනිජතෙල් නිෂ්පාදිත ආදායම, ප්‍රවාහන උපකරණ අපනයන ආදායම***

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
sajanipathirathna.9494@gmail.com

# ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි විදේශ සේවානියුක්තිකයින්ගේ ප්‍රේෂණවල දායකත්වය (2006-2016)

ආර්. පී. ඩී. එන්. වයි. ප්‍රේමරත්න[1]

**සංක්ෂේපය**

ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රධාන මූල්‍ය ප්‍රවාහයක් ලෙස විදේශ ප්‍රේෂණ හැඳින්විය හැකිය. 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමත් සමඟ ආර්ථිකයේ ප්‍රධාන විනිමය ඉපැයුම් මාර්ගය බවට විදේශ ප්‍රේෂණ පත්ව ඇත. මෙම අධ්‍යනයෙන් සලකා බලනුයේ ශ්‍රී ලංකාවේ විදේශ සේවානියුක්තියේ ආරම්භය, ස්වභාවය, විකාශනය සහ විදේශ ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනයට කෙලෙස බලපාන්නේ දැයි විමසා බැලීමයි. මෙම අධ්‍යනය සඳහා ද්විතීක මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබූ අතර එහිදී පොත්පත්, සඟරා, ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සංඛ්‍යානමය වාර්තා භාවිතා කර ඇත. වර්තමානය වන විට (2016) විදේශ ප්‍රේෂණ සඳහා පුරුෂ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර විදේශ සේවානියුක්තිය සඳහා ස්ත්‍රී දායකත්වය 42%ක් වන අතර පුරුෂ දායකත්වය 58%ක් වේ. ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ආරම්භයේ සිටම සාර්ව මෙන්ම සූක්ෂම මට්ටමින් ධනාත්මකව දායකවී ඇති බව හඳුනාගත හැකි විය.

***මුඛ්‍ය පදඃ  විදේශීය ප්‍රේෂණ, විදේශ සේවා නියුක්තිය, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමෙහිලා සමූපකාර ග්‍රාමීය බැංකු මඟින් ණය අවශ්‍යතා සපුරාලීම සම්බන්ධ දායකත්වය (කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ආර්. එච්. එම්. අයි. එම්. රාජකරුණා[1]

**සංක්ෂේපය**

ග්‍රාමීය සංවර්ධනයට අවශ්‍ය විවිධ යටිතල පහසුකම් අතර බැංකු ක්‍රමය ග්‍රාමීය ආර්ථිකය තුළ ඉතා වැදගත් සාධකයකි. ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය බැංකුකරණය සහ ණය පහසුකම් අත්‍යවශ්‍ය සාධකයක් බව සඳහන් කළ යුතුය. වර්තමානයේ ග්‍රාමීය මූල්‍ය ආයතන ග්‍රාමීය ජනතාව උදෙසා ණය පහසුකම් සැපයීමේ වැදගත් කාර්යයක් ඉටු කරයි. 1964 දී සමූපකාර ග්‍රාමීය බැංකු සථාපිත කිරීමත් සමඟ ග්‍රාමීය ප්‍රදේශවල බැංකු ක්‍රියාකාරකම් සීඝ්‍රයෙන් වර්ධනය විය. එහෙයින් මෙම අධ්‍යයනය බෙහෙවින්ම සමූපකාර ග්‍රාමීය බැංකු මත පදනම් වේ. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ණය අවශ්‍යතා සපුරාලීමෙහිලා සමූපකාර ග්‍රාමීය බැංකුව මඟින් ඉටුවන කාර්යයභාරය සාර්ථක ද යන්න අධ්‍යනය කිරීමයි. මෙහිදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය බැංකු ගණුදෙනුකරුවන් අතරින් අහඹු ලෙස තෝරාගත් පවුල් 60 කින් ගණුදෙනුකරුවන් 100 ක් තෝරා ගන්නා ලදි. මේ සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත කරගෙන ඇත. දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි යොදාගන්නා ලදි. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතා කළ අතර ඒ සඳහා ˆෂී ල ෑංක මෘදුකාංග යොදාගන්නා ලදි. එයින් එළඹි ප්‍රතිඵල වූයේ කුඩා ප්‍රමාණ ණය ලබා දීමේදී ග්‍රාමීය බැංකුව සාර්ථක තත්වයක පවතින බවත්, ණය පියවීමේදී ගෙවිය යුතු මාසික පොළී ප්‍රතිශතය පිළිබඳව ග්‍රාමීය ජනතාව තෘප්තිමත් නොවන බවත් ය. දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු, ප්‍රස්තාර, ප්‍රතිශත ආදිය භාවිතා කරන ලදි. මෙයින් සමූපකාර ග්‍රාමීය බැංකු වල ක්‍රියාකාරිත්වයේ පවතින හඳුනාගත් දුර්වලතා ලෙස ග්‍රාමීය බැංකු ඉතුරුම් රැස් කිරීමෙහිලා සාර්ථක වුවද ණය සැපයීමේ කාර්යයේදී සමූපකාර සමිතියේ නිළධාරීන්ගේ සහ වෙනත් බලවතුන්ගේ බලපෑම මත සිඳු වන බවට තොරතුරු හෙළි වීමත් සාමාන්‍ය ගැමි ජනයාගේ අවශ්‍යතාවයට ගැලපෙන ණය මුදලක් නොලැබීමත් පෙන්වා දිය හැකිය. මෙම අධ්‍යනයෙන් එළැඹි ප්‍රධාන නිගමන වන්නේ සමූපකාර ග්‍රාමීය බැංකුව ජනතාව අතර ජනප්‍රිය බැංකුවක් බවත්, එයින් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයන බවත්, කුඩා ප්‍රමාණයේ ණය ලබා ගන්නන්ට හිතකර ආයතනයක් බවත් ආදියයි. සමූපකාර ග්‍රාමීය බැංකුව හරහා ග්‍රාමීය ණයගැතිභාවය තුරන් කර ග්‍රාමීය ජනතාවලේ ජීවන තත්වය නඟා සිටුවීම තුළින් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය සඳහා ග්‍රාමීය බැංකු නිළධාරීන්ට වැඩිදුර පුහුණුවක් ලබා දීම, කුඩා ප්‍රමාණයේ ණය නිදහස් කිරීමට බැංකු ශාඛා කළමණාකරුට බලය පවරා දීම, මහා පරිමාණ ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම ආදී යෝජනා ඉදිරිපත් කළ හැකිය.

මුඛ්‍ය පද : සමූපකාර ග්‍රාමීය බැංකුව, ග්‍රාමීය ණය, ග්‍රාමීය ආර්ථිකය, ග්‍රාමීය ජනතාව

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# අනාර්ථික සාධක මාරපන දකුණ ග්‍රාමයේ ආර්ථික පසුගාමිත්වයට හේතු වූ ආකාරය

බී. එම්. එම්. රසාංජලී[1]

**සංක්ෂේපය**

පවුල් 378 ක් පමණ ජීවත් වන 1550 ක පමණ ජනගහනයකින් යුත් මාරපන දකුණ ග්‍රාමයෙහි අනාර්ථික සාධක එහි ආර්ථික පසුගාමිත්වයට බලපාන ආකාරය මෙමඟින් අධ්‍යයනයට භාජනය කොට ඇත. මූලික වශයෙන් මාරපන දකුණ ග්‍රාමයේ ආර්ථික පසුගාමීත්වයට බලපාන අනාර්ථික සාධක හඳුනාගැනීම හා එම අනාර්ථික සාධක එහි ආර්ථික පසුගාමීත්වයට බලපාන ආකාරය අධ්‍යයනය කිරීම අරමුණු කොට ගෙන සිදුකරනු ලැබූ මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටළුව ලෙස අනාර්ථික සාධක හමුවේ ජනතාව ආර්ථික පසුගාමීත්වයට මුහුණ දිම පෙන්වාදිය හැකිය. අධ්‍යයනය සිදුකිරීමේ දී නියැදිය ලෙස මාරපන දකුණ ග්‍රාමයේ 30 දෙනෙකු සසම්භාවී ලෙස තෝරා ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබාගත් අතර එයට අමතරව පුද්ගලයින් සමග සාකච්ඡා කිරීමෙන්ද තෙරතුරු ලබාගන්නා ලදි. ද්විතික දත්ත සඳහා ග්‍රාමසේවක වාර්තා, පොලිස් වාර්තා මෙන්ම සබරගමුව පිළිබඳ ප්‍රකාශිත ග්‍රන්ථ, පුවත්පත් ලිපි ආදිය උපයෝගි කරගන්නා ලදි. එම දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්ථාර සහිතව විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම උපයෝගි කරගනු ලැබීය. එම විශ්ලේෂණයන්ට අනුව ආර්ථික පසුගාමිත්වයට බොහෝ සෙයින් බලපාන සාධක ලෙස හඳුනාගත හැක්කේ ස්වභාවික විපත් හා පුද්ගල ආකල්පයන්ය. අවසාන වශයෙන් ගම තුළ ආර්ථික මට්ටම ඉහල මට්ටමක තබාගැනිමට ජනයා උත්සාහ ගත්තද අනාර්ථික සාධක හේතුවෙන් යම්තාක් දුරකට ආර්ථික පසුගාමිත්වයක් ඇති වි තිබෙන බව නිගමනය කළ හැකිය. ඒ සඳහා මූලික වශයෙන් ආපදා කළමණාකරන ක්‍රියාවලිය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම හා ජනතාවගේ ආකල්ප වෙනස් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ආර්ථික පසුගාමිත්වය අවම කර ගැනිමට හැකියාව පවතින බව යෝජනා කළ හැකිය.

***මුඛ්‍ය පද  මාරපන දකුණ, අනාර්ථික සාධක, ආර්ථික පසුගාමීත්වය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීම කෙරෙහි ග්‍රාමීය කාන්තාවනගේ ආර්ථික දායකත්වය
## (කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

එම්. පී. ඩී. සදමාලි[1]

**සංක්ෂේපය**

වර්තමානයේ ලෝක ආර්ථිකය තුළ කාන්තාවකගේ දායකත්වය ඉමහත්ය. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමඟ විවිධ අංශයන්හි සංවර්ධනය හේතුවෙන් ආර්ථික කටයුතු වලද විශාල ප්‍රසාරණයක් සිදුවිය. එමෙන්ම ගෝලීයකරණයත් සමඟ විශ්ව ගම්මානයක් බවට පත්වූ ලෝකයේ සෑම රටකම පාහේ ආර්ථික කටයුතු කෙරෙහි කාන්තාවන්ගේ නැඹුරුවීමක් සිදුවිය. මේ හේතුවෙන් ආර්ථික කටයුතු සඳහා ස්ත්‍රියගේ සාපේක්ෂ දායකත්වය ඉතා වැදගත් සාධකයක් බවට පත්විය. දරිද්‍රතාවය හේතුකොටගෙන ගැටලුවලට මුණ දෙමින් සිටින ශ්‍රී ලාංකික සමාජයේ ද මෙම තත්වය පැහැදිලිව දක්නට ලැබිණි. මේ හේතුවෙන් ශ්‍රී ලාංකික කාන්තාවන් ද රැකියා සඳහා යොමු වූ බව පැහැදිලිය. ඒ අනුව ග්‍රාමීය දරිද්‍රතාව අවම කිරීම සඳහා කාන්තාවගේ දායකත්වය ප්‍රශස්ථ අයුරින් දායක කරගෙන තිබේද යන ගැටලුව පාදක කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීම සඳහා ග්‍රාමීය කාන්තාවනගේ ආර්ථික දායකත්වය කුමක් ද යන්න විමසා බැලීමයි. පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත ද භාවිතා කළ අතර සසම්භාවී නියදි ක්‍රමය අනුව කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කරමැටිය ග්‍රාම නිලධාරී වසමේ පවුල් 300ක් ආශ්‍රයෙන් දත්ත රැස්කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කළ අතර අධ්‍යයනය මගින් අනාවරණය වූයේ ග්‍රාමීය ජනතාවගෙන් 30% ප්‍රමාණයක් දරිද්‍රතාවයෙන් පෙළෙන බවයි. සමස්ත කුටුම්බ වල විෂම ව්‍යාප්තියක් දක්නට ලැබුණු අතර අඩු ආදායම් ලාභීන්ගේ ප්‍රතිශතය ඉහළය. එමෙන්ම ඉතුරුම් මට්ටම අඩුය. මෙම තත්වය මත සෑම පවුලකම පාහේ කාන්තාව ආර්ථික කටයුතුවලට දායක වී තිබුණු අතර කාන්තාවන්ගෙන් 37% ක් පමණ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ස්ථිර රැකියා වල නිරත වී සිටියි. කාන්තාවන්ගෙන් 23% පමණ ස්වයං රැකියාවල නිරතවන්නන් බව හඳුනාගත හැකිවිය. එමෙන් ම තරුණ කාන්තාවන්ගෙන් පිරිසක් ඇඟලුම් කර්මාන්ත ශාලාවල සේවය කරන බව අනාවරණය වූ අතර ඇතැම් පිරිස් විවිධ ක්‍රම මගින් පවුලක වියදම් පිරිමසාගනු ලබයි. මෙමගින් පැහැදිලි වූයේ කාන්තාවන්ගෙන් 67% ක් පමණ ප්‍රමාණයක් රැකියාවල නිරතවන බවයි. මේ අනුව කාන්තාවන් දරිද්‍රතාවය පිටුදැකීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබදෙන බව නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද : දරිද්‍රතාවය, කාන්තාව, ග්‍රාමීය ආර්ථිකය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

dinushasadamali125@gmail.com

# ග්‍රාමීය සේවා වියුක්තිය අඩුකරලීම කෙරෙහි ඇඟලුම් කර්මාන්තයේ දුෂ්කරතාවය.(ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් )

සී. ටී. සමරසිංහ[1]

**සංක්ෂේපය**

ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් කිසියම් ආර්ථික කටයුත්තකට ශ්‍රමය සැපයීමට කැමැති, එහෙත් ඒ සඳහා අවස්ථාවක් නොලැබ ඇති පුද්ගලයින් සේවා වියුක්තකියන් ලෙස හඳුනා ගනී. මෙම අධ්‍යනයේ ගැටලුව ඇඟලුම් කර්මාන්තය හා ග්‍රාමීය සේවා වියුක්තිය අතර පවතින සම්බන්ධය සෙවීමයි. ඇඟලුම් අපනයන ශ්‍රී ලංකාවේ අපනයන සංයුතයි තුළ ඉහළ ප්‍රතිශතයක් හිමි කර ගෙන ඇති අතර විදේශීය විනිමය ඉපැයීමේ මූලාශ්‍රයක් වීම තුළ ග්‍රාමීය සේවා වියුක්තිය අඩුකරලීමට එම සාධකය කෙතරම් දුරට බලපානු ලබයි ද යන්න මෙම අධ්‍යයනයේ අරමුණයි. අධ්‍යයනය සඳහා ගාල්ල දිස්ත්‍රික්කය සංගහනය ලෙස ගත් අතර එයින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියැදිය ලෙස තෝරා ගත් අතර එයින් පවුල් 50ක නියැදියක් තෝරා ගෙන ප්‍රශ්නාවලී ක්‍රමය මඟින් ඔවුන්ගෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. මෙහි දී වාර්ගිකත්වයල ස්ත්‍රී/පුරුෂ භාවය යන කරුණු ද සලකා බලමින් ස්ථරායන නියැදීම යොදා ගන්නා ලදී. රැස් කරගත් දත්ත විශ්ලේෂණයට ප්‍රතිශත, වගු, ප්‍රස්ථාර වැනි සරල සංඛ්‍යානමය ක්‍රමවේද භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදී. විශ්ලේෂණයට අනුව බද්දේගම ග්‍රාමය තුළ ඇඟලුම් කර්මාන්තයේ 78% ක් සේවා නියුක්තව සිටින බව ද එයින් 62% ස්ත්‍රී වන බව ද 16% පුරුෂයන් වන බව ද අනාවරණය විය. තවද සේවා නියුක්තිකයන් අතරින් 68% සිංහලයන් වූ අතර 10% ක් මුස්ලිම් වශයෙන් වන බව අනාවරණය විය. ග්‍රාමීය දරිද්‍රතාවය පහත හෙළීමට, ග්‍රාමීය ආදායම් මට්ටම නැංවීමට හා ග්‍රාමීය කාර්මික අපනයන මට්ටම ඉහළ නැංවීමට ඇඟලුම් කර්මාන්තය දුෂ්කර වී ඇති බව හඳුනාගත හැකිවිය. මෙහිදී කර්මාන්තය සඳහා පවතින බාධාවන්, මුහුණු දෙන අභියෝග හා පවතින දුර්වලතා හඳුනා ගැනීම සහ කර්මාන්තයේ උන්නතිය සඳහා ගත යුතු පියවර යෝජනා කිරීමට මෙයින් උත්සාහ කරන ලදී. විශ්ලේෂණයට අනුව ග්‍රාමීය සේවා වියුක්තිය හා ඇඟලුම් කර්මාන්තය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බව හඳුනා ගත හැකවිය. ග්‍රාමීය සේවා වියුක්තිය අඩුකරලීම කෙරෙහි ප්‍රධාන සාධකයක් ලෙස ඇඟලුම් කර්මාන්තය දැක්විය හැක. ඊට අමතරව අනෙකුත් සාධක සැලකීමේදී ද ග්‍රාමීය සේවා වියුක්තිය අඩුකරලීම කෙරෙහි ඍජු හෝ වක්‍ර ලෙස ඇඟලුම් කර්මාන්තය බලපාන බව අවසාන නිගමනය වේ.

***මුඛ්‍ය පද : ග්‍රාමීය සේවා වියුක්තිය, ඇඟලුම් කර්මාන්තයල සේවා වියුක්තිය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

chathurasamarasinghe.94@gmail.com

# කෘෂිකාර්මික සංවර්ධනය හා තොරතුරු සම්පාදනය (අනුරාධපුර දිස්ත්‍රික්කයට විශේෂිතව)

ඩී. සානිකා ප්‍රියංජලී දිසානායක[1]

**සංක්ෂේපය**

ලාංකේය කෘෂි කර්මාන්තය, දේශපාලනික හා ආර්ථික ඉතිහාසය සමඟ ඓන්ද්‍රියව බැදී පවතියි. ක්‍රි. පූ 05 වැනි සියවසේ ලංකාවට සංක්‍රමණය වූ ආර්යයන් විසින් ජනාවාස පිහිට වූ ප්‍රදේශ සලකන විට මැනවින් පැහැදිලි වන්නේ ඔවුන් කෘෂිකර්මයට යෝග්‍ය ප්‍රදේශ සොයා ගිය බවයි. ජලාශ්‍රිත ව ගොඩනැගුණ ශිෂ්ටාචාරයේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. වර්තමානය වන විට මෙරට සංවර්ධන ක්‍රියාදාමයෙහි ප්‍රධාන ස්ථානයක් කෘෂිකර්මාන්තයට හිමි වේ. රටේ සේවා නියුක්ති ජනගහණයෙන් 27% කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගෙන ඇත. කාර්යක්ෂම මෙන් ම ඵලදායි කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා ගොවියාට විවිධ තොරතුරු අවශ්‍ය වේ. ඒ අනුව ගොවි ජනතාව ස්වකීය තොරතුරු අව්‍යශතා සපුරාගන්නේ කෙසේද? එම තොරතුරු සම්පාදන ක්‍රමවේද මඟින් ගොවියාගේ අවශ්‍යතා ඉටුවේද? යන ගැටලු පාදක කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ගොවි ජනතාව ස්වකීය තොරතුරු අවශ්‍යතා සපුරාගන්නා ආකාරය සොයා බැලීමයි. මෙහි දී සමීක්ෂණ ක්‍රමය භාවිතයට ගැනුණි. ඒ අනුව දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමය භාවිත කෙරිණි. උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ගොවියන් 100 දෙනෙකුගෙන් යුතු නියැදියකින් දත්ත ලබා ගන්නා ලදි. ඉහත ක්‍රමවේද මඟින් ලබාගත් දත්ත SPSS පරිගණක මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණයට භාජනය කෙරිණි. දත්ත විශ්ලේෂණයට අනුව පෙනීයන්නේ ගොවිතැන හා බැඳුන තොරතුරු සම්පාදන විධික්‍රම සම්ප්‍රදායික මට්ටමක පවතින බවත් එමඟින් කෘෂි සංවර්ධනය සඳහා ප්‍රමාණවත් තොරතුරු සම්පාදනයක් සිදුනොකරන බවත් ය. ඒ අනුව කෘෂිකර්මාන්තයේ ඵලදායි බව බිඳවැටීම සඳහා විධිමත් තොරතුරු සම්පාදන විධික්‍රම අනුගමනය නොකිරීම හේතු වී ඇත. මෙම තත්ත්වය මඟහරවා ගැනීමට තොරතුරු සම්පාදන විධික්‍රම නවීකරණය විය යුතු ය. එහිදී ගොවි ජනතාවගේ කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා හඳුනාගනිමින්, ඊට උචිත ආකාරයේ සන්නිවේදන විධික්‍රම යොදාගැනීම සහ ඒවාට ගොවිජනතාව අනුගත කිරීමට සුදුසු පියවර ගැනීම යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය.

***මුඛ්‍ය පද : කෘෂිකර්මාන්තය, ගොවිජනතාව, තොරතුරු අවශ්‍යතා, සන්නිවේදන විධික්‍රම,***

---

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

sanikapriyanjali@gmail.com

# ශ්‍රව්‍යාබාධිතයන්ගේ රැකියා නියුක්තිය

ඩබ්. එච්. ශානිකා ප්‍රියදර්ශනී[1]

**සංක්ෂේපය**

සාමාන්‍ය පුද්ගලයින්ට මෙන්ම ආබාධිත පුද්ගලයින්ටද විෂමතාවයකින් තොරව අයිතිවාසිකම් හිමි විය යුතු ය. ඒ අනුව ආබාධිත පුද්ගලයන් ගත් විට කථනාබාධිත, ශ්‍රව්‍යාබාධිත, දෘශ්‍යාබාධිත, විවිධ තත්වයන් පෙන්වා දිය හැකි ය. මෙම පර්යේෂණය තුලින් අවධානය යොමු කරනුයේ ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් වෙතට ය. ඒ අනුව ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් රැකියාවලට සහභාගී වීමේ ප්‍රවණතාව සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වී ඇති අතර රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වී සිටින ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් පිළිබඳ මෙහිදී සොයා බලයි. ගම්පහ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් 50ක නියැදියක් සසම්භාවී නොවන අයරින් තෝරා ගෙන ප්‍රශ්නාවලී ක්‍රමය ඔස්සේ තොරතුරු රැස් කරමින් ද, ද්විතීක දත්ත මූලාශ්‍රවලින් ද තොරතුරු රැස් කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. මේ අනුව මෙම තොරතුරුවලට අනුව හෙළි වූ ප්‍රධානම කරුණ වන්නේ සාමාන්‍ය පුද්ගලයිනගේ අධ්‍යාපනයට වඩා ඉතා අවම මට්ටමක අධ්‍යාපනයක් ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින්ට හිමි වී ඇති බවයි. ඒ අනුව 55% ක් පමණ සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇත.උසස් පෙළ 1% ක පමණ ප්‍රමාණයක් හදාරා ඇති අතර අනෙකුත් ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් ඊටත් වඩා අඩු අධ්‍යාපන තත්වයක් හිමි වූවන් ය. මේ නිසාම 60% ක්ම ඇඟලුම් කර්මාන්තයේ නිරත වන අතර 34% ක් කුලී වැඩ හෝ ස්වයං රැකියාවලද 6% ක් පමණ රජයේ රැකියාවලද නිරත වන බව දක්නට ලැබුණි. මේ අනුව එළැඹිය හැකි නිගමනය වූයේ ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින්ට පවත්නා අපහසුතා නිසා අධ්‍යයන කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම නිසා ඔවුන්ට රජයේ රැකියා බෝහොමයක් අහිමි වී යන අතර රැකියාවල නිරත වන පුද්ගලයින් තුළ ඉහළ කාර්යක්ෂමතාවක් දැකිය හැකි බවයි.

***මුඛ්‍ය පදඃ ශ්‍රව්‍යාබාධිත, අධ්‍යාපනය, රැකියා***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

shanikw92@gmail.com

# උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය.

යු. කේ. ඩි ශාන්ති[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවට දිගුකාලීන තිරසාර සංවර්ධනයක් කරා ළඟාවීමට නම් උගත් කමින් පිරිපුන් ශ්‍රම බලකායක් සතුවීම අවශ්‍යය වන අතරම මෙම කර්තව්‍යයේදී විශ්වවිද්‍යාල පද්ධතිය ප්‍රමුඛ වේ. වර්තමානයේ මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය තුලින් වාර්ෂිකව උපාධිය ලබා ඉන් පිටවන උපාධිධාරීන්ගේ ප්‍රමාණය 17000 කට ආසන්න වන අතර මේ වන විට රැකියා විරහිතව සිටින උපාධිධාරීන්ගේ සංඛ්‍යාව අධික වෙමින් පවතී. මෙයට විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳපොළෙහි සේවායෝජකයන්ගේ ඉල්ලුමට සරිලන සැපයුමක් උපාධිධාරීන්ගෙන් නොසැපයීම හේතු සාධකයකි. එහිදී උපාධිධාරීන් සඳහා රැකියා වෙළඳපොළෙහි ඉල්ලුම සහ සැපයුම අතර අසමතුලිතතාවයක් පැවතීම ප්‍රධාන ගැටලුවකි. මේ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ රැකියා වෙළඳපොළෙහි උපාධිධාරීන් සඳහා පවතින ඉල්ලුම හා සැපයුම පරික්ෂා කිරීමයි. මෙහිදී බස්නාහිර පළාතේ උපාධිධාරීන් 100 කින් යුක්ත සසම්භාවී නියැදියක් ඇසුරෙන් ප්‍රශ්නාවලී ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත රැස්කර ගනු ලැබූ අතර අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ ජනල්ඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ද්විතියික දත්ත රැස්කර ගන්නා ලදී. එක්රැස් කරගත් දත්ත හා තොරතුරු විස්තරාත්මක සංඛ්‍යානමය ශිල්පීය ක්‍රම හා ආර්ථික න්‍යායන් භාවිතයෙන් විශ්ලේශනයට භාජනය කළ අතර දත්ත ඉදිරිපත් කිරීමට වගු හා ප්‍රස්තාර භාවිතා කරන ලදී. මෙම අධ්‍යයනයේ දී අනාවරණය වූයේ, අධ්‍යයනයට භාජනය කළ උපාධිධාරීන් අතුරින් 26.8% ක් රැකියා විරහිත බවයි. ශ්‍රම බල ඉල්ලුමට සරිලන උපාධිධාරීන් බිහි නොවීමට බලපාන ලද ප්‍රධානතම හේතු සාධකයක් ලෙස තහවුරු වූයේ ශ්‍රම බල ඉල්ලුමට ගැලපෙන කුසලතා උපාධිධාරීන් සතුව නොතිබීමයි. එනම් සේවායෝජකයන්ගේ අපේක්ෂාවන්ට සරල නිපුණත්වයන් ගෙන් සහ පෞද්ගලික ගුණාංගයන් ගෙන් පරිපූර්ණ වූ උපාධිධාරීන් බිහිනොවීමයි. විශේෂයෙන්ම මෙහිදී උපාධිධාරීන් සතුව න්‍යායාත්මක දැනුම තිබුණද, එම දැනුම ප්‍රායෝගිකව ක්ෂේත්‍රය තුළ යොදා ගැනීමට අපහසුවක් පවතින බවද අනාවරණය විය. මේ සඳහා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ දී විධිමත් වෘත්තිය පුහුණුවක් (Internalship) ලබාදිය යුතු අතර අධ්‍යාපනය සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය හරහා උපාධිධාරීන්ගේ නිපුණතා සහ පෞද්ගලික ගුණාංග වැඩිදියුණු වන ආකාරයේ වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ද යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

***මුඛ්‍ය පද : ඉල්ලුම, උපාධිධාරීන් , විශ්වවිද්‍යාල, සැපයුම***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

divangika214@gmail.com

# කෘෂි කර්මාන්තය තුළ තරුණයින්ගේ සහභාගීත්වයේ අඩුවීම කෙරෙහි බලපාන සාධක
# (කුරුණෑගල දිස්ත්‍රික්කයේ පලුගොල්ල ග්‍රාම නිළධාරි වසම ඇසුරිනි)

ඩී. එම්. සුනේත්‍රා සෙව්වන්දි දයාරත්න1

**සංක්ෂේපය**

සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව, පකිස්ථානය වැනි රටවල ප්‍රමුඛ අංශයක් බවට පත්වන්නේ කෘෂිකාර්මික අංශයයි. මෙලෙස සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ කෘෂිකාර්මික අංශය වඩා වැදගත්වීමට බලපානු ලබන සුවිශේෂි කරුණු කිහිපයක් හඳුනාගත හැකිය. එනම්, සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ කෘෂිකාර්මික අංශය දළ දේශීය නිෂ්පාදිතයට ඉහළ දායකත්වයක් සැපයීම, රට තුළ සේවා නියුක්තියට ඉහළ දායකත්වයක් සැපයීම, කාර්මික අංශයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම යනාදී කරුණු පෙන්වාදිය හැකිය. නමුත් ශ්‍රී ලංකාවේ තරුණයින්ගේ සේවා වියුක්ති අනුපාතිකය මහ බැංකු වාර්තාවට අනුව 2016 වර්ෂය වනවිට 21.6% ලෙස පැවතියද කෘෂි කර්මාන්තය තුළ තරුණයින්ගේ සහභාගීත්වයේ අඩුවීමක් දක්නට ලැබේ. තරුණයින්ගේ සේවා වියුක්ති අනුපාතිකය ඉහළ අගයක් ගත්තද ඔවුන් කෘෂි කර්මාන්තය කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාවය පහළ මට්මක පවතී. එම නිසා කෘෂි කර්මාන්තය සඳහා තරුණයින්ගේ සහභාගිත්වය අඩුවීමට බලපාන සාධක මොනවාද යන්න මෙම අධ්‍යනයේ ප්‍රධාන ගැටළුව වේ. ඒ අනුව කෘෂි කර්මාන්තය තුළ තරුණයින්ගේ සහභාගීත්වයේ අඩුවීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම මෙම අධ්‍යනයේ අරමුණ වේ. ඒ සඳහා වයස අවුරුදු 15-29 අතර තරුණ/තරුණියන් ස්ත්‍රී/පුරුෂ මෙන්ම සේවා වියුක්ති /නියුක්ති පිරිස ඇතුලත් වන සේ තරම 100න් යුතු නියදියක් කුරුණෑගල දිස්තික්කයේ පලුගොල්ල ග්‍රාම නිළධාරී වසමෙන් තෝරා ගනු ලැබූ අතර ප්‍රශ්නාවලී ක්‍රමයෙන් හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයෙන් රැස්කර ගත් දත්ත සංඛ්‍යානමය ප්‍රස්තාර සහ වගු, විස්තරාත්මක සංඛ්‍යානය, සහසම්බන්ධතා සංගුණකය මෙන්ම කයි වර්ග පරීක්ෂා මගින් විශ්ලේෂණය කරන ලදී. ලබා ගත් නියැදියට අනුව මෙම අධ්‍යයනය තුළින් තරුණයින් කෘෂි කර්මාන්තය සඳහා යොමු නොවීමට සමාජය තුළ තත්වයෙන් උසස් යැයි සම්මත රැකියාවන් අපේක්ෂා කිරීම(46%), කෘෂි කර්මාන්තයට සම්බන්ධ කර්මාන්ත වලින් අඩු ආදායමක් ලැබීම(35%), අධ්‍යාපන සුදුසුකම් සමඟ නොගැලපීම(52%), සමාජයේ අඩු පිළිගැනීම(27%) මේ සඳහා බලපෑම් කර ඇති බව නිගමනය විය.

***මුඛ්‍ය පදඃ කෘෂි කර්මාන්තය, තරුණයින්***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යනය අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

sunethrasewmi@gmail.com

# ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අධ්‍යාපනය, සඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම

බී. එම්. එන්. එම්. තිලකරත්න[1]

**සංක්ෂේපය**

1981-2012 කාලපරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ ජනගහනය වර්ධන වේගය 1.1%ක් වන අතර 1960 සිට මෙරට උපත් අනුපාතිකය පහළ යාමක් හඳුනාගත හැකිය. විවිධ රජයන් විසින් රටපුරා පාසල් ඇතිකිරීම, නොමිලේ අධ්‍යාපනය ලබා දීම, නොමිලේ නිල ඇඳුම් සහ පොත්පත් ලබාදීම වැනි ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඒ තුළින් රටේ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාමක් මෙන්ම කාන්තාවන්ගේ අදහස්වලට ගරු කරන සමාජයක්ද බිහිවිය. කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම තුළින් ද්විතීයික අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනය කෙරෙහි කාන්තාවන් යොමුවීමේ ඉහළ ප්‍රවණතාවක් දක්නට ලැබේ. කාන්තාවන් තම විවාහය පිළිබඳවත් ප්‍රජනනය පිළිබඳවත් ස්වාධීන තීරණ ගැනීමක් දක්නට ලැබේ. කාන්තාවන්ගේ අධ්‍යාපනය සඵල්‍යතාවය කෙරෙහි බලපෑමක් ඇති කරන්නේද යන්න විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යනය සිදු කරන ලදි. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අධ්‍යාපනය සඵලතාවය කෙරෙහි ඇතිකරන බලපෑම අධ්‍යනය කිරීම යන මූලික අරමුණත් අධ්‍යාපන මට්ටම් අනුව සාඵල්‍යතාවයෙහි වෙනස්වීම හඳුනාගැනීම සහ ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යුහය අනුව සඵල්‍යතාවයෙහි වෙනස්වීම අධ්‍යයනය කිරීම යන උප අරමුණුත් පාදක කොට ගනිමින් සමීක්ෂණය සිදු කළ අතර ඒ සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් කාන්තාවන් 50කින් යුක්ත සසම්භාවී නියැදියකින් ප්‍රශ්නාවලිය ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කළ අතර ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා විභාග දෙපාර්තමේන්තුවල වාර්තාවන්ගෙන් දත්ත රැස්කර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයට අනුව පෙනීගිය කරුණු වූයේ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම සහ සඵල්‍යතාවය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතින බවයි. විශේෂ කරුණක් වශයෙන්, අධ්‍යයනයට භාජනය කළ ප්‍රජනන වයස් කාණ්ඩවල සිටින සියලුම කාන්තාවන් තුළ විංග්‍රාහක ක්‍රම සහ පවුල් සැලසුම් ක්‍රම පිලිබඳව ඇති දැනුවත්භාවය දැක්විය හැකිය. කාන්තාවන්ගේ සාමාන්‍ය විවාහවන වයස අවුරුදු 24 බවත් ඉහළ අධ්‍යාපන මට්ටමක් ඇති කාන්තාවන් අතර විවාහ වන වයස ප්‍රමාදවීමේ ප්‍රවණතාවක් පවතින බවද හඳුනා ගැනිණි. අවුරුදු 28 ට පෙර විවාහ වූ කාන්තාවන්ගේ සඵල්‍යතාවය අනෙකුත් කාන්තාවන්ට සාපේක්ෂව ඉහළ බවද දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය විය. මේ අනුව ශ්‍රී ලංකාවේ උපත් අනුපාතිකය පහළ බැසීමට ප්‍රධාන හේතුවක් ලෙස කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම බලපාන බව කිවහැකිය.

**මුඛ්‍ය පද :** *සාඵල්‍යතාවය, අධ්‍යාපනය, ජනගහනය, කාන්තාවන්*

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

medhya8@gmail.com

# ග්‍රාමීය කාන්තා සේවා නියුක්තිය දරුවන්ට ඇති කරන බලපෑම

එම්. ඩී. එම්. උබේසේන[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ආර්ථික ක්‍රමයත් සමඟ කාන්තාව වැඩි වශයෙන් රැකියාවක නිරතවීමට පෙළඹී ඇත. කාන්තාව රැකියාවක් කිරීමට විවිධ හේතු ඇත. ඒ අතුරින් කාන්තාව අධ්‍යාපනය ලැබීම, ගෘහ මූලිකයාට පමණක් කුටුම්භ ආර්ථිකය ශක්තිමත් කිරීමට අපහසු වීම ආදිය දැක්විය හැකිය. නාගරික අංශයේ රැකියාවක නිරත වීමට කාන්තාවකට අධ්‍යාපනය , විශේෂ කුසලතාවක් අවශ්‍ය වුවත් ග්‍රාමීය අංශයේ රැකියාවක නිරත වීමට අධ්‍යාපනය , විශේෂ කුසලතාවක් අවශ්‍ය නොවේ. ග්‍රාමීය අංශය කෘෂිකාර්මික අංශයකින් සමන්විත වන අතර වැඩි ජනගහනයක් ජීවත් වෙති. ග්‍රාමීය කාන්තාව විධිමත් හා අවිධිමත් රැකියාවල නිරත වේ. කාන්තාව රැකියාවක නිරත වීම, දරුවන්ට විවිධ ගැටලු ඇති කරනු ලබයි. ඒ අනුව ග්‍රාමීය කාන්තාවගේ සේවා නියුක්තිය දරුවන්ට ඇති කරන බලපෑම පරික්ෂා කිරීම මෙම අධ්‍යනයේ අරමුණ විය. අධ්‍යනය සඳහා ප්‍රාථමික හා ද්විතීක දත්ත යොදා ගන්නා ලදී. කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඹුලාන ග්‍රාමසේවක වසම නියෝජනය කරමින් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගෙන 60 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරාගෙන ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම යොදාගනිමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණයට අනුව කාන්තාවන් ගෙන් 33%ක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වේ. පෞද්ගලික අංශයේ රැකියා අතර ඇඟළුම් කර්මාන්තය ප්‍රමුඛ වේ. 50%ක් අවිධිමත් අංශයේ රැකියාවල හා 17%ක් රැකියාවක නිරත නොවේ. කාන්තාවන්ගේ රැකියාවල ස්වභාවය අනුව දරුවන්ට ඇති කරන බලපෑම විවිධාකාර වේ. කාන්තාව රැකියාවක නිරත වීම දරුවන්ගේ ආරක්ෂාවට, අධ්‍යාපනයට හා සෞඛ්‍ය තත්ත්වයන්ට බලපෑම් ඇති කරන බව සොයා ගත හැකිවිය. ඊට අමතරව කාන්තාව රැකියාවක නිරත වීමට හේතු ලෙස පවුලේ ආර්ථික තත්ත්වය, ඉහළ අධ්‍යාපනයක් ලැබීම යන කරුණු දැක්විය හැකිය. කාන්තාව රැකියාවක නිරත වීමේ දී දරුවන්ට ඇති කරන බලපෑම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගතයුතු වන්නේ කාන්තාවගේ සේවා නියුක්තිය අද ඉහළ තත්ත්වයක පැවතීම හේතුවෙනි.

***මුඛ්‍ය පද : ග්‍රාමීය කාන්තාව, සේවා නියුක්තිය, දරුවන්***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

madusanka57ubesena@gmail.com

# ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ උච්චාවචනය කෙරෙහි බලපෑම් කරනු ලබන සාධකයන්හි ප්‍රවණතාවය විමසීම.

එම්. ඩී. එම්. උබේසේන,[1] යු. පී. පී. එස්. සමරනායක,
එල්. එල්. ආර්. ලොරොරොන්සුහේවා, එස්. සී. ලසන්ති

**සංක්ෂේපය**

බ්‍රිතාන්‍ය පාලන සමයේ යැපුම් කෘෂිකර්මාන්තය වෙනුවට වැවිලි භෝග වගාවන් ව්‍යාප්ත කරන ලදී. එලෙස 1867 දී පමණ ශ්‍රී ලංකාව තුළ වාණිජමය වැවිලි භෝගයක් ලෙස තේ ව්‍යාප්ත වූ අතර ලෝක වෙළඳපොල අද වන විට ලාංකික තේ සඳහා ඉහළ පිළිගැනීමක් ඇත. ශ්‍රී ලංකා තේ වල ඇති රසය, වර්ණය, සුවඳ හා අනෙකුත් සුවිශේෂී ගුණාංග හේතු කොටගෙන ලංකා තේ සඳහා ලෝක වෙළඳපොළ තුළ ඉහළ මිලක් හිමි වී ඇත. මෙලෙස ප්‍රධාන අපනයන භෝගයක් වන තේ නිෂ්පාදනය විවිධ කාල පරාසයන් තුළ දී උච්ඡාවචනයන්ට ලක්ව ඇති බව දැකගත හැකිය. එනම් විවිධ කාල පරාසවලදී තේ නිෂ්පාදනයේ ඉහළ යාමක් සහ පහළ යාමක් දක්නට ලැබිණ. ඒ අනුව තේ නිෂ්පාදනය උච්ඡාවචනය වීම ලාංකීය ආර්ථිකය කෙරෙහි බලපෑම් කරනු ලබන අතර ඒ සඳහා යෙදවුම් හා නිමවුම් අතර සම්බන්ධතාවය සෙවීම මෙහි මූලික අරමුණ විය. තේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සාධක අතරින් භූමිය යන සාධකයෙහි කාර්යක්ෂමතාවය අධ්‍යයනය කිරිම සහ තේ නිෂ්පාදනය උච්ඡාවචනය වූ කාල පරිච්ඡේදයන් හඳුනා ගැනීම මෙහි සෙසු අරමුණු විය. මෙම අරමුණු තෘප්ත කර ගැනීම සඳහා වසර 35ක කාලයක් තුළ එනම් වර්ෂ 1975 සිට 2009 වර්ෂය දක්වා වූ කාලශ්‍රේණි දත්ත යොදා ගනු ලැබිණ. ඒ සඳහා වාර්ෂික මහ බැංකු වාර්තා තුළින් තේ නිෂ්පාදනය, පොහොර භාවිතය, භූමි ප්‍රමාණය සහ පිරිවැය යන විචල්‍යයන්ට අදාළව දත්ත රැස් කරන ලදී. මූලික අරමුණට අනුව තේ නිෂ්පාදනය හා ඒ කෙරෙහි බලපෑම් කරන සාධක අතර සම්බන්ධතාවය කොබ්-ඩග්ලස් ශ්‍රිතය මඟින් විශ්ලේෂණය කළ අතර භූමිය $\alpha = 0.05$ මට්ටමින් නිෂ්පාදනය සඳහා බලපෑම් නොකරන සාධකයක් විය. පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය ගණනය කළ විට එම අගය 51.22 විය. තේ නිෂ්පාදනයේ උච්චාවචන කාල පරිච්ඡේදය හඳුනා ගැනීමේදී වර්ෂ 1883 හා 1992 යන වර්ෂවලදී තේ නිෂ්පාදනයේ විශාල පහළ යාමක් දැකගත හැකිය. අරමුණු අනුව විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව විවිධ නිගමන ලබා ගන්නා ලදී. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් තේ නිෂ්පාදනය සඳහා භූමිය හැර පොහොර භාවිතය හා නිෂ්පාදනය ධන බලපෑමක් ඇති කරන බව නිගමනය කළ හැකිය. පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය විමසීමේදි එහි කාර්යක්ෂමතාවයක් නොමැති බව නිගමන කළ හැකිය. තේ නිෂ්පාදනය උච්ඡාවචනය පිළිබඳ අධ්‍යයනයේ දී ඒ සඳහා නියඟ වැනි ස්වභාවික තත්වයන් ද විදේශීය වෙළඳපොලේ රුපියලේ වටිනාකම වැනි හේතු බලපෑම් කළ බව නිගමනය කළ හැකි විය.

**මුඛ්‍ය පද** - තේ නිෂ්පාදනය, පොහොර භාවිතය, භූමිය, පිරිවැය, සම්බන්ධතාවය

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

madusanka57ubesena@gmail.com

# වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) මගින් ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයට වන බලපෑම

ඩබ්. පී. ඒ. එස්. විජේසේකර[1]

## සංක්ෂේපය

අන්තර්ජාතික වෙළෙඳාම තුළ ඌණ සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන වෙළෙඳ ගැටළු මගහරවා ගැනීමේ අරමුණින් යුතුව හඳුන්වා දී ඇති GSP+ යුරෝපා සංගමය විසින් 2005 වසරේ දී ප්‍රථම වරට ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලද අතර මෙමගින් ඇඟලුම් සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලාංකික අපනයන බදු රහිතව සහ සහනදායී බදු ක්‍රමයක් මත යුරෝපීය වෙළෙඳපොළට අපනයනය කිරීම අපේක්ෂා කරන ලදී. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ, GSP+ මගින් ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයට වන බලපෑම අධ්‍යයනය කිරීමයි. පර්යේෂණයේ නියැදිය ලෙස තෝරා ගනු ලැබුවේ 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ලංකාදීප සහ රිවිර පුවත්පත්වලට ආර්ථික විශ්ලේෂකයින් GSP+ පිළිබඳව ඉදිරිපත් කළ ලිපි වේ. ද්විතීයික දත්ත මගින් දත්ත රැස් කරන ලදී. පර්යේෂණයේ ප්‍රධාන නිගමනය වූයේ GSP+ මගින් ශ්‍රී ලාංකික අපනයනවලට ඉහළ ඉල්ලුමක් නිර්මාණය වන බවයි. නමුත් ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන තත්ත්වයෙන් මිදී ඉහළ මැදි ආදායම් ලබන රටක් වූ විට ශ්‍රී ලංකාවට මෙය තව දුරටත් හිමි නොවීම නිසා අනාගතයේ දී සහන නොමැතිව වෙළෙඳපොළ ජය ගැනීමට අවශ්‍ය කරන සැලසුම් අද සිටම සම්පාදනය කිරීම අනිවාර්ය වේ. තව ද ශ්‍රී ලංකාවේ අපනයනවලින් 80% ක් ම යැවුණේ බ්‍රිතාන්‍යයට වීම නිසා වසර 2019 වන විට බ්‍රිතාන්‍යය, යුරෝපා හවුලෙන් නිල වශයෙන් වෙන්ව යාමට තීරණය කිරීම ශ්‍රී ලංකාවට GSP සහනයෙන් ලබා ගැනීමට තිබූ ප්‍රතිලාභ අවම කිරීමට හේතු වේ. මේ නිසා ඉදිරියේ දී බ්‍රිතාන්‍යය සමඟ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුමක් මගින් පාඩුව පියවා ගැනීමට අවධානය යොමු කළ යුතු ය. කෙසේ වෙතත් GSP සහනයෙන් නිසිඵල ලබා ගැනීමට නම්, සාම්ප්‍රදායික භාණ්ඩ වලට වඩා අපනයන විවිධාංගීකරණය සඳහා යොමු විය යුතු ය.

***මූඛ්‍ය පද : GSP+ , බදු අපනයන ආර්ථිකය, වෙළෙඳපොළ***

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

anjlee816@gmail.com

# EDUCATION

# ඉංග්‍රීසි අධ්‍යාපනය පාසල් දරුවන් තුළ කේන්ද්‍රගත වීමේ විෂම බව

ටී. ඩබ්. කේ. එම්. ආරියකරුණා[1]

**සංක්ෂේපය**

ඉංග්‍රීසි භාෂාව අපගේ මව් භාෂාව නොවුණ ද වර්තමානය වන විට එය බොහෝ ක්ෂේත්‍රයන් මෙහෙයවීම සඳහා අත්‍යවශ්‍ය භාෂාවක් බවට පත් ව තිබේ. ඒ තුළ බොහෝ තරුණ පිරිස් මන්දගාමී වනු දක්නට ලැබේ. සමාජය තුළ වෘත්තිමය වශයෙන් ඉදිරියට යාමට ඉංග්‍රීසි දැනුම එතරම් ප්‍රබල සාධකයක් බැවින් ඒ සඳහා මූලික පදනම පාසල් අධ්‍යාපනය තුළින් ලැබිය යුතු වේ. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනයේ සිට දරුවන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කිරීම සඳහා විවිධ පාසල් තුළින් එක හා සමාන දායකත්වයක් ලැබේ ද යන්න විමසීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මේ සඳහා අවශ්‍ය දත්ත රැස්කරගනු ලැබුවේ ජාත්‍යන්තර පාසල්, ජාතික පාසල් සහ ග්‍රාමීය පාසල් මිශ්‍ර වූ නියදියක් යොදා ගනිමිනි. එම පාසල්වල විභාග ප්‍රතිඵල සටහන් හා ප්‍රගති වාර්තා සටහන් තුළින් අවශ්‍ය දත්ත රැස්කරගත් අතර එම දත්ත නිරූපණය සඳහා වගු, ප්‍රස්තාර ආදිය යොදාගන්නා ලදී. රැස්කරගත් දත්තවලට අනුව ජාත්‍යන්තර පාසල්වල වසරකට අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂය සමත්වීම 100%ක් බවත්, ජාතික පාසල්වල එම ප්‍රතිශතය 95% ඉක්මවන බවත්, ග්‍රාමීය පාසල්වල එය 50%ට අඩු බවත් පැහැදිලි විය. ඒ අනුව මෙහි දී අනාවරණය වූයේ ප්‍රාථමික අධ්‍යාපනයේ සිට දරුවන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කිරීම සඳහා විවිධ පාසල් තුළින් ලැබෙන දායකත්වය විෂම බව යි. ඒ අනුව ජාත්‍යන්තර පාසල් සහ ජාතික පාසල් තුළින් දරුවන්ට ලබාදෙන ඉංග්‍රීසි දැනුම හා සමගාමී වූ දැනුමක් විෂයානුබද්ධව සහ ප්‍රායෝගික වශයෙන් ලබා දීමේ ක්‍රමවේදයක් ග්‍රාමීය පාසල් තුළ ද ඇති කළ යුතු වේ.

***මුඛ්‍ය පදඃ  ඉංග්‍රීසි අධ්‍යාපනය, රජයේ පාසල්, ජාත්‍යන්තර පාසල්, ග්‍රාමීය පාසල්***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි දක්වන ප්‍රවණතාවය පිළිබඳ කරනු ලබන සමාජ විද්‍යාත්මක පරීක්ෂණයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ජේ. එම්. ඩී. වයි. බණ්ඩාර[1]

**සංක්ෂේපය**

වර්තමානය වනවිට උසස් අධ්‍යාපනය තුළ ඉංග්‍රීසි භාෂාව ඉතා වැදගත් සාධකයක් බවට පත් වී තිබේ. වර්තමානයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මෙන්ම ජාතික උසස් අධ්‍යාපන ආයතන තුළ ද අධ්‍යයන කටයුතු හා දේශන පැවැත්වීමට සුලභ ලෙස ඉංග්‍රීසි භාෂාව යොදාගනු ලබයි. මෙම තත්ත්වය පිළිබඳව විද්‍යාර්ථීන් විවිධ මතිමතාන්තර දරණු ලබයි. එම නිසා ඉංග්‍රීසි භාෂාව පිළිබඳව යම් දැනුමක් හෝ ලැබීම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් හට අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ඉංග්‍රීසි භාෂාව කෙරෙහි කෙතරම් උනන්දුවක් දක්වයි ද යන්න මෙම පර්යේෂණය ඔස්සේ සොයා බැලීය. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් 300ක් නියමිත ලෙස තෝරාගත් අතර එහිදී සසම්භාවී ලෙස සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර, වාණිජ හා කළමනාකරණ හා විද්‍යා යන පීඨයන් නියෝජනය වන පරිදි තොරතුරු රැස් කරන ලදී. තොරතුරු රැස්කිරීමේ ක්‍රමවේදයන් ලෙස ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රම යොදාගත් අතර දත්ත නිරූපණය සඳහා SPSS මෘදුකාංගය භාවිතයෙන් වගු සහ ප්‍රස්තාර භාවිතා කරන ලදී. ඒ අනුව මානව ශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථීන් 79%ක ප්‍රතිශතයක් ද, සමාජ විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් 56%ක ප්‍රතිශතයක් ද, වාණිජ හා කළමනාකරණ පීඨයේ විද්‍යාර්ථීන් 81%ක ප්‍රතිශතයක් ද, විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් 92%ක ප්‍රතිශතයක් ද, නියදියට අනුව ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳව තෘප්තිමත් විය.එසේම ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳව තෘප්තිමත් නොවූ පිරිසගෙන් 65%ක ප්‍රතිශතයක් තම ඉංග්‍රීසි අධ්‍යාපන මට්ටම ඉහළ නංවා ගැනීමට විවිධාකාර වූ උපක්‍රම සොයමින් පැවතීම මෙහිදී හඳුනාගත් තවත් සුවිශේෂී වූ ලක්ෂණයක් ලෙස පෙන්වාදිය හැක. නමුත් විද්‍යාර්ථීන් 30%ක ප්‍රතිශතයක් සිය ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳව කිසිඳු උනන්දුවක් නොදැක්වූ බව හඳුනාගත් අතර විද්‍යාර්ථීන් 5%ක ප්‍රතිශතයක පමණ පිරිසක් ඉංග්‍රීසි අධ්‍යාපනයේ වැදගත්කම හඳුනා නොගත් අය අතර විය.

***මුඛ්‍ය පද : විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, ඉංග්‍රීසි අධ්‍යාපනය***

[1] සමාජ විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dinukayasas571@gmail.com

# ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම සාධනයට බලපාන සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් (කොටපොල අධ්‍යාපන කොට්ඨාශය ආශ්‍රයෙන්)

ආර්. ඩී. චතුරංග[1]

**සංක්ෂේපය**

ලංකාවේ පවතින අධ්‍යාපන ක්‍රමයට අනුව ඉංග්‍රීසි භාෂාවට ලැබී ඇත්තේ අඩු අවධානයකි.මෙම අධ්‍යනයේදී ප්‍රධාන ලෙස අවධානය යොමු කරන්නේ ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි විෂය සාධනය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීමයි. කොටපොල අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 05 ක සසම්භාවී ලෙස තෝරාගත් ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුභවතුන් 10ක් හා සිසුන් 100 ක ගෙන් යුතු නියැදියක් තුලින් ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් ලදී. අනතුරුව මාතය, මධ්‍යස්ථය, මධ්‍යනය හා ප්‍රස්ථාර ආදිය භාවිත කරමින් දත්ත විශ්ලේශනය කරන ලදී. ඒ අනුව ග්‍රාමීය පාසල්වල අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රිසි විශය සමත් වීමේ ප්‍රතිශතය 11%ක් වැනි පහළ මට්ටමක පැවති අතර සම්මාන හෝ ඊට ඉහල සාමාර්ථ ලැබීම 3%ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක් ගනි. එම තොරතුරු වලට අනුව කෙටපොල අධ්‍යාපන කොට්ඨාශයේ සිසුන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපන සාධනය දුර්වල මට්ටමක පවතින බවත් ඊට හේතු ලෙස ප්‍රධාන වශයෙන් සිසුන් තුල ඉංග්‍රීසි විෂය කෙරේ පවත්නා අකමැත්ත, ඉගැන්වීම් ක්‍රම වල පවත්නා දුර්වලතා, අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම් ලැබීමට අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රිසි විෂය සමත් වීම අනිවාර්යය නොවීම, දෙමාපිය ඉංග්‍රිසි සාක්ෂරතාවය දුර්වල වීම, ඉංග්‍රිසි භාෂාව උගන්වන ගුරුභවතුන්ගේ හිඟය, ඉංග්‍රිසි විෂය පිළිබඳ පතපොත සුලභ නොවීම හා ඉංග්‍රිසි අධ්‍යාපනයේ වැඳගත්කම පිළිබඳ පවත්නා අඩු ආකල්පය ආදිය පෙන්වාදිය හැක. මෙම තත්ව මගහරවා ගැනීමට ප්‍රාථමික අධ්‍යාපනයේ සිටම සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම නගාසිටුවීමට කටයුතු කිරීමට, ඉංග්‍රිසි අධ්‍යාපනයේ ඇති වැදගත්කම පිළිබඳ යහපත් ආකල්පයක් දෙමාපිය හා දරුවන් තුළ ඇති කිරීම, ඉංග්‍රිසි භාෂාව සඳහා පවතින ගුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම, සිසුන්ගේ ආකල්ප වර්ධනයට කටයුතු කිරීම, ආදී ක්‍රියාමාර්ග මගින් සිසුන්ගේ ඉංග්‍රිසි අධ්‍යාපන මට්ටම සාධනය කළ හැක.

**මුඛ්‍ය පද :** *ග්‍රාමීය පාසල්, ඉංග්‍රීසි දැනුම*

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dinuchathuranga1992@gmail.com

# ශ්‍රී ලංකාවේ ප්‍රථමික අධ්‍යාපනයේ වර්තමාන ප්‍රවණතාවය ( ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ග්‍රාම සේවා වසම ආශ්‍රයෙන්)

ඩී. ඒ. කේ. චතුරංගනී[1]

**සංක්ෂේපය**

දරිද්‍රතාවයට මූලික පිළියම මුදල් නොව දැනුමයි. අධ්‍යාපනය, දිළිඳුකම හා අසමානතාව අඩු කිරීමේලා ඉතාමත් ම බලවත් උපකරණයක් බවත් එය චිරස්ථායි ආර්ථික වර්ධනය සඳහා පදනමක් වෙයි. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවත්නා රටක සැමට ප්‍රථමික අධ්‍යාපනය ලබා දීම සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය විමසා බැලීම මෙම අධ්‍යනයේ අරමුණයි. මෙම ප්‍රථමික අධ්‍යාපන විෂයෙහි එයට අයත් ළමා කොටස එම ප්‍රතිලාභය හිමි කරගැනීමේ දි ඔවුනට ඇතිවන අවහිරතා ලෙස කුටුම්භවල ආදායම් මට්ටම, දාරිද්‍රතාවය, යුධ ගැටුම්, අංගවිකල භාවය, වෙනත් රෝගාබාධ හා අධ්‍යාපනය සම්බන්ධව රජයේ ප්‍රතිපත්තිය වැනි දේ දැක්විය හැක. මෙම අධ්‍යනයේ සංගහනය වූ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ග්‍රාම සේවා වසමෙන් සසම්භාවී ලෙස තෝරා ගත් පුද්ගලයින් 100 කින් යුත් නියැදියකින් දත්ත රැස් කර විශ්ලේෂණය මඟින් නිගමන කිහිපයකට එළඹිය හැකි විය. මෙහි දි ප්‍රථමික දත්ත මෙන්ම ද්විතික දත්ත ද භාවිතා කෙරිණි. මෙහි දි කාන්තාවන් ප්‍රතිශතයෙන් 85% ක් ප්‍රථමික අධ්‍යාපනය ලබා ඇති අතර 15% ක ප්‍රතිශතයක ට අධ්‍යාපනය අහිමි වී ඇත. තව ද පුරුෂයන්ගේ ප්‍රතිශතයෙන් 79% කට අධ්‍යාපන වරම් හිමි වි ඇති අතර 21% කටම වරම් අහිමි වී ඇත. මෙම ගැටළු මඟ හරවා ගැනීම ට ග්‍රාමීය පාසල්වල භෞතික සම්පත් වැඩි දියුණු කිරිම, නගර කේන්ද්‍ර කොට ගෙන රාශි ගතව සිටින පුහුණු ගුරුවරුන්ගේ ශක්‍යතාවය ග්‍රාමීය පාසල්වලට ලබා දීමට පියවර ගත යුතුය

***මුඛ්‍ය පද : ප්‍රාථමික අධ්‍යාපනය, දාරිද්‍රතාවය, චිරස්ථායි ආර්ථික වර්ධනය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

kasunicranawaka@gmail.com

# අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුන්ගේ විභාග ආතතිය සඳහා විභාග මූලික අධ්‍යාපන ක්‍රමයේ බලපෑම

එස්. ඒ. දිල්හානි[1]

**සංක්ෂේපය**

වර්තමාන ලෝකයේ සුලබව දක්නට ලැබෙන සමාජ ගැටලුවක් ලෙස ආතතිය හැඳින් විය හැකිය.සමාජය විසින්ම පුද්ලයා ආතතියට ගොදුරු කරන අතර විභාග ආතතිය මින් ප්‍රධාන වේ. වර්තතමාන ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන සමාජ ගැටලුවක් ලෙස විභාග ආතතිය දැක්විය හැකිය. පහ වසර ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ ආදී කඩයිම් විභාග මෙන්ම වසරකට වාර විභාග තුනකට මුහුණ දෙන දරුවන් විභාග ආතතියට ගොදුරු වී ඇත. මේ පිළිබඳ සොයා බැලීම කාලීනව වැදගත් වේ.මෙම අධ්‍යනය සඳහා පාදක වූ මූලික ගැටලුව වන්නේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන සිසුන්ගේ විභාග ආතතිය වර්ධනය වීම සඳහා විභාග මූලික අධ්‍යාපන ක්‍රමය බලපානවා ද යන්න සොයා බැලීම වේ. ගැටලුව අධ්‍යනය සඳහා ද්වීතියික දත්ත පුස්තකාල පරිශීලනය මගින් ද, ප්‍රාථමික දත්ත කලුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය හා නාගරික පාසල්, කණිෂ්ඨ හා ජ්‍යේෂ්ඨ පාසල්, මහා විද්‍යාල, නවෝද්‍යා පාසල්, ජාතික පාසල් යන සියලුම වර්ගයේ පාසල් නියොජනය වන පරිදි අහඹු ලෙස සිසුන් 100ක ගෙන් යුක්ත නියදියක් තෝරාගෙන ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ලබාගත් අතර ලබාගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කිරීම සිදුකෙරිණි. විශ්ලේෂිත දත්ත අනුව අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන සිසුන්ගෙන් 80%කට විභාග ආතතිය පැවති අතර, විභාග ආතතිය පවතින සිසුනගේ විභාග ආතතිය වර්ධනය වීම සඳහා විභාග මූලික අධ්‍යාපන ක්‍රමය බලපෑම් කරන බව 75%ක ප්‍රතිඵල මත සනාථ විය. මේ අනුව අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුන්ට විභාග ආතතිය පවතින බවක්, විභාග ආතතිය වර්ධනය වීම සඳහා විභාග මූලික අධ්‍යාපන ක්‍රමය බලපාන බවත් නිගමනය කළ හැකි විය.

***මුඛ්‍ය පද : විභාග ආතතිය , විභාග මූලික අධ්‍යාපන ක්‍රමය , සාමාන්‍ය පෙළ සිසුන්***

---

1 සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dsamarasingha163@gmail.com

# කලා උපාධි අපේක්ෂිත විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි හා දෙමල භාෂා දැනුම (කැලණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයන් ආශ්‍රයෙනි)

ආර්. පී. එස්. එස්. දිසනායක[1], බී. ජී. ටී. ඩී. බණ්ඩාර

**සංක්ෂේපය**

විශ්වීය දැනුම සොයා යන්නෙකුට විවිධ වූ භාෂාවන් පිළිබඳව දැනුමක් තිබිය යුතුය. ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාල විද්‍යාර්ථියෙකුට අවම වශයෙන් ජාතික භාෂාවට අමතරව ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන් පිළිබඳවත් නිවැරදි දැනුමක් තිබීම වැදගත් වේ. නමුත් කලා උපාධි අපේක්ෂිත බොහෝ විද්‍යාර්ථීන්ගේ ඉහත භාෂා දැනුම් මට්ටම් පහළ මට්ටමක පැවතී. මෙ පිළිබඳව මෙම අධ්‍යයනයෙන් අවධානයට යොමු කරන අතර එහිදී මෙහි අරමුණු වූයේ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි හා දෙමල භාෂා දැනුම් මට්ටම කෙබඳුදැයි සොයා බැලීමත්, එම දැනුම් මට්ටම ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලට ප්‍රමාණවත්දැයි යන කරුණු සොයා බැලීමය. මෙහිදී මෙම අධ්‍යයනයේ සංගහනය වූ කැලණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨවල සිසුන්ගෙන් සමානුපාතික ස්තරගත නියැදීම මත සිසුන් 100 කින් යුතු නියැදියකින් දත්ත රැස්කර විශ්ලේෂණය කිරීම මගින් නිගමන කිහිපයකට එලඹීමට හැකිවිය. කලා පීඨයේ සිසුන්ගෙන් 87% කටම ඉංග්‍රීසි භාෂාව සඳහා අ.පො.ස. (සාමාන්‍ය) පෙළ සඳහා ජ හෝ ඊට පහළ සාමාර්ථ පවතින බවත් දෙමල භාෂාව සඳහා පෙනී සිටීම මෙම විද්‍යාර්ථීන්ගෙන් 15% කට පමණක් සීමා වී ඇති බවත් සොයා ගන්නා ලදී. එමෙන්ම මෙම සිසුන්ගෙන් 32% කට ඉංග්‍රීසියෙන් දේශනයන් පැවැත්වෙන බවත් ඔවුන්ගෙන් 25% කටම එම දේශන තේරුම් ගැනීමේ අපහසුතා පවතින බවත් සොයා ගන්නා ලදී. මෙම විද්‍යාර්ථීන්ගෙන් 92% ක්ම දෙමළ භාෂා දැනුම් මට්ටම පහළ මට්ටමක පවතින බවද සොයා ගැනිණි. මෙම ගැටලු මග හරවා ගැනීමට නව ඉංග්‍රීසි හා දෙමළ පාඨමාලාවල අවශ්‍යතාවය හා ඒවාට සිසුන් යොමු කිරීමේ ක්‍රියාවලියක් මෙම විශ්ව විද්‍යාල පද්ධතියට අවශ්‍ය බව පෙන්වාදිය හැකිය.

***මුඛ්‍ය පද : ඉංග්‍රීසි, දෙමළ, භාෂා දැනුම, කැලණිය විශ්වවිද්‍යාලය, විද්‍යාර්ථියා***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

shanakasandaruwan40@gmail.com

# විද්‍යාර්ථීන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන දේශන සඳහා සහභාගීවීමේ ප්‍රවණතාවය  සහ විභාග ප්‍රතිඵල අතර පවතින සම්බන්ධතාවය. (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එච්. ඒ. ඩී. ටී. හපුආරච්චි[1]

**සංක්ෂේපය**

භාෂාවක් යනු මිනිසුන් අන්‍යෝන්‍ය මත, හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීමට යොදා ගන්නා මෙවලමකි. ශ්‍රී ලාංකිකයන් වන අප මව් භාෂාව ලෙස සිංහල භාෂාව භාවිතා කල ද විශ්වීය ව පිළිගත් ප්‍රධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ද දැනුවත් වීම යෝග්‍ය වේ. රැකියා වෙළඳපලට පිවිසෙන්නන් ලෙස විද්‍යාර්ථීන් ද ඉංග්‍රීසි භාෂාවෙන් සන්නද්ධ වීම අවශ්‍යතාවයකි. ඒ සඳහා හුරු කිරීමක් වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන පැවැත්වීම දැක්විය හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ විද්‍යාර්ථීන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන දේශනවලට සහභාගී වීම සහ විභාග ප්‍රතිඵල අතර සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ඒ අනුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන දේශන සඳහා විද්‍යාර්ථීන් සහභාගී වීමත් විභාග ප්‍රතිඵල අතරත් කිනම් සම්බන්ධතාවයක් පවතී ද යන්න පර්යේෂණ ගැටලුව විය. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ වසර 4 නියෝජනය වන පරිදි විද්‍යාර්ථීන් 100 දෙනෙකු ස්තෘත සසම්භාවී නියදීමේ ක්‍රමය යටතේ තෝරා ගෙන ඔවුන්ට ඉදිරිපත් කල ප්‍රශ්නාවලියක් ආධාරයෙන් අවශ්‍ය  තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව පසුගිය දෙවන අර්ධ වාර්ෂිකයට අදාළ ව විද්‍යා්ර්ථීන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවන එක් විෂය ඒකකයක් සඳහා දේශන වලට සහභාගී වූ දින ගණන් පිළිබඳවත් ඔවුන්ගේ විභාග ප්‍රතිඵල පිළිබඳවත් දත්ත රැස් කර සහසම්බන්ධතාවය හා ප්‍රතිපායනය ඇසුරින් දත්ත විශ්ලේෂණය කරන ලදී. සහසම්බන්ධතාවය ප්‍රමාණාත්මකව 0.731ක් වූ අතර එමගින් දේශනවලට සහභාගී වීමත් විභාග ප්‍රතිඵල අතරත් ධන සහසම්බන්ධතාවයක් පවතින බව නිගමනය කරන ලදී. විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි මාධ්‍ය සාක්ෂරතාවය දුර්වල වීම ප්‍රධාන වශයෙන්ම දේශන සඳහා සහභාගී නොවීමට හේතුව ලෙස මෙම අධ්‍යයනය හරහා නිගමනය විය. ඒ සඳහා ළමුන් සෑම අධ්‍යයන වර්ෂයක් තුල ම අධ්‍යයන සම්භාර වලින් නිදහස් විෂය ඒකකයක් ලෙස ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු කිරීමත්, සරල ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් දේශන මෙහෙයවීම සහ අසීරු විෂය කරුණු සිංහලෙන් පැහැදිලි කරන ලෙසට යෝජනා ඉදිරිපත් විය.

***මුඛ්‍ය පදඃ ඉංග්‍රීසි භාෂාව, දේශන, විද්‍යාර්ථීන්, විභාග ප්‍රතිපල***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dimanihapuarachchi@gmail.com

# ඉංග්‍රීසි භාෂාව පිළිබඳව උසස් පෙළ සිසුන්ගේ ආකල්පය

එස්. ආර්. හෙට්ටිආරච්චි[1], ඩී. යූ. පී. දසනායක

**සංක්ෂේපය**

ඉංග්‍රීසි භාෂාව ලෝකයේ බහුලව ම භාවිත වන භාෂාව ලෙස සැලකිය නොහැකි මුත් එය පිළිගත් සම්මත භාෂාවක් ලෙස බොහෝ රටවල භාවිතාවට ගනී. එය සංඛ්‍යාත්මක වශයෙන් මිලියන 2 කට ආසන්න යැයි ගණන් බලා ඇත. විභාග දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයේ උසස් පෙළ විභාග අපේක්ෂකයින්ගේ කාර්ය සාධන වාර්තාවට අනුව එම වසරේ ශිෂ්‍යයන් ලක්ෂ 3 කට අසන්න පිරිසක් උසස් පෙළ සඳහා ඉදිරිපත් ව ඇති අතර ඉන් 60% කට අසන්න ප්‍රමාණය ක් සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය අසමත් වී තිබේ. මෙම තත්වය ශිෂ්‍යන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු අඩාල වීමටත් ජාත්‍යන්තර තලය වෙත ඔවුන්ගේ දැනුම විවර වීමට බාධාවක් ලෙසත් දැක්විය හැක. ඒ අනුව ඉංග්‍රීසි භාෂාව පිළිබඳව උසස් පෙළ ශිෂ්‍යන් දක්වන ආකල්පය විමසා බැලීම මෙහි මුඛ්‍ය අරමුණ වෙයි. මෙම අධ්‍යනය සඳහා ප්‍රාථමික දත්ත භාවිතා කර ඇති අතර පොකුරු නියැදීම යටතේ කැලණිය අධ්‍යාපන කොට්ඨාසයේ පාසලක් තෝරා එමඟින් නියැදියක් තෝරා ගන්නා ලදී. පරියේෂණ දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි ක්‍රමය යොදාගෙන ඇත. තවද මෙහිදී රැස් කරගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම යොදාගෙන ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යනය මඟින් උසස් පෙළ ශිෂ්‍යයන්ගෙන් 86% ක පිරිසක් ඉංග්‍රීසි භාෂාව ප්‍රයෝජනවත් බව පිළිගන්නා අතර ප්‍රයෝජනවත් නොවන බව ප්‍රකාශ කරන කිසිවෙකු වාර්තා නොවීය. සාමාන්‍ය ඉංග්‍රීසි භාෂා ප්‍රතිඵලය “Z” ලකුණ සඳහා ඇතුලත් කිරීමට 63%ක පිරිසක් කැමැත්තක් නොදැක්වූ අතර සාමන්‍ය ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය පිළිබඳව සැලකිය යුතු යහපත් මතයක් ශිෂ්‍යන් විසින් දැරූ නමුත් විෂය මාලාව සඳහා ප්‍රයෝගික සැසි ඇතුලත් විය යුතු බවට අදහසක් ඉදිරිපත් විය. මෙම පරියේෂණයේ අවසාන ප්‍රතිඵලය ලෙස වසර 13 ක අධ්‍යාපන කාල සීමාව තුල නොකඩවා ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය විෂයක් ලෙස විෂය මාලාවට ඇතුලත් වුවද ශිෂ්‍යන් තුල ඉංග්‍රීසි භාෂාව කෙරෙහි මඳ නැඹුරුතාවක් පවතින බවත්, ඉංග්‍රීසි භාෂාව ප්‍රයෝජනවත් බව පිළිගන්නා නමුත් ඉංග්‍රීසි භාෂාව කෙරෙහි සුභවාදී මතයක් නොදරන බවත් තහවුරු විය.

***මුඛ්‍ය පද : උසස් පෙළ ශිෂ්‍යන්, ඉංග්‍රීසි භාෂාව, ආකල්පය***

[1] ජාත්‍යන්තර අධ්‍යනය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

sadeeparandunu1@gmail.com

# පූර්ව ළමා විය සංවර්ධනය සඳහා පෙර පාසලේ කාර්යභාර්යය පිළිබඳ අධ්‍යනයක්

ජේ. එච්. එම්. සී. පී. ජයපත්ම[1]

**සංක්ෂේපය**

අනාගත මානව සම්පත් සංවර්ධනය සඳහා ළමා පරපුර පදනම සපයයි. පූර්ව ළමා විය වශයෙන් සලකන කාල පරිච්ඡේදය වන්නේ දරුවෙකු මව්කුස පිළිසිඳ ගැනීමේ සිට වයස අවුරුදු 5 දක්වා කාලයයි. මෙම අවධිය තුළ පුද්ගලයෙකුගේ මොළයෙන් 80% වර්ධනය වන බව සොයාගෙන ඇත. අතීතයේ පවුල තුලින් දරුවන්ගේ සංවර්ධන ක්‍රියාදාමය සිදුවුවත් වර්තමාන සමාජ රටාවේදී මෙම කාර්යය පෙර පාසල නැමති අධ්‍යාපන ආයතනය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව පූර්ව ළමා විය සංවර්ධනය සඳහා පෙර පාසලේ කාර්යභාර්යය අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය පරමාර්ථය විය. මේ සඳහා ප්‍රශ්නාවලි හා සිද්ධි අධ්‍යයන යොදාගන්නා ලදී. අධ්‍යයනයේ නියැදිය ලෙස නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පෙරපාසල් 10 ක් සසම්භාවීව තෝරාගත් අතර එහි දී 3-4 වයස් කාණ්ඩයට අයත් දරුවන් 20 ක්, 4-5 වයස් කාණ්ඩයට අයත් දරුවන් 20 ක්, පෙර පාසල් ගුරුවරුන් 20 ක් සහ නියැදියේ දරුවන්ගේ දෙමව්පියන් 40 ගෙන් නියැදිය සමන්විත වේ. දත්ත විශ්ලේෂණය දී පෙරපාසලේ භෞතික පරිසරය හා මනෝ සමාජීය පරිසරය, පෙර පාසල් ගුරුවරියගේ තොරතුරු, දරුවන්ගේ දෙමව්පියන්ගෙන් ලබාගන්නා තොරතුරු හා දරුවන් නිරීක්ෂණය කර ලබාගත් තොරතුරු මගින් දත්ත විමර්ශනය කරන ලදී. මධ්‍යනය, සම්මත අපගමනය හා ප්‍රතිශතක වැනි සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් හා වගු සහ ප්‍රස්තාර යොදා ගනිමින් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. එහිදී අනාවරණය වූයේ පෙර පාසල් අතරින් 30% ප්‍රතිශතයක් කිසිදු ආයතනයක ලියාපදිංචි කර නැති බවයි. එමෙන්ම නියැදියට අදාල පෙර පාසල් අතරින් 60% ඒ සඳහාම වෙන් වූ ස්ථානයක පවත්වාගෙන යනු නොලබන අතර 70% දරුවන්ගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ගැන සැලකිලිමත් නොවේ. එපමණක් නොව 60% පෙර පාසල් ආරක්ෂාකාරී බවින් තොර වේ. පෙර පාසල් ගුරුවරුන්ගෙන් ලබා ගත් තොරතුරු වලට අනුව 55% තම ජීවනෝපාය මාර්ගය පවත්වා ගැනීමේ අරමුණින් මෙම වෘත්තිය තෝරා ගෙන ඇත. දෙමව්පියන් ගැන විමසීමේ දී ඔවුන් රැකියා කටයුතු වලට යාමේ දී දරුවන් රැකබලා ගන්නා ස්ථානයක් වශයෙන් පෙරපාසල තෝරා ගෙන ඇති බව හඳුනාගන්නට ලැබුණි. ඒ අනුව නිගමනය කල හැකි වුයේ පෙර පාසල් පද්ධතිය තුළින් දරුවන්ගේ පූර්ව ළමා වියෙහි සමස්ත වර්ධනය නිසි අයුරින් සිදුනොවන බවයි. එබැවින් පෙර පාසල් වල ඇති මෙවැනි තත්ත්වයන් දුරුකොට දරුවන්ගේ සමස්ත සංවර්ධනය නිසි අයුරින් සිදුකර දරුවන්ගේ පූර්ණ පෞරුෂත්වය සංවර්ධනය සඳහා දායක විය යුතුය.

***මුඛ්‍ය පද : පෙර පාසල් අධ්‍යාපනය, සංවර්ධනය, පූර්ව ළමා විය සංවර්ධනය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# පාසල් ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ අධ්‍යයනයක්

කේ. ඒ. ඩී. එස්. කාරියප්පෙරුම[1]

**සංක්ෂේපය**

පරිගණක සාක්ෂරතාවය යනුවෙන් මෙහි දී හැඳින්වෙන්නේ පරිගණකය හා ඊට සම්බන්ධ තාක්ෂණය කාර්යක්ෂමව භාවිතා කිරීමට ඇති හැකියාවයි. ඒ අනුව පරිගණක තාක්ෂණය ඔස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව්‍යකරණයක් හා ඵලදායිතාවයක් ඇති කර රටේ සෑම ශිෂ්‍යයයෙකුටම එක හා සමාන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ලබා දිය හැක. ශිෂ්‍යයින්ට පුළුල් දැනුමක් පහසුවෙන් ලබා දීමට හා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය දියුණු කිරීමට පරිගණක තාක්ෂණය ඔස්සේ හැකියාව ලැබේ. ගුරුවරුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය පාසල් ඉගෙනීම් ක්‍රියාවලියට බලපෑම් කරන්නේ ද යන්න මෙහි අධ්‍යයනය ගැටළුවයි. ඒ අනුව පාසැල් ගුරුවරුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවයට බලපාන හේතු සොයා බැලීම මූලික අරමුණ වේ. 2000-2015 දක්වා කාල සීමාව තුළ ප්‍රකාශයට පත් කරනු ලැබූ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන වාර්තා වල ද්විතියික දත්ත උපයෝගී කරගෙන මේ පිළිබඳ අධ්‍යයනය කෙරුණි. මේ අනුව රාජ්‍ය පාසල් වල ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය සමස්තයක් ලෙස 42% කි. පාසල් සිසුන් හා පරිගණක සාක්ෂරතාවය සහිත ගුරුවරුන් අතර අනුපාතය 56 ක් වන අතර එය සිසුන් හා ගුරුවරුන් අතර සාමාන්‍ය අනුපාතය 18 මෙන් තුන් ගුණයකි. මේ අනුව ඇතැම් පාසල් වල මූලික තොරතුරු තාක්ෂණ හා පරිගණක පහසුකම් නොතිබීම, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගුරුවරුන්ගේ පවතින දුර්වලතා, ගුරුවරුන්ගේ වයස් මට්ටම, රජය මගින් ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය පිළිබඳව දක්වන නොසැලකිලිමත්කම, ගුරුවරුන් සම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රියාවලියකට කොටු වී සිටීම ආදිය පාසල් ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය අඩු මට්ටමක පැවතීම හේතු වී ඇත. ඒ අනුව නවීන තාක්ෂණය මඟින් වඩා ඵලදායී ලෙස හා ආකර්ෂණීය ලෙස සිසුන්ට දැනුම ලබා දීමට ඇති හැකියාව ගුරුවරුන්ගේ පරිගණක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සෑම පාසලකටම මූලික පරිගණක පහසුකම් ලබා දීම, අධ්‍යාපන ක්‍රමය තාක්ෂණයත් සමඟ මුසු කිරීම ආදිය ඔස්සේ රජයට මෙම ගැටලුව අවම කිරීම සඳහා දායක විය හැක.

***මුඛ්‍ය පද : පරිගණක සාක්ෂරතාවය, පාසල් ගුරුවරුන්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

kadsupeshala@gmail.com

# ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල බඳවා ගැනීමේ ප්‍රවණතාවය

ආර්. එච්. එම්. අයි. පී. කුමාරි[1], ජී. ඒ. එස්. මධුවන්ති, ඩී. පී. ඩී. දුලාරි

**සංක්ෂේපය**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා යොමු වන සිසුන් ඉතා ඉහළ අගයක් ගන්නා අතර උසස් පෙළ විභාගය සඳහාද විශාල සිසුන් ප්‍රමාණයක් ඉදිරිපත් විම දක්නට ලැබේ. එයින්ද විශ්වවිද්‍යාල වරම් ලැබීම සඳහා සිසුන් අතර දැඩි තරඟකාරිත්වයක් දක්නට ලැබේ. එම නිසාම වර්තමානයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන දෙඅංශයෙන්ම විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන මගින් සපයන අධ්‍යාපනය සඳහා පෙර පැවති තත්වයට වඩා ඉහළ ඉල්ලුමක් දැකිය හැකිය. නමුත් උසස් පෙළ විභාගයෙන් පසු රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන සිසුන්ගෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් විශ්වවිද්‍යාල ප්‍රවේශ වරම් ලබා ගැනීම වර්තමානයේ ගැටළුවක් බවට පත්වී තිබේ. ඒ අනුව ඉහළ සිසුන් ප්‍රමාණයක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබුවත් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කරගැනීමේ ප්‍රවණතාවය විමර්ශනය කිරීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව 2013-2015 දක්වා කාල සීමාව තුළ ප්‍රකාශයට පත් කරනු ලැබූ වාර්ෂික මහ බැංකු වාර්තා, ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා යන මූලාශ්‍ර වල ද්විතියික දත්ත උපයෝගී කර ගනිමින් කාල ශ්‍රේණි විශ්ලේෂණය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් වගු, ප්‍රස්තාර ඇසුරින් ලබා ගත් දත්ත ඉදිරිපත් කරනු ලැබීය. මේ අනුව 2013 වර්ෂයේදී උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් 63.04% ක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූවද ඉන් 16.71%ක් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගෙන තිබේ. එසේම 2014 වර්ෂයේදී උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් 58.27% ක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූවද ඉන් 17.50%ක් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගෙන තිබේ. එමෙන්ම 2015 වර්ෂයේදී උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් 60.46%ක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූවද ඉන් 17.13%ක් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගෙන තිබේ. මේ අනුව ඉහළ සිසුන් ප්‍රමාණයක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබුවත් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කරගැනීමේ ප්‍රවණතාවය ඉතා අඩු මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා සිටින සියලුම සිසුන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගැනීමේදී ඉඩකඩ පිළිබඳ සීමාවන්ට මුහුණ දීමට සිදුවීම මෙයට ප්‍රධාන හේතුව වී ඇත. එමෙන්ම විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් විවිධ නිර්ණායක යොදා ගැනීම, රජය මගින් ලබා දෙන ප්‍රතිපාදන අවම මට්ටමක පැවතීම මෙයට හේතු ලෙස හඳුනාගත හැකිය. මේ අනුව රජය මගින් විශ්වවිද්‍යාල සඳහා ලබා දෙන ප්‍රතිපාදන ඉහළ දැමීම, විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර නොගන්නා පිරිස සඳහා රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වය දිරිමත් කිරීමේ අවශ්‍යතාවය මතුවේ.

**මුඛ්‍ය පද :-** විශ්වවිද්‍යාල ප්‍රවේශය, උසස් අධ්‍යාපනය, රාජ්‍ය විශ්වවිද්‍යාල

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# අ පො . ස ඃ උ/පෙළ විභාගය සඳහා සිසුන් සීඝ්‍රයෙන් උපකාරක පන්තිවලට යොමු වීම හරහා ඔවුන්ට සාර්ථක ප්‍රතිඵල ලැබේද?

ඩී. කේ. එම්. මලගල[1], ඩබ්. ඩබ්. එල්. සී. ජනන්ජනා

**සංක්ෂේපය**

වර්තමානය වන විට සිසුන් විවිධ ඉගෙනුම් ක්‍රියාවලි අතරින් අවිධිමත් යටතට ගැනෙන ටියුෂන් අධ්‍යාපනය කරා යොමුවෙමින් පවතී. මෙසේ උපකාරක පන්තිවලට සිසුන් යොමු වීම සාර්ථක ප්‍රතිඵල කෙරෙහි හේතු වේ ද? යන පර්යේෂණ ගැටලුව මුල් කරගෙන මෙම පර්යේෂණය සිදු කර ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ප්‍රදේශයෙන් උපකාරක පංතිවලට සහභාගී වන සිසුන් 100 ක ගෙන් යුත් නියැදියක් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගනිමින් සමීක්ෂණය කරන ලදී. ප්‍රශ්නාවලිය ඇසුරින් ප්‍රාථමික දත්ත රැස්කරන ලද අතර විස්තරාත්මක විශ්ලේෂණය භාවිතා කර දත්ත ඉදිරිපත් කරන ලදී. එම දත්ත හරහා ලබාගත් නිගමනය වූයේ උපකාරක පංති තුළින් සිසුන් බලාපොරොත්තු වන ආකාරයේ අධ්‍යාපනයක් ලැබුණ ද, ගුණාත්මක අධ්‍යාපනයක් නොලැබෙන බව 35.35%ක ප්‍රතිශතයක් ලද අතර උපකාරක පන්ති එකක් සඳහා සහභාගී වන සිඝුන්ගේ සාධන මට්ටම 55% ක් ද, උපකාරක පන්ති හතරකට සහභාගී වීමේ දී සිසුන්ගේ සාධන මට්ටම 55% ක ප්‍රතිශතයකින් පහළ ගොස් ඇති බවට සනාථ විය. මින් පර්යේෂණය හරහා එළඹිය හැකි නිගමනය වූයේ උපකාරක පංතිවලට සහභාගී වීම මත සිසුන්ගේ ප්‍රතිඵල ඉහළ ගොස් නැති බව යි. මේ අනුව පාසල් අධ්‍යාපනය විධිමත් කිරීමත්, පාසල් ගුරුවරුන්ගේ ඉගැන්වීම් රටාව ගුණාත්මක කිරීම යන යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

***මුඛ්‍ය පද ඃ උසස් පෙළ සිසුන්, උපකාරක පංති, පාසල් අධ්‍යාපනය***

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

kaushalyamadhubhashini11@gmil.com

# දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි ඇති බලපෑම

එස්. ජී. එල්. ඔමීගා හංසිනී[1], පී. ටී. පතිරණ

**සංක්ෂේපය**

දරුවෙකුගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි බුද්ධිය, ස්වෝත්සාහය, ඉගෙනුම් පරිසරය, ඉගෙනුම් ක්‍රියාවලිය හා සම්බන්ධිත බාහිර කරුණු බලපාන බව හඳුනාගත හැකිය. "බුද්ධිය" යන සාධකය සලකා බැලීමේදී ඒ සඳහා බලපානු ලබන ප්‍රධාන මූලබීජය වන්නේ, දෙමාපිය ජාන මත දරුවන්ට හිමි වන බුද්ධිය යි. නමුත්, ඉගෙනුම් සාර්ථකත්වය උදෙසා හුදු බුද්ධිය පමණක් ම හේතු සාධක වන බව පිළිගත නොහැක. ඒ සඳහා බුද්ධිය වර්ධනය කර ගැනීම උදෙසා කෙරෙන සතතාභ්‍යාසය, නව දැනුම සොයා යාම ආදී කරුණු වැදගත් වේ. පර්යේෂණයේ අරමුණ ලෙස දෙමාපිය අධ්‍යාපන මට්ටම් මත දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් කෙසේ වෙනස් වේද යන්න හඳුනා ගැනීමට යොමු වූ අතර මේ සඳහා මාතර දිස්ත්‍රික්කයේ හොරපාවිට ග්‍රාමය හා ගාල්ල දිස්ත්‍රික්කයේ ඇලකාක ග්‍රාමය තුළින් පොකුරු නියැදිම යටතේ පවුල් 80ක් තෝරාගෙන පර්යේෂණය සිදු කොට නිගමන ලබා ගන්නා ලදී. එනම් අප විසින් ලබා ගන්නා ලද නියැදි දත්තයන්ට අනුව ගණනය කරන ලද දෙමාපියන්ගේ සා/පෙළ සමත් වීමේ ප්‍රතිශතය 15.48% ක් වූ අතර එම අධ්‍යයනයෙන් ලබා ගන්නා ලද නියැදියට අනුව දරුවන්ගේ සා/පෙළ සමත් වීමේ ප්‍රතිශතය 84.52%කි. මෙමඟින් පැහැදිලි වන්නේ දෙමාපියන්ගේ අධ්‍යාපනය, දරුවන්ගේ අධ්‍යාපනය තීරණය වීම කෙරෙහි විශාල ලෙස බල නොපාන බවයි. මෙය තවදුරටත් නිවැරදි දැයි පරීක්ෂා කිරීම සඳහා සහසම්බන්ධතාව ගණනය කරන ලදී. මෙහිදී ං විචල්‍ය ලෙස භාරකරුගේ සා/පෙළ සමත් වීමේ ප්‍රතිශතය ද, හ විචල්‍ය ලෙස දරුවාගේ සා/පෙළ සමත් වීමේ ප්‍රතිශතය ද යොදා ගන්නා ලද අතර, සහසම්බන්ධතා සංගුණකය අගය 0.311 කි. ඒ අනුව පැහැදිලි වන්නේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් කෙරෙහි දෙමාපිය අධ්‍යාපන මට්ටම් බලපෑමක් කර තිබුණ ද දෙමාපියන්ගේ අධ්‍යාපනය දරුවන්ගේ අධ්‍යාපනය වෙනස් කිරීම කෙරෙහි විශාල බලපෑමක් සිදු කිරීමට සමත් වී නොමැති බවයි.

***මුඛ්‍ය පදඃ අධ්‍යාපන, මට්ටම, දෙමව්පියන්ගේ, දරුවන්ගේ***

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

omeegahansini10@gmail.com

# කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සංස්කෘතික මධ්‍යස්ථානයේ අමතර පාඨමාලාවන් සඳහා ශිෂ්‍ය සහභාගීත්වය අවම වීමට බලපාන සාධක

එම්. ඒ. රුශාන්ති දිල්ශානි[1]

**සංක්ෂේපය**

තරඟකාරී අධ්‍යාපන රටාව හා වෘත්තීය අභිමුඛ අධ්‍යාපනය නිසාවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය අද වන විට තරමක් දුරට ඒකාකාරී වෙමින් පවතී. එනිසාවෙන් වඩාත් අත්‍යවශ්‍ය කාරණයක් ලෙස විද්‍යාර්ථීන්ගේ මානසික තෘප්තිය ඇති කිරීම හා පීඩනය මග හරවා ගැනීම උදෙසා සෞන්දර්යාත්මක හෝ ක්‍රීඩා කටයුත්තක නියැලීම අවැසි ය. කැලණිය විශ්වවිද්‍යාලය මගින් ඒ සඳහා විද්‍යාර්ථීන් වෙත ලබා දී ඇති ඉඩ ප්‍රස්ථා සුලභ ය. එයින් කැලණිය විශවවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය ප්‍රමුඛස්ථානයක් ගනී. එහෙත් ඉන් නිසි ප්‍රතිඵල ලබා ගැනීමට වත්මන් ශිෂ්‍ය ප්‍රජාව අපොහොසත්ව ඇති බව අධ්‍යයනයන් මඟින් තහවුරු විය. එනිසාවෙන් කැලණිය විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් දියත් කරන අමතර පාඨමාලාවන් සඳහා ශිෂ්‍ය සහභාගීත්වය අවම වීමට බලපාන සාධක අධ්‍යයනය කිරීම අරමුණු කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. එහිදී අධ්‍යයන වර්ෂ හතර ආවරණය වන පරිදි සමාජීය, මානව ශාස්ත්‍ර හා වාණිජ හා කළමනාකරණ පීඨය තුළින් අහඹු ලෙස විද්‍යාර්ථීන් 200 කගෙන් යුත් නියැදියකින් ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. එලෙස ලබා ගත් දත්ත ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් විශ්ලේශණය කල අතර SPSS මෘදුකාංගය හා Excel මෘදුකාංගය භාවිතයෙන් සංඛ්‍යානමය විශ්ලේශණයන් සිදු කරන ලදී. එහිදී සංස්කාතික මධ්‍යස්ථානය පිළිබඳ දැනුවත් බව මදකම, අනිවාර්ය දේශන සඳහා වෙන් කරන ලද කාලය, අමතර පාඨමාලා පවත්වන වේලාව ප්‍රමාණවත් නොවීම හා භෞතික පහසුකම් අවම වීම යන කාරණා ශිෂ්‍ය සහභාගීත්වය අවම වීමට හේතු ලෙස ද  සමස්ත කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාවගෙන් අතලොස්සක් පමණක් මෙම පාඨමාලා සඳහා සහභාගී වන බවද ඔවුන් ජාතික මට්ටමේ ප්‍රගතියක් පෙන්නුම් කරන බව ද පර්යේෂණය මඟින් තහවුරු විය. එසේම දත්තයන්ගෙන් අනාවරණය වූ පරිදි 34% ක් පමණක් පාඨමාලා වල නිරත වන බව ද එම ප්‍රතිශතයෙනුත් 18% ක් පමණ අඛණ්ඩව දේශන වලට සහභාගී නොවන බව ද තහවුරු විය. තව ද දත්ත අතරින් පාඨමාලා කරන අයවලුන්ගෙන් 68% ක්ම ජායාරූපකරණය පාඨමාලාවට සහභාගී වූ පිරිස අතර සමස්ත පාඨමාලා වල නිරත අයගෙන් 81% ක්ම ගැහැණු ළමුන් විය.

***මුඛ්‍ය පද : පාඨමාලා, සංස්කෘතික මධ්‍යස්ථානය, සහභාගීත්වය, අනිවාර්ය දේශන***

---

[1]ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

rushanthidilshani@gmail.com

# A Study on the Effect of Urban and Rural Divide on Youth Development Index (YDI) in Sri Lanka

Thevuni K. Kotigala[1]

Youth development has become critical for young people worldwide, in order to realize their capabilities to pursue decent employment, education opportunities, health and wellbeing, as well as civic and political empowerment. As a result, Commonwealth YDI was built as a tool to measure relative youth development across countries. This study investigates on the effect of urban-rural division on a young person in determining their YDI level, as those have divergent facilities levels that clearly differentiate each sector. Hence, the study attempts to identify the difference in between the level of Youth Development in both identified sectors of Colombo district, within the age bracket of youth in between 18-34 years. A representative sample of 299 urban (Kolonnawa DS Division) and 86 rural (Homagama DS Division) youth were chosen using stratified sampling with proportionate allocation. Primary data collection method of survey questionnaires was used to gather data. Secondary data were obtained from Census of Population and Housing (2012), National Youth Survey III (2013) and UN Statistics on Sri Lanka (1990-2014). The sample data was tested for reliability and validity by using Cronbach's Alpha (above 0.7) and Bartlett's Test of Sphericity (P-value=0.00, KMO=0.927). With 95% confidence it can be stated that there is no population mean difference in YDI (T=-1.11/ P-value= 0.268) between urban (Avg. YDI=0.803) and rural (Avg. YDI=0.818) sectors. According to the results, the sector difference has not affected the YDI level of youth. Yet examining further, Colombo district has wide opportunities available for youth more than any other district, thus, this similarity presented in urban and rural YDI may not be seen in other districts. Thereby, the study provides strategic suggestions for Sri Lanka to improve on its youth development island-wide, by presenting recommendations for government and policy makers, civil society and youth, and finally for further researches.

**Keywords:** *Youth, Development, Sector, Youth Development Index*

---

[1] University of Sri Jayawardhanapura
thevunik@gmail.com

# මුහුණුපොත භාවිතය විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් කෙරේ ඇති කරනු ලබන බලපෑම (කැළණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

කේ. එම්. ඩී. ඇම්. තිලකරත්න[1]

**සංක්ෂේපය**

අන්තර්ජාල භාවිතය ඉගෙනුම් ක්‍රියාවලියේ විශේෂ මෙහෙවරක් කිරීමට සමත් ව ඇත. නමුදු මෙම අන්තර්ජාල භාවිතය තුළින් විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපනය හා හැසිරීම් රටාවන් කෙරෙහි ඉතා විශාල බලපෑමක් ඇති කිරීමට සමත් ව ඇති බව වර්තමානයේ කරන ලද පර්යේෂණ මඟින් තහවුරු කර ඇත. එලෙසකට අන්තර්ජාලයෙහි වන මෙම ඎමුහුණුපොත□ භාවිතය විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ට ඇති කරනු ලබන බලපෑම කෙබඳු ද යන්න සනාථ කොට ගැනීමට මෙම අධ්‍යනයෙහි අරමුණ වූයේ එලෙසකට බලපාන්නා වූ සාධක සෙවීමයි. මේ සඳහා කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා,කළමණාකරණ,මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා යන පීඨයන්හී විද්‍යාර්ථීන් 25 බැගින් ගෙන පොකුරු නියැදීම ක්‍රමවේදය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයන් යටතේ විද්‍යාර්ථීන් 100ක නියැදියක් තෝරා ගෙන දත්ත රැස් කොට විශ්ලේෂණය කරන ලදි. එලෙසකට නියැදියෙන් 90%ක්ම මුහුණුපොත භාවිතා කරන අතර ඒ සඳහා පැය 1-3 ත් අතර කාලයක් මුහුණුපොත භාවිත කරනු ඇත. එම නිසා පවුලේ සාමාජිකයින් සමග කටයුතු කිරීම හෝ අන්තර්ජාලය හරහා අනෙකුත් හරවත් දැනුම සෙවීමට ඇති කාලය අපතේ යැවීමක් සිදුවන බව මෙහිදී හෙලි කර ගැනීමට හැකි විය. තවද මුහුණුපොත භාවිතය විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ඍජුවම බලපා ඇති බව නිගමනය වේ. එලෙසකට මෙම ඇබ්බැහි විම අවම කරලීමේ ක්‍රියාවලියක් ලෙස විශ්වවිද්‍යාලය තුල අන්තර්ජාල පහසුකම් සීමා පැනවීම තුළින් සිදු කළ හැකි බව යෝජනා කළ හැකිය.

***මුඛ්‍ය පද: මුහුණුපොත, විද්‍යාර්ථීන්, අන්තර්ජාලය,විශ්වවිද්‍යාලය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය

# පාසල් ළමුන්ගේ විනය පිරිහීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්. ( ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්)

ආර්. ඩී. එස්. කේ. වීරසිංහ[1]

**සංක්ෂේපය**

පුද්ගලයෙකුගේ අනාගතය තීරණය කිරීම සම්බන්ධයෙන් විශාල කාර්යභාර්යයක් පැවරී ඇත්තේ අධ්‍යාපනයටයි. පාසල යනු රජය හා දෙමාපියන් ඒකරාශී වී අවශ්‍ය කරන සම්පත් යොදවමින් මනා පෞරුෂත්වයකින් යුක්ත වූ යහපත් පුරවැසියෙකු නිර්මාණය කිරීමට අඩිතාලම සපයන ස්ථානයයි. නමුත් වර්තමානය වන විට පාසල තුල විනය පිරිහීයාමක් දක්නට ලැබේ. මේ සඳහා බලපා ඇති හේතු සාධක ගැඹුරින් විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ අධ්‍යාපන කලාපයට ඇතුළත් පාසල් හතරකින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40 ක් ස්තෘත නියදීම යටතේ තෝරාගනු ලැබීය. සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය මගින් ප්‍රාථමික දත්ත ලබාගත් අතර ද්විතික දත්ත ලිඛිත මූලාශ්‍ර වන පොත්, වාර සගරා, පර්යේෂණ වාර්තා ඇසුරින් ලබාගන්නා ලදී. ලබාගත් දත්ත වගු හා ප්‍රස්තාර මගින් විශ්ලේෂණය කරනු ලැබීය. ඒ අනුව පාසල් ළමුන්ගේ විනය පිරිහීම කෙරෙහි බලපාන ප්‍රධානම සාධක ලෙස ළමුන්ගේ පවුල් පසුබිම හා පාසල තුළ ඉගෙනුම් ක්‍රියාවලියේ හා පරිපාලන ව්‍යූහයේ පවතින අක්‍රමිකතා බලපාන බව හඳුනාගැනීමට හැකිවිය. එහිදී 70% ක් පමණ ළමුන්ගේ පවුල් තුළ විවිධ ගැටලු පවතින බව අනාවරණය විය. ඒ අනුව අපචාර මගින් ළමුන් මුදවා ගැනීම සඳහා සිසුවෙකු ලෙස ඔවුන්ගේ වගකීම හා කාර්ය භාර්යය පිළිබඳ මනා වැටහීමක් ඇති කරවීම, ගුරු දෙගුරු හමුව තුළදී එක් එක් ශිෂ්‍යයා පිළිබඳව දෙමාපියන් හා සකච්ඡා කිරීම, දඩුවම් අවම කර හැකිතාක් උපදේශනසේවා සඳහා ළමුන් යොමු කරවීම, ළමුන්ගේ හැසිරීම පිළිබඳ දැනුම ලබානොදී විෂය කරුණු පමණක් ඉගැන්වීම මගින් සිසුන් අපචාර සඳහා යොමුවීමේ සම්භාවිතාව වැඩිවිය හැකිය. එමනිසා පාසල අධ්‍යාපනය තුළ ආකල්පමය පෝෂණයක්ද සිසුන් තුළ ඇතිකළ යුතුය. විනයැති,දැනුමැති පුද්ගලයා සමාජය තුළ ජීවත්වීමට සුදුසු පුද්ගලයෙකු බවට පත් වේ.එබඳු වූ පුද්ගලයා ධාර්මික සුවයක් ආශ්වාදනය කරන විනයගරුක පුරවැසියෙකු වනු ඒකාන්තය.

***මුඛ්‍ය පද : පාසල, අධ්‍යාපනය, සිසුන්, විනය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# වර්තමාන අධ්‍යාපන රටාව තුළ 5 වසර ශිෂ්‍යත්ව ක්‍රමය මගින් දරුවන්ගේ මානසික තත්ත්වයට සිදු කරන බලපෑම

ඩබ්. එම්. ඩබ්. එම්. විජේසිංහ[1]

**සංක්ෂේපය**

වර්තමාන අධ්‍යාපන රටාව තුළ ජනප්‍රිය නොවන පාසලක එසේ නැතහොත් ප්‍රාථමික විද්‍යාලවල අධ්‍යාපනය හදාරන දරුවෙකුට ජනප්‍රිය පාසලකට ඇතුළත් වීම සඳහා ඇති ප්‍රබලම අවස්ථාවක් ලෙස 5 වසර ශිෂ්‍යත්ව කඩඉම සමත් වීම පෙන්වා දිය හැක. මෙම ශිෂ්‍යත්ව කඩඉම සමත් කර ගැනීම සඳහා දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ දැඩි පෙළඹවීම මත දරුවන් මහන්සි වී අධ්‍යාපන කටයුතුවල නිරත වේ. මෙම පරීක්ෂණය මගින් 5 වසර දරුවාගේ මානසික ගැටලු පිළිබඳව විමර්ශනය කර ඇත ග මෙහිදී ඇති වූ ප්‍රධාන ගැටලුව ලෙස 5 වසර ශිෂ්‍යත්ව ක්‍රමය දරුවන්ගේ මානසික තත්ත්වයට සිදු කරන බලපෑම පෙන්වා දිය හැක. මේ සඳහා කුලියාපිටිය බටහිර අධ්‍යාපන කොට්ඨාසය තුළ ඇස්සැද්දුම සුභාරතී කනිෂ්ඨ විද්‍යාලයෙහි සිසුන් 40 ක නියැදියක් පහසු නියැදීම ක්‍රමය යටතේ තෝරාගෙන ඇත ග සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලියක් යටතේ දත්ත ලබා ගන්නා ලදී. මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වුයේ වර්තමාන අධ්‍යාපන රටාවට අනුව දරුවන් ශිෂ්‍යත්ව විභාගය සමත් කර ගැනීම සඳහා තම ළමා කාලය කැප කරමින් නොකඩවා අධ්‍යාපන කටයුතු වල නිරත වන බවයිග ඒ සඳහා දෙමාපියන්ගේ සහ ගුරුවරුන්ගේ දැඩි පීඩනයක් එල්ල වේ. එය කුඩා මනසට දැරිය නොහැකි නිසා ඔවුන් මානසික වශයෙන් පිරිහිමට පත් ව ඇති බව නිගමනය කළ හැකග මෙම පරීක්ෂණයෙහි ප්‍රතිඵල ලෙස මානසික ආතතිය, පැය 5ක පාසල් කාලයත් ඉන්පසු අතිරේක පන්තිත් පුනරීක්ෂණ අභ්‍යාසත්නිසා දරුවන් මානසික පීඩනයට ලක්වීම, වාර විභාග ලකුණු අඩුවීම තුළ තමා අදක්ෂයෙකු යැයි සිතමින් මානසිකව කඩා වැටීම, දරුවන් සෙල්ලමට කැමති වුවත් ඔවුන්ට එම අවස්ථාව නොලැබීම නිසා දරුවන් අධ්‍යාපනයට ඇති කැමැත්ත අඩු වීම, 1 වසර සිට 5 වසර දක්වා දරුවන්ට දිවා රෑ නොකඩවා අතිරේක පංති වලට සහභාගී වීමට සිදුවීම නිසා විනෝදාත්මක කටයුතු වල නිරත වීමට නොහැකි වේ. මේ හේතුවෙන් දරුවන්ගේ නිර්මාණශීලීත්වය ඉවත්ව ගොස් ඇත.

***මුඛ්‍ය පද : 5 වසර ශිෂ්‍යත්වය, ජනප්‍රිය පාසල්, දරුවාගේ මානසිකත්වය***

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# උසස් පෙළ උපකාරක පන්ති සඳහා සහභාගී වීම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිදු කරන බලපෑම (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

එස්. ඒ. ඩී. යාමිණී[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍ය ප්‍රතිඵල කරා ළඟා වීමට උපකාරක පන්ති සඳහා සහභාගීත්වය අනිවාර්ය කරුණක් ලෙස සමාජයේ මතයක් නිර්මාණය වෙමින් පවතී. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍ය මට්ටමේ උසස් පෙළ ප්‍රතිඵලයක් ලබා ගැනීමට උපකාරක පන්ති සඳහා සහභාගී වීම කොතෙක් දුරට බලපෑම් කරනවා ද යන්න මා මෙම පරීක්ෂණය ඔස්සේ සොයා බැලීය. ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 300ක නියදියක් තෝරාගත් අතර දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයන් ලෙස ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදී. දත්ත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රස්ථාර හා වගු භාවිත කළ අතර මෙහිදී ලබාගත් දත්ත ඇසුරින් ගොඩනගා ගත් කල්පිතය කොතරම් දුරට ප්‍රත්‍යක්ෂ වේද යන්න පරීක්ෂා කිරීම සඳහා කයි වර්ග පරීක්ෂාව යොදා ගත අතර ඒ අනුව අභිශූන්‍ය කල්පිතය ප්‍රතික්ෂේප විය. ඒ අනුව විචල්‍ය පරායත්ත බව හෙවත් උපකාරක පංති සඳහා සහභාගීත්වය, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ සාධන මට්ටම ළඟා කර ගැනීමට හේතු වී ඇති බව සනාථ විය. මෙහිදී හඳුනා ගත් විශේෂ ලක්ෂණයක් වන්නේ, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උචිත සාධන මට්ටමක් ළඟා කර ගැනීමට උපකාරක පංති කෙරෙහි යොමු නොවූ ඇතැම් පිරිස් එය අනිවාර්ය සාධකයක් නොවන බවට පිළිගැනීමත් ඉන් බහුතරයක් විවිධ දුෂ්කරතා හේතුවෙන් එම අවස්ථාවන් මගහැරී ගිය පිරිසක් වීමත් ය. නමුත් සමස්ථ ප්‍රතිඵලවලට අනුව නිගමනය වූයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍ය උසස් පෙළ ප්‍රතිඵලයක් කෙරෙහි උපකාරක පංති සඳහා සහභාගීත්වය අනිවාර්ය සාධකයක් බවයි.

***මුඛ්‍ය පද : විශ්වවිද්‍යාල ප්‍රවේශය, උපකාරක පන්ති, උසස් පෙළ ප්‍රතිඵල, විශ්වවිද්‍යාලය***

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dilekayamini94@gmail.com

# HEALTH

# බස්නාහිර පළාත තුළ විශාල ලෙස ඩෙංගු රෝගය පැතිර යාම පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක්.

ඩී. එස්. අබේසිංහ[1], කේ. කේ. ඩබ්. සුබෝදනී

**සංක්ෂේපය**

වර්තමානයේ තාක්ෂණයත්, මුදලත් පසුපස හඹා යන මිනිසාට තමා ජීවත් වන වටපිටාව කෙරෙහි සැලකිල්ලක් දැක්වීමට උනන්දුවක් නොපවතී. එහි එක් ප්‍රතිඵලයක් ලෙස ඩෙංගු රෝගය අද වන විට ශ්‍රී ලංකාව තුල සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. ඒ අනුව වර්තමානය වන විට බස්නාහිර පළාත තුළ ඩෙංගු රෝගීන් බහුලව වාර්තා වීම ගැටලුව ලෙස ගෙන අධ්‍යනයක් සිදු කිරීමට උත්සාහ ගත් අතර මෙකී අධ්‍යනයේ අරමුණ ලෙස වසර කිහිපයක් තුළ දී බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් සංඛ්‍යාවේ වර්ධනය පිළිබඳව සංසන්දනාත්මක විමසා බැලීමක් සිදු කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකාවේ වැඩිම ඩෙංගු රෝගීන් පිරිසක් වාර්තා වන බස්නාහිර පළාත පහසු නියැදීම යටතේ නියැදිය ලෙස තෝරා ගත් අතර 2013 වර්ෂයේ සිට 2017 සැප්තැම්බර් 22 දක්වා වාර්තා වූ රෝගීන් පිළිබඳ දත්ත මෙම පර්යේෂණය සඳහා භාවිතා කරන ලදී. ඒ අනුව 2013 වර්ෂයේ බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් 16540 ක් වාර්තා වූ අතර එය සමස්ත ශ්‍රී ලංකාවෙන්ම වාර්තා වූ රෝගීන් ප්‍රමාණයෙන් 51.59%කි. 2014 දී මෙම ප්‍රතිශතය 55.06%ක් වූ අතර බස්නාහිර පළාතෙන් වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව 26153කි. මෙය 2013ට සාපේක්ෂව ඩෙංගු රෝගීන් සංඛ්‍යාවේ වැඩි වීමකි. 2015 දී බස්නාහිර පළාතෙන් වාර්තා වූ රෝගීන් ප්‍රමාණය 15582 ක් වූ අතර එය 2014 සාපේක්ෂව රෝගීන් සංඛ්‍යාවේ අඩු වීමකි. එය සමස්ත ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ රෝගීන් ප්‍රමාණයෙන් 52.33%කි. 2016 දී බස්නාහිර පළාතෙන් රෝගීන් 27442 ක් වාර්තා වූ අතර එය සමස්ත ඩෙංගු රෝගීන් සංඛ්‍යාවෙන් 49.76%කි. 2015ට සාපේක්ෂව 2016 දී රෝගීන් ප්‍රමාණයේ වැඩි වීමක් දක්නට ලැබුනද සමස්ත රෝගීන් සංඛ්‍යාවේ වැඩි වීමට සාපේක්ෂව බස්නාහිර පළාතේ රෝගීන් සංඛ්‍යාවේ අඩු වීමක් දක්නට ලැබේ. 2017 සැප්තැම්බර් 22 වන විට බස්නාහිර පළාතෙන් වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව 67139 දක්වා වර්ධනය වීමක් දක්නට ලැබුනද සමස්ත රෝගීන් ප්‍රමාණයෙන් 43.42% ප්‍රතිශතයක් දක්වා අඩු වීමක් දක්නට ලැබේ. මේ අනුව සලකා බැලූ වර්ෂ කිහිපයේදී බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන්ගේ වැඩි වීමක් දක්නට ලැබුනද ප්‍රතිශතාත්මකව ගත් කල සමස්ත දිවයිනෙන්ම වාර්තා වූ රෝගීන් ප්‍රමාණයට වඩා එය අඩු සංඛ්‍යාවකි. එසේම අක්‍රමවත් ලෙස කසල බැහැර කිරීමත්, නගර නිසි පරිදි පිරිසිදු කිරීමේ වැඩ පිළිවෙලක් නොමැති වීමත්, අවිධිමත් කාණු පද්ධති තිබීමත් බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් බහුල වීමට හේතු වී ඇති බව නිගමනය කල හැකි විය. ඒ අනුව නිසි පරිදි කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් දියත් කිරීම මගින් ද රජය මගින් නගර පිරිසිදු කිරීමට නිසි අවධානයක් යොමු කිරීම මගින් ද ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මගින්ද ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කර ගත හැකිය.

***මුඛ්‍ය පද : ඩෙංගු රෝගය, බස්නාහිර පළාත, ව්‍යාප්තිය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

dinusha1991sewwandi@gmail.com

# උදෑසන ආහාරය පෙර පාසල් දරුවන්ගේ කායික සෞඛ්‍යයට ඇති කරන බලපෑම

කේ. එල්. අයි. බී. ගුණවර්ධන[1]

**සංක්ෂේපය**

සිසු කායික වර්ධනයක් සිදු වන්නේ පූර්ව ළමාවිය තුළ දී බැවින් පෙර පාසල් දරුවන් සඳහා නිසි පෝෂණයක් ලැබීම අත්‍යවශ්‍ය කරුණකි. පෙර පාසල් දරුවන්ට නිසි පෝෂණයක් ලැබීම ඔවුන්ගේ කායික සෞඛ්‍ය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට ඉවහල් වේ. මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ පෙර පාසල් දරුවන්ගේ කායික සෞඛ්‍යය හා සමබර ආහාර වේලක් ලබා ගැනීම අතර කිනම් සම්බන්ධයක් පවතීද යන්න සොයා බැලීමයි. පෙර පාසල් දරුවන්ගේ කායික සෞඛ්‍යය වර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. ඉමදුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් 43 ක සංගහනයකින් සසම්භාවීව තෝරා ගත් පෙර පාසල් 10 ක නියැදියක් අතුරින් ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡාවන් ඇසුරින් ප්‍රාථමික දත්ත ද පවුල් සෞඛ්‍ය සේවිකාව මඟින් ද්වීතික දත්ත ද රැස් කරන ලදී. ප්‍රස්තාර, වගු, ප්‍රතිශත, සහසම්බන්ධතාව, ප්‍රතිපායනය යන සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කරන ලදී. ඒ අනුව කායික සෞඛ්‍යය නිසි මට්ටමක පවතීද යන්න මැන බැලීම සඳහා ශරීර ස්කන්ධ දර්ශකය භාවිත කරන ලදී. ළමුන්ගෙන් 36% ක් සමබර ආහාර වේලක් දිනපතා ලබා ගැනීමට පුරුදුව තිබූ අතර ඔවුන්ගේ ශරීර ස්කන්ධ දර්ශක අගය ප්‍රශස්ථ මට්ටමක පැවතිණි. ළමුන්ගෙන් 64% ක්ෂණික ආහාර ලබා ගැනීමට පුරුදුව තිබූ අතර ඔවුන්ගේ ශරීර ස්කන්ධ දර්ශක අගය ප්‍රශස්ථ මට්ටමක නොපැවතිණි. ඒ අනුව සමබර ආහාර වේලක් ලබා ගැනීම හා කායික සෞඛ්‍යය අතර අනුලෝම සම්බන්ධයක් පවතින බව පැහැදිලි විය. පෙර පාසල් දරුවන්ගේ කායික සෞඛ්‍යය වර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග ලෙස දෙමව්පියන් පෝෂණය පිළිබඳ දැනුවත් කිරීම, සතියකට දින 2 ක් හෝ 3ක් කොළකැඳ ලබා දීම, සතියේ දින 7ට ආහාර වේල් 7ක් නියම කිරීම, මාස 3කට වරක් වත් වෛද්‍ය සායනයන් පැවැත්වීම මඟින් පෝෂණ ඌණතා හඳුනා ගැනීම වැනි යෝජනා ඉදිරිපත් විය.

***මුඛ්‍ය පද : පෙර පාසල් දරුවන්, පෝෂණය, උදෑසන ආහාරය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

bhagyaisuri2@gmail.com

# පාසල් ළමුන්ගේ පෝෂණය කෙරෙහි පාසල් විසින් ක්‍රියාත්මක කරන පෝෂණ ව්‍යාපෘතියේ ( උදෑසන ආහාර වේල) බලපෑම

ආර්.එම්.ටී.පී.ජයසේකර[1]

**සංක්ෂේපය**

සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට පෝෂදායි ආහාර වේලක් ලබා ගැනීම සහ උදෑසන ආහාර වේල නිසි පරිදි ලබා ගැනීම වර්ධනය වන වයසේ පසු වන පාසල් ළමුන්ගේ පෝෂණය ප්‍රශස්ත මට්ටමක පැවතීමට පාදක වේ. ඒ අනුව පාසල් ළමුන්ගේ පෝෂණය කෙරෙහි පාසල් විසින් ක්‍රියාත්මක කරන පෝෂණ ව්‍යාපෘතිය බලපෑමක් ඇති කරන්නේදැයි අධ්‍යනය කිරීම පර්යේෂණයේ අරමුණ විය. යන්නයි. කුරුණෑගල අධ්‍යාපන කලාපයේ ග්‍රාමීය හා නාගරික පාසල් අතරින් මෙම ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක කරන පාසල් 10 ක් සහ නොකරන පාසල් 10 ක සංගහණයකින් සසම්භාවිව තෝරා ගත් 7 සහ 10 ශ්‍රේණිවල සිසුන් 400ක නියැදියක් තෝරාගෙන සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලිය යන පර්යේෂණ ක්‍රමවේදයන් ඇසුරින් දත්ත රැස් කරන ලදී. එම දත්ත ප්‍රස්තාර, වගු, ප්‍රතිශත ආදී සංඛ්‍යාන ක්‍රමවේද යොදාගෙන විශ්ලේෂණය කරන ලදී. මෙහිදි ශරීර ස්කන්ධ දර්ශකය (BMI) අගය මෙන් ම ආහාරවල ස්වාභාවය, ගුණාත්මකභාවය යන සාධක සැලකිල්ලට ගනු ලැබිය. විශ්ලේෂණය කරන ලද දත්ත මත පාසල් විසින් ඉදිරිපත් කර ඇති පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන පාසල්වල දරුවන්ගේ BMI අගය පහත මට්ටමක පවතින බවත් විවිධ රෝගාබාධවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පැවතුනි. මෙම පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන පාසල්වල ළමුනගේ BMI අගය 70% මට්ටමේ පැවති අතර ක්‍රියාත්මක නොකරන පාසල්වල ළමුනගේ BMI දර්ශකය 30% වැනි පහළ මට්ටමක පැවතුනි. පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන නාගරික පාසල්වල ළමුන්ගේ උදෑසන ආහාරය සඳහා වැඩි වශයෙන් ක්ෂණික ආහාර ලබා ගැනීමේ නැඹුරුවක් දැක් වූ අතර ග්‍රාමීය පාසල්වල ළමුන් බහුතරයක් උදෑසන ආහාර ලබා නොගන්නා බව තහවුරු විය. ඒ අනුව නිගමනය වන්නේ පාසල් විසින් ක්‍රියාත්මක කරන පෝෂණ ව්‍යාපෘතිය පාසල් ළමුන්ගේ පෝෂණය කෙරෙහි ධන බලපෑමක් ඇති කරන බවයි. මෙම පෝෂණ ව්‍යාපෘතියට උදෑසන දිනපතා කොළ කැද, ධාන්‍ය වර්ග හා සමබල ආහාර වේලක් ලබා දීමටත් සහන මිලට කිරි විදුරුවක් ලබා ගැනීමට කිරිහලක් පවත්වාගෙන යාමටත් එමගින් ළමුන්ගේ සෞඛ්‍ය වර්ධනය කිරීමටත් මෙම ව්‍යාපෘතිය සියලුම පාසල්වල ක්‍රියාත්මක කිරීමට යෝජනා විය.

***මුඛ්‍ය පද : BMI අගය, උදෑසන ආහාර වේල, ළමා සෞඛ්‍ය, පෝෂණ ඌණතා***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

Thilinipj3057@gmail.com

# වකුගඩු රෝග ව්‍යාප්තිය හා කෘෂි රසායනික පොහොර භාවිතය බලපෑම

කේ. එම්. එම්. පී. කුලතුංග[1], එච්. ඒ. එන්. ඩී. හෙට්ටිආරච්චි, ඩී. එච්. බෝපිටිය

**සංක්ෂේපය**

වර්තමානයේ සමාජීය වශයෙන් බරපතළ ප්‍රශ්නයක් වන වකුගඩු රෝගය මේ වනවිට උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රබලම සෞඛ්‍ය ගැටලුවක් බවට පත්ව ඇත. මෙම පර්යේෂණය මෙහෙයවන ප්‍රධාන අරමුණ ලෙස රෝගීන් මෙම රෝගය පිළිබඳ ඇති නොදැනුවත්භාවයත් කෘෂි රසායනික පොහොර භාවිතය හා ඒවා බැහැර කිරීමේ දී ඒ පිළිබඳ ජනතාවගේ ඇති දැනුවත්භාවය පිළිබඳ සොයා බැලීමත් මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වී ඇත. මේ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රී පුර ප්‍රදේශයේ පුද්ගලයින් 10ක නියැදියක් ගෙන ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් ප්‍රාථමික තොරතුරු රැස්කර ගන්නා ලදී. මෙම අධ්‍යනය තුළින් රෝගය හඳුනා ගැනීමේ ලක්‍ෂණ ලෙස වමනය, අධික මුත්‍රා පහවීම, අධික තෙහෙට්ටුව, හිසරදය හා ඇඟේ දුර්වලකම වැනි ලක්‍ෂණ ඉස්මතු වී පෙනුණු අතර අඩු ආදායම් ලබන්නන් තුළ මෙම රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති බවට සාධක හමුවිය. එසේ ම බහුතරයක් ගොවීන් කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ දී හා භාවිතා කිරීමෙන් පසු ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය නොකරන බවට මෙම පර්යේෂණය තුළින් දක්නට ලැබිණි. එසේ ම බහුතරයක් වකුගඩු රෝගීන් විධිමත් ජල මූලාශ්‍ර බීමට හා වෙනත් කටයුතු වලට භාවිතා නොකරීම මෙම රෝග ව්‍යාප්තියට සාධකයක් වී ඇත. මෙම රෝගයට බහුල වශයෙන් ගොදුරු වී ඇත්තේ අවු. 35-40 අතර අය බැවින් අවු. 20ට අඩු අය නියමාකාරයෙන් දැනුවත් කිරීම තුළින් අනාගතයේදී මෙම රෝගය ව්‍යාප්තිය පාලනය කර ගත හැකිය. එසේම කෘමිනාශක භාවිතයේදී නිවැරදි ක්‍රමවේදයක් භාවිතා කිරීම, ජලය පිරිපහදු කර පානය කිරීම ආදී ක්‍රම මගින් ද මෙම රෝග ව්‍යාප්තිය පාලනය කර ගත හැකි බවට නිගමනය කරන ලදී.

***මුඛ්‍ය පද : වකුගඩු රෝග, පොහොර භාවිතය, ගොවිතැන***

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

nuwanthipiyumika@gmail.com

# Economic Burden of Diabetes Mellitus

L. N. Liyanage[1]

## Abstract

Diabetic prevalence has raised faster in low and middle income countries than in high income country. There were 1.16 million cases of diabetes in Sri Lanka. Direct, indirect and intangible economic costs are affecting for diabetes patients. Therefore the purpose of this study was to determine the economic burden of diabetes. The data were obtained from a cross sectional survey conducted through a structured questionnaire. Descriptive statistics including mean, standard deviation, frequency, proportion, range and percentage and inferential statistics comprising $\chi2$ test, T test and logistic regression were used to analyze the data using SPSS and Excel. Average treatment cost was significantly higher in the urban community than in the rural area. Both direct and indirect costs were significantly higher in the urban community than in the rural community. Cost of treatment was significantly higher [$\chi2=18.67$ $p=0.028$] among the urban diabetic patients with longer duration but it was not significant in rural community. The total productive day lost by employed type-2 diabetics was in rural area was 17% while in urban area it was 23%. The research has identified that urban area people suffer from diabetic mellitus than rural area. As well as urban area people had the greatest burden than the rural area people.

**Key Words:** *Diabetes Mellitus, Economic Burden, direct cost, Indirect Cost, Intangible cost*

---

[1]Department of Social Statistics, University of Kelaniya
lashi.navi@gmail.com

# ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජ,ආර්ථික සාධකයන්හි ප්‍රවණතාවය විමසීම (සාහිත්‍ය විමර්ශනය ඇසුරින්)

එල්. එල්. ආර් ලොරෙන්සුහේවා[1]

**සංක්ෂේපය**

නිදන්ගත වකුගඩු රෝගය ලෝක ව්‍යාප්ත ප්‍රධාන සෞඛ්‍ය ගැටලුවක්ව පවතී. ශ්‍රී ලංකාවෙහි මෙම රෝගය වියළි කලාපයෙහි කෘෂි ජීවන පරිසරය සමග ව්‍යාප්ත වීම දැකගත හැකිය. රෝගය වැළදීම සඳහා නිශ්චිත හේතුවක් සොයා ගැනීමට නොහැකි වී ඇත. ක්‍රමක්‍රමයෙන් වකුගඩුවල ක්‍රියාකාරීත්වය පිරිහෙන අතර කාලයත් සමඟ මෙය රෝගියාට පමණක් නොව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ද බලපෑම් එල්ල කරනු ලැබේ. උතුරුමැද පළාතෙහි ප්‍රධාන සෞඛ්‍ය ගැටලුවක් ලෙස මෙම රෝගී තත්ත්වය දැක්විය හැකිය. නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජ ආර්ථික සාධක මොනවා ද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයෙහි අධ්‍යයන ගැටලුව වේ. එමෙන්ම මෙම පර්යේෂණයෙහි අධ්‍යයන අරමුණ වන්නේ නිදන්ගත වකුගඩු රෝග ව්‍යාප්තිය සඳහා බලපාන ප්‍රධාන සාධක රාශියක් පවතින බව පෙන්වා දීමයි. මෙය සාහිත්‍ය විමර්ශන අධ්‍යයනය තුළින් සිදු කරන ලදී. එහිදී පර්යේෂණ ලිපි සියයක් යොදාගත් අතර එමගින් අධ්‍යයන අරමුණු සඳහා නොගැලපෙන ලිපි හතළිහක් ඉවත් කරන ලදී. මෙහිදී පර්යේෂකයන් විසින් යෝග්‍ය පර්යේෂණ ක්‍රමවේදයන් අනුගමනය කර ඇත. සරල සම්භාවීව තෝරාගන්නා ලද රෝගීන් අතුරින් පර්යේෂණ බොහොමයක් සිදු කර ඇත. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමය යොදා ගැනීමත් ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය අනුගමනය කරමින් දත්ත රැස් කිරීමත් බොහෝ පර්යේෂණ තුළදී සිදුව ඇත. එමෙන්ම දත්ත විශ්ලේෂණ කාර්යය සඳහා බහුගුණ ප්‍රවර්ධන ප්‍රතිපායන ක්‍රමවේදයන් භාවිත කිරීම දැකගත හැකි විය. දියුණු රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවෙහි වකුගඩු රෝග ව්‍යාප්තිය වෙනස් ස්වරූපයක් ගනු ලබයි. බොහෝ පර්යේෂකවරුන්ගේ අදහස වනුයේ කෘෂිකර්මාන්තයේ අහිතකර ප්‍රතිඵල හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වන බවයි. රෝග ව්‍යාප්ත වීමට බලපාන සාධකයන් ලෙස කෘමි නාශක භාවිතය, රසායනික පොහොර භාවිතය, බැර ලෝහ ශරීරගත වීම, ආසනික්වල බලපෑම, මද්‍යසාර සහ දුම්වැටි භාවිතය වැනි සාධක ප්‍රබලව බලපෑමක් එල්ල කරන බව හඳුනා ගෙන ඇත. මීට අමතරව ස්ත්‍රී පුරුෂ බව, ආහාර රටාව, ජීවන රටා, අධ්‍යාපනය, වැනි සමාජයීය සාධක ද දරිද්‍රතාවය, විරැකියාව වැනි ආර්ථික සාධක ද මෙම රෝග ව්‍යාප්තිය සඳහා හේතුවන බව පර්යේෂකයින්ගේ අවධානයට ලක්ව ඇත.

***මුඛ්‍ය පද :  නිදන්ගත වකුගඩු රෝගය, සමාජයීය සාධක, ආර්ථික සාධක***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

rangani22lorensuhewa@gmail.com

# ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන හේතු සාධක

එන්. කේ. අයි. ටී. නමුණුකුල[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවෙහි බොහෝ ප්‍රදේශයන්හි පැතිරුණු ඩෙංගු උවදුර සඳහා බලපාන හේතු සාධක සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. ඒ සඳහා 2017 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා ඩෙංගු රෝගීන් විශාල සංඛ්‍යාවක් වාර්තා වුණු රත්නපුර දිස්ත්‍රික්කයෙහි පවතින්නා වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස 17න් වැඩිම ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් වාර්තා වුණු කුරුවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය නියැදිය ලෙස තෝරා ගත් අතර එයට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස 6 මුල්කරගෙන මෙම පර්යේෂණය සිදු කෙරුණි. මේ සඳහා ද්විතික දත්ත මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් සපයා ගැණුනි. එම ආයතනය මඟින් නිකුත් කරනු ලබන අත් පත්‍රිකා, පෝස්ටර්, ලිපි ලේඛන ආදිය පරිශීලනය කිරීම සිදුවිය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ලබා ගත් දත්තවලට අනුව තීරු ප්‍රස්තාර, වෘත ප්‍රස්තාර ආදිය නිර්මාණය කිරීමෙන් දත්ත විශ්ලේෂණය සිදුවිය. ඩෙංගු රෝගය කෙරෙහි මූලික වශයෙන් මිනිස් ක්‍රියාකාරකම් බලපානු ලබන බව කැපී පෙනෙන කරුණක් වන අතර එයට හේතුව ඩෙංගු රෝගය ඇතිකරනු ලබන වෛරසය මිනිස් ශරීරයට ශරීරගතකරන ඊඩිපස් වර්ගයේ ගැහැණු මදුරුවන් ව්‍යාප්ත වීමට අවශ්‍ය පරිසරය ගොඩනගනුයේ මිනිසා නිසාය. එනම් මෙම මදුරුවන් බෝ වීමට අවශ්‍ය පිරිසිදු ජලය, නිවාසවලින් ඉවත් කරනු ලබන ප්ලාස්ටික්, වීදුරු ටින් ආදිය තුළ මෙන්ම වැහි පීලි, ටැංකි, බැරල් ආදියෙහි එක් රැස් වීමයි. එලෙස එක් රැස් වුණු පිරිසිදු ජලයෙහි ඩෙංගු මදුරුවන් බිහි වී ඩෙංගු රෝගය ව්‍යාප්ත කරයි. මේ ආකාරයට නිවාස ආශ්‍රිතව පමණක් නොව පාසල, පංසල්, රැකියා ස්ථාන, කර්මාන්තශාලා ආදියෙහි අවට පරිසරය අපවිත්‍රව පැවතීම ඩෙංගු වර්ධනය කෙරෙහි බලපානු ලබයි. එමෙන්ම ජනතාව මෙම රෝගය පිළිබඳව වැඩි අවධානයකින් නොසිටීමද ඩෙංගු රෝගය වර්ධනය කෙරෙහි බලපානු ලබයි. ඩෙංගු මදුරුවා සාමාන්‍යයෙන් උදෑසන සහ සවස් කාලය තුළ සැරිසරන අතර එම කාලය තුළ අවධානයෙන් සිටිමින් මදුරුවන් දෂ්ට කිරීමට අවශ්‍ය ඉඩකඩ අහුරා නොසිටීමද මේ සඳහා හේතු වී ඇත. එමෙන්ම  නිවසෙහි සාමාජිකයෙකුට උණ තත්ත්වය පවතින්නේ නම් ඒ පිළිබඳව අවධානය යොමු නොකොට දින කිහිපයක් ප්‍රතිකාර නොගෙන සිට රෝගය උත්සන්න වූ පසු රෝහල් කරා යාමද මෙම රෝගය නිසා ජීවිත බොහෝ ගණනක් බිලි ගැනීමට හේතු වී ඇත. ඩෙංගු රෝගය ව්‍යාප්තවීම කෙරෙහි මූලික වශයෙන් විවිධ හේතු බලපාන බවත් එකී හේතුවලට පිළියම් යෙදීම මඟින් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම යම්තාක් දුරකට අවමකර ගත හැකි බවත් නිගමනය කරගත හැකි විය.

***මුඛ්‍ය පද : ඩෙංගු රෝගය, ව්‍යාප්තවීම***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

dinuthathsarani05@gmail.com

# ශ්‍රී ලංකාවේ පිලිකා රෝගය පිළිබඳ අධ්‍යයනයක්

ඊ. එම්. එන්. විජේරත්න[1]

**සංක්ෂේපය**

පිලිකාව යනු වයස් භේදයකින් තොරව ව්‍යාප්තවන මාරාන්තික රෝගයකි. මෙම රෝගයෙහි වර්තමාන තත්වය අධ්‍යයනය කිරීමේ අරමුණින් යුතු පර්යේෂණ මාතෘකාවට අදාල තොරතුරු ද්විතීක දත්ත මුලාශ්‍ර භාවිතයෙන් සොයා ගන්නා ලද අතර මහරගම පිලිකා රෝහල මගින් ලබාගත් දත්ත සහ අන්තර්ජාලය මෙහිදි භාවිතා කර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම භාවිත කර ඇති අතර මෙම රෝගය සදහා වන හේතු විශ්ලේෂණයේදී පහත කරුණු අනාවරණය විය. එනම්, මෙම රෝගය වැලදී ඇති පුද්ගලයින්ගෙන් 79% ක් වෛරස් ආසාදනය මගින් ද, 35%ක් ආහාර රටාවේ දුර්වලතාවයෙන් ද, දුම්කොළ භාවිතයෙන් 30%කට ද, විකිරණය හේතුවෙන් 5%කට ද, හිරු එළිය ආසාදනයෙන් 10%ක් ද, වෘත්තිමය සාධක හේතුවෙන් 4%ක්ද, මත්පැන් හේතුවෙන් 3%ක් ද, වෙනත් හේතූන් නිසාවෙන් 10%කට ද මෙම රෝගය වැලදී ඇත. තවද මෙම රෝගය ක්‍රමයෙන් වර්ධනය වන අතර 2010 වර්ෂයේදී පිලිකා රෝගීන් සංඛ්‍යාව 16, 963ක් වශයෙන් සටහන් වු අතර 2013 වර්ෂය වනවිට එය 25, 842ක් වශයෙන් වර්ධනය වී ඇත (මහරගම රෝහල, වාර්ෂික වාර්තාව). වයස් ඛාණ්ඩ අනුව පිලිකා රෝගීන් වර්ග කර දැක්වීමේදී, එක් එක් වයස් ඛාණ්ඩ අනුව පිලිකාවට ගොදුරු වී ඇති පුද්ගලයින් ප්‍රතිශතය, 0-9 අතර 1.819%ක්ද, 10-19 අතර 1.2%ක් ද, 20-30 අතර 2. 58%ක් ද, 30-50 අතර 17.51%ක් ද, 50-70 අතර 42.48%ක් ද, 70 වැඩි පිරිස 16.25%ක් ද වශයෙන් වාර්තා වී ඇත (මහරගම රෝහල, වාර්ෂික වාර්තාව). ඒ අනුව දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය වුයේ, පිලිකාව ප්‍රධාන වශයෙන් ව්‍යාප්තව පවතින්නේ වයස අවුරුදු 50-70 අතර වැඩිහිටි ජනගහනයටයි. කාලයත් සමඟ ඔවුන්ගේ අයහපත් පුරුදු හා ආහාර රටාව මෙයට බලපා ඇති බව නිගමනය කල හැකිය. එමෙන්ම වෛරස් ආසාදනයන් හේතුවෙන් මෙම රෝගය පුද්ගලයන්ට වැලදෙන බවද ගම්‍ය වේ. එනම් යම් වෛරස් ආසාදනයන් හේතුවෙන් සිරුරේ සිදුවන යම් වෙනස්වීමක් හේතුකොට ගෙන පිලිකාව වැලදෙන බව සනාථ වේ. එමෙන්ම මිනිසුන්ගේ අයහපත් ආහාර රටාවද බලපාන බව තහවුරු වේ. තවද පිලිකා රෝගයට බලපාන සාදක එකිනෙකට සම්බන්ධතාවයක් දක්වන බවයි. ඒ අනුව කුඩා දරුවන්ට සාපේක්ෂව මෙම රෝගය වැලදීමේ ප්‍රවණතාව ඉතා අඩු බවත්, පුද්ගල ජීවිතයේ පවතින අයහපත් පුරුදු අඛණ්ඩව පැවතීම හේතුවෙන් බොහෝ පිරිසක් මෙම රෝගයට ගොදුරු වී ඇත. එම හේතුවෙන් අයහපත් පුරුදුවලින් තොර, නිවරැදි ආහාර රටාවකට හුරුවීම මගින් මෙම රෝගී තත්ත්වය අවම කරගත හැකි බව මාගේ නිගමනයයි.

***මුඛ්‍ය පදඃ අයහපත් ජීවන රටාව, පිලිකාව***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

jeevagb@gmail.com

# INDUSTRIAL AND INFORMATION TECHNOLOGY

# සේවක තෘප්තිමත්භාවය සහ රැකියා කාර්යසාධනය අතර පවතින සම්බන්ධය හඳුනා ගැනීම (කොග්ගල නෝබල්වෙයා පුද්ගලික සමාගම ඇසුරෙනි)

කේ. කේ. එස්. යූ. ඉෂාරි උබේසේකර[1]

**සංක්ෂේපය**

කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ ඇඟළුම් කම්හල් රාශියක් පවතී. මේ අතරින් අන්තර් ජාතික ලෙසින් ද ප්‍රචලිත යුනිවෙලා, බ්‍රැන්ඩෙක්ස් යන කම්හල් සෙසු කම්හල් අභිබව යමින් වැඩි සේවක ප්‍රමාණයක් අත්කරගෙන සිටී. නෝබල්ස්වෙයා හි මහන යන්ත්‍ර ක්‍රියාකරුවන් ද ඔවුන් වෙත ආකර්ශණය වෙමින් පවතින බව ආයතනයේ බැහැරවීමේ සේවක දත්ත මඟින් පෙන්නුම් කරයි. ඒ අනුව නෝබල්ස්වෙයා පුද්ගලික සමාගමේ මහන යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ රැකියා තෘප්තිමත් බව සහ කාර්යසාධනය අතර සම්බන්ධයක් පවතී ද, යන ගැටලුව මත මෙම අධ්‍යනය පදනම් වේ. "රැකියා තෘප්තිමත්භාවය සහ රැකියා කාර්යසාධනය අතර දැඩි සම්බන්ධයක් ඇත", යන කල්පිතය ඔස්සේ උක්ත වූ සංකල්ප අතර පවතින සම්බන්ධතාවයේ ආකාරය කෙබඳු ද යන්න පරීක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ආයතනයේ මහන යන්ත්‍ර ක්‍රියාකරුවන් 200 දෙනෙකු අතරින් 50 දෙනෙකු අහඹු නියැදීමය යටතේ තෝරා ගනිමින් ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලියක් ආධාරයෙන් සිදු විය. රැකියා තෘප්තිමත්බව සංකල්පය මැනීමට නිර්ණායක 6ක් භාවිතා විය. ඒවා නම් මූලික වැටුප, සුපරීක්ශණය, රැකියා තත්ත්වය, උසස් වීම් ලැබීමට ඇති අවස්ථා, කළමණාකාරීත්වයේ සහයෝගය සහ ප්‍රතිලාභ යන්නයි. රැකියා කාර්ය සාධනය මැනීමට ගති ලක්ශණ න්‍යාය, හැසිරීම් න්‍යාය සහ ප්‍රතිඵල න්‍යාය යොදා ගන්නා ලදි. මේවා පාදක කරගනිමින් ප්‍රකාශනයන් සකස් කළ අතර ඒ සඳහා ලැබෙන ප්‍රතිඵල අගය කිරීම ඒකක පහක ලිකර්ට් පරිමාණය (Five Point Likert Scale) භාවිතා විය. දත්ත විශ්ලේෂණයට SPSS මෘදුකාංගයෙහි සහසම්බන්ධතා සංගුණකය භාවිතා විය. එහිදී රැකියා තෘප්තිමත් බව සහ කාර්යසාධන්යෙහි මධ්‍යන්‍ය අගයන් ගණනය කරන ලදි. සහසම්බන්ධතා සංගුණකයේ අගය 0.571ක් විය එය ධන අගයකි. එබැවින් මහන යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ රැකියා තෘප්තිමත්බව සහ කාර්යසාධනය අතර ධන සම්බන්ධයක් පවතින බව ප්‍රකාශ කළ හැකි වේ. එය ප්‍රතිශතයක් ලෙස ගත්විට 57.1කි. එය 50ට වඩා වැඩි අගයක් බැවින් රැකියා තෘප්තිමත් බව සහ කාර්යසාධනය අතර දැඩි ධන සම්බන්ධයක් ඇති බව පෙන්නුම් කළ හැකිය. ඒ අනුව ගොඩනගා ගත් කල්පිතය ද පිළිගත හැකි වේ.

***මුඛ්‍ය පද - රැකියා තෘප්තිමත්බව, රැකියා කාර්යසාධනය, නෝබල්ස්වෙයා***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

ishariubesekara@gmail.com

# Factors relating to work stress among female nurses in private and public hospitals

M. A. Rushanthi Dilshani[1]

## Abstract

Occupational stress as a recognized problem in the modern era, is vital and important. Stress is influence on work place. Nursing is one of the stressful professions. Nurses play an important role in this field to uplift the health development. According to that the government spent a large amount of money for health service per year. Because of that this research aimed to reveal the stress level of nursing occupation in Sri Lanka. The objective of this study is to review trend of the workplace stress in nursing. In this study, 180 nurses were selected among nurses working in surgical, internal and psychiatric wards of 2 public hospitals and 2 private hospitals in Medical Officers of Health area of Dompe. Data were collected using questionnaires, and Statistical analysis was done using SPSS software. Analysis of variance (ANOVA) were used as main analysis method. According to the findings, Stress of nurses has been linked to reduce physical and psychological health, reduce job satisfaction, increase sickness absence and poorer job commitment. The findings suggest that occupational stress varies within different wards in the hospitals. Occupational stress should be prevented and controlled early and nurses should be supported in this regard.

**Keywords:** *occupational stress, workplace, Nurses, Health, physical*

[1] Department of Economics, University of Kelaniya
rushanthidilshani@gmail.com

# කැලණිය විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ටී. ඩී. එච් දර්ශා[1]

**සංක්ෂේපය**

පරිගණක හා අන්තර්ජාල යනු වර්තමාන සමාජයේ සුවිශේෂී අංගයන්ය. 21 වන සියවස ආරම්භයේ සිට මිනිසාගේ සෑම ක්‍රියාවලියකම තීරකයා බවට පත් වීමට අන්තර්ජාලයට හැකියාව ලැබී ඇත. රටක ඉහළම දැනුම් පරාසයක් හිමි විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය ඉහළ මට්ටමකට පවතී. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පහලොව අතරින් සෙසු ප්‍රදේශවලට සාපේක්ෂව කොළඹ අවට විශ්වවිද්‍යාල සියල්ලෙහි පරිගණක හා අන්තර්ජාල පහසුකම් භාවිතය සාධනීය මට්ටමක පවතී. විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය කෙසේ සකස් වන්නේද යන්න අධ්‍යනය කිරීම මූලික අරමුණ වේ. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පළමුවන වසර හා සිව්වන වසර ආශ්‍රය කර ගනිමින් මෙම අධ්‍යනය සිදු කෙරුණි. එහිදී ශිෂ්‍යයන් 200ක සසම්භාවී නොවන නියදුම්කරණ ක්‍රමය යටතේ අධ්‍යනය සඳහා යොදා ගන්නා ලදි. එහිදී ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදි. දත්ත විශ්ලේශනය සඳහා Excel මෘදුකාංගය භාවිතා කරමින් වගු ප්‍රස්තාර යොදා ගනිමින් දත්ත විශ්ලේශනය කරන ලදි. එහිදී ලද නිගමනයන්ට අනුකූලව ශිෂ්‍යයන්ගෙන් 75% ක් ග්‍රාමීය ප්‍රදේශයන්ගෙන්ද 25% නාගරික ප්‍රදේශයන්ගෙන්ද නියෝජනය කරනු ලබයි. නාගරික ප්‍රදේශවල 15% ක් අන්තර්ජාලය භාවිතය පිළිබඳ දැනුවත්භාවයෙන් යුක්ත විය. ග්‍රාමීය ප්‍රදේශවල ශිෂ්‍ය ප්‍රජාවෙන් 35% ප්‍රමාණයකට අන්තර්ජාල භාවිතය හා පරිගණක භාවිතයට හැකියාව ලැබුණි. 35% ප්‍රමාණයක් විශව් විද්‍යාලට ඇතුලත් වීමේදී අන්තර්ජාලය හෝ පරිගණක සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයකින් යුක්ත නොවුණි. 10%ට පමණ ප්‍රමාණයක් පරිගණකය එක් වරක් හෝ භාවිතා කර නොතිබුණි. වර්ෂ තුනක් අවසානයේ නියැදියෙන් 96%ක් පරිගණක හා අන්තර්ජාල භාවිතය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයකින් යුතු වූවන් බව නිගමනය කළ හැකිය. මොවුන්ගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය දෛනික ක්‍රියාවලිය බවට පත් වීමද එම ක්ෂේත්‍රයේම 40% ක ප්‍රමාණයක් රැකියාවන් හි නිරත වීමට සුදුසුකම් සපුරා ගෙන ඇති බවත් අනාවරනය විය. වැඩමුළු සංවිධානය, පරිගණක අධ්‍යාපනය සෑම ශිෂ්‍යයකුටම අනිවාර්ය කිරීම තුළින් පරිගණක හා අන්තර්ජාල භාවිතය තවදුරටත් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

***මුඛ්‍ය පදඃ පරිගණකය, අන්තර්ජාලය, විශ්වවිද්‍යාල, සමාජ විද්‍යා පීඨය***

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාල

tdhdarsha@gmail.com

# ශ්‍රී ලංකාව තුල මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණයට පවතින බාධක ( දකුණු පළාත ඇසුරින්)

එච්. ජී. අයි. එස්. එච්. ගමගේ[1]


**සංක්ෂේපය**

පුස්තකාල ආරම්භය හා විකාශය දුරාතීතයකට හිමිකම් කියනු ලබන අතර තාක්ෂණයේ දියුණුවත් මානවයාගේ කාර්යබහුලත්වයත් හේතුකරගෙන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කෙරෙහි වඩාත් නැඹුරු වී ඇත. ලෝකයේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය යනු දශක ගණනාවක සිට සිදුකෙරෙන අතර තුන්වන ලෝකයේ රටක් වූ ශ්‍රී ලංකාව තුල පුස්තකාල ස්වයංක්‍රීයකරණ මෘදුකාංග භාවිතය මීට දශක දෙකකට පමණ පෙර සිට ප්‍රචලිත විය. නමුත් ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රීයකරණ මෘදුකාංග භාවිතය කෙරෙහි අවම නැඹුරුතාවයක් දක්වීම දැකිය හැකිය. ජාතික පුස්තකාලය, විශ්වවිද්‍යාල පුස්තකාල, පාසල් පුස්තකාල, මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල වශයෙන් ශ්‍රී ලංකාව තුල ප්‍රධාන පුස්තකාල වර්ග පහක් පවතින අතර යම් තරමක හෝ දියුණු ස්වයංක්‍රීයකරණ ක්‍රම භාවිතයට ගනු ලබන පුස්තකාල ලෙස විශ්වවිද්‍යාල පුස්තකාල හා විශේෂ පුස්තකාල දැක්විය හැකිය. මෙම පර්යේෂණය තුල ස්වයංක්‍රීයකරණ මෘදුකාංග භාවිතය පිළිබඳ තොරතුරු රැස් කිරීම මහජන පුස්තකාල සඳහා පමණක් සීමා කර ගන්නා ලදි. නගර සභා, මහ නගර සභා, ප්‍රාදේශයී සභා ආදිය මගින් පාලනය කෙරෙනු ලබන මහජන පුස්තකාල අතුරින් ස්වයංක්‍රීයකරණ මෘදුකාංග භාවිතයට ගනු ලබන පුස්තකාල පවතින්නේ සීමිත වශයෙනි. මෙම අධ්‍යනයේ ගැටළුව ලෙස මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය සහ ඒ සඳහා පවතින බාධක කවරේද? යන්න යොදා ගැනුනි. එම පර්යේෂණ ගැටළුව ඔස්සේ කෙරෙන මෙම අධ්‍යනයෙහි ප්‍රධාන අරමුණ වශයෙන් මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය සහ ස්වයංක්‍රීයකරණයට පවතින භාධකයන් පිළිබඳ අධ්‍යනය කිරීම සිදු කළ අතර මීට අමතරව ස්වයංක්‍රීය කරනයට පවතින බාධකයන්ට තුඩු දුන් සාදක මොනවාද?, එම බාධක මඟ හරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද? යන්න විමසීම සෙසු අරමුණු විය. මෙම අධ්‍යනය දකුණු පළාතට අයත් මහජන පුස්තකාල 25ක් නියැදියක් ලෙස භාවිතයට ගනිමින් සමීක්ෂණ ක්‍රමය ඇසුරින් ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ඔස්සේ අධ්‍යනය කළෙමි. මෙහිදී පුස්තකාල ස්වයංක්‍රීයකරණය පවතින බාධක වශයෙන් පුස්තකාලයට හිමිවන මූල්‍ය ප්‍රතිපාදන හිඟකම, තාක්ෂණික දැනුම අවම වීම, ආයතන ප්‍රධානීන්ගේ නොදැනුවත් භාවය, පුස්තකාලය සතු සම්පත් ස්වයංක්‍රීයකරණ පද්ධතියකට ඇතුලත් කිරීමට අවශ්‍ය මානව සම්පත් අවම වීම ආදී කරුණු මහජන පුස්තකාල ස්වයංක්‍රීය මෘදුකාංග භාවිතය කෙරෙහි නැඹුරු නොවීමට සාධක වශයෙන් හඳුනා ගැනීමට හැකි විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉහළ නැංවීම, කාර්ය මණ්ඩලය සදහා වැඩමුළු සංවිධානය විසදුම් වශයෙන් හඳුනාගත හැකිය.


***මුඛ්‍ය පදඃ පුස්තකාල ස්වයංක්‍රියකරණය, මෘදුකාංග, මහජන පුස්තකාල***

---

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යන අංශය කැලණිය විශ්වවිද්‍යාලය.

hgishara92@gmail.com

# රජයේ සමාජ ආරක්ෂක ආවරණ වැඩසටහන් ග්‍රාමීය දරිද්‍රතාවය කෙරෙහි ඇතිකරන බලපෑම

ඩබ්. ඒ. ඩී. ටී. එස්. මානපුරාව[1]

**සංක්ෂේපය ..**

දරිද්‍රතාවය යනුවෙන් අදහස් කරනුයේ පුද්ගලයෙකුට හෝ පුද්ගල සමූහයකට අවම ජීවන මට්ටමක් ගතකිරීම සඳහා අවශ්‍ය ආදායමක් නොමැති තත්වයයි.මෙහිදී ආයු අපේක්ෂාව,සාක්ෂරතාවය,මර්ත්‍යතාවය හා අනෙකුත් සමාජ ආර්ථික දර්ශකයන් කෙරෙහි අවදානය යොමු කිරීමේදී අනෙකුත් රටවල් හා සසඳන විට අප රටෙහි එම අගයන් ඉතා පහළ අගයක් ගනු ලබන අතර එයින්ද ග්‍රාමීය අංශයේ දරිද්‍රතාවය ඉහල අනුපාතයක් ගනු ලබයි.එබැවින් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂක ආවරණ වැඩසටහන් බොහොමයක් ග්‍රාමීය අංශය නගා සිටුවීම අරමුණු කරගත් වැඩසටහන් වේ.එසේ වුවද මෙරට ග්‍රාමීය දරිද්‍රතාවය ඉතා ඉහල අනුපාතිකයක් පැවතිම වර්තමානයේ හඳුනාගත හැකි ප්‍රධාන ගැටලුවකි. මෙලෙස ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂක ආවරණ වැඩසටහන් ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීම සඳහා සැබෑලෙසම දායක වන්නේද යන්න හඳුනා ගැනිම මෙහි අරමුණ වේ. අන්තර්ජාලය,2000 සිට 2015 දක්වා ප්‍රකාශයට පත් කරනු ලැබූ වාර්ෂික මහ බැංකු වාර්තා, ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන වාර්තා යන මූලාශ්‍ර වල ද්විතියික දත්තද උපයෝගී කර ගනිමින් කාලශ්‍රේණි විශ්ලේෂණයන් ඔස්සේ වගු, ප්‍රස්තාර, ඇසුරින් දත්ත ඉදිරිපත් කරන ලදී.ඒ අනුව දැනට ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාප්තින්ගෙන් 82% ක්‍රියාත්මක කොට ඇත්තේ ග්‍රාමීය අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය,රැකියා උත්පාදනය,කෘෂිකාර්මික අංශය නගා සිටුවීම මෙන්ම දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ශක්තිමත් කිරිම කෙරෙහිය.ඒවාද උතුරු නැගෙනහිර,වියළ කලාපය,මාතලේ දිස්ත්‍රික්කය,වයඹ පළාත,හා සබරගමුව පළාත කේන්ද්‍ර කොට ගනිමින් ක්‍රියාත්මක කොට තිබේ.මුළු දිළිඳු ජනගහනයෙන් 22.8%සමෘර්ධි ප්‍රතිලාභ භුක්ති විඳිති.එසේ වුවද දරිද්‍රතාවය අඩුවී ඇත්තේ 0.6% පමණ වේ.මෙය රජය දරනු ලබන සහනාධාර වියදමට සාපේක්ෂව බලන කල ඉතා අඩු වර්ධන අනුපාතිකයක් විය.තවද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පිරිවැය අධික විම හා අකාර්යක්ෂමතා බහුල විම,විධිමත් සම්බන්ධිකරනයක් හා ජනතා සහභාගිත්වයක නොමැති විම,එයට බලපෑ සාදක ලෙස හඳුනා ගත හැකිවිය.එබැවින් වඩාත් යෝග්‍ය සංවර්ධන ව්‍යාප්තින් හඳුනා ගැනිම හා ජනතාව දිළිඳු භාවයට පත්විම අවම කිරිම සඳහා වු සමාජ ආරක්ෂන ව්‍යාපෘති නියම ආකාරයට අදාල සමාජ ස්ථර වෙත ඉලක්ක කොට ක්‍රියාත්මක කිරිම තුලින් අරමුණු කොටගත් ප්‍රතිඵල වඩාත් සුභදායක ආකාරයට අත්කර ගැනිමට හැකිවනු ඇත.

***මුඛ්‍යපද : සමාජ ආරක්ෂක ආවරණ වැඩසටහන්, ග්‍රාමීය දරිද්‍රතාවය***

---

[1] සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය

Thilinishankani1993@ gmail.com

# Media and Tourism

# ඩෙංගු මර්දනය හා කළමනාකරණය කෙරෙහි ජනමාධ්‍ය දායකත්වය (ගාල්ල දිස්ත්‍රික්කයේ ගොඩකන්ද සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය ඇසුරෙන්)

කේ. එම්. පී. එම්. ඩයස් [1], කේ. ඩී. ලියනගේ

**සංක්ෂේපය**

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී ඩෙංගු රෝගය මර්දනය සම්බන්ධයෙන් ජනමාධ්‍ය කෙතරම් දුරට දායකත්වය දැක්වූයේ ද යන්න පිළිබඳව අවධානය යොමු කර ඇත. මෙහි දී අප අධ්‍යයන ගැටලුව ලෙස මතු කළේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ඩෙංගු රෝග මර්දන වැඩසටහන් විකාශය කළත්, ඩෙංගු රෝග මර්දන කටයුතු සම්බන්ධව කෙතරම් ලිපි පල කළත්, ඩෙංගු රෝග වසංගතයට ගොදුරු වන්නන්ගේ ප්‍රමාණයෙහි වෙනසක් දක්නට නොලැබීමට හේතුව කුමක් ද යන්නයි. ඩෙංගු රෝගය හඳුනා ගැනීම, ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන පාරිසරික සාධක, ඩෙංගු රෝගය මර්දනය හා කළමනාකරීත්වය, ඒ සඳහා ජනමාධ්‍ය දැක්වූ දායකත්වය පිළිබඳව ගාල්ල දිස්ත්‍රික්කයේ ගොඩකන්ද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයට අයත් ගොඩකන්ද 216/ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙන් අහඹු ලෙස තෝරාගත් නිවාස 40ක් වෙත ප්‍රශ්නාවලියක් යොමු කර ඩෙංගු රෝගය පිළිබඳව දත්ත එක්රැස් කරන ලදි. දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස නිරීක්ෂණය, අවිධිමත් සම්මුඛ සාකච්ඡා, ව්‍යුහගත ප්‍රශ්නාවලි, විධිමත් සම්මුඛ සාකච්ඡා යන ක්‍රම ශිල්ප උපයෝගී කරගන්නා ලදී. ඩෙංගු මදුරුවන් බෝවන ආකාරයෙන් තම නිවාස අවට පරිසරය අපිරිසිදුව තබාගෙන ඇති ආකාරය හඳුනා ගැනීම මෙන්ම විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සලකා බැලීම සඳහා ප්‍රාථමික දත්ත උපයෝගී කරගනු ලැබූ අතර මාධ්‍ය මගින් ඩෙංගු උවදුර පිටුදැකීම සඳහා දක්වා ඇති දායකත්වය කෙබඳු ආකාරයෙන් ද යන්න විමසා බැලීමට ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප අනුගමනය කරන ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණය ඇසුරෙන් රැස් කරගනු ලැබූ දත්ත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප අනුගමනය කරමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. එසේම සාහිත්‍ය විමර්ශන ලෙස මෙම විෂය ක්ෂේත්‍රය සම්බන්ධව ලියවී ඇති ග්‍රන්ථ, සඟරා, පර්යේෂණ වර්තා හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් දත්ත ලබා ගැනුණි. නගර මට්ටමින් හා ගම් මට්ටමින් ඩෙංගු මදුරුවන් බෝ විය හැකි ස්ථාන අවම කර ගැනීම, පිරිසිදු කිරීම හා පවත්වා ගෙන යාම කෙරෙහි පුද්ගල ආකල්ප හා හැඟීම්වලට ආමන්ත්‍රණය කිරීමේ දී ජනමාධ්‍යයේ ප්‍රමුඛ දායකත්වයක් අවශ්‍ය වේ. ඒ සඳහා රාජ්‍ය මට්ටමින් කණ්ඩායම් වශයෙන් ජනමාධ්‍ය සමඟ එක්ව ඩෙංගු මර්දන වැඩසටහන් සකස්කර ගනිමින් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. කෙසේ නමුත් ඩෙංගු රෝගය මර්දනය කිරීම කෙරෙහි ප්‍රවණතාවයක් දක්නට නොලැබෙන්නේ හුදෙක්ම ජනතාව තුළ පවත්නා මන්දෝත්සාහීභාවය නිසාවෙන් බව නිගමනය කළ හැකි ය.

***මුඛ්‍ය පද : ඩෙංගු රෝගය, ඩෙංගු කළමනාකරණය හා ජනමාධ්‍ය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# සන්නිවේදනය සහ අපරාධ (සන්නිවේදන මාධ්‍යක් වන රූපවාහිනිය අපරාධ කෙරෙහි බලපාන ආකාරය)

ඩී. ඩී. වයි. එන්. ගුණරත්න[1]

**සංක්ෂේපය**

කාර්මික ක්‍රමයේ ස්ථාපිත ආගම මාධ්‍ය සමාජයේ කාර්යසාධක මිථ්‍යාවන්ට සරිලන උපකල්පනයන් ගොඩනගයි. වර්තමානයේ අපරාධ ඉහළ යමින් පැවතීම නිසා සන්වේදනය හා අපරාධ පිළිබඳ පර්යේෂණය කිරීම කාලෝචිත වේ. අපරාධ හා සන්නිවේදනය විෂය ක්ෂේත්‍ර 2ක් ඔස්සේ සමීප ලෙස බැඳී. පවතී විද්වතුන්ගේ න්‍යායික හා ප්‍රායෝගික නිර්වචන අනූව එය තහවුරු වේ. සන්වේදනය මාධ්‍ය අපරාධ කෙරෙහි කෙසේ බලපාන්නේ ද? යන්න අවධානය යොමුකර සන්නිවේදන මාධ්‍යක් වන රූපවාහිනි මාධ්‍යයේ බලපෑම සෙවීම පර්යේෂණ ගැටලුව වේ. අපරාධ සහ සන්නිවේදනය යන මාතෘකාව ඔස්සේ රූපවාහිනිය මාධ්‍ය අපරාධ කෙරෙහි බලපානු ලබන්නේ කෙබඳු අයුරින්ද යන්න මෙහිදී දත්ත රැස්කරන ලදී. ප්‍රමුඛකොට දත්ත රැස්කිරීමට ප්‍රාථමික මූලාශ්‍ර යටතේ ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. සමීක්ෂණය සඳහා භාවිතා කළ සසම්භාවී නියදිය යටතේ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමසේවා වසම් කිහිපයකින් පුද්ගලයින් 50කින් යුතු නියැදියක් තෝරා ගෙන ඇත. රූපවාහිනී වැඩසටහන් මගින් ප්‍රචණ්ඩකාරී බව නිරූපිතද යන්න නියැදියට තෝරා ගත් පුද්ගලයින්ගෙන් කෛයිවර්ග පරීක්ෂාවක් ලබා දෙමින් රැස්කරගත් දත්ත මත මුළු නියැදියෙන් වැඩි ප්‍රතිශතයක් එයට එකග වූ බව දැකගත හැකි විණි . වෙළෙඳ අරමුණු මුල්කර ගනිමින් සංස්කෘතික අංශ බටහිර ආකෘතීන් සමග සම්බන්ධ කර වර්තමාන මාධ්‍ය ව්‍යුහය සකස් කර ඇත. ප්‍රබල මාධ්‍යක් වන රූපවහිනිය ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට පෙලඹවීමක් ඇති කරමින් අපරාධ ඇති කිරීමට දායක වේ ද? යන්න එහි මාධ්‍ය ව්‍යුහය විශ්ලේෂණයෙන් පැහැදිලි වේ . ප්‍රචණ්ඩත්වය හා අපරාධ සඳහා ප්‍රමුඛ හේතුව මාධ්‍ය සංදේශ නොවන බවත් එයට සමාජ සංස්කෘතික සාධක බලපාන බවත් දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි වේ. මෙලෙස ඇතිවන සමාජ ගැටලුවට පිළියම් ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශ ඔස්සේ විවිධ ක්‍රියාමාර්ග ගත හැක. එමෙන්ම මාධ්‍ය සංදේශ පිළිබඳව ක්‍රියා කිරීමෙදි දෙමවුපියන්, අධ්‍යාපනවේදීන්, සමාජ විද්වතුන්, ආගමික නායකයින් හා තරුණ පරපුර වෙත පැවරී ඇති වගකීම නිසි අයුරින් ක්‍රියාවට නැංවිය යුතුය.

***මුඛ්‍ය පද : අපරාධ, ප්‍රචණ්ඩත්වය, සන්නිවේදනය, රූපවහිනිය මාධ්‍ය. ව්‍යුහය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

yashodanayomi12@gmail.com

# තරුණ ප්‍රජාව ත්‍රාසජනක ගමනාන්තයන්හි, සංචාරය කිරීමටත්, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වීමට සමාජ ජාල වෙබ් අඩවිවල බලපෑම

ඩී. එච්. ඩී. හේවගේ[1] ඒ. ඒ. පී. එන්. කුමාර

**සංක්ෂේපය**

වර්තමානයේ සංචාරක කර්මාන්තයේ දී සංචාරකයන්ගේ ගමනාන්තයන්, ආකර්ෂණයන්, නවාතැන් සොයා ගැනීම සඳහා සිය සහෘදයන් විසින් සමාජ ජාල වෙබ් අඩවි තුළ ඔවුන් ප්‍රකාශයට පත් කරනු ලැබූ අන්තර්ගතයන් උපයෝගී කරගනු ලබයි. වර්තමාන තරුණ ප්‍රජාව ත්‍රාසජනක සංචාරක ගමනාන්තයන්හි සංචාරය කිරීමටත්, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වීමේ ප්‍රවණතාවයක් පවතී. ඒ සඳහා ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම්වලට අදාළ ඡායාරූප, වීඩියෝ පට සමාජ ජාල වෙබ් අඩවි තුළ ප්‍රදර්ශනය හා හුවමාරුව ඒ සඳහා බලපානු ලබයි. ත්‍රාසජනක සංචාරක ගමනාන්තයන්හි සංචාරය කිරීමටත්, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වීමට තරුණ ප්‍රජාව, සමාජ ජාල වෙබ් අඩවි භාවිතය හා හැසිරීම කොතෙක් දුරට බලපා ඇද්ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම අධ්‍යයනය සිදුකරනු ලැබුවේ ප්‍රාථමික දත්ත ආශ්‍රයෙනි. ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත එක් රැස් කිරීම ප්‍රධාන වශයෙන් සිදු වූ අතර ඒ සඳහා Face book වෙබ් අඩවිය භාවිතා කරනු ලැබීය. එහිදී සංචාරකයන් 38%ක් සංචාරක ස්ථානය ලෙස තෝරාගෙන තිබුණේ ඇල්ල කන්ද නැගීම හා කඳවුරු බැඳීමයි. ඊට අමතරව සංචාරකයන් 27%ක් මීමුරේ ප්‍රදේශයේ ද 17%ක් දානිගල කන්ද තරණය ද 12%ක් බෝඹුරු ඇල්ල ද හා 6%ක් වෙනත් ප්‍රදේශවල ද සංචාරය කිරීමට තෝරාගෙන තිබුණේ ය. මෙම සංචාරක ස්ථානයන්හි විශේෂත්වය වන්නේ එකී ස්ථාන ප්‍රවර්ධනය නොවූ, සංචාරක පහසුකම් සංවර්ධනය නොවූ ස්ථානයන් ය. මෙම ස්ථාන ආශ්‍රිතව විශේෂයෙන් ම කඳවුරු බැඳීම, කඳු නැගීම, දිය ඇළි නැගීම හා ඇවිදීම යන ක්‍රියාකාරකම්වල නිරත වීමට කැමැත්තක් දක්වයි. සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, පළාත් සංචාරක කාර්යංශ හා පළාත් සංචාරක අමාත්‍යාංශයන්හි සංචාරක සැලසුම් තුළ අවධානය යොමු නොවු ස්ථානයන් ප්‍රවර්ධනය කිරීමට තරුණ ප්‍රජාව සමාජ ජාල වෙබ් අඩවි ධනාත්මක ලෙස භාවිතයට ගනී.

***මුඛ්‍ය පද : ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම්, තරුණ ප්‍රජාව, සමාජ ජාල වෙබ් අඩවි, සංචාරක කර්මාන්තය, සංචාරක ගමනාන්ත***

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

hasankahewage071@gmail.com

# POLITICAL AND POVERTY

# රූපවාහිනී දේශපාලන වැඩසටහන් ඡන්දදායක හැසිරීමට බලපාන ආකාරය

එල්. අයි. ඒ ගුණතිලක[1]

**සංක්ෂේපය**

වර්තමානය වන විට රූපවාහිනිය වඩාත් ප්‍රබලතම මාධ්‍යයක් බවට පත්ව ඇත. මෙහි දී විශේෂ අවධානයක් රූපවාහිනී දේශපාලන වැඩසටහන්වලට හිමි වෙයි. වර්තමාන පැවැත්ම තුළ මාධ්‍ය භූමිකාව විමසා බැලීමේදී රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයේ ම ඉදිරිපත් කරන දේශපාලන මතවාදය ඉතාමත් වැදගත් එකක් සේ සැලකිය හැකිය. වර්තමානයේ සෑම නාලිකාවක්ම පාහේ විවිධ දේශපාලනික වැඩසටහන් විකාශය කරයි. රූපවාහිනි දේශපාලන වැඩසටහන්වලට පැමිණෙන දේශපාලකයන් හෝ විචාරකයන් හෝ මතු කරන ලද කරුණු ජනතාවට තම ඡන්දය ප්‍රකාශ කිරීමේ දී තීරණ ගැනීමට කොතරම් දුරට බලපා ඇත්ද යන්න සෙවීම මෙම පර්යේෂණයේ ගැටලුව වෙයි. ඒ ඔස්සේ රූපවාහිනී දේශපාලන වැඩසටහන් ඡන්දදායක චර්යාව කෙරෙහි ඇති කෙරෙන බලපෑම අධ්‍යනය කිරීම මෙහි අරමුණයි. පර්යේෂණය සඳහා මිශ්‍ර ක්‍රමවේදය භාවිත කරමින් දත්ත ලබා ගැනුණි. එහිදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා අන්තර්ගත විශ්ලේෂණ භාවිත කළේය. ප්‍රශ්නාවලිය ලබා දීමේ දී බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයන් 100ක් සසම්භාවී නියැදියට යොදා ගෙන දත්ත රැස් කෙරුණි. අන්තර්ගත විශ්ලේෂණය සඳහා දෙරණ හා හිරු නාලිකාවන්හි විකාශය වන වාද පිටිය සහ බලය දේශපාලන වැඩසටහන් වල මාසයක විකාශන කාලය යොදා ගැණුණි. මින් ලබාගත් දත්ත ඇසුරින් 54%පිරිසකට රූපවාහිනී දේශපාලන වැඩසටහන් ඔවුන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමට යම් බලපෑමක් සිදු කර ඇති බව පැහැදිලි විය. 46% පිරිසකට බලපෑමක් සිදු වී නැත. දේශපාලන වැඩසටහන් දේශපාලනය තුළ ගැඹුර මතුකර සමාජ ආකල්පය වර්ධනය කිරීම වෙනුවට විනෝදය හා හාස්‍ය උත්පාදනය කරන්නට වැඩි වශයෙන් සමත් වී ඇත.

***මුඛ්‍ය පද : දේශපාලනය, රූපවාහිනී වැඩසටහන්, මතවාදය, ඡන්දදායකයා***

---

[1] ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2anuradhi@gmail.com

# The “DOKLAM” border standoff between two asian giants

M. S. H. U Karunarathne [1]

**Abstract**

Sino-Indian border disputes has a long history which marked the deterioration of their relations. This particular study is mainly focused on ‘Doklam’ face-off, the most recent confrontation of borderland between China and India. The main objective is to examine the present situation of the border disputes regarding the ‘Doklam’ face-off and also discusses what types of changes will happen in their future bilateral relations regarding the ‘Doklam’ incident. Furthermore the study will examine the Bhutan factor which is the third party of the ‘Doklam’ faceoff. To achieve aforesaid objectives qualitative approach has been adopted and secondary data is the main type of data obtained from various sources such as books, journal articles, newspapers, government records and other relevant documents available in both printed and electronic versions. Document analysis and theoretical analysis are used to analyze data. In document analysis documents are interpreted to give meaning and it collects available data related to the study and interprets them to find out specific issues. Concepts derive from literature review and theoretical analysis helps to develop broader understanding on those issues and collect new knowledge. The research findings conclude Chinese influence over the other entities seems inevitable with its rise as a global economic and military power which is perceived as a threat by India. India is also trying to match Chinese rise resulting suspicion and fear psychosis among one another’s achievements. Border disputes consider as one of the main factor which is shaping their bilateral relations. Border States and areas, such as Bhutan and ‘Doklam’ has become convergence points for both India and China due to its strategic importance in the border areas.

Key words: Standoff, Border disputes, Bilateral relations, Convergence, Face-off

[1] Department of International Studies, University of Kelaniya
hasithstudyum@gmail.com

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික දරිද්‍රතාවය පිළිබඳව අධ්‍යනයක්

ටී. ඩබ්. එස්. කාංචනමාලා[1]

**සංක්ෂේපය**

යම් රටක සංවර්ධන ක්‍රියාවලියේ සඵල බව විද්‍යාමාන වන එක් ප්‍රධාන පැතිකඩක් වන්නේ, දිළිඳු ජනගහනයේ ප්‍රමාණාත්මක අඩු වීමයි. කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල සමූහයකට යහපත් පැවැත්මක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන පරිභෝජන හෝ ආදායම් මට්ටමකට හෝ නිවාස,සෞඛ්‍ය,අධ්‍යාපන පහසුකම්,පවත්නා සමාජ ආර්ථික තත්ත්වයන් මත රැකියා, දේපළ, හිමි විය යුතු අයිතිවාසිකම්, ලැබිය යුතු වේ. මෙකී අවශ්‍යතා පැහැදිලි ලෙස අහිමි වීම දරිද්‍රතාවය වන අතර, නාගරික, ග්‍රාමීය හා වතු අංශය කේන්ද්‍ර කරගෙන දැකිය හැකිය. දරිද්‍රතාවය හේතුකොට ගෙන නාගරික හා ග්‍රාමීය ජනයාට මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම කෙරෙහි බලපා ඇති සාධක විමර්ශනය කිරිම මෙම අධ්‍යනයේ ප්‍රධාන ගැටලුව වන අතර දරිද්‍රතාවය නිසා සමාජීය හා ආර්ථික වශයෙන් සිදු වී  ඇති බලපෑම අධ්‍යනය කිරිම මෙම පර්යේෂණයේ අරමුණ වේ. දරිද්‍රතාවය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන සාධක සමස්තයක් ලෙස ගත් කළ පුළුල් ලෙස විමර්ශනය කිරීමක් මෙම අධ්‍යනය තුළින් සිදු කර ඇත. අධ්‍යනය සඳහා ජන හා සංඛ්‍යාලේඛන වාර්තා හා මහ බැංකු වාර්තා වැනි ද්විතියීක මූලාශ්‍ර මඟින් දත්ත රැස් කර ගන්නා ලදී. මේ තුළින් නාගරික හා ග්‍රාමීය වශයෙන් දරිද්‍රතාවය ඇති වීම කෙරෙහි ඒක පුද්ගල මුළු මූර්ත පාරිභෝජන වියදම,වයස් මට්ටම, සාමාන්‍ය මාසික ආදායම, ගෘහයේ සාමාජීය ආර්ථික වටපිටාව මෙන් ම දේශපාලන රාමුව තුළින් ඇති වූ ප්‍රබල වෙනස්කම් ද බලපා ඇති බව පැහැදිලි විය. 2009/10 කාලය තුළ නිල දරිද්‍රතා රේඛාවේ අගය රු.3028 වූ අතර 2006/07-2009/10 කාලය තුළ විශාල ජන කොටසක් දිළිඳු බවෙන් මිදුණ ද දිළිඳු නොවන පිරිස් දිළිඳු බවට පත් විමට අවධානමක් තිබුණි. 2016 රටේ ජනගහනයෙන් දරිද්‍රතාවය 7% අඩු වුවද ඇතැම් ප්‍රදේශ වල අතිශයින්ම දිළිඳු බවක් දක්නට ලැබුණි. 2017 අගෝස්තු වන විට ජාතික මට්ටමින් නිල දරිද්‍රතාවය රු.4305කි. නාගරික වශයෙන් දරිද්‍රතාවයට නාගරීකරණය, අධික ජනගහනය, අසීමිත අවශ්‍යතා සඳහා සීමිත සම්පත් පැවතීම හා පන්ති භේදය වැනි ආර්ථික සාධක හඳුනාගත හැකි විය. කෙසේ වුවත් නාගරික දරිද්‍රතාවය සඳහා වඩා ග්‍රාමිය දරිද්‍රතාවය වැඩි වි ඇති බව ගම්‍ය වේ. අධික කාලයක් සිට පැවති යුද්ධය, ග්‍රාමිය සංවර්ධනයට යොදන මුදල් ප්‍රමාණය අවම විම හා සුබසාධන වැඩ කටයුතු සඳහා වැය වන අධික මුදල් ප්‍රමාණය ග්‍රාමිය දරිද්‍රතාවයට සමාජීය හා ආර්ථික වශයෙන් බලපා ඇත. දිළිඳු ජනතාව පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති, නව රැකියා අවස්ථා ජනිත කරමින් යටිතල පහසුකම් දියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග මඟින් දිළිඳුකම පිටුදැකිය හැකි බව හඳුනාගත හැකිය.

***මුඛ්‍ය පද : දරිද්‍රතාවය , ග්‍රාමිය , නාගරික***

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

savi26kanchana@gmail.com

# SOCIO-CULTURAL

# කැලණිය විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අතර ජංගම දුරකථන භාවිතය

ඒ. ඒ. එස්. ඩී. අධිකාරි1

**සංක්ෂේපය**

සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ වර්තමානය වන විට ගෝලීය ජීවන රටාව වෙනස් වීම කෙරෙහි ජංගම දුරකථන භාවිතය විශේෂයෙන් බලපා තිබේ. සාහිත්‍ය විමර්ශනයන් සලකා බැලීමේ දී එමඟින් බොහෝ විට අවධානය යොමු කර ඇත්තේ ජංගම දුරකතන සංවාද හා කෙටි පණිවිඩ යැවීම, ජංගම දුරකතන මඟින් සමාජයට වන බලපෑම, නිදහස, මානසිකත්වය වැනි ක්ෂේත්‍රයන් පිළිබඳවයි. නමුත්, අධ්‍යයන අවශ්‍යතා සඳහා ජංගම දුරකතනය භාවිතා කරනු ලබන ආකාරය පිළිබඳ අධ්‍යයනයන් විරල බැවින් මෙම අධ්‍යයනය තුළින් ඒ පිළිබඳ අධ්‍යයනය කරන ලදී. විවිධ ජංගම දුරකථන යෙදවුම් (එදඉසකැ 'චචකසජ්එසදබි* සහ එහි නිරත වන ආකාරය, අධ්‍යයන අවශ්‍යතා සඳහා සිසුන් අතර ජංගම දුරකථනය භාවිතා වන ආකාරය සහ එම අධ්‍යයන කටයුතුවලදී ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජංගම දුරකතන භාවිතයේ වෙනසක් පවතී ද යන්න සොයා බැලීම  මෙම අධ්‍යයනයේ අරමුණ විය. කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් අතරින් 300කින් යුත් සසම්භාවී නියැඳියක් මේ සඳහා තෝරා ගත් අතර ගත් අතර අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. spss මෘදුකාංගය භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කිරීම සිදු කළ අතර නියැදි ප්‍රතිඵල මඟින් පෙන්නුම් කරනු ලැබුවේ බහුතරයක් සිසුන් (පිරිමි සහ කාන්තා) ස්මාර්ට් ජංගම දුරකථන සහ කුඩා ප්‍රතිශතයක් (25% ට අඩු) අනෙකුත් සාමාන්‍ය දුරකථන භාවිතා කරන බවයි. තවද, කාන්තා සිසුන්ට වඩා  පිරිමි සිසුන් තම දුරකථන යෙදවුම් පිළිබඳ සෑහීමකට පත් වන නමුත් අධ්‍යයන කටයුතු සඳහා ජංගම දුරකථන භාවිතයේදී කාන්තා සිසුන් වඩාත් ඉදිරියෙන් සිටී (463.6%). සමස්තයක් ලෙස ශිෂ්‍යයින්ගෙන් 70% ට වැඩි ප්‍රමාණයක් ඔවුන්ගේ නිබන්ධන, පැවරුම් යනාදිය සඳහා තොරතුරු සෙවීම, බාගත කිරීම සඳහා ජංගම දුරකථන යෙදවුම් භාවිතා කරයි. ඒ අනුව, සිසුන්ගේ අධ්‍යයන අවශ්‍යතාවන් සඳහා ජංගම දුරකථනය ඵලදායි ලෙස භාවිතා හැකි බව නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද ඃ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, ජංගම දුරකථන භාවිතය, අධ්‍යයන අරමුණු***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

samikadinu@gmail.com

# ඇඟලුම් හා රෙදිපිලි කර්මාන්තය කෙරෙහි ඇඟලුම් සේවකයන් මුහුණදෙන තත්ත්වයන් බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (බියගම අපනයන සැකසුම් කලාපය ඇසුරින්)

පී. පී. එන්. බස්නායක[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකීය රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය මගින් කරනු ලබන නිෂ්පාදනය වර්තමානය වන විට මෙරට දළ දේශීය නිෂ්පාදනයට විශාල දායකත්වයක් සපයයි. මේ වන විට ආර්ථිකය කාර්මික අපනයන කෙරෙහි නැඹුරුව පවතී. එහිදී ප්‍රධානම දායකත්වයක් සපයනුයේ ඇඟලුම් හා රෙදිපිළි කර්මාන්තයයි. ඇඟලුම් කර්මාන්තානුබද්ධ සේවක ප්‍රජාව එහිදී නිරායාසයෙන්ම අවධානයට ලක්වනුයේ රෙදිපිළි නිෂ්පාදනය හා සේවකයන් අතර පවතිනුයේ අවියෝජනීය සම්බන්ධතාවක් වන බැවිනි. ඇඟලුම් සේවකයන් ශාරීරික හා මානසික ගැටලුවලට මුහුණ දීම හා එම හේතුව මත ඇඟලුම් සේවකයන් දීර්ඝකාලීනව සේවා නොකිරීම හේතුවෙන් ඇඟලුම් කර්මාන්තය අභියෝගයට ලක්ව පැවතීම පර්යේෂණ ගැටලුවයි. මෙම අධ්‍යයනයෙහි අරමුණ ඇඟලුම් කර්මාන්තයෙහි නියුක්ත සේවක ප්‍රජාව හට මුහුණ දීමට සිදුවන ගැටලුකාරී තත්වයන් හඳුනාගැනීම, එය ඇඟලුම් කර්මාන්තයට හානිදායක ලෙස බලපෑම් කරනුයේදැයි විමසීම හා එම බාධාවන් පිටු දැකීම සඳහා යෙදිය හැකි පිළියම් සොයාබැලීමයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත එක්රැස් කිරීමේදි අපනයන සැකසුම් කලාපය තුල සේවයෙහි නියුක්තවූවන් අතරින් නිස්සසම්භාවී නියැදුම් ක්‍රමයක් වන පහසු නියැදීම මගින් තෝරාගත් පිරිසකට ප්‍රශ්නාවලියක් යොමුකිරීම හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යෙදා ගැනුණි. එමෙන්ම ආයතන කළමණාකරුවන්ගෙන් ද සම්මුඛ සාකච්ඡා මගින් අවශ්‍ය ප්‍රාථමික තොරතුරු ලබාගන්නා ලදි. ඇඟලුම් කර්මාන්තය පිළිබඳ තොරතුරු ලබාගැනීමේදි ද්විතීයික දත්ත ලෙස ආශ්‍රය කරනු ලැබූවේ මහ බැංකු වාර්තාල සඟරා ආදියයි. එම දත්ත විශ්ලේෂණය කිරීමේදී වගු, ප්‍රස්ථාර වැනි මූලික සංඛ්‍යානමය ශිල්ප ක්‍රමයන් හා උසස් සංඛ්‍යානමය ශිල්ප ක්‍රමයන්ද උපයෝගි කරගන්නා ලදි. ඇඟලුම් කර්මාන්තාශ්‍රිත රැකියාවන් පිළිබඳ සමාජය තුල ඇති සම්මතයන්, ශ්‍රමයට සරිලන වැටුපක් නොලැබීම, විවේක මදකම ඇතුලු බහුවිධ හේතූන් මත ඇඟලුම් සේවකයන් ඉන් ඉවත්ව වෙනත් රැකියවන් කෙරෙහි යොමු වීමට පෙළඹීමත්, විරැකියාවෙන් සිටින ශ්‍රමිකයන් මෙම කර්මාන්තයට යොමු වීමට මැලිකමක් දක්වන බවත් විශද විය. මෙබඳු හේතු සාධක ඇඟලුම් ක්ෂේත්‍රය කරෙහි දැඩි අවදානමක් ඇති කරන බව හඳුනාගත හැකි වූ අතර පූර්වෝක්ත අහිතකර ලක්ෂණ මගහරවා ගැනීමට ඇඟලුම් කර්මාන්ත සේවය පිලිබඳ පවත්නා සමාජ දුර්මත ඉවත් කිරීමට පිළියම් සෙවිය යුතු වෙයි. සේවක ගැටලු පිළිබඳව සාවදානව විමසා පිළිතුරු සොයා ගතහොත් එමගින් ඇඟලුම් සේවකයන් මුහුණ පාන ගැටලුකාරී තත්ත්වයන් මගහරවාගනිමින් කර්මාන්තාභිවර්ධනය ද මනාව අර්ථවත් කරගත හැකි බව නිගමනය කළ හැකි ය.

***මුඛ්‍ය පද : ඇඟලුම් කර්මාන්තය, දළ දේශීය නිෂ්පාදනය, මුහුණපාන ගැටලු, සේවක ප්‍රජාව***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# කාන්තාවන් ආර්ථික හා දේශපාලන වශයෙන් ක්‍රියාකාරීත්වය පහල මට්ටමක පැවතීමට අදාල හේතු අධ්‍යයනය (ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන්)

එම්. කේ. අයි. ඒ. බණ්ඩාර[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ජනගහන පැතිකඩ අනුව පුරුෂ ජනගහනයට වඩා ස්ත්‍රී ජනගහනයේ වැඩිවීමක් දක්නට ලැබුණ ද ශ්‍රී ලංකාව තුල කාන්තාවන් ආර්ථික දේශපාලන වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පවතින බව කිව හැකිය. ඒ අනුව පර්යේෂණ අරමුණ වන්නේ කාන්තාවන් ආර්ථික දේශපාලන වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පැවතීමට බලපාන සමාජ ආර්ථික හා ප්‍රජා විද්‍යාත්මක සාධක හදුනා ගැනීමයි. ඒ අනුව ශ්‍රී ලංකාව තුල ජීවත් වන 52%ක ස්ත්‍රී ජනගහනයෙන් නාගරික 31.8%කුත් ග්‍රාමීය 35.7%කුත් වතු 43.5%ක් වශයෙන් ආර්ථිකයට දායක වන බවත් මුළු ශ්‍රී ලංකාව තුල 35.9% ක් පමණ ආර්ථිකයට දායක වන බවත් 2016 ජන හා සංඛ්‍යාලේඛන වාර්තා මත කිව හැකිය. ශ්‍රී ලංකාව තුල ජීවත් වන 56% ක් වූ ස්ත්‍රී ජන්ද දායකයන්ගෙන් 18%ක් පමණ ස්ත්‍රී ජනගහනයක් දේශපාලන කේෂ්ත්‍රය තුල ක්‍රියාකාරී ලෙස නියෝජනය කරන බවත් එයින් පාර්ලිමේන්තු කාන්තා නියෝජනය 5.8%කුත් පලාත් සභා තුල 4%කුත් පලාත් පාලන ආයතන තුල 2.7%ක් වශයෙනි. මෙම පර්යේෂණයට අදාලව කාන්තාවන් 80ක් නියැදිය සදහා තෝරා ගත් අතර ප්‍රශ්නාවලී ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, සිද්ධි අධ්‍යයනය තුලිනුත් ජන හා සංඛ්‍යාලේඛන, මහබැංකු වාර්තා, ලිපි ලේඛන, සගරා තුලින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කරන ලදී. ශ්‍රී ලංකාව තුල කාන්තාවන් ආර්ථික, දේශපාලන වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පැවතීමට බලපාන හේතු ලෙස කාන්තාවන් පවුලේ ආර්ථික කටයුතුවලට දායක වීම, පවුල් පසුබිම, පවුලේ ආදායම ප්‍රමාණවත් වීම, සහනාධාර ලැබීම්, පවුලෙන් එල්ල වන බලපෑම්, නිසි දැනුමක් නොමැති වීම, සාම්ප්‍රදායික බව, විවාහකත්වය, විවාහක වයස, දරුවන්ගණන, රෝගීතාවය, සංක්‍රමණ ආදී කොට ගත් විවිධ ආර්ථික, සමාජ, ප්‍රජා විද්‍යාත්මක සාධක බලපා ඇති බව සැලකිය හැකිය. මීට අමතරව සමහර ප්‍රදේශවලදී යටිතල හා ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම, නව රැකියා නුපුහුණු ශ්‍රමය බහුල වීම, ළමුන් පාසැල් ගමන නතර කිරීම ආදී කොට ගත් විවිධ කරුණු මෙයට බලපා ඇති බව දැකිය හැකිය. මෙම තත්වය අවම කිරීමට නම් යටිතල පහසුකම් සංවර්ධනය, රැකියා අවස්ථා සැලසීම, අධ්‍යාපන දැනුම ආකල්ප වර්ධනය, සම අවස්ථා ලබා දීම, කාන්තා ප්‍රචණ්ඩත්වය අවම කිරීමට කටයුතු කිරීම, දේශපාලන අවබෝධය ලබා දීම ආදිය වැදගත් වේ.

***මුඛ්‍ය පද : කාන්තාවන්, ආර්ථිකය, දේශපාලනය, ජනගහනය***

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

bandaraisuru418@gmail.com

# හෙල්මළු වී වගා ක්‍රමය හීන වී යාම (මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළයටවර ග්‍රාමසේවා වසම ආශ්‍රයෙන්)

ඩී. ඒ. කේ. චතුරංගනී[1], ආර්. පී. එස්. ඩබ්. ආරියරත්න, ඩබ්ලිව්. එම්. එල්. ඩී. ජයතිලක, ආර්. ඩී. එස්. කේ. වීරසිංහ, එල්. පී. අයි. එස්. මධුශානි

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වන අතර "වී" ප්‍රධාන ආර්ථික භෝගයක් ලෙස හැඳින්වීමට හැකිය. වී වගා කිරීමේ දී විවිධ ක්‍රමයන් ඔස්සේ වී වගාව සිදු කරනු ලබන අතර ඒ අතරින් හෙල්මළු වී වගා ක්‍රමය සුවිශේෂී තැනක් ගනී. කඳුකර ආශ්‍රිත ප්‍රදේශවල සිදු කරන වී වගා ක්‍රමය හෙල්මළු වී වගාව ලෙස හැඳින්වේ. වර්තමානය වනවිට මෙම හෙල්මළු වී වගා ක්‍රමය අවම වෙමින් පවතින අතර ඒ සඳහා බලපාන ලද හේතු විමසා බැලීම අපගේ ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ශ්‍රී ලංකාවේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළයටවර ග්‍රාමසේවා වසමට අයත් හෙල්මළු වී ගොවීන් 20ක් සසම්භාවී නියදුම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණය සඳහා අවශ්‍ය ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත රැස්කරගත් අතර වත්තේගම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ද අවශ්‍ය දත්ත ලබාගන්නා ලදී. එම දත්ත කාලශ්‍රේණි විශ්ලේෂණයෙන් හා වගු,ප්‍රස්තාර භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව හෙල්මළු වී වගා ක්‍රමය හීන වී යාම සඳහා බලපාන ප්‍රධානම හේතුව ශ්‍රමය හිඟකම බව දැක්විය හැකිය. නියැදියට අදාලව 2005 වර්ෂය වන විට අක්කර 48 ක් වූ වගා බිම් ප්‍රමාණය 2015 වර්ෂය වනවිට අක්කර 18.5 ක් දක්වා අවම වීමක්ද දක්නට ලැබුණි. ජල සම්පාදන ක්‍රම නොමැතිවීම, සත්ත්ව හානි ආදිය ද හෙල්මළු වගාව අවම වීමට බලපා ඇති අතර සුදුසු ජල ව්‍යාපෘති හඳුන්වාදීම, ණය යෝජනා ඉදිරිපත් කිරීම ආදී ක්‍රියාමාර්ග මගින් ගොවීන්ට යම්කිසි සානුබලයක් ලබාදිය හැකිය.

***මුඛ්‍ය පද : හෙල්මළු වී වගාව, ගොවීන්, අවම වීම***

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 2-5 අතර ග්‍රාමීය දරුවන්ගේ බර අඩු වීමට හේතු (මඩුල්ල - දැලිව පවුල් සෞඛ්‍යය සෝවා නිලධාරි කොට්ඨාශය ඇසුරින් සිදුකරන ලද අධ්‍යයනයක්)

කේ. එම්. සී. ප්‍රියංගනී[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ව වෙසන කුඩා දරුවන්ගේ බර අඩු මට්ටම පවතින බව අනාවරණය ඇත. ඒ අතින් වයස අවුරුදු 2-5 අතර ග්‍රාමීය දරුවන් ප්‍රමුඛ බව වාර්ත වේ. මඩුල්ල සෞඛ්‍යය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ දැනට පවතින වාර්තා අනුව දැලිව පවුල් සෞඛ්‍යය සේවා නිලධාරී කොට්ඨාශයේ වයස අවුරුදු 2-5 අතර දරුවන්ගේ බර අඩු මට්ටම පවතින බව වාර්තා වී ඇත. මෙම දරුවන්ගේ බර අඩුවීමට හේතු දැන ගනිමින් එම හේතු අවම දරුවන්ගේ බර වැඩි කිරීම මූලික අරමුණයි. ඒ සඳහා මඩුල්ල සෞඛ්‍යය වෛද්‍ය නිලධාරි කාර්යාලය යටතේ පවතින දැලිව පවුල් සෞඛ්‍යය සේවා නිලධාරි කොට්ඨශය නියැදිය වශයෙන් තෝරාගත් අතර එහි වයස අවුරුදු 2-5 අතර දරුවන් 380ක් සිටින අතර එය 35%ක ප්‍රතිශතයකි. මෙම අධ්‍යයනයේදී කාර්යාල ලේඛන හා වාර්තා සම්මුඛ සාකච්ජා, නිරීක්ෂණ, පුද්ගල මෙන්ම සාමුහික සාකච්ජා යොදා ගන්නා ලදි. මෙම පර්යේෂණයට අනුව සොයා ගනු ලැබූ වැදගත් තොරතුරු අතර සෞඛ්‍යය පුරුදු හා පෝෂණය කුඩා දරුවනාගේ වර්ධනය පිළිබඳ ව මව්වරුන්ගේ දැනුම මද බව (40%), ආර්ථික හා සමාජ මට්ටමේ දුර්වලතා (20%), සෞඛ්‍යය සේවා සැපයීමේදී ඉලක්ක කණ්ඩායම් තෝරා ගැනීමේ හා අවශ්‍යය දැනුම ලබා දීමේ අඩුපාඩු (55%) ඇති බවත්ය. ඒ අනුව දරුවන්ගේ පෝෂණය හා වර්ධනය පිළිබඳ ව දෙමාව්පියන්ගේ දැනුම අවබෝධය වැඩිදියුණු කිරීම, දරුවන්ගේ ආහාර රටාව වෙනස් කර සමබර ආහාර වේලක් ලබාදීමට උපදෙස් දීම ආදිය තුළින් දරුවන්ගේ බර වැඩි කිරීමට කටයුතු කළ හැකි බව පෙනී යයි.

***මුඛ්‍ය පද : දරුවන්ගේ පෝෂණය හා වර්ධනය, හොඳ සෞඛ්‍යය පුරුදු***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ වර්තමාන කාන්තා පුවත්පත්වල ස්ත්‍රී සමාජභාවය වැදගත් කොට දැක්වීම පිළිබඳ අධ්‍යයනයක්

එම්. පී. ආර්. වී. ගුණසේකර[1]

**සංක්ෂේපය**

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ වර්තමාන පුවත්පත්වල අන්තර්ගතයන් පිළිබඳව කෙරෙන සුවිශේෂී අධ්‍යයනයකි. ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව වර්තමාන ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රකාශන බිහිවීම මෙන් ම අලෙවිය ද ඉතා ඉහළ මට්ටමක පවතී. එසේම පුවත්පත් අලෙවි වන ප්‍රමාණයට වඩා කාන්තාවන් විශාල ප්‍රමාණයක් අතර කාන්තා පුවත්පත් හුවමාරු වන බව දත්ත විශ්ලේෂණයේ දී සනාථ විය. ඒ අනුව බලන විට කාන්තා ප්‍රකාශනවල කාන්තාවන් සඳහා සෘජු බලපෑමක් එල්ල කර ඇත. මෙම කාන්තා ප්‍රකාශන ඔස්සේ සිදුවන බලපෑම තුන් වැදෑරුම් වේ. පුවත්පත් මිලදී ගන්නා ග්‍රාහක කාන්තාව වෙත කෙරෙන සෘජු බලපෑම, මවගෙන් දුවට යන සංකල්පය ඔස්සේ සමාජානුයෝජන ක්‍රියාවලියේදී සිදුකෙරෙන බලපෑම, අදෘශ්‍යමානව පවුලේ සියලු දෙනා වෙත කෙරෙන බලපෑම ආදියයි. කාන්තා පුවත්පත් පොදුවේ ගෙන බලන විට එහි අභ්‍යන්තර ආකෘතිය හා අන්තර්ගතය එක සමාන බව පෙනේ. වර්තමානයේ විද්‍යුත් ජනමාධ්‍ය තිබුණ ද තවමත් වර්තමාන ශ්‍රී ලාංකික කාන්තාව පුවත්පත් කෙරෙහි ද සැලකිය යුතු මට්ටමකින් නැඹුරුවක් පෙන්නුම් කරයි. වත්මන් ශ්‍රී ලංකාවේ කාන්තා පුවත්පත් පිලිබඳව එතරම් පර්යේෂණ පවත්වා නැති අතර ම එම පුවත්පත්වල ද අන්තර්ගතයන් පිළිබඳව එකින් එක අවධානය යොමු කර නැත. මෙම පර්යේෂණය හරහා එය හැකි උපරිමයෙන් කිරීමට උත්සාහ දරා ඇත. ඒ අනුව 2016 වසරේ පුවත්පත් ප්‍රකාශයට පත්වන මාස පිළිබඳව ද මූලික විනිශ්චයක් ඇතිව එනම් එම අවුරුද්දේ විශේෂ කාල වකවානු හසු නොවන ලෙස සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් යන මාස ත්‍රිත්වය පදනම් කර ගනිමින් තරුණී, සිරිකත හා නවලිය යන පුවත්පත් මේ සඳහා යොදා ගන්නා ලදී. අහඹු ලෙස තෝරාගත් ප්‍රදේශයකින් නියැඳියට අදාලව කාන්තා පුවත්පත්වල ඉලක්ක ග්‍රාහක පිරිස අතරින් මේවා කියවන වයස 19-55 වයස් සීමාවේ විවාහක, අවිවාහක ලාංකික කාන්තාවන් 100ක් තෝරා ගත් අතර ඔවුනට ප්‍රශ්නාවලියක් ලබා දී තොරතුරු ලබා ගන්නා ලදී. මෙම පුවත්පත් තුනෙහි සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙකුගෙන් සම්මුඛ සාකච්ඡා ලබා ගන්නා ලදී. දත්ත මාධ්‍ය සාක්ෂරතා ලක්ෂණ අනුව ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ගීකරණය තුළ දත්ත විශ්ලේෂණය සිදු කළ අතර දත්ත කාණ්ඩ අනුව වගුගත කරමින් ද ප්‍රස්ථාර භාවිතය මගින්ද වැඩිදුර තොරතුරු පැහැදිලි කර ඇත.

***මුඛ්‍ය පද : කාන්තා, සාපේක්ෂ, පුවත්පත්***

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

# A Study based on the predicaments of studying environment of the university undergraduates.

M. Y. G.V. Jayawardena[1]

## Abstract

Learning environment is a crucial factor that affects for the university education of an undergraduate. Studying environment is not only limited to the lecture halls since most of the undergraduates are residential. Hence, we can identify that the several difficulties could be affected for the education of an undergraduate. The main objective of this research is to identify those difficulties of studying environment faced by the undergraduates during their university life. This research conclude from the data collected randomly from 200 undergraduates of University of Kelaniya using a questionnaire. This research is based on the stratified sampling method and the data analysis has done using the SPSS software. Moreover, the factors that make an impact for the studying environment and the impact for the studying environment through those predicaments have identified. According to the data analysis, 65% of the undergraduates have those predicaments in their studying environment. Most of them from the other 35% are coming from their homes. The recorded data elucidates that Food and nutrition problems, the accommodation problems and the effect from the university sub culture and the lectures are conducted from the English language that is not much familiar for the undergraduates are the main predicaments faced by the undergraduates.

**Keywords: Undergraduate, Predicaments, Studying environment.**

[1] Department of Social Statistics, University of Kelaniya
yahamaleejayawardena@gmail.com

# ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි මහජන පුස්තකාලවල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් (කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ඩබ්. ජී. වී. ආර්. කුමාර[1]

**සංක්ෂේපය**

සංවර්ධනයේ ප්‍රධාන කේන්ද්‍රීය සාධකය වන්නේ ග්‍රාමීය සංවර්ධනයයි. නිදහසින් පසු බලයට පත් වූ සෑම රජයක් ම පාහේ ආර්ථික සැලසුම්කරණයේ දී ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. නමුත් මෙම සංවර්ධන ක්‍රියාවලින් සඳහා මිනිසාගේ දැනුම, ප්‍රායෝගික කුසලතා භාවිතා කිරීම අතින් බලන විට එහි දුර්වල තත්ත්වයක් පවතින බව පෙනී යයි. මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ, ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සඳහා මිනිසාගේ දැනුම වඩන මහජන පුස්තකාලවල දායකත්වය පිළිබඳ විමසා බැලීමයි. මෙම අධ්‍යනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ මහජන පුස්තකාල හතරක සමාජිකයින් 150ක සසම්භාවී නියැදියක් යොදා ගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ක්‍රම සහ ද්විතීක දත්ත රැස්කිරීමේ ක්‍රම යොදා ගන්නා ලදි. ඒ අනුව ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ලිපි, වාර්තා, වාර්ෂික වාර්තා පුස්තකාල හැඳීන්වීම් පිළිබඳ මූලාශ්‍ර යොදා ගැනුණි. මේ සඳහා MS Excel පරිගණක මෘදුකාංගය භාවිතා කළ අතර දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රමය භාවිතා කරන ලදි. මෙම අධ්‍යනයේදී පුස්තකාල ක්ෂේත්‍රයේ වර්ධනය විය යුතු ක්ෂේත්‍ර ගණනාවක් අනාවරණය විය. ඒ අනුව ග්‍රාමීය සංවර්ධනයේ දී සාකච්ඡාවට බඳුන් වන මූලික කාරණා ලෙස සලකන ආර්ථික සංවර්ධනය, සෞඛ්‍ය, අධ්‍යාපන, පරිසරික, සංකෘතික හා යටිතල පහසුකම් යන අංශ යටතේ ආදාල පුස්තකාල එකතුව වර්ධනය කිරීම, නව පුස්තකාල ප්‍රකාශන, නව තොරතුරු තාක්ෂණය ප්‍රායෝගික සංවර්ධන ක්‍රියාවලි සඳහා භාවිතයට ගැනීම ආදීය තහවුරු විය. ග්‍රාමීය සංවර්ධනයේදී දැනුම අත්‍යවශ්‍ය කාරණාවක් බව පැහැදිලි ය. ඒ අතර ම පුස්තකාල භාවිතයේදී පුද්ගලයන් මුහුණපාන ගැටලු පිළිබඳව ද අධ්‍යනයේදී අවධානයට ලක් විය. ඒ අනුව සම්පත් හිඟකම, පුද්ගලයින්ගේ තාක්ෂණික සාක්ෂරතාව හීන වීම, පුස්තකාල සම්පත් ලබා ගැනීමේ අපහසුව, පුස්තකාල සම්පත් පිළිබඳ පුද්ගලයන් තුළ අවබෝධයක් නොමැති වීම පාඨකයින් හා කාර්යමණ්ඩලය හමුවේ ඇති ගැටලු වේ. මේ සඳහා යෝජනා කිහිපයක් ඉදිරිපත් කර අතර පවත්නා මූලාශ්‍රවලින් තොරතුරු ලබාගැනීම, ජංගම පුස්තකාල සේවා, පුස්තකාල සහයෝගිතා ව්‍යාපාර, අන්තර් පුස්තකාල පිරුළු සේවා ආදීය ඒවා අතර විශේෂයෙන් කැපී පෙනේ. මෙම යෝජනා බලාත්මක කිරීම තුළින් පාඨකයින් හමුවේ ඇති ගැටලු මඟ හරවා ගත හැකිය. ඒ අනුව ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් වන්නේ දැනුමෙන් සන්නද්ධ මිනිසුන් බව තහවුරු වේ.

***මුඛ්‍ය පද : ග්‍රාමීය සංවර්ධනය, පුස්තකාල සේවා, මහජන පුස්තකාල***

---

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

www.vipulrohana13@gmail.com

# වයස්ගත වීම කාන්තාවන් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම

වයි. එම්. ආර්. කුමාරිහාමි[1]

**සංක්ෂේපය**

ජනගහනය වයස්ගතවීම සමස්ත ලෝක ප්‍රජාව හමුවේ වන ගැටලුවකි. බොහෝ රටවල් වැඩිහිටි ජනගහනය කොටස් දෙකකට වෙන් කර දක්වයි. ඒ අනුව වයස අවුරුදු 60-74 දක්වා "තරුණ වැඩිහිටි" ලෙසද අවුරුදු 75 සහ ඊට වැඩි ජනගහනය "මහළු වැඩිහිටි" ලෙසද හැඳින්වේ. එහිදී පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් වයස්ගත වීමත් සමඟ ගැටලු රාශියකට මුහුණපෑමට සිදුවේ. වයස්ගත වීමත් වැඩිහිටි කාන්තාවන් මුහුණපාන ගැටලු සොයා බැලීමට සහ ඔවුන්ගේ සමාජ සුබසාධන අවශ්‍යතා හඳුනා ගැනීම අරමුණු කරගන්නා ලද අතර ද්විතීක දත්ත මූලාශ්‍ර සහ ප්‍රථමික දත්ත මූලාශ්‍ර උපයෝගී කර ගන්නා ලදී. ප්‍රථමයෙන්ම සාහිත්‍ය ගවේෂණය සිදු කරන ලදී. එහිදී ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන ඇසුරින් ද්විතීක දත්ත රැස් කළ අතර පොල්පිතිගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින් ප්‍රාථමික දත්ත රැස් කළ අතර අහඹු නියැදුම් ක්‍රමය භාවිතා කළ අතර දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලදී. 2012 ජන හා නිවාස සංගනනයට අනුව 56% කාන්තාවන් වන අතර එය වැඩිහිටි පුරුෂ සංඛ්‍යාවට වඩා 289,271 කින් වැඩි වේ. එමෙන්ම පුමිතිරි අනුපාතය 79%ක් වන අතර ස්ත්‍රී වැන්දඹුභාවය 86.3% ක් වන අතර කාන්තාවන් පුරුෂයන්ට වඩා පහළ ආර්ථික මට්ටමක පසු වේ. ශාරීරික අපහසුතාද කාන්තාවන් අතර බහුලව වාර්තාවන බව නිගමනය වූ අතර ප්‍රාථමික දත්ත විශ්ලේෂණයේ දී කාන්තාවන්ගෙන් 72% ක් යැපෙන්නන් බව අනාවරණය වූ අතර පුර්ෂයන්ට සාපේක්ෂව කාන්තාවන් 27% ක් ශාරීරික අපහසුතාවලින් පසුවෙති. යෝජනා ලෙස ස්ත්‍රී ශ්‍රමය ඉලක්ක කොට ගෙන රැකියා අවස්ථා ඇති කළ යුතු අතර පෞද්ගලික අවිධිමත් අංශය සඳහා සුදුසු විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම සහ තරුණ වයස් කාණ්ඩවල කාන්තාවන් සඳහා ඉතුරුම් ක්‍රම හා රක්ෂණාවරණ ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීම, සෞඛ්‍ය අවශ්‍යතා මෙන්ම නිදහස්ව සතුටින් ගත කිරීමට අවස්ථාව සලසා දිය යුතුය.

***මුඛ්‍ය පද : වැඩිහිටි කාන්තාව, වයස්ගත වීම***

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ත්‍රීරෝද රථ අනතුරු සිදුවීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම

එම්. පී. එන්. පී. මැණික්ගේ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල වඩාත් ජනප්‍රිය ප්‍රවාහන මාධ්‍යයක් වශයෙන් ත්‍රීරෝද රථ භාවිතය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම මෙරට ප්‍රවාහන අංශය තුළ වැදගත් භූමිකාවක් ත්‍රිරෝද රථයට හිමිව තිබෙන අතර ඒ හරහා මෙරට තුළ සේවා නියුක්ති අවස්ථාවන් බොහොමයක්ද නිර්මාණය වී තිබේ. වර්තමානය වනවිට මෙරට තුළ ලියාපදිංචිවන ත්‍රීරෝද රථ සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනයවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම විශේෂ කරුණකි. 2016 වර්ෂය අවසාන වන විට මෙරට ලියාපදිංචි මුළු ත්‍රීරෝද රථ සංඛ්‍යාව මිලියනය ඉක්මවා ගොස් තිබේ. මෙලෙස මෙරට මාර්ග පද්ධතිය තුළ ධාවනයවන ත්‍රිරෝද රථ සංඛ්‍යාව ඉහළයාමට සාපේක්ෂව ත්‍රීරෝද රථ සම්බන්ධ අනතුරුවලද වර්ධනයක් හඳුනාගත හැකිය. 2016 වර්ෂය සැලකීමේදී වැඩිම මාරක රිය අනතුරු ප්‍රමාණයකට දායක වී ඇති රථවාහන අතර දෙවැනි ස්ථානය ත්‍රිරෝද රථවලට හිමිව තිබේ. මෙරට වාර්තා වන අනතුරු වලින් 1/4 ක් සිදුවන්නේද ත්‍රීරෝද රථ සම්බන්ධවයි. සෑම වර්ෂයක්ම පාහේ සැසඳීමේදී ත්‍රීරෝද රථ සම්බන්ධ අනතුරු ඊට පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ අගයක් වාර්තා කර තිබීම විශේෂ කරුණකි. මේ ආකාරයට ත්‍රිරෝද රථ අනතුරු ඉහළයාම බරපතළ සෞඛ්‍ය ගැටලුවක් වශයෙන් හඳුනාගත හැකි අතර මෙම ගැටලුව පාදක කොට ගනිමින් ත්‍රීරෝද රථ අනතුරු සිදුවීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ විය. ඒ සඳහා ශ්‍රී ලංකා පොලිස් රථවාහන මූලස්ථානයේ ත්‍රිරෝද රථ අනතුරු සම්බන්ධ 2002-2016 දක්වා දත්ත වාර්තාවන් ප්‍රධාන ද්විතික දත්ත මූලාශ්‍ර වශයෙන් භාවිතයට ගනිමින් මෙම අධ්‍යයනය මෙහෙයවූ අතර සාධක විශ්ලේෂණ (Factor Analysis) ශිල්පීය ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය සිදු විය. අධ්‍යයනය අවසානයෙහි අනාවරණය කරගත් කරුණු අතර අධික වේගය, ත්‍රිරෝද රථයෙහි ගමන් කිරීමට අවසර ලබාදී ඇති පුද්ගලයින් සීමාවන් උල්ලංගනය කරමින් පුද්ගලයින් රැගෙනයාම, රියදුරන්ගේ වයස් සීමාවන් සහ බීමත්ව රිය ධාවනය වැනි ත්‍රීරෝද රථ රියදුරන්ගේ නීති කඩ කිරීම් ඇතුළුව ත්‍රිරෝද රථයෙහි නෛසර්ගිකව පවතින අනාරක්ෂිත ව්‍යූහය වැනි සාධක ත්‍රීරෝද රථ අනතුරු සිදුවීම කෙරෙහි දැඩි ලෙස බලපෑම් සිදුකර ඇති බවට නිගමනය විය.

***මුඛ්‍ය පද : අනතුරු, නීති, රියදුරන් , රථ, ත්‍රිරෝද***

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

nirmaliprasanthika1@gmail.com

# මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි නාගරික හා ග්‍රාමීය පාසල් සිසුන් දක්වන නැඹුරුතාව

එම්. ඩී. ඒ. නිශාදි[1]

**සංක්ෂේපය**

වර්තමානයේ පාසල් සිසුන් බොහොමයක් පාසල් හැරයාම බහුලව දැකිය හැකිය. ග්‍රාමීයත්වය හා නාගරිකත්වය මත පදනම්ව ශිෂ්‍ය ප්‍රජාවගේ මෙම ඇබ්බැහිවීම් වල විෂමතාවක් පවතීද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාසල් දෙකක් හා නාගරික පාසල් දෙකක් ආශ්‍රයෙන් පර්යේෂණය සිදු කරන ලදි. එම පාසල්වල 9 -13 ශ්‍රේණි වල පිරිමි සිසුන්ගෙන් 100 ක නියැදියක් ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් දත්ත රැස්කරගෙන විශ්ලේෂණය සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය වූයේ ග්‍රාමීය පාසල් වල සිසුන්ගෙන් 68% ක් සහ නාගරික පාසල් වල සිසුන්ගෙන් 42% ක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවී ඇති බවයි. මෙමගින් නිගමනය වූයේ නගරයට සාපේක්ෂව ග්‍රාමීය පාසල් වල සිසුන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමේ වර්ධනයක් ඇති බවයි. මීට හේතු වශයෙන් පර්යේෂණය අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ ග්‍රාමීය පාසල් තුළ ශිෂ්‍යයන් පාසල අවට ම පදිංචිකරුවන් වීම හේතුවෙන් පාසල් කාලයෙන් බැහැරව ද ඔවුන් එකිනෙකා මුණ ගැසීමේ අවස්ථා වැඩිකම මත ඔවුන් කල්ලි වශයෙන් මෙම ක්‍රියාවල නිරත වන බවයි. එමෙන්ම නාගරික පාසල් තුළ ශිෂ්‍යයන්ට පාසල් කාලයෙන් බැහැරව මුණ ගැසීමේ අවස්ථා සීමිත වීම ඔවුන් මත්ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහිවීමේ ප්‍රවණතාවය අඩුවීම සඳහා හේතුවේ. මෙම සියලු හේතු සාධක අධ්‍යයනය කිරීමෙන් පෙනී ගියේ වර්තමානයේ පාසල් සිසුන්ගෙන් බොහොමයක් සමාජයට අහිතරකර පුද්ගලයන් වශයෙන් නිර්මාණය වන බවයි. පර්යේෂණයේ දී ඉදිරිපත් වූ යෝජනා අතර පාසල් සිසුන් ඇසුරු කරන කණ්ඩායම් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව දෙමාපියන් දැඩි අවධානයක් යොමු කළ යුතු බව පැහැදිලි විය.

***මුඛ්‍ය පද : මත්ද්‍රව්‍ය, ඇබ්බැහිවීම, පාසල් සිසුන්***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

anuththara.nishadi6@gmail.com

# පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවීමේ ප්‍රවණතාවය

ආර්. එන්. කේ. රාජපක්ෂ[1]

**සංක්ෂේපය**

වර්තමානය තුළදී දක්නට ලැබෙන ප්‍රධානතම ගැටළුවක් වන්නේ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සඳහා ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ලැබීමයි. මෙසේ පාසල් සිසුන් මත් ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වීම තුළින් ඔවුන්ගේ ජීවිත වලට අහිතකර ප්‍රතිඵල රාශියක් ලැබෙන බව මෑත කාලීනව සිදුකරන ලද පර්යේෂණ මගින් තහවුරු වී ඇත. එබැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීමට බලපාන හේතු සහ එමගින් ඔවුන්ට ලැබෙන අහිතකර ප්‍රතිවිපාකයන්ගේ බලපෑම කෙබඳුද යන්න හඳුනාගැනීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. අධ්‍යයනය සඳහා ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරාගත් අතර පාසල්වල 10 සිට 13 දක්වා ශ්‍රේණිවල පිරිමි සිසුන්ගෙන් 100 ක පොකුරු නියැදියක් ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් දත්ත රැස්කර සහසම්බන්ධතා සංගුණකය මගින් විශ්ලේෂණය සිදු කරන ලදි. මෙහිදී අනාවරණය වූයේ මිතුරු සමාජ තුළ කල්ලි වශයෙන් එක්වී මත්ද්‍රව්‍ය භාවිතා කරන බවත් එමගින් බොහෝ සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වන බවත් ය.  එසේම පාසල් අසල සිටින කුලීරථ රියදුරන්ගේ ඇසුරද මෙම ඇබ්බැහිවීම්වලට බලපාන සාධකයක් ලෙස හඳුනාගත හැකි විය. මෙම සියලු හේතු සාධකයන් මත සිදුවන අනිවාර්ය කරුණක් ලෙස පෙනී ගියේ  පාසල් සිසුන්ගෙන් බහුතරයක් නිසිකලට ප්‍රථම පාසල හැරයාම සහ ඒ හේතුවෙන් සමාජයට අහිතකර පුද්ගලයන් නිර්මාණය වීමයි. පර්යේෂණ සිදුකරගෙන යාමේදී ඉදිරිපත් වූ යෝජනා අතර පාසල් සිසුන් ඇසුරු කරන කණ්ඩායම් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව දෙමාපියන් දැඩි අවධානයක් යොමු කල යුතු බව ප්‍රත්‍යක්ෂ විය.

***මුඛ්‍යපද : පාසල් ශිෂ්‍යයා, මත්ද්‍රව්‍ය, ඇබ්බැහිවීම***

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

# විදේශ සේවා නියුක්තිය සඳහා දෙමාපියන් විදේශගත වීම (අත්තනගල්ල හා ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරෙන්)

ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග[1], ඩී. ඩී. වයි. එන්. ගුණරත්න, ඩී. ඩී. ඩබ්ලිව්. එන්. ගුණරත්න, කේ. ඩී. ලියනගෙ, කේ. එම්. ජී. එම්. ඩයස්

**සංක්ෂේපය**

"ස්වදේශිකයකුගේ ආදරය එක් රැස්වන කේන්ද්‍රස්ථානය ලෙස සැලකිය හැක්කේ පවුලයි. ඇත්ත වශයෙන්ම ඥාති ක්‍රමය, එයට සම්බන්ධ පෞද්ගලික නීතිය පිළිබඳ සංස්ථා, සමාජයේ ඒකක ලෙස සැලකුවේ පුද්ගලයා නොව පවුලයි." (පීරිස්, 2001, පි, 209) අතීතයේ සිට පැවති ශ්‍රී ලාංකීය පවුල් සංස්ථාව බිඳවැටීමට විවිධ හේතු සාධක ගණනාවක් හේතු විය. විවෘත ආර්ථිකයේ බලපෑමත් සමඟ විදේශ රටවල් කරා ඇදී ගිය ශ්‍රම සංක්‍රමණික ප්‍රවාහය ඉතා විශාල විය. මේ හේතුවෙන් දෙමාපියන් විදේශගත වීම නිසා පවුලේ ආර්ථිකයට සහ දරුවන්ගේ අධ්‍යාපනයට වන බලපෑම කෙබඳුදැයි විමසීම අප අධ්‍යනයේ මූලික අරමුණ වේ. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ සේවා නියුක්ති සංගහනයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ජා ඇල සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි තෝරාගත් ග්‍රාම සේවා වසම් අටක පවුල් හතලිහක් නියදිය ලෙස තෝරාගෙන ඇත. සසම්භාවී නොවන නියදි ක්‍රමය පදනම් කරගෙන තෝරාගත් නියදිය තුළින් රැස් කරගත් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත සඳහා කල්පිත පරීක්ෂාවන් යොදා ගනිමින් පර්යේෂණය කර ඇත. ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස තෝරාගත් නියදිය වෙතට ප්‍රශ්නමාලාවක් ඉදිරිපත් කිරීමෙන් දත්ත රැස් කරන ලදී. දෙමාපියන් විදේශගත වීම නිසා පවුලේ ආර්ථිකයට සහ දරුවන්ගේ අධ්‍යාපනයට සෘජුවම බලපෑම් කරනු ලබයි. ඒ පිළිබඳව දත්ත විශ්ලේෂනයේ දී කල්පිත ගොඩනැංවීම මගින් ප්‍රත්‍යක්ෂ කර ගැනීමට හැකියාව ලැබුණි. එනම් "දෙමාපියන් විදේශගත වූ පවුල්වල පෙර හා පසු ආර්ථික තත්ත්වය සමාන වේ." යන කල්පිතය රැස් කරගත් දත්ත මත ප්‍රතික්ශේප වූ අතර විදේශගත වීමට පෙර ආදායමට වඩා පසු ආදායම සාමන්‍යයෙන් දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. ඒ නිසා පවුලේ ආර්ථිකය යහපත් වී ඇත. එම බලපෑම් ආර්ථික වශයෙන් යහපත් වූවද අධ්‍යාපනික වශයෙන් අයහපත් ප්‍රතිඵල වැඩි වී ඇත. බොහෝවිට ළදරුවියේ දරුවන් සිටින දෙමාපියන් වැඩි වශයෙන් විදේශගත වීම හේතුවෙන් දරුවන්ගේ සමාජානුයෝජනය ක්‍රියාවලිය එමගින් අඩාල වී ඇත. අධ්‍යයනයට තෝරාගත් පවුල් හතළිහ තුළ විදේශගත වීමට පසු පවුලේ ආදායම සහ අධ්‍යාපනයට වැයකරන ප්‍රමාණය මත ප්‍රතිපායන සමීකරණය ගණනය කිරීමේ දී ධන සබඳතාවක් දැකගත හැකි වුණි.මේ අනුව දෙමාපියන් විදේශගත වූ පසු පවුලේ ආර්ථිකය යහපත් වූව ද දරුවන්ගේ අධ්‍යාපනයේ සාධනීය මට්ටම පහත වැටී ඇති බවට තහවුරු කර ගැනීමට හැකි විය. මේ අනුව දෙමාපියන් විදේශගත වූ පවුල්වල දරුවන් කෙරෙහි පාසල් මට්ටමින් විශේෂ අධ්‍යාපනයක් ලැබිය යුතු අතර ඔවුන්ගේ අධ්‍යාපන කුසලතා ඔප්නැංවීම සඳහා වෘත්තීමය හෝ වෙනත් සානුබල ඔවුන්ට ලබා දිය යුතු ය.

***මුඛ්‍ය පද : දෙමාපියන් විදේශගත වීම, පවුලේ ආර්ථිකය, දරුවන්ගේ අධ්‍යාපනය***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# වත්මන් පාසල් ශිෂ්‍ය ප්‍රජාව විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමුවීමේ ප්‍රවණතාව

පී. ඒ. ඩී. ටී. ඩී. රත්නසිරි[1]

**සංක්ෂේපය**

වර්තමානය වන විට බොහෝ පාසැල්වල විෂයානුබද්ධ ක්‍රියාකාරකම් මෙන්ම විෂයබාහිර ක්‍රියාකාරකම් සඳහා ද සිසුන් යොමු කරවීමට මහත් උත්සුක වේ. විෂයබාහිර ක්‍රියාකාරකම් යනුවෙන් අරුත් ගැන්වෙනුයේ පොතපතේ අධ්‍යනයන්ට අමතරව සිදුකරනු ලබන ක්‍රීඩාව, සෞන්දර්යය කලාව ආදියයි. වර්තමානය වන විට අධ්‍යාපනයේ තරඟකාරීත්වයත් සමඟ දරුවන් විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමුවීමට ඇති ප්‍රවණතාව සොයාබැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ගම්පහ ප්‍රදේශයේ එක් පාසලක් තෝරාගෙන ශ්‍රේණි මට්ටම් 03කට වර්ග කර සිසුන් 100ක නියැඳියක් තෝරා ගන්නා ලදි. අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස්කිරීම සිදු කරනු ලැබූ අතර දත්ත ඉදිරිපත් කිරීමට වගු ප්‍රස්තාර යොදා ගන්නා ලදි. එමෙන්ම දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදි. මෙලෙස සිදුකරන ලද පර්යේෂණයේ දී තහවුරු වූයේ සිසුන් 100ක නියැඳියෙන් සිසුන් 43ක්ම විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු නොවීමයි. එනම් වර්තමාන පාසල් ශිෂ්‍ය ප්‍රජාව විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධවීමේ ප්‍රවණතාවය අඩු බවයි. මෙසේ අඩුවීමට හේතු ලෙස අ.පො.ස සාමාන්‍ය පෙළ/උසස් පෙළ විභාගයන් සමත්වීම සඳහා බාධාවක් වීම, ඒ සඳහා කාලය වෙන් කිරීමට නොහැකි වීම, විෂයානුබද්ධ ක්‍රියාකාරකම් සඳහා විශේෂ තැනක් ලබාදීමත් එම නිසා විෂය බාහිර ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමට උනන්දුවක් නොදැක්වීම, එමෙන්ම විෂයබාහිර ක්‍රියාකාරකම් කිරීමට ඇති අලසකම හා නොසලකා හැරීම, පාසල් අධ්‍යාපනයට අමතරව සවස් කාලය තුළ සහ සති අන්තයේ අමතර පංති වලට සහභාගී වීම ආදී කරුණු දැක් විය හැකිය. එසේම විෂයබාහිර ක්‍රියාකාරකම් සිදු නොකිරීම හේතුවෙන් දරුවන් බෝ නොවන රෝගවලට ගොදුරුවීමට ඉඩකඩ වැඩි බවද අපට තහවුරු විය. එමනිසා විෂයබාහිර ක්‍රියාකාරකම් සිදුකිරීමෙන් ලැබෙන ශාරීරික හා මානසික සුවය පිළිබඳව සිසුන් දැනුවත් කරමින් එය විෂයානුබද්ධ ක්‍රියාකාරකම් සඳහා බාධාවක් නොවන පරිදි සිදුකල හැකි බවට දරුවන් තුළ විශ්වාසයක් ගොඩනැංවිය යුතුය.

***මුඛ්‍ය පද : පාසල් සිසුන් , විෂය බාහිර ක්‍රියාකාරකම් , අධ්‍යාපන ක්‍රමය***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# වයස්ගතවූවන් පැමිණීමට හේතු සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය (මීරිගම සෙත්සෙවන වැඩිහිටි නිවාසය ඇසුරෙනි)

කේ. ඒ. ඩී. එල්. වයි. එම්. සේනාපාල[1]

**සංක්ෂේපය**

ළමාවිය, තරුණවිය, මැදිවිය හා මහලුවිය මානව ජීවන අවධීන් පසුකරන විටදී ළමාවිය දෙමාපියන්ගේත්, තරුණවිය හා මැදිවිය ස්වශක්තියෙන් ද, මහලුවිය පරපෝශිත අවධියක් ලෙසද ගතවෙයි. සමාජයේ සැලකිය යුතු අවධානයක් යොමු විය යුතු ජේෂ්ඨ පුරවැසියන් වැඩිහිටි නිවාසවලට ඇතුළත්වීමට හේතු හා තනිවූවන් වැඩිහිටි නිවාසවල ඔවුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. 20 දෙනෙකුගෙන් යුතු නියදියකගෙන්, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් දත්ත රැස් කරන ලදී. නියදියේ සියලු පුරුශයන් අවිවාහකයන් වූ අතර කාන්තාවක් 80%ක් විවාහක අය විය. තමන් පෙර කළ ගතකළ ජීවිතය හා සසදන විට වැඩිහිටි නිවාස ජීවිතය සුවදායක බව 90% දෙනාගේ අදහස විය. වැඩිහිටියන් බැලීමට 30% පැමිණෙන අතර 20% දෙනා තමන් බැලීමට එයි යන අපේක්ෂාවෙන් සිටින අතර ඉතිරි වැඩිහිටියන් තමන් බැලීමට කවුරුන් හෝ පැමිණෙනවාට අකමැති යැයි ප්‍රකාශ කළ අය වේ. තමන් පෙර ගතකළ ජීවිතය අමතක කිරීමට රූපවාහිනියට හා ගුවන්විදුලියට යොමුවීමටත් ධර්මානුකූල ජීවිතයක් ගත කිරීමටත් යොමුව ඇති අතර නියදියේ පුරුෂයන් 90%ක් අන් අය සමඟ කතා කරමින් කාලය ගත කිරීමට කැමැත්තක් දක්වා තිබේ. දරුවන්ගේ රැකවරණය නොලැබීමෙන් 46%ක්, අවිවාහකබවින් නියදියේ ස්ත්‍රීන්ගේන් 55%ක්ද නියදියේ පුරුෂයන්ගේන් 100%ක්ද, දරුවන් නොමැතිකම නිසා 20%ක්ද, ජීවත්වීමට තැනක් නොමැතිකමින් 35%ක්ද, දරුවන්ගේ අයහපත් ක්‍රියාකලාපය නිසා 10%, ජීවිතයේ තනිවීම හා මැදිවියේ රැකියාවක නිරත වුවත් අවසන් අවධියේ රැකබලා ගැනීමට අයෙකු නොමැතිකම වැඩිහිටි නිවාසයට පැමිණීමට හේතු විය. යන්න තැනක් නොමැති වීම හා දරුවන්ට කරදර කිරීමට ඇති අකමැත්ත යන හේතු මත 80%ක් දෙනා නැවත නිවාස බලා යාමට අකමැත්ත ප්‍රකාශ කරයි. මෙම අධ්‍යයනය මඟින් අවිවාහකබව, අස්ථාවර ආර්ථීක තත්ත්වය, ජීවත්වීමට ස්ථාවර ස්ථානයක් නොමැති වීම හා ජීවිතයේ තනිවීම වැඩිහිටි නිවාසයට පැමිණීමට ප්‍රධාන හේතු විය. එමෙන්ම පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් වැඩිහිටි නිවාසගත වී තිබේ.

***මුඛ්‍ය පද : වැඩිහිටියන්, වැඩිහිටියන් අසරණ වීම, වැඩිහිටි නිවාස, අවිවාහකබව***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

yashiyashoda94@gmail.com

# විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ ජංගම දුරකථන භාවිතය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එච්. ටී. ඒ. ශාලික[1]

**සංක්ෂේපය**

තාක්ෂණයත් සමග නිරන්තර වෙනස්වීම්වලට භාජනයවෙමින් සන්නිවේදන කාර්යයේදී ප්‍රමුඛ ස්ථානයක් හිමිකරගෙන ඇති සන්නිවේදන උපකරණයක් වශයෙන් ජංගම දුරකථන හඳුනාගත හැකිය. මුල් යුගයේ ජංගම දුරකථනය කතා කිරීම , කෙටි පණිවුඩ යැවීමට පමණක් සීමා වුවත් වර්තමානය වනවිට එම අවශ්‍යතාවන්ගෙන් ඔබ්බට ගොස් කාර්යයන් බොහොමයක් ඉටු කර ගත හැකි බහුකාර්යය උපාංගයක් බවට ජංගම දුරකථනය පත්ව තිබේ. ජංගම දුරකථන භාවිතය සම්බන්ධ පාරිභෝගික හැසිරීම් කෙරෙහි බලපානු ලබන බහුමාන සාධක ගණනාවක් පවතී. විශ්වවිද්‍යාලයක් සැලකීමේදී සෑම ශිෂ්‍යයෙකුම කුමන හෝ වර්ගයක ජංගම දුරකථනයක් භාවිතා කිරිම සුලභ වශයෙන් දක්නට ලැබෙන්නකි. මෙම අධ්‍යයනයේදී අවධානය යොමුවන්නේ ජංගම දුරකථන තෝරා ගැනීම කෙරෙහි විශ්වවිද්‍යාල සිසුනගේ හැසිරීම් රටා අධ්‍යයනය කිරීම වේ. ඒ අනුව මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින් එකක 100 යුක්ත නියැදියක් සියලුම පීඨ නියෝජනය වන පරිදි ස්ථුත සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ තෝරාගනු ලැබූ අතර එසේ තෝරා ගත් නියැදිය ඇසුරින් විවෘත හා සංවෘත ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්ණාවලියක් ඇසුරින් අවශ්‍ය ප්‍රාථමික දත්තයන් රැස් කරගනු ලැබිණි. ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම්ව අධ්‍යයනය මෙහෙය වුවද අවශ්‍යතාවය මත ද්විතික ද්ත්තයන් ද භාවිතා කරනු ලැබීය. අධ්‍යයන අවසන් නිගමනය වූයේ පවුලේ ආදායම් තත්ත්වය ධනාත්මක අර්ථාන්විත බලපෑමක් විද්‍යාර්ථීන්ගේ ජංගම දුරකථන තෝරාගැනීම් කෙරෙහි ඇති කරන බවත් ඊට අමතරව මිල ගනන්, වෙළෙඳ සන්නාම, ජංගම දුරකථනයෙහි පවතින පහසුකම් සහ වෙළෙඳපොළ නව ප්‍රවණතාවන් කෙරෙහිද විශ්වවිද්‍යාල සිසුනගේ ඉල්ලුම නම්‍යතාවයක් පෙන්නුම් කරන බවයි.

***මුඛ්‍ය පද : සන්නිවේදනය, තාක්ෂණය, දූරකථනය, ඉල්ලුම, විශ්වවිද්‍යාල***

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ashanshalika008@gmail.com

# විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ ජංගම දුරකථන භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

ටී. එම්. එච්. ඩී. තලවත්ත[1] , ආර්. ඩබ්ලිව්. එම්. බී. එන්. රණසිංහ

**සංක්ෂේපය**

මානව සමාජයේ සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ප්‍රධාන හැරවුම් ලක්ෂයක් ලෙස තාක්ෂණික උපකරණ භාවිතය පෙන්වා දිය හැක. එහි දී ජංගම දුරකථන භාවිතයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. වර්තමාන ලෝක ජනග්‍රහනයෙන් බිලියන 4.77 ක ජනග්‍රහනයක් ජංගම දුරකථන භාවිතා කරනු ලබයි. (statista , 2017) ජංගම දුරකථන භාවිතා කරන්නන් අතර විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථීන්ගේ ජංගම දුරකථන භාවිතය පිළිබඳ අධ්‍යනය කිරීම අපගේ අරමුණ වේ. ඒ යටතේ විද්‍යාර්ථීන් ජංගම දුරකථන වැඩි වශයෙන් භාවිතා කරන්නේ කුමක් සඳහාද, ඒ සඳහා වැය වන පිරිවැය මෙන්ම ඔවුන් වැඩි වශයෙන් භාවිතා කරන ජංගම දුරකථන වර්ගය යනාදිය පිළිබඳව අවධානය යොමු කෙරිණි.මෙම අධ්‍යනය සඳහා ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීමෙහි ලා ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය ඔස්සේ ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. මෙහිදී කැලණිය විශ්වවිද්‍යාලයේ සමස්ත විද්‍යාර්ථීන්ගෙන් යුත් සංගහනයෙන් කොටස් නියැදීම යටතේ විද්‍යාර්ථීන් 100 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් තෝරා ගනු ලැබීය. ඒ තුළින් විද්‍යාර්ථීන් ජංගම දුරකථනය කුමන අරමුණක් උදෙසා භාවිතා කරන්නේද යන්න අධ්‍යනය කරන ලදී. මෙම අධ්‍යනයේ දී කේන්ද්‍රික ප්‍රවණතා මිණුම් යටතේ මධ්‍යන්‍යය ගණනය කළ විට ජංගම දුරකථන භාවිතා කරන විද්‍යාර්ථීන්ගෙන් 76% ක් ස්මාර්ට් ජංගම දුරකථන (smart phones) භාවිතා කරන බවද විද්‍යාර්ථීන් 49% ක ප්‍රමාණයක් රු. 250- 500ක මුදලක් ජංගම දුරකථනයේ පෙරගෙවුම්පත් සහ පසුගෙවුම්පත් සඳහා මාසිකව වැය කරන බව ද තහවුරු විය. තවද කේන්ද්‍රික ප්‍රවණතා මිණුම් යටතේ මාතය ගණනය කළ විට එහි ප්‍රතිඵලය ලෙස විද්‍යාර්ථීන්ගෙන් 51% ක් ජංගම දුරකථන භාවිතා කරනුයේ ඇමතුම් ලබා ගැනීම සඳහා බව සංඛ්‍යාත්මකව අනාවරණය විය. පසුව පිළිවෙලින් අන්තර්ජාලය භාවිතය (32%), කෙටි පණිවිඩ යැවීම (16%), සමාජ ජාල වෙබ් අඩවි භාවිතය (15%), අධ්‍යාපන කටයුතු (11%) සඳහා ද ජංගම දුරකථන භාවිතා කරන බව තහවුරු විය. මෙම අධ්‍යනයට අනුව විද්‍යාර්ථීන් නව දැනුම සොයා යාම සඳහා වැඩි වශයෙන් ජංගම දුරකථනය යොදා ගන්නේ නම් එය ඔවුන්ගේ දැනුම පරාසය පුළුල් කර ගැනීමට ඉවහල් වනු ඇත. ඒ සඳහා යෙදවුම් මෘදුකාංගයක් (mobile app) ජංගම දුරකථන සඳහා හඳුන්වා දෙනු ලබන්නේ නම් විද්‍යාර්ථීන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු පහසුවෙන් හා සාර්ථකව කර ගෙන යාමට උපකාරී වනු ඇත.

***මුඛ්‍ය පද : ජංගම දුරකථනය, විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථීන්***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

hasaradtm@gmail.com

# පාසල් සිසුන්ගේ ජංගම දුරකථන භාවිතය හා එමගින් අධ්‍යාපනයට ඇති බලපෑම

කේ. පී. එල්. උදයංගනී[1]

**සංක්ෂේපය**

වර්තමානය වන විට පාසල් සිසුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීමක්, නිසි වයසට ප්‍රථම පාසල් හැර යාමක් හඳුනාගත හැකිය. ඊට හේතුවක් ලෙස ජංගම **දු**රකථන භාවිතය පෙන්වා දිය හැකිය. පාසල් සිසුන් කොපමණ ප්‍රමාණයක් ජංගම **දු**රකථන භාවිතයට යොමු වී ඇත් ද? සහ එය ඔවුන්ගේ අධ්‍යාපනයට කෙසේ බලපෑම් කර තිබේ ද? යන්න සොයා බැලීම මෙම පරයේෂණයේ මුඛ්‍ය අරමුණ වී ඇත.වදුරඹ **වදුරඹ** ප්‍රදේශයේ පාසලකින් 11 ශ්‍රේණියේ සිසුන් 50 ක නියදියක් පහසු නියදීමේ ක්‍රමය මඟින් තෝරා ගෙන ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කර ගන්නා ලදී. වගු, ප්‍රස්ථාර,ප්‍රතිශත වැනි සරල සංඛ්‍යාන ක්‍රමවේද හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය ක්‍රමයක් වන ප්‍රතිපායන ආකෘතිය මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙහිදී සිසුන් 11 ශ්‍රේණියේ පළමු වාර පරීක්ෂණයේදී විෂයන් සඳහා ලබා ගත් මුලු ලකුණු පිළිබඳ අවධානය යොමු කරන ලදී. මෙහිදී ලබා ගත් නිගමන වලට අනුව සමස්තයෙන් සිසුන් 65% ක් පමණ ජංගම දූරකථන භාවිතා කරයි. තම දෙමාපියන් නොදැනුවත්ව ජංගම දූරකථන භාවිතා කරන පිරිස වැඩි අතර, සමහර සිසුන් දෙමාපියන් දැනුවත්ව ජංගම දූරකථන භාවිතා කරයි ඔවුන්ගේ අධ්‍යාපන **සාර්**ථකත්වය විමසා බැලූ විට බහුතරයක් සිසුන් අඩු ලකුණු මට්ටම්වල සිටී. සිසුන් වැඩි පිරිසක් මුලු ලකුණු 400ට වඩා අඩු ප්‍රමාණයක් ලබා ඇත. මෙ මෙඟින් පෙනී යන්නේ ජංගම දූරකතන ඵාවිතය ඔවුන්ගේ අධ්‍යපනය කෙරෙහි බලපා ඇති බවයි. මෙහිදී ප්‍රේම සමභ්බක්ධතා තිබීම, පවතින සමාජ රැල්ල අනුගමනය කිරීම වැනි හේතු නිසා ඔවුන් ජංගම දූරකතන භාවිතයට යොමු වී ඇනි බව හෙලි විය. තවද පිරිමි ළමුන් ගැහැණු ළමුන්ට සාපේක්ෂව වැඩි වශයෙන් ජංගම දූරකතන භාවිතයට යොමු වී තිබේ.

***මුඛ්‍ය පද  පාසල් ළමුන්, අධ්‍යාපනය, ජංගම දූරකථන , බලපෑම***

[1]සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

lilanthikaudayangani@gmail.com

# කාටූන් ශිල්පියා සහ නිර්මාණාත්මක සංදේශය ( තලංගම ජයසිංහ චරිතාපදාන අධ්‍යයනයක් )

ඩබ්. පී. සචිනි වත්සලා විජේසේකර[1]

**සංක්ෂේපය**

පුවත්පත් කාටූනය වර්තමානයේ දී ජාතික පුවත්පතකට නැතිවම බැරි විශේෂාංගයකි. ස්වභාවික ලෝකයේ ඇති සිදුවීම් උපහාසය හා හාස්‍යය ජනනය වන අයුරින් විකට ස්වරූපයෙන් අඳින චිත්‍ර කාටූන් ය. පුවත්පත් කාටූන් ශලීපියා යනු, විශාල පරාසයක විහිදී ඇති සිද්ධි සමුදායක් එක් කාටූනයකට ගොනුකර එය හාස්‍යයයෙන් හා උපහාසයෙන් ගෙන එන සූක්ෂම නිර්මාණකරුවෙකි. කාටූන් ශිල්පියාගේ නිර්මාණ කෙරෙහි කුඩා කාලයේ පටන් ඔහු සතු වූ දේශපාලනික, ආර්ථික, සමාජීය අත්දැකීම් බලපාන්නේ ද, එසේ නම් කුමනාකාරයෙන් ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. 2015 ජනවාරි මාසයේ පල වූ ඒතුමා කාටූන් පෙළ අන්තර්ගත විශ්ලේෂණයට ලක් කිරීම සහ එහි නිර්මාණකරු තලංගම ජයසිංහ කාටූන් ශිල්පියා සමඟ කළ සම්මුඛ සාකච්ඡාවෙන් දත්ත ලබා ගෙන නිගමන වලට එළඹෙන ලදී. කාටූන් ශිල්පියෙකුගේ කාටූන් සංදේශ නිර්මාණය කෙරෙහි කුඩා කළ පටන් ඔහු ලැබූ අධ්‍යාපනය, පවුල් පසුබිම මෙන් ම ඔහු ලැබූ දේශපාලනික, ආර්ථික, සමාජීය දැනුම සහ අත්දැකීම් සවිඥානිකව හා අවිඥානිකව උපයෝගී සහ හේතු වේ. ක්‍රමානුකූල පුවත්පත් කාටූන් විචාරය කිරීමේ කලාවක් හෝ විෂයයක් මෙන් ම කතිකාවක් මෙරට පාඨකයන් අතර ඇති කළ යුතු ය.

***මූඛ්‍ය පදඃ කැරිකේචර්, දේශපාලන කාටූන්, කාටූන් ශිල්පියා,කාටූන් සන්නිවේදනය, චරිතාපදානය***

---

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

sachiniwijeseka21@gmail.com

# ඌව පළාත් උපාධිධාරීන් රජයේ රැකියා අපේක්ෂා කිරීමට හේතු

ඩබ්. ඩබ්. එම්. ඩී. විජේතුංග[1]

**සංක්ෂේපය**

වර්තමානයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ද යම් ප්‍රමාණයකින් ඉහළ දැමීමට කටයුතු කර ඇත. ඒ තුළින් හා බාහිර උපාධි ආශ්‍රයෙන් බිහිවන උපාධිධාරීන් ප්‍රමාණය විශාල වේ. නමුත් මෙලෙස බිහිවන උපාධිධාරීන්ට අවශ්‍ය රැකියා නිර්මාණය වන්නේද පිළිබඳ ගැටළුවක් පවතී. මෙලෙස බිහිවන උපාධිධාරීන් රජයේ රැකියා අවස්ථාවලට යොමුවීමේ ප්‍රවණතාවක් වර්ථමානයේ දී හඳුනාගත හැක. උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් රාජ්‍ය සේවයට පිවිසීමට බලාපොරොත්තු වුවද රාජ්‍ය සේවය තුළ නිර්මාණය වන නව රැකියා අවස්ථා ප්‍රමාණය සීමිත වේ. මේ හේතුවෙන් ඌව පළාත තුළ පසුගිය වසර කිහිපය තුළ රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව සීග්‍රයෙන් ඉහළ යාම පර්යේෂණ ගැටළුව ලෙස මෙම පර්යේෂණයේ දී හඳුනාගෙන ඇත. ඌව පළාත් උපාධිධාරීන් වැඩි වශයෙන් රාජ්‍ය සේවයට නැඹුරු වීමට හේතු කවරේද යන්න මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරනු ලබයි. ඌව පළාත් සභාව මඟින් ලබාගත් ද්විතික දත්තයන් හා සසම්භාවීව තෝරාගත් රැකියා විරහිත උපාධිධාරීන් 100 කින් ලබාගත් තොරතුරු මඟින් පර්යේෂණ ක්‍රියාවලිය කරනු ලබයි. එහිදී උපාධිධාරීන්ගෙන් 70% ඌව පළාත් සභා රාජ්‍ය සේවයෙහි නිරත වීමට බලාපොරොත්තු වන අතර එයින් 25%ක් රාජ්‍ය සේවයේ පමණක් නිරත වීමට බලාපොරොත්තුවෙන් රැකියා වියුක්තිභාවයෙන් සිටී. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව මෙයින් බොහෝ පිරිසක් කලා උපාධිධාරීන් වේ. එමෙන්ම රාජ්‍ය සේවයේ පවතින විවිධ වරප්‍රසාද හා විවේකීය ස්වභාවය නිසා රාජ්‍ය සේවයේ රැකියා සදහා යොමුවීමට කැමැත්ත දක්වයි. තවද බොහෝ පිරිසක් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු වීමට කැමැත්ත දැක්වුවද, ඔවුන්ගේ උපාධිය ඒ සඳහා යෝග්‍ය නොවීමත්, ඉංග්‍රිසි භාෂාවේ දුර්වලතාවයත්, වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව නොමැති නිසා පෞද්ගලික අංශයේ රැකියා සදහා  සුදුසුකම් නොලැබීම ප්‍රධාන වශයෙන් ඌව පළාත් උපාධිධාරීන් රජයේ රැකියා අපේක්ෂා කිරීමට හේතු ලෙස හඳුනා ගන්නා ලදි. එම හේතුන් අවම ගැනීමට ගත හැකි විකල්පයන් පිළිබඳ මෙම පර්යේෂණයේදී අවධානය යොමු කර ඇත.

***මුඛ්‍ය පද : උපාධිධාරීන්, ඌව පළාත***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

thiwankadanz@gmail.com

# OTHER

# ගුවන්විදුලි කාන්තා වැඩසටහන් සහ ශ්‍රාවක බලපෑම පිළිබඳ අධ්‍යයනයක්
# (නෙත්, ලක්, ස්වදේශී සහ අයි.ටී.එන් ගුවන්විදුලි නාලිකා ඇසුරෙනි)

ඒ. එම්. එල්. එස් අත්තනායක[1]


**සංක්ෂේපය**

ගුවන්විදුලිය යනු, හඬ-නිහඬ අන්තරය පදනම් කරගත් ප්‍රබල තරංගකාරී මාධ්‍යයකි. එක් එක් වැඩසටහන් ඉදිරිපත් කිරීමේ දී ග්‍රාහකයාගේ සමාජ, ආර්ථික සහ වයස් මට්ටම යන කාරණා කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. වර්තමාන ගුවන්විදුලිය මෙම කාරණා මූල්කරගනිමින් විවිධ තේමාවන් ට අනුව වැඩසටහන් ආකෘති සහ අන්තර්ගතයන් නිර්මාණය කරනු ලබයි. එහිදී සමාජයේ ග්‍රාහක ක්ෂේත්‍රය ට ප්‍රබල අවධානයක් යොමුවේ. ගුවන්විදුලි වැඩසටහන් අතර කාන්තා වැඩසටහන් යනු, එක් ප්‍රබල ආකෘතියකි. මෙහි ඉලක්ක ග්‍රාහක ක්ෂේත්‍රය කාන්තාවන් ය. එක් එක් ගුවන්විදුලි නාලිකාවන්හි මෙම ආකෘතියට අනුව සකස්කර ඇති වැඩසටහන් විවිධත්වයක් පෙන්වන අතර එමඟින් ඉලක්කගත ශ්‍රාවක පිරිසට සිදුකරනු ලබන බලපෑම් ද විවිධාකාරය. ඒ අනුව ගුවන්විදුලි නාලකා තුළ විකාශනය කරනු ලබන කාන්තා වැඩසටහන් මඟින් කාන්තාවන්ට බලපෑමක් සිදුකරයි ද? යන්න මෙම අධ්‍යයනයේ ගැටළුව ලෙස යොදා ගැණුනි. ගුවන්විදුලි කාන්තා වැඩසටහන් මඟින් කාන්තාවන්ට සිදුකරන බලපෑම අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර ක්‍රමවේදය යොදාගන්නා ලදී. ඒ යටතේ දත්ත රැස්කිරීම මෙන්ම දත්ත විශ්ලේෂණය කිරීම සිදුවිය. ප්‍රාථමික දත්ත රැස්කරගැනීම සඳහා යොදාගත් ක්‍රම වන්නේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ ප්‍රශ්නාවලි ක්‍රමය යි. ගුවන්විදුලි කාන්තා වැඩසටහන් පිළිබඳ අන්තර්ගත විශ්ලේෂණය සිදුකිරීම මඟින් ගුණාත්මක දත්ත රැස්කරගැනීමට හැකිවිය. මෙහිදී ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි කාන්තා වැඩසටහන් විකාශය කරනු ලබන ගුවන්විදුලි නාලිකා කිහිපයක් වන නෙත්, ලක්, ස්වදේශී සහ අයි.ටී.එන් යන ගුවන්විදුලි නාලිකා තෝරාගන්නා ලදී. වැඩිම කාන්තා ජනසංඛ්‍යාවක් සිටින ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහටා තිබෙන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අතරින් තෝරාගත් කාන්තාවන් 100 දෙනෙකුගෙන් සමන්විත වූ අරමුණුගත නියැදියක් මෙහිදී යොදා ගැණුනි. නිබන්ධන, ග්‍රන්ථ සහ අන්තර්ජාලය ඇසුරු කරමින් ද්විතීයික දත්ත රැස්කරගැනීම සිදුවිය. දත්ත විශ්ලේෂණය මගින් තහවුරු වූයේ, මෙම ගුවන්විදුලි වැඩසටහන් කාන්තාවන් ඉලක්ක කරගන්නා වැඩසටහන් වුව ද, අන්තර්ගතය තුළ ඒ සඳහා ලබාදෙන ඉඩ ප්‍රමාණය අවම මට්ටමක පැවතීම ඇතුළු ගැටලු කිහිපයක් නිසා කාන්තාවන් කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදුනොකරන බවයි. ඊට විසඳුම් වශයෙන් වැඩි සම්පත් දායකයින් ප්‍රමාණයක් එක්කර ගනිමින් වැඩසටහන් වල ගුණාත්මකභාවය වර්ධනය කරගැනීමත්, අන්තර්ගතය තුළ ආකර්ශණියබව වර්ධනය කිරීම තුළින් ග්‍රාහකත්වය පුළුල් කරගැනීමත් කළ යුතු බව මෙම අධ්‍යයනයේ දී පැහැදිලි විය.


***මුඛ්‍ය පද : කාන්තාව, ගුවන්විදුලිය, වැඩසටහන්, ශ්‍රාවක බලපෑම***

---

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

loshanisummya@gmail.com

# බස්නාහිර පළාත තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

කේ. එල්. සී. එස්. චන්ද්‍රසිරි [1]

**සංක්ෂේපය**

එදිනෙදා ක්‍රියාවලියන්ගෙන් ජනිතවී ඉවත දමනු ලබන ආර්ථිකමය වටිනාකමක් නොමැති නිසි කළමනාකරණය තුලින් සම්පතක් බවට පත් කළ හැකි ඝන තත්වයේ ද්‍රව්‍යයන් ඝන අපද්‍රව්‍ය වේ. අපද්‍රව්‍ය අවිධිමත්ව බැහැර කිරීම නිසා ගැටලු රාශියකට මුහුණ දී ඇති අතර ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ ඝන අපද්‍රව්‍ය විධිමත්ව කළමනාකරණය නොකිරීම මෙම අධ්‍යයනයේ ගැටලුවයි. බස්නාහිර පළාත තුළ ඝන අපද්‍රව්‍ය විධිමත්ව කළමනාකරණය නොකිරීමට හේතු විමසා බැලීම මෙහි අරමුණ වේ. කාලශ්‍රේණි දත්ත භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී. ශ්‍රී ලංකාවේ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය සැලකූ විට කැපී පෙනෙන අපද්‍රව්‍ය වර්ධනයක් කොළඹ මහ නගර සභාව තුළ දැකිය හැකිය. කොළඹ නගරය වර්ග කිලෝමීටර 37.3 ක ප්‍රමාණයක් වුවද වර්ග කිලෝමීටරයක ජීවත්වන ජන සංඛ්‍යාව 170 000ක් පමණ වේ. අධික ජන ඝනත්වය මෙන්ම දෛනිකව පිටතින් කොළඹට පැමිණෙන පුද්ගලයින් මගින් කොළඹ නගරයේ ඝන අපද්‍රව්‍ය උත්පාදනය ඉහළ යාමට හේතු වී තිබේ. කොළඹ නගරයේ පමණක් මේ වන විට කසල එක්රැස් ස්ථාන 25-30 අතර ප්‍රමාණයක් නිර්මාණය වී තිබේ. මීතොටමුල්ලට කසළ බැහැර කිරීම ආරම්භ වන්නේ 2008 වසරේදී කොළඹ බ්ලූමැන්ඩල්හි කසළ බැහැර කිරීම නවතාලීමත් සමඟය. සමස්ථයක් ලෙස අධ්‍යයනය පිළිබඳ සලකා බැලීමේදී පැහැදිලි වූයේ කළමනාකරණය සඳහා පිළිගත් ක්‍රමවේදයක් ශ්‍රී ලංකාව තුළ නොමැතිවීම හේතුවෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 48 ඔවුන්ගේම ආකාර වලට අපද්‍රව්‍ය කළමනාකරණය කරන බවයි. ශ්‍රී ලංකාවේ සමස්ථ අපද්‍රව්‍ය ජනනයෙන් 60%ක් එනම් දිනකට මෙට්‍රික් ටොන් 3500ක් බස්නාහිර පළාත තුළින් ජනනය වීම සිදුවේ. වාර්ෂිකව එම ප්‍රමාණය 1.2% කින් වැඩි වීමක් පෙන්නුම් කරන අතර ඒ අනුව 2050 වන විට බස්නාහිර පළාතේ නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය දිනකට මෙට්‍රික් ටොන් 7000ක් ඉක්මවීමේ ප්‍රවණතාවක් පවතී. බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වාර්ෂිකව විශාල මුදලක් වැය කරන අතර ඒ සදහා පළාත් ප්‍රතිපාදන පත් කරන අතර කළමනාකරණයට අවශ්‍ය ඉඩිකිරීම් සහ මිලදී ගැනීම් වෙනුවෙනි. 2015 වර්ෂයේදී ඒ සදහා රු.මිලියන 65 ක් අධිකාරියට ලැබී ඇති අතර 2016 වර්ෂයේද මිලියන 60ක මුදලක් ලබාදෙන ලදී. කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී ශ්‍රී ලංකාව ප්‍රාථමික අවධියේය. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික ක්‍රමවේද අඩු වීම, පිරිවැය ගැටලු, විධිමත් වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම ආදිය ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය විධිමත් කළමනාකරණයක් නොකිරීමට හේතු වී තිබේ. අපද්‍රව්‍ය ප්‍රතිශක්තීකරණය, ඒවා උත්පාදනය අඩුකිරීම, කොම්පෝස්ට්කරණය, ජෛවීය වායු නිෂ්පාදනය නිෂ්කර්ෂණය කිරීම ආදියෙන් අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය. කැළිකසළ විධිමත්ව බැහැර නොකරන්නන්ට එරෙහිව විවිධ නීති රජය හඳුන්වා දුන්නද විධිමත් කළමනාකරණයක් සිදුවී නොමැත.

***මූඛ්‍ය පද : ඝන අපද්‍රව්‍ය, කළමනාකරණය, බස්නාහිර පළාත***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

chathu28subodi@gmail.com

# ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන වෘත්තිකයන් මුහුණපාන පොදු ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් (බස්නාහිර හා මධ්‍යම පළාත් ඇසුරින්)

ජී. එම්. එන්. එස්. ගජනායක[1]

**සංක්ෂේපය**

කිසියම් මහජන සේවාවක් අරමුණු කරගනිමින් සුවිශේෂ වූ කාර්යයක් ඉටුකරන ඒ සඳහා නිරන්තර අධ්‍යනයේ යෙදෙන එහිදී විශේෂ දැනුමක් පුහුණුවක් අත්‍යවශ්‍ය වන රැකියා විශේෂ වෘත්තීන් වේ. වර්තමානයේ වෘත්තීන් යනු භාණ්ඩ නිෂ්පාදනයේ හා බෙදා හැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ දෙයක් මෙන්ම කිසියම් අනුග්‍රාහක පිරිසකට සුවිශේෂ සේවාවක් ඉටු කිරීම සඳහා අයිතිය හා බලය පැවරුණු පිරිස වේ. එහිදී පුස්තකාල වෘත්තිකයන් යනු පුස්තකාල හා විඥාපන විද්‍යාව ක්‍රමික ලෙස හදාරන ලද කිසියම් අභිමත පුස්තකාල වර්ගයකින් එක් පුස්තකාලයක හෝ තොරතුරු මධ්‍යස්ථානයක කටයුතු කරන පුද්ගලයින් වේ. මෙම අධ්‍යනයේදී මූලික අවධානය යොමු කරන ලබන්නේ ශ්‍රී ලංකාව තුළ පුස්තකාල වෘත්තිකයන්ට මුහුණ දීමට සිදුවන පොදු ගැටළු, සම්බාධක හා අභියෝග මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදී ප්‍රථමයෙන් ම පුස්තකාල වෘත්තිකයන් සිය වෘත්තිය තුළ පවත්නා තෘප්තිමත්භාවය කෙරෙහි මෙන් ම ඔවුන්ට පවත්නා ගැටළු හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ විධික්‍රමය යටතේ ප්‍රශ්නමාලා ක්‍රමය හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය දත්ත රැස්කිරීම සඳහා යොදාගන්නා ලදි. ඒ සඳහා නියදිය වශයෙන් බස්නාහිර හා මධ්‍යයම යන පළාත් තෝරා ගනු ලැබූ අතර එම පළාත් තුළ පාසල් පුස්තකාල, මහජන පුස්තකාල හා විශ්වවිද්‍යාල පුස්තකාලවල පුස්තකාල වෘත්තිකයන් 200 ක් නියදිය වශයෙන් තොරා ගන්නා ලදි. එහිදී පුස්තකාල වෘත්තිකයන්හට සිය වෘත්තිය තුළ යම් යම් ගැටලුවලට මුහුණපෑමට සිදු වී ඇති බව අනාවරණය විය. එනම් සිය වැටුප් හා වරප්‍රසාද පිළිබඳ තෘප්තිමත් වූ පිරිස ප්‍රතිශතයක් ලෙස 25% ක් ද තෘප්තිමත් නොවූ පිරිස සියයට 75 ක් වශයෙන් ද හඳුනාගත හැකි වූ අතර දේශපාලන අධිකාරියේ බලපෑම මත පුස්තකාල වෘත්තිකයන් බඳවා ගැනීම්, උසස් කිරීම් ආදිය ප්‍රතිශතයක් ලෙස 55% ක් පමණ බව සනාථ විය. මීට අමතරව පරිපාලනයන් විසින් පනවනු ලබන නීතිරීති, පුස්තකාල වෘත්තිකයන්ගේ සේවාව සමාජය තුළ අවතක්සේරුව, පරිගණක හා තාක්ෂණික පුහුණුව හා පහසුකම් අවම වීම ආදී ගැටළු පුස්තකාල වෘත්තිකයන් තුළ පවතින බවට සනාථ විය. මේ සඳහා රාජ්‍ය අංශයේ අවධානය යොමු කිරීම, වරප්‍රසාද ඉහළ නැංවීම විසඳුම් වශයෙන් ක්‍රියාත්මක කළ හැකිය.

***මුඛ්‍ය පද : පුස්තකාල, වෘත්තිකයන්, ගැටලු***

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

gmns.gajanayaka1993@gmail.com

# ස්ත්‍රී පුරුෂභාවය සහ සංගීත වර්ගය අනුව විශ්වවිද්‍යාල සිසුන් සංගීතයට ඇති රුචිකත්වය.

එච්. එම්. ඩී. ඊ. ගුණරත්න[1], පී. ජී. ඒ. කාවින්දි, ඊ. එම්. ජී. ජී. ඒකනායක.

**සංක්ෂේපය**

විශ්ව භාෂාවක් බඳු සංගීතය කෙරෙහි මිනිසා තුල පවතින්නේ එකිනෙකට වෙනස් වූ රුචිකත්වයක්ය.ඔවුන් සිටින අවස්ථාව , මානසික ස්වභාවය , අධ්‍යාපනය , සමාජ පසුබිම ආදී බොහෝ කරුණු ඔවුන්ගේ සංගීත රුචිකත්වයට බලපායි.අප විසින් සිදු කල මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ එකිනෙකට වෙනස් වූ මිනිසාගේ සංගීත රුචිකත්වය කෙරහි ස්ත්‍රී පුරුෂභාවය හා සංගීත වර්ගය කෙබඳු බලපෑමක් සිදු කරයිද යන්න අධ්‍යනය කිරීමයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන සියලු පීඨ වලින් ඒකක 100 ක නියැදියක් ලබා ගන්න ලදී. ඒ අනුව සමාජ විද්‍යා , මානව ශාස්ත්‍ර , වාණිජ, කළමනාකරණ හා විද්‍යා යන පීඨ වලින් ස්තෘත සසම්භාවී නියදුම් ක්‍රමය භාවිත කර මෙම නියදීම සකසා ගන්න ලදී. දත්ත රැස් කර ගැනීමේදී විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨ වලින් විද්‍යාර්ථීන් ප්‍රමාණය අනුව සමාජ විද්‍යා පීඨයෙන් විද්‍යාර්ථීන් 37 දෙනෙකු ද මානව ශාස්ත්‍ර පීඨයන් විද්‍යාර්ථීන් 26 දෙනෙකු ද විද්‍යා පීඨයෙන් 19 දෙනෙකුද කළමනාකරණ පීඨයන් 19 දෙනෙකුද අධ්‍යනයට සහභාගී කරගන්නා ලදී. සමස්තයක් වශයෙන් ගැහැණු ළමුන් 60 දෙනෙක් හා පිරිමි ළමුන් 40 දෙනෙක් මේ සඳහා සහභාගී විය. ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මගින් රැස් කර ගන්නා ලද ප්‍රථමික දත්ත තුළින් ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. එම දත්ත ස්ත්‍රී පුරුෂභාවය , අධ්‍යන වර්ෂය , රසවින්දනය කරනු ලබන සංගීත වර්ගය , ගීත වල භාෂාව වැනි විවිධ කාණ්ඩ ඔස්සේ වර්ගීකරණයට ලක් කරන ලදී. ඒ අනුව ස්ත්‍රී පුරුෂ භාවය සහ සංගීත වල භාෂාව අතර සම්බන්ධය පරීක්ෂා කිරීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන්ම වැඩි කැමැත්තක් දක්වන්නේ සිංහල ගීත සඳහා බව පෙනී ගියේය. සංගීත වර්ගය අනුව ගත විට 70% පමණ රුචිකත්වයක් දක්වන්නේ සම්භාව්‍ය සන්ගීතයටයි. 44% විනෝදාංශයක් වශයෙන් සංගීතයට සවන්දෙනු ලැබේ. 80% පමණ විශ්ව විද්‍යාලය තුළ පවත්වන සංගීත වැඩසටහන් සඳහා සම්බන්ධ වන බව තහවුරු විය. කේන්ද්‍රීය ප්‍රවණතා මිනුම් හා කයි වර්ග පරීක්ෂාව ඇසුරෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණයේ අරමුණ අනුව අප සිදු කරනු ලැබූ කයි වර්ග පරීකෂාවෙන් ස්ත්‍රී පුරුෂභාවය අනුව විශ්වවිද්‍යාල සිසුන් සවන්දෙන සංගීත වර්ගයට බලපෑමක් පවතීද යන්න පරීක්ෂා කිරීමේදී කයි වර්ග අගය 3.7 වූ අතර එය 5% මට්ටමින් වෙසෙසි විය. ඒ අනුව තහවුරු වන්නේ ස්ත්‍රී පුරුෂභාවය සවන්දෙන සංගීත වර්ගය කෙරෙහි බලපෑමක් ඇති නොකරන බවයි.

**මුඛ්‍ය පද :** *සංගීත රුචිකත්වය, විශ්වවිද්‍යාල සිසුන්, ස්ත්‍රී පුරුෂභාවය*

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

erandi94k23@gamil'com

# Socio-economic Impact of Brain drain in Sri Lanka

K. N. Samarasinghe[1]

## Abstract

People leave their motherland away from family and friends, in search of adventure, better economic prospects and to obtain better professional opportunities and a higher standard of living. International migration provides more benefits not only to the employers but also to their families and their country. Large scale migration of highly educated, skilled people of developing countries to highly rich and developed countries is called Brain-Drain. A relatively larger proportion of skilled Srilankan labours have migrated in the few last years. So that it is evident that Srilanka is mostly affected by this brain drain. Therefore, the objective of this study was to identify social economic impact of brain drain in Srilanka. The study is based on the primary data which was collected through questionnaires from 100 migrated skilled labours and secondary data from Sri Lanka Bureau of Foreign Employment. The data was analyzed by using SPSS. The survey revealed that, political instability, lack of autonomy academic freedom, lack of career opportunities are the pull factors for the emigration to developed countries. In economic perspective, as a result of fewer productive educational funds, worse health care system, unemployment and inflation, country becomes a poor state. Besides Regional inequalities, strains on families and gender roles are costs of emigration. The Brain-Drain generates the Foreign Direct Investment to the country and increase the global economies. There are both negative and positive impacts of human capital flight.

**Keywords:** *Migration, Brain-Drain, Socio-economic cost, Developing Countries*

[1] Department of Social Statistics, University of Kelaniya

# විශ්ව විද්‍යාල විද්‍යාර්ථයින්ගේ පුස්තකාල භාවිතය පිළිබඳ අධ්‍යනයකි (කැළණිය විශ්ව විද්‍යාලය ඇසුරිනි)

ඒ. එන්. සිරිමාන්න[1], ඒ. එම්. ඩබ්. සී. පුංචිනිලමේ, ආර්. එම්. එස්. කුමාරි

**සංක්ෂේපය**

පුස්තකාලය වූ කලී දැනුම ගබඩාවකි. වර්තමානය වන විට සෑම පාසලකම, විශ්ව විද්‍යාලයකම, නගරයකම පාහේ පුස්තකාලයක් නිර්මාණය වී තිබේ. නමුත් වර්තමානය වන විට නව තාක්ෂණයේ දියුණුවත් සමඟම මිනිසාගේ පුස්තකාල භාවිතය කෙතරම් දුරට වර්ධනය වී තිබේද යන්න ගැටලුවකි. පුස්තකාල භාවිතා කරන්නන් අතර විශ්ව විද්‍යාල විද්‍යාර්ථයින් කොපමන ප්‍රමාණයක් පුස්තකාලය කෙසේ කුමන අරමුණු උදෙසා භාවිතා කරන්නේද යන්න අධ්‍යනය කිරීම අපගේ අරමුණු වේ. මෙම අධ්‍යනය සඳහා ප්‍රධාන වශයෙන් දත්ත රැස්කිරීමෙහි ලා ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත යොදාගත් අතර ප්‍රශ්නාවලී ක්‍රමය ඔස්සේ ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. මෙහිදී කැලණිය විශ්ව විද්‍යාලයේ සමස්ත විද්‍යාර්ථයින්ගෙන් යුත් සංගහනයෙන් අහඹු නියැදීම යටතේ විද්‍යාර්ථයින් පනස් දෙනෙකුගෙන් සමන්විත නියැදියක් තෝරා ගන්නා ලදී. ඒ තුළින් කැලණිය විශ්ව විද්‍යාල විද්‍යාර්ථයින් පුස්තකාලය කෙසේ කුමන අරමුණු උදෙසා කොපමණ ප්‍රමාණයක් භාවිතා කරන්නේ ද යන්න විද්‍යාර්ථයින්ගේ ආකල්ප අධ්‍යනයක් සිදු කරන ලදී. මෙම අධ්‍යනයේදී දත්ත කේන්ද්‍රික ප්‍රවනතා මිනුම් යටතේ ගණනය කළ විට මෙම සිසුන් සියලු දෙනාටම පුස්තකාල සාමාජිකත්වය හිමි අයවලුන්ය. ඔවුන් සියලු දෙනාම පාහේ පුස්තකාලයේ දී බහුල වශයෙන් විෂයානුබද්ධ පොත් පරිශීලනයට යොමුව ඇති බවක් පෙනේ. එමෙන්ම බොහෝ පිරිසක් පුස්තකාලය තුළ වැඩි කාලයක් ගත කරනුයේ විෂයානුබද්ධ පොත්පත් පරිශීලනය කරමිනි. ඔවුන් අතරින් 58%ක ප්‍රතිශතයක් කියා සිටියේ පුස්තකාල පොත් ලඟ තබා ගැනීමට ලබා දී ඇති කාල සීමාව ප්‍රමාණවත් නොවන බවයි. නමුත් 42%ක පිරිසක් එම කාල සීමාව හා එකඟ වී ඇත. බොහෝ පිරිසකගේ අවධානය බහුල වශයෙන් යොමුව ඇත්තේ සිංහල පොතපත කෙරෙහි වන අතර ඉංග්‍රීසි භාෂා පොත් හැරුණු විට වෙනත් භාෂාවල පොත් කෙරෙහි අවධානයක් යොමුව නොමැති තරම්ය. පුස්තකාල කාර්ය මණ්ඩලයේ සේවය පිළිබඳ ව සිසුන් 58%ක ප්‍රතිශතයක් තෘප්තිමත් වන අතර සිසුන් 42%ක ප්‍රතිශතයක් තෘප්තිමත් නොවන බවත් මෙම පරීක්ෂණයෙන් ලද දත්ත ඇසුරින් කිව හැක. අවසාන වශයෙන් විශ්ව විද්‍යාලයේ පුස්තකාලය පිළිබඳ ව සිසුන් 76%කගේ තෘප්තියක් හිමි බවත් ඉතිරි 42% තෘප්තිමත් නොවන බවත් ගම්‍ය විය. එමෙන් ම කයි වර්ග පරීක්ෂාව අනුව විශ්ව විද්‍යාලීය විද්‍යාර්ථයින් තවමත් දැනුම සොයාගනු වස් පුස්තකාල කරා ඇදී ඒම සිදුවන බව තහවුරු විය. පුස්තකාලය හා සම්බන්ධව සිසුන් බලාපොරොත්තු වන තත්වයන් ඔවුන්ට අවැසි අයුරින් ඉටු කරලීමෙන් නැණවත් ගුණවත් දක්ෂ මතු පරපුරක් බිහි කරගත හැකිය.

**මුඛ්‍ය පද :** *පුස්තකාලය, පොත්, විශ්ව විද්‍යාල විද්‍යාර්ථයින්*

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# අර්ධ නාගරික ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතනවල හා ගෘහ ඒකකවල දායකත්වය

කේ. කේ. ටී. උදයංග1 ආර්. එම්. එන්. ගුණසේකර

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමණාකරණය, ප්‍රධාන වශයෙන්ම පළාත් පාලන ආයතන මඟින් සිදුකරන අතර මසකට එක් රැස්වන කසල වලින් ප්‍රතිචක්‍රීයකරණය සිදුවනුයේ 7%ක් වැනි ඉතා සුළු ප්‍රමාණයකි. ඒ අනුව මසකට 93%ක කසල ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීයකරණයට ලක් නොවී පරිසරයට මුදා හැරෙන අතර එය ප්‍රබල පාරිසරික, ආර්ථිකමය හා සමාජමය ගැටලුවකි. ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රියාවලියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පළාත් පාලන ආයතන සඳහා සහායක සේවාවක් වශයෙන් පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතනවල දායකත්වය ලබා ගැනීමේ යෝග්‍යතාව විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය විය. ඊට අමතරව වර්තමාන අපද්‍රව්‍ය ගැටලුව සඳහා ගෘහ ඒකකවල හැසිරීමෙහි බලපෑම ද මෙමඟින් සොයා බලන ලදී. පර්යේෂණයට අදාළ සංගහනය වූයේ කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යි. ගෘහ ඒකක 100 ක නියැදියක් හා පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතන 30 ක නියැදියක් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය මඟින් තෝරා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතනවල දායකත්වය ලබා ගැනීමේ යෝග්‍යතාව සමාජමය පැතිකඩට හා ආයතනිකමය පැතිකඩට අනුව විශ්ලේෂණය කෙරිණි. ඒ සඳහා දර්ශක දෙකක් නිර්මාණය කරන ලදී. ගෘහ එකකවල අපද්‍රව්‍ය කළමණාකරණයේ ගුණාත්මකභාවය විමසීමට ද දර්ශකයක් නිර්මාණය කරන ලදී. සමාජමය පැතිකඩට අනුව පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම 85% ක ප්‍රතිශතයකින් ඉතා ඉහළ යෝග්‍ය මට්ටමක පවතින බවත්, ආයතනිකමය පැතිකඩට අනුව එය 100% ප්‍රතිශතයකින් ඉහළ යෝග්‍ය මට්ටමක පවතින බවත් පැහැදිලි විය. ගෘහ කුටුම්භවල අපද්‍රව්‍ය කළමණාකරණය 60% ක ප්‍රතිශතයකින් ඉහළ ගුණාත්මක මට්ටමක පවතින බව ද තහවුරු විය. අපද්‍රව්‍ය කළමණාකරණයට සහායක සේවාවක් වශයෙන් පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතනවල දායකත්වය තවදුරටත් ඉහළ නැංවිය යුතු බවත්, ශ්‍රී ලංකාවේ කසල ප්‍රතිචක්‍රීයකරණය ආශ්‍රිත ගැටලුවට ගෘහ ඒකකවලින් සැලකිය යුතු බලපෑමක් ඇතිව නොමැති බවත් මෙහි දී නිගමනය විය. පෞද්ගලික කසල ප්‍රතිචක්‍රීයකරණ ආයතන සඳහා බදු සහන හා දිරි දීමනා ලබා දිය යුතු බවට මෙහි දී යෝජනා කෙරිණි.

**මුඛ්‍ය පදඃ** *අපද්‍රව්‍ය, කාර්යක්ෂම බව, පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශය*

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

kktudayanga@gmail.com

# ආයෝජනය සඳහා කොටස් තෝරාගැනීමේ තීරණ කෙරෙහි බලපෑම් කරනු ලබන සාධක අධ්‍යයනය කිරීම. ( කොළඹ කොටස් වෙළඳපොළ දේශීය පුද්ගලික ආයෝජකයන් ඇසුරින් )

ඒ. එම්. දුලීකා ප්‍රියදර්ශනී[1]

ප්‍රතිලාභ හා අවදානම ඉහළ වන්නා වූ කොටස් වෙළඳපොළ ආයෝජනයේදී ගනුලබන සුවිශේෂී තීරණයකි ආයෝජනය සඳහා කොටස් තෝරාගැනීම. පුද්ගලික ලෙස තීරණ ගැනීමේදී සමාජීය මානසික තත්වයන්ගෙන් වන බලපෑම මත පුද්ගලික ආයෝජකයන්ල ආයතනික ආයෝජකයන් මෙන් සැමවිටම තාර්කිකව තීරණ ගන්නා වූ අවස්ථා සීමිතය. එබැවින් පුද්ගලික ආයෝජකයන්ගේ කොටස් තෝරාගැනීමේ තීරණ කෙරෙහි බලපෑම් කරනු ලබන සාධක අධ්‍යයනය මෙහි පරමාර්ථය වේ. මුද්‍රිත හා ගුගල් පෝරම ආශ්‍රිත ප්‍රශ්නාවලි මාර්ගයෙන් දත්ත රැස්කළ අතර ඒ සඳහා පහසු නියදීම් ක්‍රමවේදය යටතේ තැරවුකාර සමාගම් 3ක් හරහා හඳුනාගත් කොටස් ආයෝජනයේ නියුතු පුද්ගලික ආයෝජකයන් 151දෙනකු ඇසුරු කරගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක හා බහුවිචල්‍ය විශ්ලේෂණ සංඛ්‍යාන ක්‍රමවේදයන් භාවිත කරන ලදී. 72%ක් පුරුෂ හා 65% අවිවාහක ප්‍රතිශතයකින් සමන්විත නියැදිය අනුව පුරුෂයන් අඩු වයස් සීමාවකින් ආයෝජනයට යොමුවන බවද අවම වශයෙන් ආයෝජකයන් උසස්පෙළ සමත් හා බහුතරය උපාධිධාරීන් බවද හඳුනා ගැනිණි. එසේම ආයෝජකයන්ගෙන් 80% පෞද්ගලික අංශයේ රැකියාවේ නිරතය. 83% ඡන්දබලය හිමි සාමාන්‍ය කොටස්හි ආයෝජනයේ නිරතයග ආයෝජන දැනුවත් කිරීම් සඳහා යොමුවූවන් 39% ප්‍රමාණයකි. තමා විසින්ම ගනුදෙනු කිරීමේ යෙදෙන ප්‍රමාණය 15% කි. එසේම වැඩි මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරනුයේ පුරුෂයන් බවද තැරව්කරුවකු හරහා බවද හඳුනාගැනීමට හැකිවිය. එසේම ආයෝජනයේ යෙදෙන වාර ගණන, සමාගම් සංඛ්‍යාව ආයෝජනය කරනු ලබන ආකාරය, ආයෝජන දැනුවත් වීමේ වැඩසටහන්වලට සහභාගී වීම ආදිය කෙරෙහි අධ්‍යාපන මට්ටමෙහිද භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය සහ රන් භාණ්ඩ ආයෝජනය කෙරෙහි පුමිතිරිබවෙහි ද වෙනසක් පවතින බව හඳුනා ගත හැකි විය. ලිකට් පරිමාණ දත්ත ඔස්සේ විචල්‍ය 60ක් අතුරින් කොටස් තෝරාගැනීම කෙරෙහි ප්‍රබලව බලපෑම් කරනු ලබන විචල්‍යයන් 41 වශයෙන්ද තවදුරටත් බාහිර පුද්ගල චර්යාත්මක සාධක, සමාගමික තොරතුරු, වෙළෙඳපළ තොරතුරු සංයුතිය හා අත්දැකීම්, රටෙහි වත්මන් තත්වය හා දිශානතිය, පුද්ගලික අභිමතාර්ථ ආදී වූ මූලික සාධක 10 වශයෙන් හඳුනා ගැනිණි. ඒ අනුව කොටස් තෝරාගැනීමේදී පුද්ගලානුබද්ධ සාධකහි බලපෑම පාලනය කරමින් වෙළඳපොළ තොරතුරු පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීමත් විවිධාංගිකරණයෙන් හා ආයෝජන කළඹක් වශයෙන් මෙන්ම අවබෝධයෙන් යුතුව ආයෝජනය සඳහා දැනුවත් කිරීම් හා නව්‍යතා වැඩසටහන් සඳහා යොමුවීම හා යොමුකරලිම සඵලදායි ආයෝජනයකට පිටුවහලක් වනු ඇත.

***මුඛ්‍ය පද : ආයෝජනය, කොටස් වෙළඳපොළ, කොටස්, පුද්ගලික ආයෝජකයා, කොටස් තෝරාගැනීමේ තීරණ***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

dulikapriyadarshani92@gmail.com

# The Impact of Microfinance Services on the Growth of the Microenterprises in Sri Lanka. (With special reference to Homagama DS. Division)

S. U. Badullahewage[1]


## Abstract

The microfinance is the provision of financial services to low income sectors, including the micro and small enterprises. It is mostly used in developing economies where micro and small enterprises do not have access to other sources of financial assistance. The microenterprises said to be the less privileged business group in the society which could play a significant role in the economy. There are substantial microenterprises operate in the Homagama region, but no study of impact of microfinance services on the growth of the microenterprises has been conducted. Therefore, the study intended to ascertain the impact of microfinance services on the growth of income and productivity of the microenterprises being operated on the micro loans and advisory and training services provided by microfinance institutions. All microenterprises in Homagama is the target population and out of which 60 microenterprises which have obtained micro loans from the microfinance institutions were selected based on the judgmental sampling method. The primary data were collected on face to face interview through structured questionnaire and secondary data were collected through literature survey. Quantitative and qualitative techniques were used to undertake data analysis respectively based on descriptive statistics and parameter estimation and open ended questions. The paired sample t-test, multiple regression, chi-square test, gamma and Kendal tau-b tests in the SPSS software were used to achieve the expected objective. The findings of the study indicated that micro loan and advisory and training services have created positive impact on the income and productivity growth of the micro enterprises. Moreover, majority agreed that the micro loan was fair enough for the expected tasks, they were satisfied with financial assistance received and success of their business. So, the study concluded that the microfinance services create impact on the growth of the microenterprises in Homagama region. Further, microfinance institutions should develop diversification in their products and government should create legal and regulatory environment to the entry of microfinancing by local and foreign investors.


***Key Words: Growth, Microenterprises, Microfinance***

---

[1] Department of Economics, University of Sri Jayewardenepura, Sri Lanka.
Shohani.92v@gmail.com

# Factors Affecting the Usage of Social Media among Youngsters (A Quantitative Approach)

G. P. S. Nalaka[1], H. P. Diunugala

## Abstract

Youngsters in every society are of great importance. Their attitudes and behaviors are significant since they are the leaders of tomorrow. They are getting involved with internet related activities more closely than others. Especially, at present social media plays a vital part in their day today life. Therefore, main focus of this study is to explore the factors that affect the usage of social media among youngsters. Mainly, primary data were used. Sampling was done through stratified random sampling technique. Data were collected from 420 undergraduates at the University of Sri Jayewardenepura using a web-paper based questionnaire. Descriptive statistical tools were used to present data. Regression models were applied on two dimensions of social media usage as how often youngsters use social media and how much time youngsters spend on social media. Most of youngsters use social media daily and spend 2 hours a day on social media. Relationship with family, relationship with friends, and privacy concentration are significant factor to the time spent on social media model. Relationship with friends, privacy concentration, and income are significant factor to the frequency of social media usage model. The coefficients are 0.0016, -0.0085, and 0.00000284 respectively. According to Analysis of Variance, purpose of online surfing and rural-urban residence effect on both frequency of social media usage and time spent on social media. Purpose of education is demotivated the usage of social media while communication and entertainment are motivated the usage of social media. Youngsters in urban areas use social media more than youngsters in rural areas.

**Keywords: Youngsters, Social Media, Usage, Regression**

[1] Department of Social Statistics, University of Sri Jayewardenepura, Sri Lanka
hellonalaka@gmail.com

# ග්‍රාමීය හා නාගරික බව අනුව ස්ත්‍රී දේශපාලන සහභාගීත්වය

ඩී. ඒ. කේ. අයි. සිල්වා[1]

**සංක්ෂේපය**

ස්ත්‍රී සාක්ෂරතාවය 82.4% හා විශ්වවිද්‍යාල අධ්‍යයනයට පිවිසෙන ස්ත්‍රීන් 42-45%වැනි ඉහළ මට්ටමක පැවතියද, ස්ත්‍රී දේශපාලන සහභාගිත්වය පවතින්නේ ඉතා පහළ මට්ටමකිනි. (මූලාශ්‍රයඃ එච්.ඩබ්.කරුණාරත්න,1997) සංවිධානාත්මක දේශපාලන ක්‍රමයක් තුළ සක්‍රීය දේශපාලන ජීවියෙකු වශයෙන් ක්‍රියාකාරීත්වය අත්කර ගැනීමට පුරවැසියා සතු ඉඩ ප්‍රස්තාව දේශපාලන සහභාගිත්වය වේ.ග්‍රාමීය, නාගරික මට්ටමින් කාන්තාවන් දැනුවත් කර මෙරට දේශපාලනය තුළ නායකත්වය හෙබවීම සඳහා ස්ත්‍රීන් දිරි ගැන්වීම මෙන්ම ස්ත්‍රීන් දේශපාලනය සඳහා සහභාගි කරවීමේදී ඇතිවන ගැටලු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් සෙවීම සිදු විය යුතුය. මෙහිදී ශ්‍රී ලංකාවේ ප්‍රදේශයන් කිහිපයක් අධ්‍යයනය කරමින් ප්‍රාදේශීය විවිධත්වය සඳහා බලපානු ලබන ස්ත්‍රී දේශපාලන සහභාගිත්වය ග්‍රාමීය මට්ටමින් හා නාගරික මට්ටමින් අධ්‍යයනයේ යෙදෙමින් වැඩි ස්ත්‍රී දේශපාලනයක් පවතින්නේ නාගරිකවද , ග්‍රාමීයවද යන්න අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. ඒ සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත භාවිතා කරන ලදී. එහිදී ජනතාවගේ අදහස් ප්‍රශ්නාවලියක් හරහා රැස් කළ අතර කළුතර , රත්නපුරය , අනුරාධපුරය හා ගම්පහ යන ප්‍රදේශ යොදාගෙන අධ්‍යයනය සිදු කර ඇත. ඒ අනුව ස්ත්‍රී දේශපාලන සහභාගීත්වය නියෝජනය වන පරිදි අහඹු ලෙස සිසුන් 100ක ගෙන් යුක්ත නියැදියක් තෝරාගෙන ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ලබා ගත් අතර ලබා ගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කිරීම සිදු කෙරිණි. විශ්ලේෂිත දත්ත අනුව ග්‍රාමීය මට්ටමින් 28%ක ස්ත්‍රී දේශපාලන සහභාගීතවයක් හා නාගරික මට්ටමින් 72%ක ස්ත්‍රී දේශපාලන සහභාගීත්වයක් පවතින බව සනාථ විය. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ කාන්තා දේශපාලන සහභාගිත්වය වැඩි වශයෙන් නියෝජනය වන්නේ නාගරික ප්‍රදේශවල බවයි. මෙහි විශේෂත්වය වන්නේ කාන්තා නියෝජනය කිසිදු අවස්ථාවක ග්‍රාමීය හා නාගරික මට්ටමෙන් සමාන නොවීමයි. මේ අනුව ප්‍රාදේශීය විවිධත්වය දේශපාලන සහභාගීත්වය සඳහා බලපාන ආකාරය විග්‍රහ කිරීමේදී දේශපාලන සහභාගීත්වය වැඩි වී ඇත්තේ නාගරික ප්‍රදේශයන් තුළය. ස්ත්‍රී දේශපාලන සහභාගීත්වය වැඩි කර ගැනීමට කාන්තාව පිළිබඳ පවත්නා මිත්‍යා විශ්වාස වෙනස් කිරීම , ආසියානු රටවල් තුළ ඇති පංගු ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක කිරීම , දේශපාලන රැස්වීම් හරහා කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය නැංවීම සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය දැනුවත් කිරිම යෝජනා ලෙස දැක්විය හැකිය.

***මුඛ්‍ය පදඃ ස්ත්‍රී දේශපාලන සහභාගීත්වය , ග්‍රාමීය , නාගරික***

[1] , දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය.

kalpanisilva1994@gmail.com

# Author Index


| | |
|---|---|
| ටී. ඩී. එච් දර්ශා | 79 |
| ඩී. ඒ. කේ. චතුරංගනී | 100 |
| ඩී. එස්. අබේසිංහ | 67 |
| ඩී. එන්. ප්‍රනාන්දු | 23 |
| ඩී. කේ. එම්. මලගල | 56 |
| ඩී. එච්. ඩී. හේවගේ | 87 |
| ඩී. එම්. යූ.. සි. දෙලන | 20 |
| ඩී. පී. ඩී. දුලාරි | 55 |
| ඩී. එච්. බෝපිටිය | 70 |
| ටී. ඩබ්. එස්. කාංචනමාලා | 93 |
| ඩි. ඩි. වයි. එන්. ගුණරත්න | 86, 109 |
| ඩි. ඩි. ඩබ්ලිව්. එන්. ගුණරත්න | 109 |
| ඩි. යු. පි. දසනායක | 3, 52 |
| ඩි. සානිකා ප්‍රියංජලී දිසානායක | 34 |
| ඩි. ඒ. කේ. චතුරංගනි | 48 |
| ඩී. එම්. සුනේත්‍රා සෙව්වන්දි දයාරත්න | 37 |
| ටී. එම්. එච්. ඩී. තලවත්ත | 113 |
| ටී. ඩබ්. කේ. එම්. ආරියකරුණා | 45 |
| ඊ. එම්. එන්. විජේරත්න | 74 |
| ඊ. එච්. එම්. අයි. පී. කුමාරි | 55 |
| ඊ. එම්. ජී. ජී. ඒකනායක | 122 |
| ජී ඒ. එස්. මධුවන්ත | 55 |
| ජී. පී. එන්. බස්නායක | 14, 98 |
| ජී. එස්. ජී නිසංකා | 81 |
| ජි. එම්. ජී. සි ගජනායක | 5 |
| ජී. එම්. එන්. එස්. ගජනායක | 121 |
| ජේ. එම්. ඩී. වයි. බණ්ඩාර | 46 |
| ජේ. එච්. එම්. සී. පී. ජයපත්ම | 53 |
| කේ. ඩී. ලියනගෙ | 85 |
| කේ. ජී. එල්. උදයංගනී | 8, 114 |
| කේ. කේ. එස්. යූ. ඉෂාරි උබේසේකර | 8,77 |
| කේ. කේ. ඩබ්. සුබෝදනී | 67 |
| කේ. එල්. අයි. බී. ගුණවර්ධන | 68 |
| කේ. එම්. ජී. එම්. ඩයස් | 85 |
| කේ. එම්. සී. ප්‍රියංගනී | 101 |
| කේ එල් සී එස් චන්ද්‍රසිරි | 120 |
| කේ. එම්. එම්. පී.කුලතුංග | 70 |
| කේ. ඩී. ලියනගේ | 109 |
| කේ. එම් .ඩී. ඇම්. තිලකරත්න | 60 |
| කේ. කේ. ටී. උදයංග | 125 |
| කේ. ඒ. ඩී. එල්. වයි. එම්. සේනාපාල | 111 |
| කේ. ඒ. ඩී. එස්. කාරියප්පෙරුම | 54 |
| කේ. එම්. ජී. එම්. ඩයස | 109 |
| යු. ජී. පී. එස්. සමරනායක | 40 |
| යු. කේ. ඩි. ශාන්ත | 36 |
| යූ. එච්. ජී. පී. එස්. සමරනායක | 10 |
| බී. එම්. එම්. රසාංජල | 31 |
| බි. ජී. ටී. ඩි. බණ්ඩාර | 50 |
| බී. පී. එස්. පී. කේ. පතිරත්න | 28 |
| සී. ටී. සමරසිංහ | 33 |
| බී. එම්. එන්. එම්. තිලකරත්න | 38 |
| බී. එම්. එස්. පී. බාලසූරිය | 20 |
| වයි. එම්. ආර්. කුමාරිහාමි | 105 |
| පී. ඒ. ඩී. ටී. ඩී. රත්නසිරි | 110 |
| පී. ටී. පතිරණ | 14, 57 |
| පී. ජී. ඒ. කාවින්දි | 122 |
| ඒ. එම්. දුලීකා ප්‍රියදර්ශනී | 126 |
| එල්. පී. අයි. එස්. මධුශානි | 100 |
| එල්. එල්. ආර්. ලොරෙන්සුහේවා | 40, 72 |
| එල්. අයි. ඒ ගුණතිලක | 91 |
| ඒ. ඒ. පී. එන්. කුමාර | 87 |
| ඒ ඒ එස් ඩී අධිකාරි | 97 |
| ඒ. ඩී. එන්. පී. අස්සැල්ල | 19 |
| ඒ. එම්. ඩබ්. සී. පුංචිනිලමේ | 124 |
| ඒ. එන්. සිරිමාන්න | 124 |
| ඒ. ජී. එස්. සරෝජනී | 11 |
| ඒ. පී. ඩී. එන්. පෙරේරා | 3 |
| ඒ. එල්. ඒ. ඩී. පී. කුමාරි | 26 |
| ඒ. එම්. එල්. එස්. අත්තනායක | 119 |
| එච්. ඒ. ඩී. ටී. හපුආරච්චි | 51 |
| එච්. ටී. ඒ. ශාලික | 112 |
| එච්. ඒ. එන්. ඩී. හෙට්ටිආරච්චි | 70 |
| එච්. ජී. අයි. එස්. එච්. ගමගේ | 80 |
| එච්. එම්. ඩී.ඉ. ගුණරත්න | 122 |
| එම්. ඩී. ඒ. නිශාදි | 107 |
| එම්. ජී. ආර්. වී. ගුණසේකර | 102 |
| එම් කේ අයි ඒ බණ්ඩාර | 99 |
| එම්. ඒ. රුශාන්ති දිල්ශානි | 58 |
| එස්. ටි. ආර්. අයි. සිල්වා | 13 |
| එස්. සී. ලසන්ත | 6 |
| එස්. ජී. එල්. ඔමීගා හංසිනී | 57 |
| එස්. ඒ. ඩී. යාමිණී | 63 |
| එස්. ඒ. ඩි. එම්. ඩි. ඒ. විජේසිංහ | 15 |
| එස්. ඒ. දිල්හානි | 49 |
| එස්. ටී. ආර්. අයි. සිල්වා | 8 |
| එස්. ජී. එල්. ඔමීගා හංසිනී | 14 |
| එස්. සී. ලසන්ති | 40 |
| එස්. ඒ. දිල්හානි | 21 |
| එම්. ඩී. එම්. උබේසේන | 39, 40 |
| එස්. ආර්. හෙට්ටිආරච්චි | 52 |
| එම්. පී. ඩී. සදමාල | 32 |
| එම්. පී. එන්. පී. මැණික්ගේ | 106 |
| එන්. කේ. අයි. ටී. නමුණුකුල | 73 |
| ඩබ්. පී. සචිනි වත්සලා විජේසේකර | 115 |
| ඩබ්. පී. ඒ. එස්. විජේසේකර | 41 |
| ඩබ්. ජී. වී. ආර්. කුමාර | 104 |
| ඩබ්. එම්ග ඩබ්. එම් විජේසිංහ | 8 |

ඩබ්. ඩබ්. එම්. ඩී. විජේතුංග 116
ඩබ්ලිව්. එම්. එල්. ඩී. ජයතිලක 100
ඩබ්. එම්. ඩබ්. එම්. විජේසිංහ 62
ඩබ්. ඩබ්. එල්. සී. ජනන්ජනා 56
ඩබ්.ඒ.ඩී.ටී.එස්.මානපුරාව 94
ඩබ්.එච්.ශානිකා ප්‍රියදර්ශනී 35
ඩී.ඒ.කේ.අයි.සිල්වා 129
ආර්. පී. එස්. ඩබ්. ආරියරත්න 4,100
ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග 7
ආර්. එම්. එස්. කුමාරි 124
ආර්. ඩී. චතුරංග 47
ආර්. ඩී. එස්. කේ. වීරසිංහ 61
ආර්. පී. ඩී. එන්. වයි. ප්‍රේමරත්න 29
ආර්. පී. එස්. එස්. දිසානායක 14
ආර්. පී. එස්. එස්. දිසනායක 50
ආර්. ඒ. එස්. සඳුනිකා 3
ආර්. එච්. එම්. අයි. එම්. රාජකරුණා 30
ආර්. එම්. ටි. පි. ජයසේකර 69
ආර්. එම්. එන්. ගුණසේකර 125
ආර්. එන්. කේ. රාජපක්ෂ 108
ආර්. ඩබ්ලිව්. එම්. බී. එන්. රණසිංහ 113
ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග 109
ආ්ර්. ඩී. එස්. කේ. වීරසිංහ· 100
අයි. අයි. ර්. සිල්වා 3
G.P.S. Nalaka 128
K.N. Samarasinghe 123
L. N. Liyanage 71
M.A. Rushanthi Dilshani 78
M. S. H. U. Karunarathne 92
M. Y. G. V. Jayawardena 103
R. M. Dilki Hansika Rathnayake 22
S. U. Badullahewage 127
Thevuni K. Kotigala 59
H. P. Diunugala 128